

# ධම්පියා අටුවා ගැටපද විවරණය

# ධම්පියා අටුවා ගැටපද විවරණය.


කර්තෘ:-

සරික්කාමුල්ලේ "සිරිනඳන" පරිවේණාධිපති,

පණ්ඩිත මැදඋයන්ගොඩ විමලකීර්ති

ස්ථවිරයන් වහන්සේ.



ප්‍රකාශක:-

පරණගම පී. ජී. ඩේවිඩ් සිල්වා මහතා

මුද්‍රණය:-

විද්‍යාශේඛර යන්ත්‍රාලය, හොරණ.

ශ්‍රී. බු. ව. 2491.

# සංඥාපනය.

---

ලොවට සෙත් කළ අති ශ්‍රේෂ්ඨ සිංහල නරේන්ද්‍රයකු වන පස්වන කාශ්‍යප රජුගේ ගැඹුරු ධර්ම ශාස්ත්‍ර ඥානය පිළිබිඹු කරන ධම්පියා සන්නය වනාහි දැනට තිබෙන ඉතා පැරණි සිංහල ග්‍රන්ථය වන්නේය. එය ආධුනිකයන් අතට පැමිණවීමේ ගෞරවය විද්වත් ජයතිලක ඇමතිතුමන් කර යෙයි. සිංහල භාෂාවෙහි ඉතිහාසයත් පැරණි සිංහල ශබ්දමූලයත් පිළිබඳ අවබෝධයක් ඇතිකර ගැනීමට උත්සාහවත් වන සාහිත්‍ය ප්‍රේමීන්ට මෙයින් ලැබෙන ආලෝකය අනෙක් කිසිම ග්‍රන්ථයකින් නොලැබිය හැකිය. මේ ග්‍රන්ථයෙහි පෙනෙන විශේෂ ශබ්ද ප්‍රයෝග, ශබ්ද බිඳීම් ක්‍රම, වර නැගීම් විධි, පාඨ ශෝධන පූර්වක අර්ථ කථන ක්‍රම, ණ න ල ළ යෝගය, විශේෂණ විශේෂ්‍ය යෝගය, උච්චාරණ පෙරළි යනාදි නොයෙක් දේ විමසා ලියූ දීර්ඝ සංඥාපනයත් ශුද්ධි පත්‍රයත් මෙවර මෙහි ඇතුළත් කරන්නට නොලැබේ. මුද්‍රණ කාර්ය සම්බන්ධයෙන් නොයෙක් අපහසුකම් ඇති වූ නිසාය.

දෙවන වර මුද්‍රණයේ දී ඒ සියල්ල සම්පූර්ණ වන බැව් සැලකිය යුතුයි. මෙහි තැනින් තැන තිබෙන පාළි ව්‍යාඛ්‍යාන්ට අර්ථ දක්වන ලද්දේ ගිහි ශිෂ්‍යයන්ගේ ප්‍රයෝජනය පිණිසය. එකම කාරණය නිසා තැනක විස්තර කෙළේත් ශිෂ්‍යයන්ගේ පහසුව සඳහාය. සමහර ශබ්ද පොතේ පෙනෙන රූපය ගත් හැටි දැක්වීමේදී පරිකල්පිත රූපයන්ට මුලින් පූර්ව සලකුණ යොදනු සිරිත වුවත් අප විසින් එසේ නොයොදන ලදි. අපට මේ කාර්ය සඳහා වැඩි කාලයක් යොදන්නට නොලැබුණු හෙයින් ද පොත බොහෝ සෙයින් අශුද්ධව පවත්නා හෙයින් ද තවත් විමසිය යුතු තැන් මෙහි අධිකව පෙනේ. ඒ සියල්ලට සුධීහු කමත්වා.

මේ පොත මුද්‍රණය කරවීමේ දී පාණදුරේ මොරවින්නේ සුධර්මාරාමාධිපති ගෞරවාර්හ බී. ඥාණරතනාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ ශිෂ්‍ය පණ්ඩිත ගොරකානේ සෝමරතන ස්ථවිරයන් වහන්සේගෙන් ද උපකාර ලැබුණු බව සඳහන් කරමු.

එසේම නොයෙක් අනවකාශතා මධ්‍යයෙහි මෙහි හරි වැරදි බැලීමෙන් හා සමහර කරුණු විනිශ්චය කිරීමෙන් ද අපට නොයෙක් අයුරින් අනුග්‍රහ කළාහු නම් ආචාර්ය මාපලගම සිරි සාගර, යටවර ජිනරංසි, බලදෙර ඥාණකිත්ති, යන ස්ථවිරයන් වහන්සේලාය. එබැවින් එකී සියලු ස්ථවිරයන් වහන්සේලාට අපගේ අවංක ගෞරවාදරය මෙයින් පිරිනමමහ.

අප හිතවත් පරණගම සෝමාලඞ්කාර ස්ථවිරයන් වහන්සේගේ සහෝදර පී. ජී. ඩේවිඩ් සිල්වා මහතා මෙම පොත මුද්‍රණය කිරීම සඳහා නොමසුරුව ධන පරිත්‍යාග කළ බව ද, හොරණ විද්‍යාශේඛර යන්ත්‍රාලයාධිපති ජ්. ඩී. බර්නාඩ් අප්පුහාමි සහ පෝර්ම කීපයක් මාලිගාකන්දේ සෑඩු මුද්‍රණාලය පාණදුරේ ශිලාලඞ්කාර යන්ත්‍රාලය යන තැන්හි අධිකාරී මහතුන් මුද්‍රණය කරවා දුන් බවද අපි ඉතා ආදරයෙන් සිහිපත් කරමු

මීට,

මැදඋයන්ගොඩ විමලකීර්ති ස්ථවිර

සිරි භද්‍ර පිරිවෙණ,
සරික්කාමුල්ල,
පාණදුර.
1948-3-30.

"ලක්දිව ශිලාලිපි සංග්‍රහය යනතුසථ බව සිතේ තබාගන්න!"

# ධම්පියා අටුවා ගැටපද විවරණය.

විශඛ්‍යන්, ව්‍යාඛ්‍යානය-සන්නය; (ව්‍යාඛ්‍යාන-වියඛ්‍යන වියඛ්‍යන්) ඇදුරන්හු, ආචාර්‍යවරයන්හු විසින්; **පුබ්බභාගෙ**, පූර්වභාගයෙහි; (බුබ්බ, පුව-පුව්' පූ) **පළමුනවාහි**, පළමුකොට වන්නාහී; **වම්නවාහි** යනුව 12. දෙව්දත් තෙරුන් වත්හි "භුණ්ණුනවාහි වන සෙයින්" යන තන්හිද, 82. දරුසිරි මහතෙරුන් වත්හි නවාහි නොකල් (අකාලෙබොනාව) යන තන්හිද 137 දන්තපේරසස වත්හි "සඨර නවාහි" යන තන්හිද පෙනේ. 'නාවහි" යනුයෙන් ආයේයයි සිතිය හැකිය. වනාහි අර්‍ථයෙහි යෙදුන නාව යනුව "අහංනාව" (මම වනාහි) යනාදී තන්හි එයි. නමාහි යනු අප පාඨයි. **"මහාමොහතමොනද්ධලොකො ලොකන්තදස්සිනා"** මහත් මොහනැමැති අඳුරෙන් හැඩසිගත් ලෝකයෙහි ලොකාන්ත සඞ්ඛ්‍යාත නිවණ දක්නා වූ බුදුහු විසින්; **අවිජ්ජෙයහි**, (අවිජ යෙහි) අවිජ්ජායෙහි; **සඤ්ඤ**, නාමිය වෙයි; (සඤ් + ය=සඤ්ඤ) (සඤ්ඤ-සඥ-සඤ්) **මෙනැන් දෙජ්**, මේ නම, අඳුරු යන නැන් දෙනම; (දෙව-දෙජ-දෙජ්) **අවිජ්ජෙම කියා**, අවිද්‍යාවම කියයි. (අවිජ්ජා-අවිජ-අවිජ්) **පිළිසොයන අපින්**, වසන අර්‍ථයෙන්; (පටිච්ඡාදන-පිළිසයන-පිළිසොයන) **"නමෝවිය මෝහො මෝහනමො"** අන්ධකාරය වැනි මෝහය මොහතමවෙයි. **මොහතමම මහා විෂයවන බැවින් එව්**, මොහ නැමැති අඳුරම මහවිෂය (මහ මුලාව) වන බැවින් හෝ; මෙහි විෂය ශබ්දය මුලාව කියයි. **පැහෙන බැවින්**, ප්‍රහීන වන බැවින්; පැහෙන යනු පහ හැරුම්හි දයින් නිපන් කෘදන්තයි. පහීන ශබ්දයෙන් හෝ ආ හැකිය. (පහීන-පැහින-පැහෙන) **මහාපටිපක්ඛවෙයි**, මහ සතුරු වෙයි. රහත් මග නැණින් මිස අන් මෙහා මගෙකින් බැහැර නොකළ හැකි හෙයිනි. **"මහාවිසයා මොහතමො-වාති මහා මොහොතමො, තෙනාබද්ධො පටිපක්ඛොති මහාමොහතමො නද්ධො"** මහාවූයේත් මොහතමය වූයේත් එකක්මනුයි මහා මොහතම නම්. ඒ මහා මොහතමයෙන් වළඳනාලද්දේ මහා මොහතමොනඩ නම් වේ. **තස්මිං මහා මොහතම මොනද්ධෙ**, මහා මොහතමොනද්ධ ශබ්දය සප්තමී විභක්තිගත් නැති, **ලොකෙ** යනුවට විශේෂණ වේ. මහත් මොහ නැමැති අඳුරෙන් වළඳනා ලද (ලෝකයෙහි) යනු අර්‍ථයි. **"සද්ධම්ම පජ්ජොතො ජාලිතො"** සඬම් නැමැති පහන දවල්වන ලද්දේද,

"ලෙව්භිය" මෙහි අවසාන යකාරය වේ යන ක්‍රියාව වෙනුවට යෙදෙන්නේ වෙයි. 154 යමක පාටිහීරවත්ථුයෙහි "සතිස්සොදුකක් අවට ඇතිභියැ" යනුව හා සසඳ බලනු.

ලොවුතුන, ලොකයෝ තුනෙක් වෙත් "ලොකියන්ති එත්ථ සුභා සුභං තංඵලංච" යි ගත (මෙහි සුභා සුභ ක්‍රියාවත් හා ඵලය දක්නා ලැබේ) යි ගතහොත් සත්ලෙවු, සත්ත්වලොකයයි, "ලුජ්ජති පලුජ්ජතීති" යි ගත (බිඳේනුයි විශෙෂයෙන් බිඳේනුයි) ගත හොත්, සබරලොවු සංස්කාර ලොකනම්. ලොකියන්ති එත්ථ සුභා සුභං තංඵලඤ්චාති ලොකො" අනුමාන විසින් කුශලා කුශල කර්මයද ප්‍රත්‍යක්ෂ විසින් ඉෂ්ටානිෂ්ට විපාකද මෙහි සිට බලානුයි. සත්ත්ව සන්තාන ලොක නම්. නොහොත් "ලුජ්ජති පලුජ්ජතීති ලොකො" දැයින් ඉපැද ජේරෙන් දිරා මරණින් මිරිකෙන බැවින් සත්ත්වලොක නම්" යනු ජාතක අටුවා ගැටපදයි, (ජයතිලක 3 පිට) ලොකියන්ති එත්ථ ථාවර ජඞ්ගමාසි ගත, ලොකියනාති...ජඞ්ගමායි ගතහොත්, බජුන්ලොවු, භාජන ලොකයයි. එත්මෙහි ථාවර-ජඞ්ගමා, සපිර චංචලදේ ලොකියනාතිති දක්නා ලැබෙන්නු යි, භාජන ලොක නම්.

"ලොකියන්ති එත්ථ ජඞ්ගමාථාවරාච තෙසංච ඔකාසභූතො ති ඛන්ධා තදාධාරතාය සෙසභාජන ලොකොති පවුච්චති"

(සාරත්ථදීපනී 203) චංචල නිශ්චල වස්තු සමූහයට ආධාර හෙයින්, අවකාශ ලොකය මෙහිලා භාජන ලොක නමින් අදහස් කරනු ලැබේ. (භාජන-බජන-බජුන-බජුන්) අනුසය පරියුට්ඨාන වීතික්කම විසින් පරිභොගභාජනය එහි ලැබෙන බැවින්, අනුසය පරියුට්ඨාන වීතික්කම යන මොවුන්ගේ වශයෙන් පරිභොගභාජනය (භාත් පසින් වැසීම) සත්ත්වලොකයෙහි ලැබෙන බැවිනි. "අනුසය නම් මැගින් නුපුහුන් කාමරාගාදී කෙලෙස්" යි (279) කී හෙයින් මාර්ගයෙන් බැහැර නොවූ හෙවත් නැවත නූපදනා පරිදි බැහැර නොවූ කෙලෙස් අනුසය නම් වෙති. "කුසලොත්පත්තියට අවකාශ නොදී සිත්හි වැද්දගෙන කෙලෙසුන්ගේ සිටීම පරියුට්ඨාන නම් වෙයි." යනු විසුද්ධි මග සන්න හෙයින් කුසල් ඉපදීමට ඉඩ නොතබා කෙලෙසුන් විසින් සිත වැළඳගෙන සිටීම පරියුට්ඨාන නමැයි දතයුතුයි. විශෙෂයෙන් ශික්ෂාපදයන් ඉක්මවීම හෙවත් කාය වාග්ද්වාරයෙහි සංක්ලෙශධර්ම නම් කෙලශ ධර්ම යන මොවුන්ගේ අධ්‍යාචාරය වීතික්කම නම්.

තෘෂ්ණාවයින් සිපි ලොවුජ් ගන්නේ මේ [ඒ] වී, කාම රූප අරූප යන තුන් ආකාරයෙන් සිටි ලොකද ගතයුතුම හෝ වෙයි. වරා, වලක්වා; (වාරෙත්වා-වරය-වරය්-වරා) හැමජ, සියල්ල යනු අර්ථයි. සබ්බත්ථ යන්නෙන් ආයේයයි සිතතොත් සියලු තන්හි යන අර්ථය ගතයුතුය. එසේම එය "සමන්තා" ශබ්දයෙනුදු ආ-හැකිය. හාත්පස යනු අර්ථයි. (සමන්තා-සමත-හැමත-හැමත-හැමජ) යනු ආ සැටිය. මොහ අඳුරු පිළිවසයෙන බැවින්, මොහාන්ධකාරය විසින් වසනු ලබන හෙයිනි. (බැවිනි-බැවින්) ලොවත් දක්නවුහු විසින්, ලොකාන්ත සඞ්ඛ්‍යාත නිවන දක්නා බුදුහු විසින් (ලොකන්ත-ලොවත-ලොවත්) "ලොකන්තං පස්සතී ති ලොකන්තදස්සි" ලොකාන්තය (නිවන) බලානු යි ලොකන්ත දස්සී නම් වෙයි. "නච අප්පත්වා ලොකන්තං දුක්ඛා අත්ථි පමොචනං" නිවනට නොපැමිණ දුකින් මිදීමෙක් නැත්තේය. (සෙයිනි-සෙයින්) විපරිණාම කොට, වෙනස් කොට යෙනබුඬෙන යනු "යෙනසම්බුඬෙන" යී යොදාගත යුතුයි. "සද්ධම්මො එව පජ්ජොතො සද්ධම්ම පජ්ජොතො" සද්ධර්මයම ප්‍රදීපයවූයේ සද්ධම්ම පජ්ජොත නම් "පජ්ජොතො විය සද්ධම්මො සද්ධම්ම පජ්ජොතො" ප්‍රදීපයක් වැනි සද්ධර්මය සද්ධම්ම පජ්ජොත නම් වෙයි. සද්ධම්ම දෙ වෙ, සද්ධර්මය දෙකෙක් වෙයි; දෙප්, ඒ සද්ධර්ම දෙකද; "සතං ධම්මො සද්ධම්මො සන්තො පසත්ථො ධම්මොති සද්ධම්මො" සත්පුරුෂයන් ගේ ධර්මය හෝ ශාන්තවූ-ප්‍රශස්ත වූ ධර්මය හෝ සද්ධර්ම නම්. "ගණෙත"යනු ගන්නේ යි ශුද්ධ විය යුතුය.

පුවසනා ලද්ද, ප්‍රකාශ කරන ලද්ද; (පකාසිත-පුවසන) මෙ! මේ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන නසෙවිතබ්බා" මහණෙනි! මේ අන්තවය (කාමසුඛයෙහි ඇලීම සහ ආත්මයට දුක්දීම) පැවිද්ද විසින් නොසෙවිය යුත්තාහ. යෙමින්, කියමින්; ය-කියුම්හි ධාතුයි. අඤ්ඤා කොණ්ඩඤ්ඤ තෙරුන්, අඤ්ඤා කොණ්ඩඤ්ඤ තෙරුන් ලවා; උපයමින්, උපදමින්; උපය-උපයුම්හි ධාතුයි. (උප්පාද-උපය) ජුලු, ජලිත; (ජලිත-ජිලිය-ජුලුය-ජුලු) "ජලිතා ඉද්ධියස්සසො ජලිතිද්ධි" දිලිහුණු සෘද්ධිය යමෙකුටද ගේ ජලිතිද්ධිනම්. පධන්හි පටා පිළියෙමින් අවුජ් ඉධපාධමුන් රහත් ඵල සමග කෙලපත් බැවින්, ප්‍රධාන වීර්‍ය්‍යයෙහි පටත් දිලිසෙමින් අවුත් සතර ඍද්ධිපාද ධර්මයන් හා අරහත්ඵල සමග කෙළවරට පැමිණි බැවින් (පධාන-පඩන-පඩන්) (පට්ඨාය-පටය-පටය්-පටා) සමාමිහි, සමාගමයෙහි; (සමාගම-සමහම-සමාම-සමාමි) කියූහයත්, කිවාහුදයි කියතොත්; සවාප සම්පත්ති, සවාර්ථයට පැමිණීම; පරාර්ථප්‍රතිපත්ති,

පරාර්ථය සිදුකිරීම; ප්‍රණාමාරහ, ප්‍රණාමයට සුදුසු; "තස්සපාදෙන-මස්සිත්වා සම්බුද්ධස්ස සිරිමතො, ශ්‍රීමත්වූ ඒ සම්බුදුන්ගේ පාදයන් වැද. එහු, ඔහුගේ; සඟුලුවන්, දෙක; උපභෝග, කම්; භුම්ඹ, සපතම්; භුභුජ්, භූතද; භුම්හගෙම, තමා විසින්ම; ජනුවහ, දත්තහුගේ, "බුජ්ඣිතා සච්චානීති බුද්ධො" චතුරාර්‍ය්‍යසත්‍යයන් අවබොධ කරන ලද්දේනුයි බුද්ධ නම් වෙයි. මුළුලෝදන්වූවහ. සමස්ත ලෝකයා ලවා දැන්වූවහුගේ; "බොධෙතා පජායාති බුද්ධො," ප්‍රජාවට ධර්මය අවබොධ කරන තැනැත්තේ බුද්ධ නම් වෙයි. සබනැණින්, සර්වඥය ඥානයෙන්; මුළුනේ, දතයුතු සියල්ල (ඤෙය්‍ය-ඤෙය නෙය-නෙය්-නේ)

"සබ්බං අභිඤ්ඤාසි යදත්ථි ඤෙය්‍යං
තථාගතො තෙන සමන්තචක්ඛු"

සර්වඥයන් වහන්සේ වනාහි දතයුතුයමක් ඇත්ද (සංස්කාර විකාර ලක්ෂණ නිර්වාණ ප්‍රඥප්ති) ඒ සියල්ල දත්සේක. එහෙයින් සමන්තචක්ඛු නම වෙති. සැපත් සතර සම්පත්තිය සතරෙක් වෙයි.

එනම්;-නුවණ, ප්‍රසන්නතාව, ආනුභාව, රූපය යන මොවුහු යි. අනුහවුරුස් යනු "අනුහවු රුසුවයි වියයුතුය. "සිරීඑතස්ස අත්ථිසිරිමා, තස්සසිරිමතො" මොහුට සැපත් ඇත්තේනුයි සිරිමා නම්. ඒ සිරිමන්ත ශබ්දය සිව්වන විබත්ගත්විට සිරිමතො යි සිරී, ගථා+අනුරක්ඛන, ගාථාවගේ ඡන්දස රැකීම; දිගි (දිඝ+ඉ) දිඝීවිය. "සධම්මං චස්ස පූජෙත්වා" ඒ බුදුන්ගේ සද්ධර්මයද පුදා; සවඤ්ඤුතුසබ්ද, සර්වඥයන් වහන්සේ හා සම්බන්ධ හෙවත් සර්වඥයන් වහන්සේගේ; නිමිත්ත නෛමිත්තික සම්බන්ධයෙහි, නිමිත්ත නෛමිත්තික දෙදෙනාගේ සම්බන්ධයෙහි; බුද්ධත්වය, සද්ධර්මය නිමිති (කරුණු) කොට ලබාගත් හෙයින් මෙහි නිමිත්ත නම් සද්ධර්මයයි. ඒ සද්ධර්ම සඞ්ඛ්‍යාත නිමිත්තෙන් ඇතිවූ ඵලය. සර්වඥයන් වහන්සේ හෙයින් උන්වහන්සේ නෛමිත්තික (නිමිත්තනිසා ඇතිවූ ඵලය) වෙති. සච්චිකිරියෙයන්, අවබොධ කිරීමෙන්; එවුහට (එහු+හට) උන්වහන්සේට; බුද්ධභාව හෙතුත්ව ලක්ෂණ ගුණ, බුදුබවට හේතුබව ලක්ෂණ කොට ඇති ගුණ; "කත්වාසඞ්ඝස්සචඤ්ජලිං" සඞ්ඝයාටද වැඳ; ඇරැ අධ්‍යාහාරකොට; (ආහරිත්වා-ඇරැය-ඇරැ) සවු, ශ්‍රාවක-අසන, (සාවක-සවු උරෙසිද (උරෙහිද) දැවු; උරෙජන ශබ්දයෙන් කිය වෙනුවෙර් ජාතක දරුවෝය. එහෙත් බුද්ධශ්‍රාවකයන්ටද ඒ නම ඉබහෙවින් යොදා තිබේ. සමානාර්ථය සලකා වියහැකිය,

(ආගත-අගත-අයය-අය්-ආ) සීලදිට්ඨිසාමඤ්ඤෙන සංඝටි-තතා සඞ්ඝො" ශීලය දෘෂ්ටිය ශ්‍රමණ ඵලය යන මෙයින් සම්බන්ධ වූ හෙයින් සඞ්ඝ නම් වන්නේය. සෙඛජ හොතුජ්, සෙඛද (ත්‍රිවිධ ශික්ෂායෙහි හැසිරෙන්නන්) වුවත්; තථා භාවයට, ආයතීපුද්ගල භාවයට; වියක්ඛ්‍යනටට්, ව්‍යාඛ්‍යාන (අටුවා) කරනු කැමති (ව්‍යාඛ්‍යා-වියක්ඛ්‍ය) ඉන්දගොපක, වැසිකාලයෙහි ඇතිවන ගැඩවුලන් මෙන් රත්පාට කුඩා පණු විශෙෂය කැයි සලකනු ලැබේ. සෙවු, දක්ෂවූ; (ජේක-සෙවු) කුසල්කම් පථධම් කුශලපථ සඞ්ඛ්‍යාත ධර්මය; ඉටානිටු විවාට කරුණු, ඉෂ්ට නිෂ්ට විපාකයට හේතු; (විපාක-විවග-විවා) (විවා + අට විවාට) සපන්, පැමිණි; "සද්ධම්මො එවපදං සද්ධම්මපදං සම්පන්න සද්ධම්මපදං සෙනා සො සම්පන්න සද්ධම්මපාදෙ" සදම් නැමැති පිහිටසදම්පද නම්. යමෙක් සදහම් පිහිටට පැමිණියේද එතෙමේ සම්පන්න සද්ධම්මපද නම්. නව ලොවුතුරාධම්, සිව්මග සිව්ඵලය නිවන යන මොවුනු නව ලොවුතුරා ධම් නම්හ. සසරැහි නොහිය දෙනුව පිටහිවන බැවින්, සංසාරයෙහි වැටෙන්නට නොදී පිහිට වන හෙයින්, (හිය නොදෙනුව-නොහියදෙනුව) එසපත් බැවින් ඒ සදම් නැමැති ප්‍රතිෂ්ඨාවට පැමිණි බැවින්, එට කරුණු, ඒ දෙශනාවට හෙතුවූ, "යානත්තාය බුද්ධන විනෙයජනං සාසතීති සත්ථා" බුද්ධ පච්චෙක බුද්ධ අරහත් යන යාත්‍රත්‍රයයෙන් විනෙය ජනයාට අනුශාසනාකෙරේනුයි සත්ථු නම්වන්නේය. (ධම්මපද-ධම්පිය-ධම්පියා) "ඉධ භික්ඛවෙ භික්ඛු ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං" මහණෙනි මේ ශාසනයෙහි භික්ෂුව සූත්‍රගෙය්‍ය යන ධර්මය හදාරයිද; සන්තිපදං, නිවන් පිහිට; කායසනත්ථ ධම්මපද අපිලාපනති, එහිදී ඔහුට ධම්කොටස් කියත්. ධම්මොච සො පදං චාති ධම්මපදං" ධර්මයත් පිහිටත් දෙකම එකක්මනුයි ධම්මපද නම්. ධම්ජුහෙ මෙවයි. පෙල අපින්, කොටස් අර්ථයෙන් ධර්මයද එයම වෙයි. පියෙ හෙමෙමවෙයි පිහිට අපින් හා කොටස් අපින්, ප්‍රතිෂ්ඨාර්ථයෙන් හා කොටස් අර්ථයෙන් පදයත් එයම වේනුයි ධම්මපදං යනු වේ.

පිහිට අටනම් ගතුවගු දුගී හා සසර නොහිස දෙන අට, ප්‍රතිෂ්ඨාර්ථය 'නම් ගත් තැනැත්තනු දුර්ගතියෙහි වැටෙන්නට නොදීම් අර්ථය වේ. සතර සිය දෙව්සිගයෙක් දහමෙ, සාරසිය දෙව්සිගථාවක් පමණ ධර්මය තෙමේ; සොබවන, ශුභවූවක් වන; සොභතීති සුභං, හෙබේනුයි සුහනම්,(විධමෙත්වා-විධමය-විධමය්-විධමා) දුරුකොට; උත්තානපදබ්‍යඤ්ජන, පැහැදිලිපද හා වාක්‍ය; ව්‍යඤ්ජන ශබ්දය අකුරුමෙන්ම වාක්‍ය යනුද කියයි. ශ්‍රැතිරම්‍යව

කණව මිහිරිව; විමර්දක්‍ෂම, අර්ථය සාරාබැලීම් වශයෙන් මිරිකීමට සුදුසු; "කිරති කිණාති සංගරාතීති කරුණා" පරහට පත් දුක්දුරලයි එව නහයි එව් පරහටදික සාධූන් කපවයි එව් කරුණා නම්, යනු කිරති යනාදී වාක්‍යයෙහි අර්ථය වේ.

නහසිඊව, නසයි හෝ වේද; පරහට දික සාධූන් කපවයි එව්, අනුන්ට (පත්) දුක සාධූන් කම්පාකරවයි හෝ; කරුණාය ආවෙගො පරදුක්ඛ දස්සනෙ තුරිතතා කරුණා වෙගො, කරුණාය, කරුණාවගේ; ආවෙගො, සේයි; පරදුක්ඛ දස්සනෙ තුරිතතා, අනුන්ගේ දුක දැකීමෙහි ඉක්මන්කම; කරුණා වෙගො, කරුණාවෙග නම්. "යෙන සමුස්සාහිතං මානසං යස්සසො කරුණාවෙග සමුස්සාහිත මානසො" ඒ කරුණාවෙග යෙන් උත්සාහවත් කරවන ලද සිත් ඇත්තේ යමෙකුටද හේ සමුස්සාහිත මානස නම් වේ. දුනුදිය වෙගෙනන්දුවන කඩ සෙයින්, දුනුදියෙහි වේගයෙන් දුවන හීයසේ; (වෙග-වෙය-වෙය්-වෙ) (වෙ+තෙන්) කුළුණු වෙගෙනන් සෙත්විහර විහිජ දෙසුන් සඳණපිට දුවන හෙයින්, කරුණාවේගයෙන් සත්ත්ව විහාරයෙහි (සත්ත්ව ලොකයෙහි) විහිදී දේශනා ඥානය මතුපිට දුවන හෙයින් එකංශාර්ථ, ඒකාන්තාර්ථයෙහි; එකායනාය කරුණාය සමුස්සාහිතමානසො, එකම ප්‍රතිපත්ති සඞ්ඛ්‍යාත මාර්ගයවූ කරුණායෙන් උත්සාහවත් කරවනලද සිත් ඇති; සුපණ්, ගුරුළු; අධිගමාරහයන් (අධිගම + අරහයන්) අධිගමයට සුදුස්සන්; "දිබ්බන්තීතිදෙවා" ක්‍රීඩා කෙරෙත්නුයි දෙවියෝ නම් හ. මනස්ස උස්සන්නතාය මනුස්සා, සිත නොහොත් බුද්ධිය උසස් හෙයින් මනුෂ්‍යයෝ නම් වෙත්. දෙවාච මනුස්සාච දෙවියෝද මිනිස්සුද දෙවමනුස්සා නම් වෙති. තෙසං දෙවමනුස්සානං, දෙවමනුස්ස ශබ්දය සම්බන්ධ විභක්තිගත්විට දෙවමනුස්සානංයී සිටී. දෙසෙසි යනුව හයිද්, දෙසෙසි යන ක්‍රියාපදය සමගද; යනු ශබ්දය නම්විබත් ගත්විට යනුව යී සිටියි (සඞං-හයි). සබඳි, සම්බන්ධවෙයි. පීතිචපාමොජ්ජංච පීතිපාමොජ්ජං තංවඩ්ඪතීති පීතිපාමොජ්ජවඩ්ඪනං, මුහුකල ප්‍රීතියද නොමුහුකළ ප්‍රීතියද පීතිපාමොජ්ජ නම් ද එය වඩනය කෙරේනුයි පීති පාමොජ්ජවඩ්ඪන නම්ද වෙයි. හුණුලා කල්කිලිල් නම්වන සෙයින්, උණගස් බාලකාලයෙහි කිලිල් (ගෙබ්බඩ) වත්නාසේ; (කලීර-කලිල-කිලිල්) මිහිකැරුණු, මේරූ කල්හි; අල්පාචීතර බැවින්, ස්වල්ප ස්වර ඇති බැවින්, වන්ද සමාසයෙහි අල්පස්වර ඇතිපදය මුලට යෙදිය යුතුය යනු නීතියි.

පැවුහු, ප්‍රකාශ කළහ; පැහැ ප්‍රකාශකොට; අවිඤ්ඤූපපත්ති, කාරණය; තස්සහ චරිත, ඒ අවිඤ්ඤූපපත්තිය හා යෙදුන; පිළිවෙ වහණේ, ධර්මාවබොධය ඇතිකරනයේ; (පටිවෙධ, පිළිවෙය-

පිළිවෙය්-පිළිවේ) ගුණාඛ්‍යාණයෙන්, ගුණකීමේන්; කාරුණ්‍යප්‍රාප්ත යේ, කරුණාව උපන්සේ හෙවත් කරුණාව වෘඩි ප්‍රාප්තසේ; සෙද, සෙදක; කිමෙසින්, කෙසේ, සපියුතු, යුක්ත; (සම්පයුත්ත-සපියුතු) යුව, කී කල්හි; බුදුසැලි, බුඩකාලික; ඇත්තෙනා, ඇත්තේ නොවේද, ඒඇත්, එය ඇති කල්හි; යනුවනට කියන්නන්ට; (හේතු-හෙයු-හෙය-හෙය්-හේ) පරම්පරාභතා තස්ස නිපුණා අත්ථවණ්ණනා" පරපුරෙන් ගෙනන ලද ඒ ධම්ම පදයාගේ සියුම්වූ අර්ථ වණ්ණනාව; තුනුවන ධම්සඟා පවා, තුන්වන ධම්සංගායනාව දක්වා; පවා, පව පැවුම්හි දයින් නිපන් පෙර කිරියයි. පව ධාතුව පැවුහ යනාදී තන්හි පෙනේ. (පකාස පවස-පවහ-පව) අරනලදීය, ගෙන එන ලද්දී; ධම්පියාටු යනු ඒ ධම්පියවු යි යොදුගත යුතුයි ඒ ධම්මපදයාගේ යනු අර්ථයි. (ධම්පියනු-ධම්පියවු) සේවිය, ජේක (සියුම්) විය; (ජේක-සෙය සෙය්-සේ) (අට්ඨකථා-අටුවය-අටුවය්-අටුවා) "අමෙත්ථාවණ්ණ-ගති එනායාති අත්ථවණ්ණා" නාමේ කරණකොටගෙන අර්ථය වණ්ණනා කරනු ලැබේනුයි අත්ථවණ්ණනා නම්.

(තම්බ පණ්ණි-තබපණී-තඹපණී-තඹණී-තඹෙණී-තඹෙණ්-තඹෙන්) සමහරවිට හෙළුයෙහි මධ්‍ය ප හට ලොප්වෙයි. මීපුප්-මීප්, හස්පුප්-හසුප් යනාදිය නිදසුනි. තම්!දිවැ තම් දී (දත්වා-දීයැ-දිවැ) හැත්නට නොකල්!නත්හය් මිතුරුද් ඇත හොතුප් කාල්තතක් හා මතුරක් ඇති බැවින් එසින් නම් දිවු මුළුලු වෙණෑහය් මතුරැ" (15 සාමාවතියා වත්60පිට) සල්පිකින් නම්දිවු උසන්හිය (194 සුභද්ද පරිබ්බාජ්ජා තසසවත්ථු 218 පිට) යනාදිය පරීක්ෂාකර බැලීමද මැනවි. (තාම දීපක-තම්දිවු) තාම්බපණ්ණිච යොදීපොවාති තාම්බපණ්ණි දීපො" තම්බණ්ණිවූයේත් එයමය විපය වූයේත් එයමනුයි තම්බ පණ්ණිදීප නම්. (සමුද්ද-සමුද-මුහුද-මුහුද්) කිදෙව, කුමකට-කුමක් හෙයින්; (කිදි + අට-කිදට, කිදෙට) කිදි යනු කිනයි නිපාතයෙන් ආ හැකිය. බත්ධ ශබ්දයෙන් කිදු,සි ආසැපි සලකනු මෙළහ, සිංහලයෝය. සිදනෙහි නැතත් ප්‍රථමා බහු අර්ථයෙහි "හ" විබතක් හෙළුයෙහි ලැබේ. කරනුවහ (48) වැටයුතුවහ (219) යනාදිය නිදසුනි. කිමෙසනි, කොයි අයුමරන්, කිසේ ශබ්දය කරණ විබත් ගත්නැති. මේ අර්ථයෙහිම යෙදුන මෙකමෙසනි, ශබ්දයක් පැරැණි බංගලි භාෂායෙහි පෙනේ.

---

4 උදම්හයාගේ පුළියම්කුලම් පියද බලනු" නම්දී කැරැ

ඇ. ශෙ. 1-185

**සීහබාහු රජ සීහකුමරා,** සිංහබාහු රජුගේ සිංහ කුමාරයා **"සීහංලූනවාඉති සීහළො"** සිංහයා විනාශ කෙළේනු යි සිහළ නම්. **වැටෙමින්, පැවැතෙමින්;** **බුදුකැලිඅටුවා** බුද්ධකාලික අටුවා; **මෙය කුමක්දැයි සෙවිය** යුතුය. බුද්ධකාලයෙහිත් දේශනාගත ගැඹුරු වචන හා නොපැහැදිලි අදහස් විස්තරකළ අටුවා ක්‍රමයක් තිබෙන්නට ඇත. සර්වඥයන් වහන්සේගේ ප්‍රකීර්ණක ධර්මදේශනාව බුදුකැලි අටුවායයි සමහරු සලකති. එසේ නම් එය දැනට පෙළවම ඇතුළත්ව තිබෙන බව කිය යුතුය. මේ කියන අටුවාව **එය නොවේ. නොසාහා,** සිදුනොකෙරෙයි. (සාධෙති-සාහයි-සාහා) **නොසූවනට, සෙස්සන්ට;** සහට තවනු හෙළුයෙහි සිරිති. **යේවා-තේවා** යනාදිය නිදසුනි. දෙමළ ඇසුරෙන් සිදුවීයයි සිතේ. **දීපනනර, අනෙක් විපයන්,** (හිත=හිය) **සුබකාරණ,** සුවයට හේතුව; **උවසපුව,** උපාය සම්පත්තිය (උපාය-උවය-උව) (සම්පද-සපුව-සපු) **හිතංවතංසම්පදං** වෙති හිත සම්පදං හිතවූ යේත් එයමය සැපතවූ යෙත් එයමනුයි හිතසම්පද නම්. **මැනවි නම්නො,** මැනවි (මනොඥ) නම් නොවේද. **ආශංසාර්ථයෙහි,** ප්‍රාර්ථනාර්ථයෙහි; **සාහැති** සිඩකරන්නේ නම් යනු අර්ථයි. (සාහනු-සාහැති) **ආශංසාර්ථයිමෙවු,** (ආංසාර්ථහිමෙවූ) ප්‍රාර්ථනාර්ථයෙහි ම වූ. **ක්‍රියාපදජ** යනු කර්තෘයි. කර්තෘ "ක්‍රියාජ" යී සිටියා නම් වූ යනු නිවැරැදිය. පදශබ්දය සමග යෙදුන හෙයින් ක්‍රියාව "වී"යි සිටිය යුතු වුවද මෙසේ සිටිනුත් සිරිති. (යථ පැවැසි සිත්මෙවූ 10 පිටුව) හිතව, මෙහි ව්‍යාකරණද විමසිය යුතුය. හිතය යනුම හිතව වීදැයි නොදනිමු. **මදව** (14 පිට) යනුත් මෙබන්දෙකි. **ඉස්නහු විසින්,** කැමැතිවන්නහු විසින්, (ඉච්ඡන-ඉචන-ඉසන-ඉස්න) **දුනු,** දිනන ලද; **සලේ පිළිවුවහි,** සල්ලේඛ ප්‍රතිපදායෙහි; කෙලෙස්ලියා හරින ප්‍රතිපදාව සල්ලෙඛ ප්‍රතිපදා නම්. **දෞශ්ශිල්‍යමල,** දුශ්ශීල භාව නැමැති මලකඩ; **සමන,** සිංසිඳුවන; **සමංචරති සමෙචරන්නී සමචාරී,** සමුච්ඡේදක සල්ලේඛ ප්‍රතිපදායෙහි හැසිරේනුයි සමචාරී නම්. **සමං** යනු චරධාතුයොගයෙහි ආධාරාර්ථයෙහි නම් විබත්. **"පිරශෙශාගණනාපෙරා"** සපිරශිලාදී ගුණයන් හා යෙදුන හෙයින් පෙර නම්. **හානභාගිනි නොවන,** පිරිහීම් කොටසෙහි නොවන; **විවට පැකිඩම්හි පිහිපිසිත්,** විවට්ට (නිවන්) පක්ෂයෙහිවූ: ධර්මයෙහි පිහිටිසිත්, (පතිට්ඨිත-පිහිටිය-පිහිටි) **පිරශෙවතො යසසතො පිරශෙවතො"** සපිරසිත යමෙකුවද යේ පිරවෙත නම්

**අධිගම සද්ධර්මයට**, සිව්මග සිව්ඵල නිවන් යන මේවාට; ආගම සද්ධර්මයා, ත්‍රිපිටක ධර්මයාගේ; **සද්ධම්මස්සඨිති සද්ධම්මට්ඨිති තං කාමෝ, සද්ධම්මට්ඨිතිකාමෝ තේන සද්ධම්මට්ඨිතිකාමේන**, සද්ධර්මයාගේ පැවැත්ම සද්ධම්මට්ඨිති නම් ද එය කැමැතිවන්නා සද්ධම්මට්ඨිතිකාම නම් ද වන්නේය. සද්ධම්මට්ඨිතිකාම ශබ්දය තෙවන විබත්ගත්විට සද්ධම්මට්ඨිතිකාමේන යි සිටී. සද්ධම්මට්ඨිතිය කැමැතිවන්නා විසින් යන්නු අර්ථය. **සභාව නිරුත්තින්**, පෙළබසින්; **පිළිපජ්ජනවුන් බොහෝ ජනාවන බැවින්**, පිළිපදින්නන් බොහෝ දෙනෙකුන් වන හෙයින්; **ආගමධම් සිටි හැඟියනු විසින්**, ආගම ධර්මයාගේ සන්තිය බලාපොරොත්තු වන්නනු, විසින්; (සන්ති-සිති-සිටි) **ඇදුරුව**, ආදර ඇතිව; **යජනලද්දෙම්**, යාච්ඤාකරනු ලැබූ-මම;(යාචන-යජන)**අජ්ඣේසණ**, බුහුමන් පෙරටු ආරාධනය; **තදත්ථ**, ඒ ආරාධනාවගේ කාර්‍ය; **තදභිප්‍රාය** ඒ ආරාධකයාගේ අදහස; **තත්සමුට්ඨාන**, ඒ අදහස ඇතිවීම හෙවත් නැගීම; **සමුපගත වන්නාන්**, සමුපගතය වනුවන්; **කරන ප්‍රකාර**, අටුවාව කරන හැටි; **තංභාසං** ඒ සිංහල භාෂාව යනු අර්ථයි. **තස්සාභාසා, තම්භාසා**, ඒ සිංහල අටුවාවගේ භාෂාව; **වචන සන්නිවේසො** වචනයන් පිහිටුවීම හෙවත් රචනා කිරීම; **නිදුටු** (නිද්දිට්ඨ) **දක්වන ලද**; **අරවා**, ආරෝපනය කොට-නඟා; **විපරිණාම**, වෙනස්; **අර්ථශරීර**, අර්ථ සංඛ්‍යාත ශරීරය; අර්ථයම අර්ථශරීර නම්. **අරුත්විසජ්ජයි**, අර්ථය ප්‍රකාශ කෙරේනුයි, අර්ථව්‍යඤ්ජනය නම් අර්ථ ප්‍රකාශයයි, **"පජ්ජති අනෙන අත්ථොති පදං"** මෙයින් අර්ථය දන්නා ලැබේනුයි පදනම්. **බ්‍යඤ්ජනසච්ඡාය**, බ්‍යඤ්ජන හය; අක්ඛරපද ව්‍යඤ්ජන යන තන්හි ව්‍යඤ්ජන ශබ්දයෙන් වාක්‍යය අදහස් කරන ලදී. **ආකාර**, පදවිභාගය; **නිරුත්ති**, ප්‍රකෘති ප්‍රත්‍යයන්ට අනුව පදයක අර්ථය සෙවීමේදී යොදනු ලබන විග්‍රහ වාක්‍යය, **නිද්දෙස**, නිර්වචන (විග්‍රහ) ය පිළිබඳ විස්තරය; ඉහත **දැක්වූ පද ආකාර දෙදෙනාගේ වෙනසනම්**:- පදවශයෙන් විභාග නො කල වාක්‍යයක අවයවය පදවශයෙනුත්-පදවශයෙන් විභාගකල වාක්‍යයක අවයවය ආකාර වශයෙනුත් සැලකිමයයි කියති. **සංකාසන**, සැකෙවින් දැක්වීම; **පකාසන**, පලමුකොට දැක්වීම; **විවරණ**, විස්තර කොට දැක්වීම; **විභජන**, විභාගකොට දැක්වීම; **උත්තානීකම්ම**, අර්ථය උඩුකුරුකොට හෙවත් පැහැදිලි කොට දැක්වීම; **පඤ්ඤත්ති** සර්වප්‍රකාරයෙන් දැක්වීම; **විස්තර නොතත් ප්‍රකරණයෙයි** එයි.

**අජ්ඣාහාර**, පදඌන දැක්වීම; **වෙවචන**, සමානාර්ථ ඇති වචන; **ප්‍රත්‍යයාපදීපන** ප්‍රත්‍යයන්ගේ කාරකාදී අර්ථයන් දැක්වීම; **අනවශෙෂ**, ඉතිරිනැති; **නොහැවූපදමනු**, ප්‍රකාශ නොකළපද

පමණක්; උපයෝග, කම්විභත්ති; එමේ, ඒ අර්ථ වණ්ණනාවම්; එමෙකියුව හෙළුයෙන් කියුවා යනුවනට කියති, එමෙකියුව, එම අර්ථවණ්ණනාවම කියුවහොත් හෙළුයෙන් කියූහයි කියන්නහු සඳහා කියති. අපරෙනා තමෙව න සද්දෙනා, අර්ථ වශයෙන් එය හෙවත් හෙළු අට්ටුවාහි කී අර්ථයමැයි. ශබ්දයෙන් (සිංහල) නොවේ, සද්දෙනා පනභාසන්තරෙනභාසිස්සං, ශබ්දයෙන් වනාහි අනෙක් භාෂායෙකින් කියන්නෙමි. අන්බස නම් පෙළබසය. පැරණි සිංහල අටුවායෙහිත් මේ පාළියට නැගූ අටුවායෙහිත් වෙනස ශබ්දයෙන් මුත් අර්ථයෙන් නොවන බව මෙයින් කියන ලදී. ප්‍රත්‍යවස්ථාව; වෙනස් අවස්ථාව.

පවසනුවන් සිතට, ප්‍රකාශ කරන්නන්ගේ සිතට; අත්‍ථං විභාවයන්ති පකාසෙන්තීති විභාවිනො, අර්ථය ප්‍රකාශ කෙරෙත්නුයි විභාවීහු නම් වෙති. සුකතං දුක්කතං විභාවෙන්ති ජානන්ති විභාවිනො, සුකෘත දුෂ්කෘත (හොඳ නොහොඳ) දනිත්නු යි. විභාවීහුවෙත්. තෙසංමනසො, ඔවුන්ගේ සිතට; කෙලෙහි නාමනාජන්නවුන් සිතට, කලදෙයෙහි හොඳනොහොඳ දන්නවුන්ගේ සිතට; මෙහි පෙනෙන (නාමතම්) යනුව නාමනා යී සිබවලද විතියෙහි පෙනේ. දැන් නොමනා යි ව්‍යවහාරයට ගොස් තිබෙන්නේත් අර්ථය වශයෙන් ඉතාසුළු වෙනස් කමක් ඇතත් මේ "නාමනා" ශබ්දයමැයි, ඇසුරුකළවූ, ඇසුරුකරන ලද යනු අර්ථයි. ඇසුරුකලවූයි, වූයේ ඇසුරුකලහු යන කම්විබතයි. අරියතිඤායතීති අත්‍ථො, අරියති, යේයි ඤායතීති දනීනුයි. අත්‍ථො, අත්‍ථ නම් වේ. සොදෙරිජවන් අනුසරින් පැවැති මනදෙරිජවන් විඤ්ඤාණින් ජනන ලැබෙයි අරුත් නම්, සොතද්වාරික ජවනානු සාරයෙන් පැවැති, මනොද්වාරික ජවන විඤ්ඤාණයෙන් දන්නා ලැබේනු යි අර්ථ නම් වේ. ශබ්ද ශ්‍රවණයට ඉක්බිතිව ඇතිවන ආවජ්ජනාදී චිත්තයන්ට අනතුරුව උපදනා ජවන චිත්තයෝ සොතවාරික ජවනයෝය. ඔවුන් අනුව යැමෙන් මනොවාරික විඤ්ඤාණය පහළවන්නේය. ඒ මනොවාරික විඤ්ඤාණයෙන් හඳුනාගනු ලබනුයේ අර්ථ නම් වෙයි. (වාරික-දෙරිය-දෙරි) "අත්‍ථොච ධම්මොච අත්‍ථධම්මා, තෙ උපනිස්සයිතීති අත්‍ථධම්මූපනිස්සිතං" අර්ථයද ධර්මයද අත්‍ථධම්ම නම්ද ඔවුන් ඇසුරු කරනු ලැබෙත්නුයි අත්‍ථධම්මූපනිස්සිත නම් ද වන්නේය. පඤ්ච, පසෙකි; (පංචක-පසක-පසු) එකූ, එකෙකි; ගා, ගාථාව (ගාථා-ගය-ගය්-ගා) පරිසමාපනෙ, අවසානාර්ථයෙහි කථභාසිතානි පූජ්ජා, කොහිදී දෙසන ලද්දීද යනු විචාරණයයි.

පරිහාරො, පිළිතුරුයි. භාසිතාතිපදං ආනෙත්වා යොජෙතබ්බං, භාසිතා යන පදය අධ්‍යාහාරකොට යෙදිය යුතුයි. නෙළච්චක්ඛුං එකං ථෙරං, තැසුණු ඇස් ඇති එක් තෙරනමක් සොහි එළිත චක්ඛුත්තා එළිත සද්දස්ස පරනිපාතො චක්ඛු එළිතොතිවා වත්තබ්බෙ එකාරස්ස පකාරං අකාරස්සදීඝත්තං තකාරස්සලොපං ඉකාරස්ස අකාරං කත්වා නිරුත්තිනයෙන චක්ඛු පාලොතිවුත්තො. උන්වහන්සේ එළිත (පැලුණු) ඇස් ඇති බැවින් එළිත චක්ඛුකියා හෝ එළිත ශබ්දය පරනිපාතකොට චක්ඛුඑළිත කීයා හෝ කියයුතු කල්හි එහට පකාරාදෙශද අහට දීඝද තහට ලොප්ද ඉහට අකාරද කොට නිරුක්ති ක්‍රමයෙන් චක්ඛුපාලයයි කියන ලදී. පුදුම නිරුක්ති ක්‍රමයෙකි, පාල නාමය එළිත ශබ්දයෙන් සෑදුනේ යයි සපිර කරන්නටගත් නුසුදුසු උත්සාහය මෙ පෙරළියට හේතුවිය. අනුසාවාපෙති, අනුශ්‍රව (ආරංචි) අර්ථයෙහි; "කුටුම්බං වුච්චති සාපතෙය්‍යං තං යස්ස අත්ථි සො කුටුම්බිකො" සැපතට කුටුම්බ යන් කියනු ලැබේ. ඒ සැපත යමෙකුට ඇත්තේද හේ කුටුම්බික නමි.

"සපති" යනු ධනස්වාමියාට නමෙකි. ආධිපච්ච පරිවාරාදි වසෙන අඩ්ඪො, අධිපතිබව පරිවාරය යන මොවුන් ගේ වශයෙන් ආඪ්‍යය. සබ්බ සාපතෙය්‍යවසෙන සියලු සම්පත්තින්ගේ වශයෙන් නිඛණිත්වා ඨපිතධනානං වසෙන, නිධන්කොට තබන ලද ධනයන්ගේ වශයෙන්, තිරියං සසියා අජ්ඣිතං, රිටෙහි සරසට පිහිටුවන ලද්ද (පතාකය) ගබ්භපරිපාලන විධානං මඞ්ගලාදීනං වා, ගැබෙහි ආරක්ෂාව පිණිස කළයුතු කෘත්‍ය සංවිධානය, මඞ්ගලාදි හෝ වෙයි. සොත්ථිලද්ධසෙට්ඨිච්ඡත්තතාය සෙට්ඨිතිවුච්චති, හේ වනාගී ලබන ලද සිටු ජේසත ඇති බැවින් සිටුවරයා යයි කියනු ලැබේ. ගෙදලින්, ගෘහ බන්ධනයෙන් ගෘහ කටයුතු වලින්; "දුක්ඛං පරිඤ්ඤෙය්‍යං පරිඤ්ඤාතං" දනගත යුතු දුක දැනගන්නා ලදී. සමුදයො පහාතබ්බො පහීණො, දුරු කළ යුතු තෘෂ්ණාව දුරුකරන ලදී. "නිරොධො සච්ඡිකාතබ්බො සච්ඡිකතො" අවබොධ කටයුතු නිරොධය (නිවන)අවබොධකරන ලදී. "මග්ගො භාවෙතබ්බො භාවිතො" වැඩියයුතු මග වඩනාලදී, (ආකාර-අයර-ආර) පිළිවෙළ; අනුපුබ්බෙන, පිළිවෙළින්; බාරාණසිතො කප්පාසිකවනසණ්ඩං......බරණැසින් කැප්පිටියා වනලැහැබ වද එයින් උරුවෙලාවටද එයින් රජගහාවටද එයින් කපිල පුරයටද එයින් සිතවනයටද යි, ඉමිනා අනුක්කමෙන ආගතත්තා, මේ පිළිවෙළින් ආහෙයින්; විහාරම්භ විහාර

පූජාව; විසජ්නලද, විසඳම් කරන ලද; ඈද, ආදියද; නිබද්ධවාස නිබඳවාසය; දහරසාමණේරා, ළදරු සාමණේරයෝ; සප්පි නවනීත තෙලමධුඵාණිත, ගිතෙල් වෙඬරු තලතෙල් ආදී තෙල් වර්ග මී පැණි උක්සකුරු.

සාලූක, කුද්‍රසිකසන්නාදියෙහි ඕලුයයි කියාතිබේ. සංස්කෘත යෙහි නෙලුම්අලවාචක සාලූක ශබ්දයෙක් එයි. ළපටි නෙලුම් අලම්රිකාගත්විට ද රසවත් පානයෙක් වන්නේය. භාරතීයයන් ග්‍රීෂ්මකාලයෙහි එය පානය කළබවද ග්‍රන්ථාන්තරයෙහි පෙනේ. චොච ඇටකෙහෙල්, මොච, මස් කෙහෙල් අම්බ, අඹ; ජම්බු,දඹ; ඵාරූස, බොරළුදමනු; නෙසං යනු 'නෙ'යි වියයුතුය; එකමෙකං කොට, එකක් ඉතිරිකොට; යථා පැවැසි සිත්මෙවූ, චිත්තානුකූල පරිදි යනු අර්ථයි. සිත යම්සේ පැවැත්තේද එසේ (පවත්තිත-පැවැතිය-පැවැති-පැවැසි) පඤ්හබ්‍යාකරණ, ප්‍රශ්න විසඳීම; කිලමන්වඨාන, ක්ලාන්තයටහේතු; තංකථන්ති අපෙඨා, ඒ කෙසේද යන අර්ථයි; වත්කාම්, වස්තුකාම, සිත අලවන පස්කම් සැප; කෙලෙස්කම්, විසම ලොභාදිය; අවෙන්වා ආදීනව; (ආදීනව-අදෙකව-අවෙනව-අවෙන්වා)

"පබ්බජ්ජාපඨමං ඣානංනිබ්බාණඤ්ච විපස්සනා
සබ්බෙපි කුසලාධම්මා නෙක්ඛම්මන්ති පවුච්චරෙ"

පැවිද්ද, ප්‍රථමධ්‍යානය, නිර්වාණය, විදර්ශනාව, යන සියලුම කුසල ධර්මයෝ නෙක්ඛම්මයයි කියනු ලැබෙත්. එක්මෙඅර්කියා, සණ්හසුඛුම යන දෙශබ්දයම එකම අර්ථයක් කියයි. ගැනා, මෙය (ගණ්හිත්වා) යන පෙර කිරියෙන් ආයේය. ගෙන යනු අර්ථයි. පසුව නිපාතයක් බවට පැමිණියේය. තදඟ විඛම්භන් සුමුසෙ පහන්; පහන් යනුව තදඟ විඛම්භන් සුමුසේ යන තෙපදය සමගම සම්බන්ධ කටයුතුය. කුශලාඞ්ගයකින් අකුශලාඞ්ගයක් පහකිරීම, තදඞ්ගප්පහානයනම්ද ධ්‍යානබලයෙන් කෙලෙසුන් ඔබා ගැනීම වික්ඛම්භනප්පහාණ නම්ද මාර්ගයෙන් මුලුසුන්ව කෙලෙස් නැති කිරීම සමුච්ඡේදප්පහාණ නම්ද වන්නේය. (සමුච්ඡෙද-සමුසෙය-සුමුසෙය්-සුමුසේ) නාසවන්ති, කිකරු නොවෙත් වසඟනොවෙත් වුනනංති, කියන ලද්දයේ මැයි; නපටිපජ්ජන්තිති අපෙඨා, අනපය ක්‍රියායෙහි නොයෙදෙත් යන අර්ථයි. අනාසවා, (න + අසසවා) අකීකරුවෙත්; අවිධෙය්‍යාති අපෙඨා) එම අර්ථයි. පගෙව,කියනුම කවරේද; යස්සහනාපාද ජරාජජ්ජරිතා අනාසවා හොන්ති, යමෙකුගේ අනපය ජරාවෙත්. මිරිකී අකීකරු වෙත්ද; නාසවිර වචනංස්සව, ඔහු හඬද්දීම"සල්ලහුකාවුත්ති යස්සෙසා සල්ලහුකවුත්ති," සැහැල්ලු පැවැත්ම යමෙකුටද ශේ සල්ලහුකවුත්ති නම්.

"පන්තසෙනාසනානීති, දූරානං සෙනාසනානමෙතං අධිවචනං" පන්තසේනාසනය යන මෙය දුරුසෙනසුන්ට නමෙකි. "සතතස්ස භාවො සාතච්චං සාතච්චෙන ක්‍රියා සතතක්‍රියා" නිරතුරු කරන ක්‍රියාව සතතක්‍රියා වයි. භොජ්ජා, වළඳවා; (භොජෙත්වා-බොජය-බොජය්-බොජා) සඨාසුවනැන්, සුවනැත යම්සේද එබඳු තැනකට; භවජ්ජාම යනුවට නමියි. භවනෙනික්ඛමණං,|සසරින් නික්මීම; අනුච්ඡවිකං සුදුසු; සෙළෙන්,සොකරාටික කමින්; (සළ්-සළ) (සළ+එන්-සෙළෙන්) පංචසුකාම ගුණෙසු වොස්සට්ඨ සතිස්ස. පස්කම් ගුණයෙහි විහිදිගිය සිත් ඇතියා හට; වුහුටුසිත් ඇතියාහුටය, බැසගත්සිත් ඇත්තාහුටය; නොව ජනවූහට, නොවදනා (නොපැමිණෙත්තා) හව; (නොවජනහු-නොවජනවූ) අරුණස්ස උග්ගමනෙ, සූර්‍යයා උදාවූ කල්හි-උදේ; වෑහෙනුවූ, කඳුළු වැහෙන්නාවූ; එවුනෝ, වත්කරන්නෝ; සරීරෙ පවත්තමානෙ, සිරුර පවත්නාකල්හි; කරජොජාතං කරජං, කරසඞ්ඛ්‍යාත ශුක්‍ර ශ්‍රොණිතයෙන් හට ගත්තේ කරජනම්.

කිරියතෙ විප්පකිරියතෙ ඉතිකාරං, වැගිරේ නුයි කරනම්. ආසයො-ආකරෙ-උත්පත්තිස්ථානය; "අනු අමතො අපරිච්ඡිනෙනා අග්ගාසස්සසො අනමතග්ගො" නොපිරිසුන් කෙළවර ඇත්තේ යමක්හටද හේ අනමතග්ගයයි. වෑමෙන, පවත්නා; නසෙවිතො; නොසෙවන ලදී. රුස්වා, කැමැතිවච-රුචිකරච; මමයි,¦ආත්මයයි; නස්නා,නැසීම; ගමනාකාරො,යන අයුරක්; පඤ්ඤායති,පෙනේ; ඉත්ථිසද්දෙදඅයනති, මේ ස්ත්‍රී ශබ්දයකැයි; සොචෙඛො ඉත්ථියා ගීත සද්දො, හෙද ස්ත්‍රියකගේ ගීත ශබ්දයෙක් වෙයි. පැවැතිවිකි, පව්ඇත්තෙක් වූ යෙහිය; පාපමෙතස්ස අත්ථීති පාපො, මොහුට පව් ඇත්තේනුයි පාපනම්. ඝටමොළ, හැරම්ටිකොණ; උත්‍රසො තැතිගත්තේ; ඛ්‍යවසායකො, නිශ්චයාවීයෙහි;' සයකොපව නිදන්නෙම්ම වෙමි. අපරාපරං පරිවත්තනස්ස ඔබ මොබ පෙරළෙන්නාවූදමාගේ; නිදෙස්, හේතු දක්වීම; (නිද්දෙස) කිම; ජාතසංවෙගො, හටගත් සංවෙග ඇත්තේ; මෂා, මාවිසින්; සහසාකතං සාහසිකං, නොවිමසා කරනලද්ද සාහසික නම්. සාසනස්ස අනනුරූපං, ශාසනයට නොගැළපෙන; පැක්සැ, පැන ගොස්; උපෙනාහගතො, දෙඅත්; උක්ඛිපිත්වා, ඔසොවා; නපුන මනුස්සාවාසං ආගඤ්ජිති අධිප්පායො, නැවත මනුෂ්‍යාවාසයට නොආයේය යන අදහසයි. බඳුවදපත්, පොකුරුවද පත්‍ර; උණ්හංපිය ඤාණොසි, උණුවූවක් මෙන් දුත්වීය; අභිඤ්ඤා දිවඇස් නොගෙන, අභිඥ (ශ්‍රෙෂ්ඨබුද්ධි) යෙන් නිපන් දිවඇස් නොගෙන; දෙවනිකායොත්පත්තින් ලද්, දෙවනිකායෙහි !ඉපදීමෙන් ලබන

ලද; සක්‍රු එක්ම ඇස් පැණ දහස් ඇස් නම්විය, ශක්‍රයාගේ එකම්නුවණැස දහසක් ඇස්නම්විය. ජෙහයි, ශුද්ධකෙලේශය; විශුද්ධි මග්ගසන්නයෙහි "සුධොතජාතිමණිවිය"යන්නට දුහැළිකල දුමණි රුවනක් මෙන් යී අර්ථ දක්වන ලදී. (1-99 පිට) මෙහි දුහැළි යි කියන ලද්දේ සුධොතයන්න වෙනුවට ය, පාළිධොවධාතුව හෙළයෙහි දෙහ (ජොහ) යී සිටිය හැකි බව එයින් පෙනේ. දෙහ (ජොහ) ධාතුයෙහි අතීතාඛ්‍යාතය ජෙහයි, යී; සිටියාවිය හැකිය. ජෙබැලිය, පඹුඇඹුල්අස්න හුණුවීමට හේතුව බැලිය-නොහොත් තමාට පැමිණෙන විනාශය බැලීය. සූස් යනු සෙතු ශබ්දයෙන් මෙන්ම ජෙද ශබ්දයෙනුදු ආහැකිය (සේතු-සෙය-සෙය්-සේ,— ජෙද-සෙය-සෙය්-සේ) පව්මුන්ශරහනුවූයේයි, පව්ටන්ට ගහී කරන්නෙක්වූයේය; අජීවූ, ආජීවය-දිවිපැවැත්ම; පව්මුහු ගන් යට එල්බැ දෙනුගැලෙ, පව්ටා විසින් ගන්නා ලද සැරයටියෙහි එල්බ ජීවත්වීම බැහැර කෙලේය; ගැලෙ යනුයෙන් ගළිත කෙළේ. ශුවත්කෙලේ යන අර්ථය ගතයුතු. ශොරොක්කොව, හරුක කොව, (ගරුක-හරොක්-ශොරොක්) පවුම්නු සසගසිඳ, පාපමිත්‍ර සංසගීය සිඳ, අතික්කම්, ඉක්මන් කටයුත්තක්; (අත්‍යාසික- අතිසික-අතික-අතික්)

දානං සීලං භාවනා පත්තිදානං-වෙය්‍යාවච්චං දෙසනාවානුමෝදෙ
දිට්ඨුජ්ජුකත්තං සංසුතීවාපචායො-ඤෙදශො එවංපුඤ්ඤවත්ථුපප
හෙදෙ

දන් දීම සිල්රැකීම භාවනා කිරීම පින්දීම වත්පිළිවෙත්කිරීම, දහම් දෙසීම පින්අනුමෝදන් කරවීම දෘෂ්ටිය සෘජුකිරීම සංසුති (හොඳට බණ ඇසීම) වැඩිහිටියන්ට සැලකීම යන මොවුහු පුණ්‍ය වස්තුන්ගේ ප්‍රභෙදයෝ යයි දතයුත්තාහ. වෛය්‍යාවච්ච පින් කිරියවත්,වතාවත්කිරීම පිළිබඳ පුණ්‍ය ක්‍රියාවසතුව; නානානාහක වනුයේ, නැනනැන සංක්‍ෂෙපකරනුයේ;(සංඛිපන-හකාවනු) වසම් පියෙස් මුළුළුහකවා, විසම (උස්පහත්) ප්‍රදෙශ සියල්ල හකුලා; සුලාක් සවල්පයක්(සුලුවක්-සුලාක් සිඛවළඳවිනිසැ පව්ති විනිසෙහි පෙනෙන චූළ්හපරිච්ඡන්න චූළ්හවජ්ජන්න යනාදී තන්හි පෙනෙන චූළ්හ ශබ්දය සමහරවිට සිංහල සුලු ශබ්දය බලාගෙන යෙදූවා විය හැකිය. සොයනු. (චූල-චුල-සුලු) චුඹ යනුත් පැරණිපාඨයි. නිශතුශ, පමුණුවනු වෙයි; දෙවියකු වන්නෑයි, දෙවියකු වන්නට ඇතැයි, (වත්හයි, වන්නැයි) මෙය භවිස්සති යන්න වෙනුවට යොදන ලදී භවිස්සති යනු පරිවිතර්කාර්ථයෙහිය. අමාවතුරෙහි එන කවටිබද යනාදී තන්හි පෙනෙන බද යනුත් මෙහිදී සැලකිය යුතුය. දූන්වද වත්ද යනුත් මේ අර්ථයෙහිම යෙදේ. දෙවියක්,

දෙව්ශබ්දය ස්ත්‍රී ලිංගය ගත්තැනි, ලැක්මෙකින් ගැතැප්මකින්; ලැගුම් යනු සැතපුමට තත්කාලීන නම්. [ලැගුම්-ලැග්ම්-ලැක්ම] නොහැරැ, හරණය නොකොට-නොගෙනවිත්; ඇලැසියන්, ගෙන එනලද්දේදැයි කියතොත්; වෙය්‍යාවච්චකකම්, වතාවත්; "දසසු පුඤ්ඤකිරියවත්ථුසු එකං ලභිස්සාමි" දසපින් කිරිය වතුන්ගෙන් එකක් ලබන්නෙමි; පන්හල්, පන්සල්; උළුසිණන් කණසියන් හොතුජ් උළුසෙවෙති හෝ තණ සෙවෙති වුවත්; ආරෙන්, අයුරින් (ආකාර-අයර-ආර) අයුරු සිද එන්නේය. කල්සබඳහු සමහනින්, කාන්ත මිත්‍රයකු ගේ ස්වරූපයෙන්; [සණ්ඨාන-සටහන] සං, කාන්ත, පාලි කල්ල-සිං [කල-කල්] ඇස්නවශේෂව, ඇස් නැසුන බවට; නටසේ ශබ්දය සපදන්විබත් ගත්තැනි [වැටෙනුයේ-වැටෙන්යේ-වැටේන්නේ] ලෝවළඳ; ලෝකව්‍යවහාරය; එළඹෙවයි, උපස්ථාන කරවයි; වටාව, එම අර්ථයි [උවටාව-වටාව] පිටිතියරිවැසියෝ, පිටිසර වැසියෝ පිටිසර වැසියෝ යනු අපපාඨයි. රුවන්වල් තිසණ්ඩුවෙයහිත් ප්‍රත්‍යන්ත වාචක තියරි සද පෙනෙතත් සැකසහිතය. දෙවලෝ, වැස්ස; මහසුප් මහතෙරුන් වත්හි [128 පිට] දෙවූලායි පෙනේ. අධො ලිපියක් වශයෙන්දක්වන ලද "දෙවෙ" යනුද සැලකිය යුතුය. සමහරවිට ශුද්ධපාඨය එයම විය හැකි හෙයිනි. කසවි, ඉවත්විය; (ගත-ගස-කස) ඉදුදීන්, මෙහි අර්ථය අවිශදය. "විද්ධස්ත" ශබ්දයෙන් ආයේදැයි සෙවිය යුතුය. රුකුළු, ආරම්භ කරනලද; මෙහි කුළු යනුව කරධාතුයෙහි අතීත කෘදන්තය වේ. රු යනුව තවමත් තේරුම්ගත නොහැකිය.

"ආරද්ධවිරියංයෙන සො ආරද්ධවිරියො" යමෙකුන් විසින් වීර්‍ය්‍යය ආරබ්ධ ලද්දේද හේ ආරබ්ධවිරිය නම්. ඇසින්, පුරුදු කරනලද; (ආචිණ්ණ-ඇසිණ-ඇසිණ්) ණ්හට න්වීමෙන් ඇසින් සිද සිටී. ආචිණ්ණං වඩ්ඪකම්මං යෙන සො ආචිණ්ණවඩ්ඪකම්මො" යමෙකු විසින් සක්මණ පුරුදු කරන ලද්දේද හේ ආචිණ්ණවඩ්ඪකම්මත නම් වේ. නවවට පෙලෙවින්, අලුත වස්නාලද පොලොවෙන් (පොලොවින්-පෙලෙවින්) ඉඳුගොවමෝ රත්පාට කුඩා පණු විශෙෂයකී. ගැඩවුල් පවුලට අයත්ය. නිවැසි මහණහු, වසන භික්ෂූහු; මෙහි නිවැසි යි කියන ලද්දේ ආවාසිකා ශබ්දය වෙනුවටය. විනය අට්ඨවාවට අනුව නම් ආවාසික නෙවාසික දෙශබ්දයේ අර්ථය තරමක් වෙනස්ය. ආවාසික ශබ්දයෙන් ආවාසයේ ප්‍රධාන අධිකාරී භික්ෂූව කියවෙයි. දවස් ඇති කල්හිමෙ, කල්ඇතිවම; හිය, හිත; විපරිණාමනොකොට, වෙනස් නොකොට; පුහුන් ප්‍රහීණ; (පහීණ-පුහුණ-පුහුණ්-පුහුන්) උපනිශ්‍රය

**හේතුසම්පත්;** “**අහංපුත්තධීතාහිසද්ධිං තෙදාසිභවිස්සාමි,** මම දූ පුතුන් සමග ඔබට දැසියක් වන්නෙමි. **යලක්,** වරක් (කල-යල) **පිසවී සිටියවුහු,** මුලින් තිබුනසේ වූහ; **පකති සණ්ඨිතානි පාකතිකානි,** මුලින් තිබුන තත්ත්වයෙහි (ප්‍රකෘතියෙහි) පිහිටියාහු පාකතික නම් වෙත්, **වොහරියන්ති,** ව්‍යවහාර කරනවා ඇත. ‘**මානුමා දස්කාලයි මොලිවගු මොලොක් පිලයාවින් බැවහැර නොකරනු,** |මා තමාගේ (වෙදගේ) දැසියක්වූ කල්හි (මට වෙද) මෘදුවචනයෙන්-මෘදු හැසිරීමෙන් නොපවතිනවා ඇත. (මුදුක-මුළුක-මෝළොක-මොලොක්) **වස්නෙමි,** වංචාකරන්නෙම. **නලනෙම්,** එම අර්ථයි. **රූපති නොරූපති යූනස්,** රූද කෙමරයිද නොකෙරෙයිද යනු අර්ථයි. **අයිරා,** වැඩියෙක්; (අතිරෙක-අයිරය-අයිරය්-අයිරා) **වැට අග්ගිජල සිලක්,** ප්‍රදීපාග්‍රයෙහි ගිනිසිලක්; (ජාලා-ජල) (සිඛා-සිළ) **පස්පස් නුහුබද්** පසු පස්සෙහි ලුහු බැන්දේය. (අනුබන්ධි-අනුබඳි-අනුහුබඳි-නුහුබද්) **විචාවර,** විපාකචාරය; **පචා,** දක්වා; **උසුලනුවහ,** උසුලන්නහුගේ; **ජන්ති,** ජනෘයෙහි-කරෙහි; **පදං අනුගච්ඡන්තං චක්කංවිය,** පාදය පසු පස්සෙහි යන රියරෝදය මෙන්; (අතීත-අයිය-අයු) **අරහත්තස්ස උපනිස්සයෙසති කස්මා අභබ්බොජාතො,** රහත්වීමට හේතු සම්පත් ඇති කල්හි කුමක් නිසා අභව්ද.

**අලි,** ගෙනහැර දක්වූ; **පුච්ඡානුසන්ධි,** ප්‍රශ්නයත් පිළිතුරත් දෙක ගැළපීම; **මැම්බක් රාජසාසනයක්,** මුද්‍රාව තැබිය යුතුතැන මැටිබහාලූ රාජකීය ලියවිල්ලක්; දූත් මුද්‍රාව ලාකඩ මතුයෙහි ඔබන්නාක්මෙන් පැරණියන් ඒ සඳහා සකස් කළ විශෙෂ මැටියක් උඩ ඔබාලූ බැවි මෙයින් පෙනේ. **හස්සාරන්නාක්හු සෙයින්,** හංස ලඤ්ඡනය පිහිටුවන්නාක්මෙන්; පැරණි රජුන්ගේ මුද්‍රාව මධ්‍යයෙහි හංසරූපයෙක් විය. එය ප්‍රධානව පෙනෙන හෙයින් රාජකීය මුද්‍රාව තැබීටට හස් තැබීමයයි ව්‍යවහාර විය. එසේම ඒ කාලයෙහි මුද්‍රාව ඇඟිල්ලෙහි දමන මුදුයෙහිම තිබුනේය. **පුවහුන්,** පකාසනය; **රජමුන්දෙන්,** රාජමුද්‍රායෙන්, මුන්ද යන තැන පෙනෙන නකාරය අධිකසේ පෙනෙතත් මේකාලයට අයත් බොහෝ ලියවිලිවල එය දක්නා ලැබේ. මේ රජුගේම (5 කසුබ්) කෘතියක්වන අභයගිරි ශිලාලිපියෙහි මද යනුව "මන්ද"යි යොද තිබීමද නිදසුනි. දෙමළ ආශ්‍රයෙන් වූවකැයි හැගේ. **ඔබුල,** ඔබන ලද; **ක්‍රියාචිත්ත,** අවිපාක-ක්‍රියා මාත්‍රයක්වූ සිත; කෙලෙස් නැසුවකු පිණක් කිරීමේදී ඇත්වන කුශල චෙතනාව ක්‍රියාචිත්ත යකි. උපතක් නැති හෙයින් විපාකාවස්ථාවට නොයන හෙයිනි, **සබ්බම්පිචතු භූමිකං චිත්තං,** සියලු චාතුර්භූමක චිත්තය, කාමරූප

අරූප ලොකුත්තර යන සිව්භූමියෙහිවූ සිත; හැම සම්පයුතුධම්නුප්‍ර සිත් පුවගමාවන බැවින්, වේදනා සඤ්ඤා සංඛාර යන සියලු චෛතසික ධර්මයනුද්‍ර සිත පෙරටුකොට ඇති බැවින්; මේ අට හැම සිතට යෙදේත් හොතුදු, මේ චිත්තානුවර්ත කාමාවචරාදී භෙද හැම සිතකටම යෙදෙන නමුත්; මෙදෙසුන් සක්පල් තෙරුන් අයුරෙහි පිළිඹු සම්පයුතු සිතින් මාගම ඇස් නැගු අධියරහි පැවැති බැවින්, මේ දෙශනාව වනාහි සක්පල් තෙරුන් අතීතයෙහි ක්‍රොධ සහිත සිතින් මාගමකගේ ඇස් නැසීම කළ අධිකාරයෙහි පැවැති බැවින්; අධියර (අධිකාර) ශබ්දය නොයෙක් අර්ථයන්හි වැටෙතත් මෙහිලා එය කාරණාර්ථයෙහි වැටුණේ යයි සිතිය යුතුය. මහා වංශයෙහි එන "පුබ්බෙපෙරාධිකාරං සො', (11-30) යනාදියද පිරික්සනු, ඒ අධියරවශකොට ගෙනත්, ඒ කාරණයට සුදුසුකොට යොදත්හොත්; දක්වනුවවස්, දැක්වීම පිණිස; දක්වනුව යනු දක්වනු ශබ්දය විබත් ගත්තැනි. වස් යනු පච්චය ශබ්දයෙනි, නියම්ය මානං, නියම කරනු ලබන; පශ්චාංශ සමාසාර්ථ ඇති පද; (පටිස-පිළිඹු) පෙරෙගම්නීවූවන, ඉදිරියෙහි යන (ප්‍රධාන) සුලුවූවාහුය. (පුරෙගාමනී-පෙරෙගම්නි) පුරෙගම්නි වූ යනු ප්‍රකෘතියි.

සමන්නාවූවන,සමන්නාගත (යුක්ත)වූහ.(සමන්නාගත-සමනගත-සමනගය-සමනවය-සමනම-සමනවි-සමනා) පඨම්ගාමිනා, පඨම ගාමිනාහුනවා යන දෙපාඨයම පැරණි පාඨවූවත් දෙවැන්න වඩාත් ආදර කටයුතුසේ පෙනේ. ප්‍රථමය "පඨම ගාමිනො"සී වීනම් වඩාත් මැනවි. මෙය පරීක්ෂාකළ යුතු තැනෙකි. වෙදනාදිධර්මයෝ පුරෙගම්නීවූ පිළිඹුසිත්හු විසින් යෙදෙන ලදුවන. වේදනාදී චෛතසික ධර්මයෝ වනාහී ප්‍රධානවූ ක්‍රොධ චිත්තයාගේ වශයෙන් (ක්‍රොධසිත හා සමග) යෙදෙන ලද්දාහු වෙත් පණිවාවරු, ප්‍රාණඝාතයෙන් වෙන්වීම; (පාණඝාත-පණිවය-පණිවර්-පණිවා) (විරති-විරයි-වැරයි-වැරු) සමො සදිසො විපාකො සමවිපාකො සමවිපාකොයෙසං අත්ථි සො සමවිපාකිනො" සමාන විපාකය (ඵලය) සමවිපාකනම් ද එය ඇත්තාහු සමවිපාකීනම් ද වෙති. දෙජේනා, ධර්මා ධර්ම දෙදෙන; උපලක්ෂණ, තමාත් තමාගෙන් අන්‍ය වූවනුත් හඳුන්වන ශබ්දය උපලක්ෂණ නමි. "නිරයං පාපෙති" යන තැන නිරය ශබ්දයත් කවුඩන්ගෙන් දී රැකියයුතු යන තැන කවුඩු ශබ්දයත් මෙන්.

පිළිසඳදෙන විසින්, ප්‍රතිසන්ධිය දීම වශයෙන්, දෙන යනු භාවයෙහි සිඩය. වාචනා මග්ගයෙහොවැ, පාළිකොට; සංගායනාවෙන් බණවර විසින් කොටස්වලට බෙදු ග්‍රන්ථාරූඪකළ පාළිය වාචනා මග්ග නමි. ආතම ආත්මීය භාවයෙන්, ආත්මභාවයෙන් හ,

ආත්මීය සන්තකභාවයෙන්; **ධම්මමත්තා**, ධර්මයෝ පමණක්, **නිස්සත්ත සභාවතො ධම්මා**, නිස්සත්ත (ආත්මයක් නැත්තේය) යයි කියන ලද ධර්මය; **සිත්පුවගමා නම්නො**, සිත පූර්වංගම කොට ඇත්තාහු නොවෙද්ද; දෙවන **එතෙහි** යනුව "එතෙසං" යි ශුධ විය යුතුය. **පුබ්බඞ්ගාමිවත්**, පුබ්බගාමී (පෙරටුවයන) වුවහොත්; **නානාවිණ්ණී**, නානාවර්ණිත; **එකිණ්ණී**, එකවර්ණිත; **සම්ප්‍රයොග ලක්ෂණ**, යෙදීමේ ලක්ෂණ; **භාවනපුංසක**, ක්‍රියා විශෙෂණ; **එක නිරොධ**, එකවිට නැතිවීම; **පරිහාර**, පිළිතුරු; **උපජ්ජනෙසින්** උපදනා හෙයින්; **විසෙස කාරණ** බැවින්, විශෙෂ හේතුව බැවින් **පච්චයත්ථෙන්**, ප්‍රත්‍යය (අප්‍රධාන හේතුව) වන්නේය යන අර්ථයෙන්, **පුබ්බඞ්ගම වොහාරබ්‍යවහාරඊ**, පුබ්බංගමවේතැයි යන ව්‍යවහාරයාගේ ව්‍යවහාරය; (සම්පදං--සපජම්-සැබජම්) **බැතිරෙක විශෙෂ**; **නහිතෙමෙතෙ අනුප්පජ්ජන්තෙ උපජ්ජිතුං සක්කොන්ති**, ඒ චෛතසිකයෝ සිත නූපන් කල්හි උපදනට නොහැකිවෙත්; **නොඋපන**, නූපන්කල; නූපන්නොත්, යනුත් අර්ථයි; **නොඋපජියහෙන** බැවින්, උපදින්නට නොහැකි බැවින්; **පසෙව් නො යනුවනට**, ප්‍රත්‍යය නොවන්නේදැයි කියන්නන්ට; **අබ්‍යාකතසිත්**, විපාක සිත් හා ක්‍රියාසිත්; **තුමා ඉසුරුයෙහි** තමා ඊශ්වරබවෙහි; (සුවණ්ණ-සුවණ) **මනාවනාණිපඵතනතා**, හිතීන් නිපන් හෙයින්; **චිත්තානමගතැන්** සිත ප්‍රධානකොට ඇතිතැන්; **භවගමන්**, **භවංගසිත**-මේ භවයෙහි උත්පත්තිය සඳහා උපකාර උනු කර්මයෙහි එල්බී පවත්නා සිත; **අභිජ්ඣා**, විසම ලොභය; **පටනගිමෙම**, මූලදීම; **අවුතු** අවුතු-ආගන්තුක; (ආගන්තුක_ අවුතුය-අවුතු) **දහයි**, මෙරමාහටද පිහිටවුවදහයි (පැරණී හෙරණ සිඛ 12) මලදහයි නොසිතා (එම 34) මිතාවුව දහයි සිතා (එම) යනාදිය පෙනෙන හෙයින් හොඳයි, යහපති යන අර්ථය එයින් කියවෙන්නේ ය. උන්නත් දහයි මලත් දහයි යන ව්‍යවහාර යද සැලකිය යුතුය. පාලි සාධු ශබ්දයත් මේ අර්ථදෙයි. **කිරියමයසිත්**, යහපත් හෝ අයහපත් ක්‍රියාවක් කරනවිට ඒ ක්‍රියාව සමග බැඳී පවත්නා සිත කිරියමය සිතයයි මෙහිදී අදහස් කරන ලදී. රහතුන්ට උපදනා අවිපාක චිත්තයද ක්‍රියා චිත්ත නාමයෙන්ම ප්‍රසිද්ධය. **සංකිලෙස සපිශෝ ලදුහෙයක්**, කෙලෙශ සම්ප්‍රයොගය ලැබූ චිත්තයෙක්; **එකත්තනයෙන්** සියල්ල එක්කොට සලකන නීතියෙන්; **නානත්තනයෙන්**, වෙනස් බැවින් **ආගන්තුකෙහි නීලාදිහි උපක්කිලිට්ඨං නීලොදකාදි භෙදංහොති** අමුතුවෙන් පැමිණී නීලවර්ණාදියෙන් හෝ සෙවෙල් ආදියෙන් අපිරිසිදුවූජලය නිල්ජලය ආදී ප්‍රභෙද ඇත්තේවෙයි.

**නව නවං උදකං,** අලුත්ජලයත් නොවේ, **නාපිපුරිමංභවඞ්ග චිත්තමෙව,** මුලින් පැවැති පිරිසුදු භවංගසිතද නොවේ. අපිරිසිදුවූ සිතමැයි, **ආගම,** පාළිය; **පණ්ඩරං,** ඉතා පිරිසිදු; **ඇතිසෙකි,** ඇති කල්හි යනු අර්ථයි. **වාක්විඤ්ඤත්ති,** වචනයෙන් හැඟවීම්; **තං පතිට්ඨාපක චේතනා,** ඒ වාක්විඥප්තිය පිහිටුවන චේතනාව; **කිඝත්,** කියත්හොත්; **කුරුකුඹු** ඇව, කුඩා කුහුඹි ආදීන්ව; කුඩා වාචක, කුරු ශබ්දය දෙමළ යෙහි ප්‍රසිද්ධය. **සිරුරු අධිඨන්කොට,** ශරීරය කරුණුකොට; **චේතොවත්ථුක,** සිත වස්තුකොට ඇති; **අකුසල විපාක කායවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ;** අකුසල විපාක දුක්ඛසහගත කායවිඥානය අකුසල, විපාක උපෙක්ඛා සහ ගත සම්පටිච්ඡනය, (අකුසලවිපාක දුක්ඛවේදනාව සමග යෙදුන කායප්‍රසාදය ඇසුරුකොට; පවත්නා කායවිඥානයද-උපෙක්ෂා සහගත සම්පටිච්ඡන (රූපාදිය පිළිගන්නා) චිත්තයද- රූපාදිය තීරණය කෙරෙමින් උපදනා සන්තීරණ චිත්තයද යන තෙසිත **පුරෙරටව යනුවා කඳට,** ඉදිරියෙහි යන්නාගේ බෙල්ල; (කඬර-කදර-කඳට) (කටීපාද-කලවය-කලවෙය-කලවෙල්-කලවේ) **පියනු පියවූයේ,** පාදය අනුව යන්නේවෙයි; **වාසනාධානතො** වාසනාවට අධිෂ්ඨානවූයෙන්; **ඵලභවභොග නිප්ඵාදනතො,** මාර්ගඵල සහ භවභොග සම්පත්තිය නිපදවන හෙයින් වාසනාව නම් පුණ්‍ය භාවනාවයි.

**1 චක්ඛුපාලත්ථෙරස්ස වත්ථු.**

**තුලාරක්ඛගට,** සවණ්කාරයකුහට; (තුලාධාර-තුලහර-තුලාර) **බැල,** කුලිය; (භති-බැල) **කටාම්,** කැටයම්; **මට්ටකුණ්ඩලි මෙ,** මට්ටකුණ්ඩලී කියාම; (රොග-රොවු-රොව්) **එතකපුත්තු;** මෙපමණක්වූ පුත්‍රයා හෙවත් එකම පුත්‍රයා (එත්තක-එතක) **භවතා** පින්වතිය; **ද්‍රව්‍යක්ෂය,** ධනවිනාශය; **යම්තමක්,** යම් ඒ දෙයක්; **බමුණා** බමුණාගේ; **බිලිපසොස්සල්,** ඉතා උදය කාලය, "බිලිපසොස්" යනු බලවපච්චූෂ ශබ්දයෙහි. කල් යනුව පූර්වරූපය ගත්තෙත් "සල්" විය. **සිමිවහි**=සමීපයෙහි (සමීප-සමිව-සිමිව) **"පච්ඡිමයාමාවසානං පච්චූසො"** පශ්චිම යාමයාගේ අවසානය **පච්චූස නම්. "සොඑව නාතිඛයානතනාබලව පච්චූසො"** ඒ පශ්චිම යාමයම අවසන් නොවූ හෙයින් බලව පච්චූස නම්. **"තස්මිංබලව පච්චූස සඞ්ඛාතෙ සමයෙ"** ඒ බලවත්උදසන යයි කියන ලද සමයෙහි; **"මහාවිසයතාය මහතී කරුණාමහාකරුණා"** මහත් සත්ත්ව සමූහයක් විෂයකොට ඇති බැවින් මහත්වූ කරුණාව මහාකරුණා නම්; **සාඑව සමාපජ්ජිතබ්බට්ඨෙන සමාපත්තීති මහාකරුණා සමාපත්ති** ඒ (මහා කරුණාවම සම වැදියයුතු යන අර්ථයෙන් සමාපත්තිය වේනු යි.) මහා කරුණා,

සම්පත්ති වෙයි. කරුණාඤාණං සමාවජ්ජ, කරුණාධ්‍යාශයට සමවැද හෙවත් පැමිණ; (ලඞ්ඝිත්වා-ලැගිය-නැගිය) අධියර, අධිකාර-පින්; නිබ්බේධභාගිය කුසල්, නිවන භජනය කරන කුසල් හෙවත් නිවනකරා ලංකරන කුසල්; “නිබ්බෙධො වුච්චති නිබ්බානං, තං භජන්ති උපගච්ඡන්තීති නිබ්බෙධභාගියා” (සංගීතිසුත්තවණ්ණනා) “විනෙතබ්බට්ඨෙන වෙනෙය්‍යා,” “අරිය භාවනිප්ඵාදකෙන කුසලමූලෙන සමන්නාගතත්තා බන්ධවා’ති වෙනෙය්‍ය බන්ධවා නෙසං,” විනය (හික්මවීම) කටයුතුය යන අර්ථයෙන් වෙනෙය්‍ය නම්ද, ආර්‍ය්‍යභාවය සිදුකරන කුසලමූලයෙන් යුක්තහෙයින් බන්ධු නම්ද වෙති, ඒ වෙනෙය්‍ය බන්ධුන්ගේ; ආසයානුසයඤාණය, ආසය දන්නා නුවණ සහ අනුසය දන්නා නුවණ; ශාස්වත උච්ඡේද යන දෙදෘෂ්ටිය සහ අනුලොමඛන්ති (සියලු ධර්මයෝ හෙතුප්‍රත්‍යය සමුප්පන්නායයි දන්නා නුවණ) සඞ්ඛ්‍යාත යථා භූත ඤාණය ආසය නමුත්, කාමරාග පටිඝ මාන දිට්ඨි විචිකිච්ඡා භවරාග අවිජ්ජා යන සත අනුසය නමුත් වන්නාහ. ථාමගත (දෘඪ) කෙලශයෝ අප්‍රහීණාර්ථයෙන් අනුසය නම් වෙති.

ඉන්ද්‍රිය පරාවරතා ඤාණය ශ්‍රද්ධාදිපඤ්චව ඉන්ද්‍රියයන් විසින් මෘදුවූ ඉන්ද්‍රියන් ඇති සත්වයන් හා තියුණුවූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් ඇති සත්වයන් දන්නා නුවණ; ආනෙත්වා දහන්ති එත්ථාති ආළාහනං, මෙහි ගෙනවුත් දවත්නුයි ආළාහන නම්. සජනලද, සරසනලද “සඞ්ඝාටෙසු හරිතබ්බත්තා සඞ්ඝාටහාරා, තෙවතෙ අලං කාරාචෙති සඞ්ඝාටහාරාලංකාරා, තෙහිපතිමණ්ඩිතං සඞ්ඝාටහාරාලඞ්කාර පතිමණ්ඩිතං” ගැල් හැටක පැටවියයුතු හෙයින් සඞ්ඝාටහාර නම්ද, ඒ ගැල්සැටක පැටවිය යුත්තාහුත් ඔවුහුමය අලංකාරවූවාහුත් ඔවුහුමනුයි සටසකට හාරාලංකාර නම් ද එයින් අලංකාරවූයේ සඞ්ඝාටහාරාලංකාර පතිමණ්ඩිත නම්ද වෙයි. “අච්ඡරානං සහස්සං පරිවාරො එතස්සාති අච්ඡරා සහස්ස පරිවාරො” අප්සරාවන් දහසක් පිරිවර වූයේ මොහුටනුයි අච්ඡරාසහස්සපරිවාරනම්. “සිරිසඞ්ඛාතා සම්පත්ති සිරිසම්පත්ති” සිරි සඞ්ඛ්‍යාත සම්පත්තිය සිරි සම්පත්ති නම්. උපභොග සපුව, උපභොග(ධනධාන්‍ය)සම්පත්තිය; විපුවරව නුවහු, විප්‍රකාරයට පැමිණි ඇහු කම්විබති, නොකෙළෙසින්-නොකළ හෙයින්; අක්ෂමායෙන් නොඉවසී මෙන්; මවුකුඩලිහි, (මටුකුඩලිහු) මට්ටකුණ්ඩලීගේ; නොයෙජ් නොසත්, නොයෙදේ නොවේදැයි කියතොත්; ගැන, ගෙන; සඳුජු, කල්හිදූ; මෙනියර, මේ ආකාර;(නීහාර-නිහර-නියර) හජාරන බැවින්, සංධාරණය(ඉගෙනගන්නා) බැවින්; (සංධාරණ-හදුරණ-හජාරණ) ගන්නේ=ගතයුතුය; පිළිලැබ, ප්‍රතිලාභය;

**පිළිජශ්**, සතස්; **රසක්විහිටි**=රශ්මියක් විහිදුසේක. (විහිටි-විහිට) විසසටථ ශබ්දයෙහි; **මෙහෙ**=සේවය-වතාවත්; **කවිපිමෙසහි**, කරනු කැමැත්තෙහි; **විධාතුංඅසක්කුණෙය්‍යා**, ක්‍රියා කරවන්නට නො හැකි වෙත්; **ඒ මතුමෙන්**, එපමණකින්; හඹා, ප්‍රමාණයි, (සමත්ථ-සමත-සමය-හමය-හඹය-හඹය්-හඹා)

**නිපජ්ජි** උපන්නේය; (නිපජ්ජි-නිපජ්ජී-නිපජ්ජී) **ඇස්සමු**, (ඇස්+හමු) ඇසට පෙනෙනතාක් දුර; **ආමෙණ්ඩිත**, පුනරුක්තය; **'පඨමංසුණෙත්නාවිශපචජා පබුමෙඩාවිය'** පළමු ශයනය කොට පසුව පිබිදියාක් මෙන්, **සිසුනොමෙණහි**, චුතවූ තෙමෙණහි; (චුත-සුසු-සියු) **විලප්පරිසින්**, විලාපපරායන විලාපයෙහි නියුක්ත; (පරායන-පරියින-පරියින්) පසාධන පහසින්, කවචායන-කාසයින්, යනාදියද මෙතෙහි කරනු. **දවහ දවහ**, දීනපතා විශාදවයි, බෙදවයෙහි; **හාඑක්මේපුතැ**, අහෝ එකම පුත්‍රයාණෙනි, කැපෑ කැපෑ, කම්පා වෙවී; **ඔරෙසී**, හඬයි; "ආරොදති ශබ්දයෙන් ආහැකිය; **දෙහොඅතුන්**, **දෙඅත්**; (දුක-දුහු-දෙහො) **ඉතිබැවින්**, මෙසේ හෙයින්; **"මෙතැන විලප්මින් සිටි,යි බැවින් යට නිපජ්ජිත්වාරොදිස්සති යි බුදුන් දුටහ යනු නො යෙදේ. ඉති බැවින් එතැන 'ඨත්වාරොදිස්සති' ,යනුමෙ මැනවි, එයට නිසිසේ මෙතැන රොදමානානිපජ්ජතියි, කියැ යුතු නොායන්"** බුදුන් මට්ටකුණ්ඩලීහුගේ ගෙට යැමෙහි ප්‍රයෝජනය සැලකූ සැටි කියූ අවස්ථායෙහි 'නිපජ්ජිත්වාරොදිස්සතී යි ද, උන්වහන්සේ සැලැකූ දෙය සිදුවූ අවස්ථාව කියනවිට රොදමානා අඨාසි,යි කියන ලදී.

ප්‍රථම පාඨය හා දෙවන පාඨය ගලපන්නට නම් (දෙවන පාඨය) රෝදමානානිපජ්ජති,යි විය යුතුය. එහෙත් ඒ පාඨය නොව ප්‍රථම පාඨය 'ඨත්වාරොදිස්සති'යි වී නම් මැනව යනු සන්න කතෘහුගේ අදහසය. එයට එතුමා කියන කාරණය නම් සිටගෙන මිස බුදියගෙන හිසඅතබඳ නොහැඬියහැකි බවය. **බුදුන් දුටහ**, මෙහි බුදුන් යනු ප්‍රථමාර්ථයෙහි යෙදුන නාමවිබත්ති. **සැජිමෙහි**, අලංකාරවූයෙහි; **'උස්සද'** ශබ්දය ගැල්වීම් අර්ථය දෙයි. **හරිසඳුන්**, විෂ්ණුට ප්‍රිය හෙයින් සුදු සඳුනට හරි (විෂ්ණු, සඳුනැයි කියත්ලු. ගොසීසචන්දන යනුත් එයටම නමෙකි. සථාන නාමයෙනි, ගොසීස යනු මලය පර්වතයාගේම එක්තරා කොටසෙක්වේ. මහාවංසටීකාහි ගොසිස යී ගෙන ජලය මෙන් සීතල සඳුන් ගොසීස චන්දනයයි කියන ලදී. **රියපඤ්ජරෙන්**, කරත්ත කූඩුවක්; **පුසයට**, පුවජාවට; **ජහිස්සංජිවිතං නෙන දුක්ඛෙන**, ඒ දුකින් ජීවිතය හරින්නෙමි. **සාධකනාම**, නිදසුන්

දිලුඹිජෙයට, දුර්ලභ දෙයට; (සඞ්කාව - සගට - සගළ) දිගි, (දිග් + ඉ) දිඝීවෙයි. නාසීසේයි, නාලවා යන අර්ථයි. භූතපූර්ව ගතින් හෝ, පෙර මිනිස් ලොවැ සිටියෙහි හෝ, "උභතපටිසෙධෙනනපිලිනං නිඝඝහො" කීදෙය ප්‍රතිෂෙධ (වැළැක්ම) කිරීමෙන් පිඩා කිරීම නිග්‍රහ නම්.

ඔහු, ඔහු විසින්; 'චන්දසූරියෙහි මෙ අනො' සඳ හිරු දෙදෙනාගෙන් මට ප්‍රයෝජනය; මෙත්, මෙයත්; බැවින්ජ්, බැවින්ද; පටිඤ්ඤාතනො, ප්‍රතිඥ කරන ලද්දේ නොවේද? භාසමානා, බබලන්නාහු; ඇවිමු, අභිමත–කැමැති; (අභිටඨ–ඇබිට්ටු–ඇවිට්ටු) හෙළයි, දමා; (ගාථා–ගය–ගය්–ගා) "නකිඛවං ලබ්භසිචන්දසූරියෙ" තෝසඳහිරු දෙදෙනා නො ලබන්නෙහිය; හත්ගල්පමා, අසන පජීතය දක්වා; ගියවුහු, ගියාහුගේ; බිලිනෙරෙක්, අතිශයින් බාලයෙක්; මමියැ, මමද; නොාශ, තෝද; 'චන්දංරුදංදුරකොවිය,' හඳට අඩන දරුවකු මෙන්; මා සෝගිනින් දිලියෙන සැහැවියා, ශොක ගින්නෙන් දිලියෙන (දූවෙන) සවභාව ඇති මා, මෙහි විශෙෂණය පරවිය. සැහැවියා යනු කම්විබනයි; දරඵ, පීඩා; පිළිණීකොට සිටිනෙයින්, පීළනය කොට සිටින හෙයින්; අපහරි, බැහැර කෙළේය. "අබ්බූළ්හං උඩවං සල්ලං යස්ස," අබ්බූළ්හං, සේයි; උඩවං, උදුරන ලද; සල්ලං, හුල; යස්ස, යමෙකුගේ ද; තව, තාගේ; නොනියම්‍ා නියමනොකොට; (නියමෙතා–නියමය–නියමය්–නියමා) හඳබඟල ගන්ධබ් සමූහය; (සවා–ගළ) පූපිරිගුණෙහි, පූජියෙහි පුරණ ලද ගුණ යයි. (පුබ්බ–පුබ–පූව–පුව්–පු) "ද්වීසු දෙවලොකෙසු දෙවෙ අනුසාසිතුං අසුරෙච අභිභවිතුංපහොති" දෙදෙව්ලොව් දෙවියන්ට අනුශාසනා කරන්නටත් අසුරයන් මඩින්නටත් පොහොසත් වෙයි. පරියාදුක්වූයේ වෙයී. පරියාය (සමානාර්ථ ඇති) වචන දැක්වූයේ වෙයි. ඹකෙකා, පුරින්දදෙ යන දෙශබ්දයම ශක්‍රයා කියන හෙයිති.

'පාරිය' යනු අප පාඨයි, (තාග–තග–තයි–තය්–තා) තදරීයෙහි, තාගේ දරුවෙක් වෙහිද (දරු–දරි) දන්මහ, දනුම්ද; (දනුමූහ–දනුමහ–දන්මහ) පුළුවුස්මහ, විචාරම්හ; (පුළුවුසුමහ–පුළුවුස්මහ) ඒ අවනාපිතිමි, ඒ මම තාගේ පුත්‍රයා වෙමි. (අහං–අහ–අව) ගොරොක්කොට, ගරුක (දූඩි) කොට; දීඩවක්, දෙය්‍ය ධර්මයක්; (දෙය්‍ය–දෙය–දිය–දිය්–දි) මොණුයෙහිද, මූදනෙහිද; (මුද්ධු–මොයණු–මොණු) 13 සුමනාදෙවියාවත්හි (57 පිට මූහුණු අර්ථයෙහි යෙදූ මොණ ශබ්දය පෙනේ; "දදනානස්ස නාවදූනං නාදදසං"

දෙනනාගේ දනයක් නුදුටුමී; 'ආබාධතිපීළෙතීති ආබාධො සො අස්ස අත්ථීති ආබාධිකො' ආබාධති, පේසි; පීළෙතීති, පීඩා කෙරේ නුයි ආබාධ නම්. ඒ ආබාධය ඔහට ඇත්තේනුයි ආබාධික නම් වෙයි. දිකින්, දුකින්; ගුලින්පි සොමනස්, මෙය ගුණිපි සොම්නස් යි වීනම් මැනවි.

ක්ෂීණවූ ප්‍රීතිය හා සතුට (ඛිණ-ගුණු-ගුණ) ගෛලහමීක්ෂයෙ, ගෛලධාතුව සතුට ක්ෂයවීම් අර්ථයෙහි වැටේ. සැහැවිගෙයි, සවභාව ඇත්තෙමි. රෙළුහල්ලෙමි, රූක්ෂ ආකාරය ඇත්තෙමි. කවි සිළුමිණෙහි (රොළුටමස් 13–15) යි කීයේ සාරයක් නැතිව, රළුවගිය ඇට මස් වලටය. (ආලය–අලු–හලු) ගිලානාලයං යනාදී තන්හි ආකාරවාචී ආලය ශබ්දය පෙනේ. එයින් ආ 'අලු' යනුව හෙළුයෙහිත් ප්‍රසිඩය. හලු බවට ගියේ හකාරාගමයෙනි; (හලු + යෙම්=හල්ලෙම්) 'කඩවූ' යනු 'කසවූ' යි ශුඩවිය යුතුය. බැහැරවූ යනු අර්ථයි. "රාගො රජො නච පන රෙණුවුච්චති" රජස් නම් රාගයයි ධූලි නොවේ; තුරූකක්, බැහැරකළ සැකය; (තරිත–තරිය–තිරිය–තුරුය–තුරූ) (කඞ්ඛා–කක–කක්) පිළිවුවා යෙන්, ප්‍රතිපදයෙන්; පිරිපුණු, සම්පූර්ණවූ; (පරිපුණ්ණ–පිරිපුණු–පිරිපුණු) අනාබෙයාතිශයවූ, අත්‍යර්ථයෙන් පරිපූර්ණවූ; 'හට්ඨ චිතෙතා' සතුටු සිත් ඇත්තේ; එක්වන්නෙ නොවනජූ, නිතර නොවන දෙය; විස්මය, පුදුමය; නොවූවිරූ, පෙර සිදුනොවූ ආදිඅනනයෙහි විකුම්වැරිය, පංචසිල අටසිල ආදී ශික්ෂා පද සඞ්ඛ්‍යාවන්ගේ මූල හෝ අග ශික්ෂා පදයන් කැඩීම ආදි අනත වීතික්කම නම් වේ. එසේ ශික්ෂා පද නොකැඩීම "ආදි අනතයෙහි විකුම්වැරිය" නමින් අදහස් කරන ලදී.

(වාරිත–වැරිය) වීතික්කම (වියිකුම්–විකුම්) ඡිද්‍ර සබල කම්මාස, මැදින් කැඩුණු සිකපද ඇති සීලය ඡිද්‍ර සීලය නම් ද, පිළිවෙළින් ශික්ෂා පද කීපයක් කැඩී ගිය ශීලය සබල (කබර) ශීලය නම් ද, අතරින් අතර කැඩිගිය ශික්ෂා පද ඇති ශීලය කල්මාසසීලය නම්ද වෙයි. සිංගිරිවින්, ස්වරූපයෙන්; (රුවින්–රිවින්) පා, ප්‍රකාශ කෙරෙයි. (පායි–පා) 'හොති' යනු 'හොති' වියයුතුය. අතනනියෙන, තමා සතුවූ; නරූතනමසා, මනුෂ්‍යාත්‍යනම සජිඥයන් වහන්සේගේ; අධිවාසෙසිමෙහනනං, ඔගේ දනය ඉවසනු මැනවි. 'භත්තසම්පාදන ආසන පඤ්ඤාපනාදි සාධුකාරං' දනය සකස් කිරීම ආසන පැනවීමාදි යහපත් ක්‍රියා; සක්කාරීයති එතෙනාති සක්කාරො" මෙයින් සත්කාර කරනු ලැබේ නුයි සත්කාරනම්.

'කච්චිභොතොගොතමඛමනීයං' භවත් ගෞතමයන් වහන්සේ සෑහූ ගුණාදිය ඉවසිය හැකිද; පිළිසඵර, සිහි කළයුතු කථා; පබ්බාජවන, උතුම් භොජනය පිණිස; (29 අරජවිවසුමහණ්ඩුවත් 101 පිට) බලනු. පිතිපාමොජවන් යනු අප පාඨයි. පිඨකජ්ජකාදී, පිටි වලින් තැනූ කැවිලි ආදිය; අනකාදි, අංහාරාදිය; පිළිසෙල කරවී; සකස් කරවී; (පටියතත-පිළියත-පිළියළ-පිළිසෙළ) අනුසාවාපි, අනුශ්‍රව (ආරංචි) අර්ථය; මූලාමහත්මූලා, සාමාන්‍ය මූලාව හා මහා මූලාව යනු අර්ථයේ හගිනු. තවත් සෙවිය යුතුය; හැඟිණියරක්තව යනන බැව, හගනා ලද (සිතූ) ආකාරයකින් කළහැකි බව; (යහන ශබ්දය 210 පිටේ බලනු) මිහින්තලා ලිපි යෙහි 'හොයහන' යන තන්හිද එය පෙනේ. (සඞ්කිත-හැඟිය-හැඟි) සඞ්කිත ශබ්දය විතර්කාර්ථයෙහිත් වැටේ. (නීහාර-නිහර-නියර) බට අස්සෙනති, පහත් ආසනයෙහි; විජ්පසට, පැහැදිලි; සෙදු, දෙක, එකාර්ථවත් කෙවල, මතත යන ශබ්ද දෙක; "අංජලිං අකරිං තථාගතස්ස" බුදුන්ට නමස්කාර කෙළෙමි. පසාදසමුඞ්ගිත, ප්‍රසාදයෙන් හටගත්; පටා, පටන්, (පඨාය-පටය-පටය්-පටා) "නිබ්බිචිකිච්ඡානහොති" නිසැක වූවෙක් නොවේ. අතික්කන්ත සොනත, මිනිස් විෂය ඉක්මවූ හෝ මනොඥවූ; ආභාය, වර්ණයෙන්-කාන්තියෙන්; දවහත්සරු, දිවසාවසානයෙහි බබලන හෙයින් එනම්වීයයි සමහරු කියති. එසේ නම් දවහත් යනුව දිවසනත ශබ්දයෙන් (දිවසනත-දවගත-දවහත්) ආහැකිය.

ඔසධිතාරකායට වාහන වන බැවින්, ඖෂධ වගී ගැනීමට ආධාර වන බැවින් යන අර්ථය මෙයින් ගතහැකිය. අඞ්ගුලිපොඨචෙලුක්ඛෙපාදී, අසුරු ගැසීම් පිළිහිස සිසැරීම් ආදී; ප්‍රසාදන්මක, සතුට ජීවිතය කොට ඇති; කා, කා විසින්; කරන ලබන්න, කරනු ලබන දෙය; (ලබනුය-ලබන්ය-ලබන්න) සනිටු වන ලබනු, නිශ්චය කරනු ලබන; (සන්නිඨාන-සනිටුහන-සනිටුවන) මට්ටකුණ්ඩලිනි, (මට්ටකුණ්ඩලීහු) මට්ටකුණ්ඩලීහුගේ; දහස්වැම, නොයෙක් ප්‍රදීප; (වට්ටි-වටි-වැටි-වැට) "එවංසම්පදං" මෙය පාළියෙහි නිපාතයක්සේ සැලැකෙයි. මුලදී සම්පදං යනුව "සැබජම්"යි හෙළුවට පෙරළන ලදී. මෙහි 'සපු'යි පෙනේ. එය සම්පද ශබ්දයෙන් මිස සම්පදං යන නිපාතයෙන් ආබවට නිදසුන් දුලබය. සොයත්වා. නිපැන්, නිෂ්පන්නය; ධම්මිකගණාදීන්ට, දන්දීම් ආදී ධාර්මික ක්‍රියාවන්හි නියුක්ත සමූහාදීන්ට; සෙණිකුල, කර්මාන්තකුල; වන්සොාම ඇති, උපදු කොට ඇති; (උප්පජ්ජන-උපජන-උපජ්නා) ඒවාමහත්, එපමණ විශාල; (ඒතා මහත්=ඒවා මහත්)

2. මට්ටකුණ්ඩලිවත්ථු.

නෑදි, නැන්ද; 'පිතුභගිනිපිතුච්ඡා, පියාගේ සොහොයුරිය පිතුච්ඡා (නැන්ද) නමු. කොළනලද පිළිකොළනලද, (පඬු) ගසන ලද නැවත, නැවත පඬුගසනලද; උපලක්ෂිතව යුක්තව "ආදිතො පඨාය යාවඔසානා කොපිතං ආකොපිතං" මුලසිට අවසානය දක්වා ගසනලද්දේ ආකොටිත නම්. පුනවණ්ණෙටට සම්පා-දනත්ථාය කොටිතං පච්චාකොටිතං, නැවත වණයත් මෘදුබවයත් සම්පාදනය කරණු පිණිස ගසනලද්දේ පච්චාකොටිත නම් වේ. සෝද පඬුගසා මදින ලද යන අර්ථය දෙන්නට මේ වචනවය යොදන ලදැයි සිතේ. කුමසග බැවින්, තමා බාල හෙයින්; මිහඬ වේ, නිශ්ශබ්දවෙයි. 'ම' යනු ප්‍රතිෂෙධාර්ථයෙහිය. (මා-ම) උවසර, සත්කාර (උපචාර-උවසර) බුදුපිරිගාමෙ, බුදුන්ගේ ශ්‍රාවක බැවින් අයිතිය; (පරිග්ගහ-පිරිගා) "නමොගිකඛමෙ එතං වත්ථබ්බං" මහණ මෙහි නොවිසිය යුතුයි. දිකින්, දූකින්; දුමු, දුඹට, ආලොලකං, කලබලය; අවුතු, ආගන්තුක; (අවුතුව-අවුතු) මහණහු, මහණහට; කම්පිබති. හැවුල, තර්ජනය කෙළේලු; (සපිත-හැවිය-හැවුය-හැවු) වඳනහට, වඳිනු පිණිස; දූසිජ්, දූෂිව-අකීකරු; (දුබ්බච-දුවුජ්-දුයුජ්-දුසිජ්-දුසිජ්) දුක්ඛංවචොඑතසා තිදුබ්බචො" දුක්වූ (නපුරු) වචන මෝහටනුයි දුබ්බච නම්. ඇමතුණු, ආමන්ත්‍රණයයි' නොබැරිහොත්, බරක් (කරදරයක්) නැත්නම්; දින්ගි, දුන්නෙහිද; උපවදනෙනන්, උපවාදයෙන්, කච්චිආවුසො ඛමනියං, කොහොමද ඇවැත්ති සෑතුගුණ ආදිය ඉවසියහැකිද? කාලතුරැගි, කාලාන්තරයෙහි; සවුගන්වනෙමි' සාපගන්වන්නෙමි-සාපකරන්නෙම් යනු අර්ථයි.

ක්‍රොධසිතින් අනුන්ට අයහපතක් වේවායි පැතීම මෙහිලා සාප ශබ්දයෙන් ගතයුතු අර්ථයවෙයි. මුදඩාශෙ එලතු, තගේ ඔලුව පැලේවා' සිසංනොරූජතු, තගේ ඔලුව රිදේවා- ගිසින්සුන්, රුචියෙන් ශූන්‍ය;, උපලක්ෂණ, ස්වාර්ථයද එයින් පිටත් අර්ථයන්ද හඟවන හෙවත් අවබොධකරන ශබ්දය උපලක්ෂණ නම්. "තල-කාක්කන්ගෙන් ආරක්ෂාකළයුතුයි" මේ වාක්‍යයෙහි එන කාක-ශබ්දයෙන් ස්වාර්ථයවන කාකයෝද එසේම තල වනසන් කුකුළු බලූ ආදි අනෙක් සත්වයෝද ගනු ලැබෙත්, සහස්සරංසි යන තැන පෙනෙන සහස්ස ශබ්දයෙන් ස්වාර්ථසඞ්ඛ්‍යාත සහස්‍රාර්ථයද එයට සම්පව පවත්නා අනෙකාර්ථයද කියවෙන්නේය. මෙහි, අනෙකාර්ථය උපලක්ෂණාර්ථයයි. එය සහස්සශබ්දයෙන්ම හැගේ. අලුකරනඅපින්රශ්නම්, ආලොක කරන්නේය යන අර්ථයෙන් රශ්මිනම්වෙයි. අයිහවන, මඩිත; "නමංවිනොදතිපජහතීති

නම්පිනොදහනා" අඳුරු දුරුකෙරේනුයි, නමවිනොදන නම්, මා කියන්නාහටමෙ (කියනමාහටමෙ) විශෙෂ්‍යය පූර්ව විශෙෂණය පරව්ය. විශෙෂණයට පූර්ව යෙදෙන සමානාධිකරණ විශෙෂ්‍යය මෙසේත් සිටිනු සාමාන්‍ය සිරිති. එය විශෙෂණයට පරව යෙදෙන කල්හි නිත්‍යයෙන් විභක්තිගෙන සිටියි. සමානාධිකරණ විශෙෂණය විශෙෂ්‍යයට මුලින් සිටද ඇතැම් තැනෙකදී විබත්ගත්තා බවටද නොයෙක් නිදසුන් තිබේ. බුහුතැණියන් අංජනදේවින්, සැමියා කොසොල්රජු, කුළුවෝ මහණහු, සවාමීනි මහෞෂධපණ්ඩිතයෙනි, මපියාණන් සුදෙවුන්මහරජාණන්, යනාදිය එයින් කිපයෙකි.

අභිසාප, විපතක් වේවායි පැතීම; අභිඤ්ඤානුභාවු, අභිඤ්ඤා (විශිෂ්ටනුවණ) සඞ්ඛ්‍යාත ආනුභාව; 'සාප' ව්‍යාපාදපූර්වකනො, සාපය ක්‍රොධපූර්වකනොවේද? අභිඤ්ඤාලාභීහු කිසෙකින් සාපදෙන්නියන්, අභිඤ්ඤාලාභීහු කෙසේසාප දෙත්දැයි කියතොත්; අනිවරණාවස්ථාව කොපනැතිවන බැවින්, නීවරණ නැති අවස්ථාව, කොප නැති අවස්ථාවක් වන බැවින්; "කස්සනුකො උපරි සාපො පතිස්සති" කවුරුන් මතුයෙහි සාපය වැටෙන්නේදැයි; අනාගතංසඤාණෙන්, අනාගතය බලන නුවණින්; සමවැදුම්විසිපත් කින් සමාපජ්ජිතු කාමතායෙන්, සමපත්තියට සමවැදීමේ වශගබවට පැමිණියේ, ධ්‍යානයට පැමිණෙනු කැමැත්තෙන්; පුනාලක්මෙ උපයන්මෙ, නැවත උපදවන කල්හිම; පාකතිකමෙවයි. මුලින් තිබුන තත්වයට පැමිණෙයි. මේ 'පුනාලක්මෙ' යනුයෙහි නියම අර්ථය නොදනිමු. "පුනාලක්නොම්යෙන්" (78) යන පාඨය සමගත් සමකර බැලිය යුතුය. පුනකල් ශබ්දය පුනාල්යි, සිටිය හැකිය. අක් යනු ප්‍රත්‍යයයි. දෙනකල්, දෙනාල්වූසැටි සලකනු. ධ්‍යානලාභියාගේ සිතෙහි ක්‍රොධයෙක් නැත. ක්‍රොධනැතියකු විසින් සාපනොකලහැකිය. යනු මෙහිලා හගනලද ප්‍රථම ප්‍රශ්නය වෙයි. ධ්‍යානයෙන් පිරිහී සාපදෙත්, යනු එයට පිළිතුරුය. ඉදින් නාරද තවුසා සාපකලේ ධ්‍යානයෙන් පිරිහී නම් ධ්‍යානයෙන් පිරිහෙනවිටම අනාගතංසඤාණයෙනුත් පිරිහෙන හෙයින් "කස්සනුඛො උපරිසාපො පතිස්සති" යි ඔහු අනාගතංසඤාණයෙන් බලනලද්දේ කෙසේද යනු දෙවන ප්‍රශ්නයයි. "සමවැදුම්වැසිපත්කින් සමාපජ්ජිතුකාමතායෙන් පුනාලක්මෙ උපයන් මෙ අභිඤ්ඤාපාකතිකවෙයි" යනු එයට පිළිතුර වෙයි. සමාපත්තීය වශඟකරගත් කැනැත්තේ ධ්‍යානයට සමවදිනු කැමැත්තෙන් නැවතත් (ඒ ධ්‍යානය) උපදවන කල්හි අභිඤ්ඤාව ප්‍රකෘතිවෙයි යනු අර්ථයි.

**පූශොනි** විසින්, පූර්වෝත්පත්තියගේ වශයෙන්; (පුබ්බ-පුව-පුව්-පු) **"අනාගතසඤ්ඤාණින්"** යනු **"අනාගතංසඤ්ඤාණින්"** යි වියයුතුයි. **'සුරියොමාගච්ඡතූති,** හිරුඋදනොවේවයි; **පිරිසමා** යනු **'පිරියමා'** යි වියයුතුය. පරිකම්කොට යනු අර්ථයි. **කිරණොදය,** සූර්යරශ්මිය උදවීම; **බිම්බොදය,** සූර්යබිම්බය උදවීම; **අසක්ඛෙත්,** සැකකරන්නේ; (ආසඞ්කා-අසක්) දඩුවැටින්, විලක්කු වලින් යුක්තව; **කසිකම්,** කාශිකම්; කසුකම් යනුත් පාඨයි. **"කථංඅනාගතභයො නාභවෙය්‍යාති"** කෙසේ අනතුරක් නොවන්නේදැයි; **යථ සිතින්,** කාමංකෙරෙමි යන සිතින්; **නොපහරුත්මෙ** නොවැදෙන කල්හිම; **කුම්බුයෙන්,** කිම්දූන හෙයින්; **කිලිසිසද** කිම්දූන කල්හි;ඔලුව **සත්කඩක්ව** පැලෙනුයේ එහි සැඩි හතක් ඇති හෙයිනි. **"උග්ගච්ඡන්තසූරියෙඵලතු"** හිරුඋදවන කල්හි පැලේවා; **උග්ගතසූරියසද,** උදවූ සූර්යයා ඇති කල්හි; **පාලද,** වැදූනද; (පහට-පහල-පාල) **හවනලද්,** ආක්‍රෝශ කරන ලද්දේ, **හෙළැයි,** පැහැරගත්තේයයි; (හර-හළ) දබ්භපලාල' දර්භතෘණ හා පිදුරු.

කුශාඃ කාශාවල්වජාශ්ච-තථාත්‍යන්තීක්ෂ්ණරෝමශාඃ
මෞඤ්ජාශ්ච ශාද්වලාශ්චෛව-ෂඩ්දර්භාඃපරිකීර්තිතාඃ

යි කීහෙයින් දබ්භ හවගෙකැයි දතයුතුය. **පච්චත්ත,** ප්‍රථමා; **කම්මස්සකතා,** (කම්ම + සකතා) කර්මය ස්වකීයකොට ඇතිබව; **අනාපදෙශයෙන්,** (අන්‍ය + අපදෙශයෙන්) අන්‍යයෙකුගේ ව්‍යාජයෙන්; **අසිඳුනාලදවන්නෙන්,** පැහැරගත්තාලද්දේ වන්ද; **එකිපටා,** එතැන්පටන්, **සුසුජ්ජිය.** සුවවයෙක්විය. (සුබ්බව-සුවුජ්-ඡුසුජ්-සුසුජ්)

## 3. තිස්සථෙර වත්ථු.

**පොසෙසති,** පොෂණය කෙරෙයි. **රුස්වා,** කැමැති කරවා; **වරප්පසායාමි,** වරධාතුව කැමැතිවීම් අර්ථයෙහි වැටේ, **"කිංනාමෙ තංවදෙසි"** මොනොවද මේ කියන්නෙ; **නොපිශවිනු,** ප්‍රකෘතිය නොවෙයි නොවේද; නු යනු ප්‍රශ්නාර්ථයෙහිය, **ඉලියනු** සෙවීම; **ඉලිය,** සෙවුමෙහි ධාතුයි. "ගබ්භං **පාතෙතිඑතෙනාතිගබ්භපාතනො"** මෙයින් ගැබ හෙළාතුයි ගබ්භපාතනනම්. **අඩුමිනිස්සු,** ස්ත්‍රීහු; ගෑනු මනුෂ්‍යයෝ යනු අර්ථයි. මෙහි මිනිස්සු යි කියේ පුරුෂයන්ට නොව සාමාන්‍ය මනුෂ්‍යයන්ටය. **සෙවෙන්,** එක ස්වාමියෙකුගේ නොයෙක් ස්ත්‍රීහු; ඔවුනොවුන්ට සපත්නිහු(සමාන පතනීහු) වෙති. **"ජීවිස්සාමිනුඛොනානුඛොජීවිස්සාමි"** ජීවත් වෙම්ද නොවෙම්දැයි; (ජඤ්ඤ-ජණ) **බිහිනුවරහි,** නගරයෙන්

**පිවත**; **උදකනයනවාරො**, දියගෙනෙනවාරය; **නුනත්දෙහෙන්** අනොතත්තවිලින්; (අනොතත්ත-අනුතත්-නුතත්) **නිස්පන්නීන්**, **නිස්** පරම්පරායෙන්; **නිශූවේ**. පැමිණවූයේ වෙයි. නිශූ යනු කතෘකාරකයෙහි සිඬ අතීත කෘදන්තක්‍රියා ය. කතෘ ජෙනේයි යෙදුන හෙයිනි. ඉදින් එය කර්මකාරකයෙහි සිඬනම්. කතෘ ජනායි විය යුතුය.

**වෙලෙවිගමිනින්**, ඉක්මන් ගමනින්; වේලෙවි යනු වේගාර්ථවත් 'විරෙවු' යන දෙමළ වචනයෙන් ආයේය. "**මම හඨනොනාමු-ච්චිස්සති**" මා අතින් නොමිදෙයි, **ගුවනලද**, ඔසොවනලද; **ජිවූ**; දිවුවාය; **කැඳව**, කැඳවනු;! **කළසිගු**, වලසාගේ; **බුහුරුජමුන්**, බුහුරුජම් ශබ්දය සබඳවිබත් බුහුබස් ගත්තැති අමාවතුරෙහි 'බුහුරුරුක්' නමින් කොලොම්ගස අදුන්වනලදී. සිදුරු සහිත වෘක්ෂය හෝ එයින් ගතහැකිය. ගස්බිලයට බුහුරුනාමය ධම්පියා ගැටපදයෙහි 102 වන පිටේ එයි. දම් යනු දඹශබ්දය අනුකරණය කෙරෙයි. මේ කරුණු ගැන සිත්නවිට බහුරුජම් (කොලොම් ගස්) ශබ්දයට වඩා බුහුරුජම් ශබ්දය යොග්‍යයයි සිතේ. කො-ලොම්ගස වැඩිවශයෙන් සිදුරු සහිත හෙයින් මේ නාමය යෙදුනා විය හැකිය. **තවත්** සොයත්වා, **මහමුහුණු**, බතමූණා; **කාම්සුවාසෙ** බැලිමෙමින්, කමිය සවකිය කොට ඇතිසේ බැලීමෙන්; **කුමක් නිසා ගෙම්වැලඳ**, මොකද මේ විලාපය; **යම්නම්සෙයෙකින්**, යම්කිසි ක්‍රමයකින්; **සම්පියොවින්වා විසම්පියොවින්වා**, ධම්මිෂ්ටවූ හෝ අධම්මිෂ්ටවූ හෝ; **සමපියොවින්මනු ජෙනුසුම්**, ධම්මිෂ්ට ප්‍රයෝගයෙන් පමණක් ජීවත්වන මම; **ජෙම්**, ජීවත්වම්ද; **ජෙනුවිනුවට**, ජීවත්වනු පිණිස; (ජෙනුවට) යන පාඨය වඩාත් යොග්‍යසේ පෙනේ. **උවෙ**, උපාය; (උපාය උවය- උව) **නහම්සිත**, නො-සිතව; (සිතනි-සිත) නිලොපයෙනි නහම් යනු ප්‍රතිෂෙධාර්ථයෙහි නිපාතයි සංස්කෘතයෙහි "මාගවජ්ජිසම" යනාදීන්හි පෙනෙන මාසම, යනුව 'මහම්' සී අවුත් ම හට න වීමෙන් එය නිපන්නේ යයි සමහරු සලකති. එහෙත් එය නොගැළපෙන බව කිය යුතුය. මේකාලය වනවිට සමහර සිංහල ශබ්දවල අගට 'ම්' යනුවක් එකතුවූ බවට නොයෙක් නිදසුන් ඇත්තේය. 'සීස' ශබ්දයෙන් ආ හිගුම් ශබ්දය එයට හොඳ නිදසුනකි. මා ශබ්දයෙන් ආ මහ යනුව මේ පොතෙහිම පෙනේ. මහම් වූයේ ඒ මහ යනුමැයි.

'**මාසසුපුත එව මකායි**, (නැවත එසේ නොකරව) මේ මාසසු යනුත් සලකා බැලිය යුතුය. මාසසු නිපාතය මෙන්ම නාසසු නිපාතයකුදුවෙයි. නහම් යනු එයින් ආහැකිය. සොයත්වා. **හඹු**, කැඳ; හඹු ශබ්දයෙන් මූලදී අදහස් කරන ලද්දේ ගිතෙල්

මිශ්‍ර කෑදය, එයින් සාමාන්‍ය කෑද කියවෙන්නට පටන්ගත්තේ පසුවය. සමහර තැනෙක 'හඹුකෑද' යිද පෙනේ, පරපදය ලෝපයට ගොස් හඹු ශබ්දය පමණක් ඉතිරිවී යයි ද එයින් සිතා ගතහැකිය. (සං, සර්පිස්, පාලි, සප්පි යනුයි. හඹු යනු එයින් ආ හැකිය.) (පුසුහි-පුසු) වසෙළු, පිඩිවංස සබ්දය වෙනුවට යොදනලද මේ ශබ්දයෙහි අර්ථය තවමත් සැඟවී පවත්නේය. එබැවින් පළමුකොටම ශබ්දය යෙදී තිබෙන තැන් කීපයක් දක්වීම මැනවැයි සිතේ. **1. බුද්දඝොසරෙ පිඨිවංසං අතික්කමිත්වා නිසීදන්ති ආපත්තිපාචිත්තියස්ස** (පචිති පොත අරියවංසථෙර 96 පිට) 2. **"පිඨිවංසස්සවා කූටාගාරකණ්ණිකාය වා උපරිථූපිකාය වා පඤ්ඤසනිසින්නෙනාපිද නමුඛවට්ටි අනෙනනබලොකෙතනායසම්ං භූමිභාගෙඨිතංපස්සති"** (විනය අටුවා මහල්ලකවිහාරසික්ඛාපද) 3. **පිඨිවංසං අතික්කමිත්වාති ඉමිනාමජ්ඣාතික්කමං දස්සෙති** (විනය අටුවා සභොජනසික්ඛාපද) **4. නසච පිඨිවංසසංඝාටනා හඬ්ඪාගෙස අවිජගිජනපි පිඨිවංසාතික්කමො හොතිති ආහ** (විමති විනොදනී 326)

5. **වංසංදත්වාති, පුරිසප්පමාණෙපාදෙ නිඛනිත්වා තෙසං උපරිපිඨිවංස සදිසං පස්සවංසංඨපෙත්වා ඔසාරෙත්වා එකං දණ්ඩ කොටිං අතිඋච්චාය විහාරගිතතිකොටියා එකං කොටිංනීච වංසපිඨිසං ඨපනවසෙන දණ්ඩකෙ පසාරෙත්වා** (එම 465 පිට) 6. **සො තත්ථ ගන්ත්වා පිඨිවංස කොටියංනිලීයි.** (සුවණ්ණකංස-ජාතක) පිටිසේසෑවස්සට කොළවරෙහි (ජා. ගැටපද 109 ජයතිලක) 7. **සොපිඨිවංසථූනායවසති.** (ගගජාතක) වස්කප තොහොත් වස්යට ජාතක ගැටපද 118) 8. **එසේම උන්වසන ගෙයි වාසල් වඩ්යමඩහි වසනා දෙවතාදුද**...... .........වස්යටෙහි පටන් ගෙමැද දක්වා (සඩමීාලංකාර දෙවත අම්බාමාත්‍ය වස්තුව) 9. ඔසරකොති අතාගිඥකො විහාරෙ වංසංදත්වා තතොදණ්ඩකො ඔස්සාරෙත්වා සතංජදනපමූඛං (විනය අටුවා චුල්ලවග්ගවණ්ණනා සෙනාසනගගාහ විතිවජය) 10. පිඨිවංසෙවා, වසෙළ පාශීවයෙහි හෝ (කඩබාවිරණී ගැටපද 72) 11. ප්‍රාග්වංශ, (යාගද්‍රව්‍යයන් තබන ඉදිරිපැත්තේ ගෙය) 12 වංශෘපෘෂටාසථානගෙ-හොර්ධව කාෂ්ටෙ වෙණෙඟණෙකුලෙ (රජුවංශටිකා 7-39) 13. අන්තඃජිංශ (අන්තඃපුරය) (කාදම්බරි 181 පිට) මේ සියල්ල ගොනුකොට සලකනවිට පෙනෙනුයේ පිඩිවංස ශබ්දයෙන් වහලත් ගෘහයත් දෙකම කියවෙන බවය. වී කොටිම් ආදිය සදහා ප්‍රධාන ගෙයට පිටින් සාදනු ලබන කුඩා ගෘහය පිඩිවංස ශබ්දයෙන් මෙහිදී අදහස් කරන ලදී. සියන්,

පියස්ය; (ඡදන-සියන-සියන්) කවචර' කුණු; (කවචර-කසල) කසල යනු කසල ශබ්දයෙනි. කසල ශබ්දය සඞකාර ශබ්දයෙනුත් ආහැකිය. **නලදෙර**, ග්‍රාමවාරය; පාලියෙහි වාසස්ථානවාචක නිල ශබ්දයද දෙමළයෙහි ග්‍රාමවාචක නිලශබ්දයද ප්‍රසිඞය. නල යනු එයිනි. වගාකළ ඉඩමුදු නිලශබ්දයෙන් කියවෙයි.

**ඉඳුල්උළු**, ඉඳුල්දිය; (උච්ජිඨ - උච්ට - උජුල - ඉඳුල - ඉඳුල්) (උදක-උළය-උළු) (දුව ලැව්) ආදිය සිඳුවූ සැටිද සලකනු. **ලක්-ගොග**, කල්ලිගැසීම; **අභියොග**, යෙදීම; **සුවට**, මනාකොට වස්නාලද වැසි, ඇතිවෙයි; **පැත්නී**, පැමිණී තැනැත්තිය; **ලහ-බත්**, දිනපතා එක භික්ෂුවකට දෙන දනය; එබඳු දන කිපයක් කිපතැනෙක ඇතිවූ විට එක භික්ෂුවක් නිබඳවම එකතැනකට යනු වළක්වනු සඳහා ලහ බෙදනු සිරිති. පිණ්ඩපාතය ඇති ස්ථානයෙහි නම සටහන්කළ පත්‍ර ඉරටු පතුරු ආදී යමක් භික්ෂූන් අතර බෙදීම ලහ බෙදීම වෙයි. ඒ ලහ බෙදීමේදී තමාට ලැබුන සලාකයේ තිබෙන නම අනුව නියමිත ස්ථානයට ගොස් භික්ෂූහු පිණ්ඩාහාරය ලබාගත්හ. කාලියක්ෂණීය නැබු පිණ්ඩපාතයත් එබන්දක් හෙයින් එයත් ලහබත් නාමයෙන් ප්‍රසිඞ විය.

## 4. කාලියක්ඛිනියා වත්ථු.

---

**කොසඹෑයෙහි**, කෞශාම්බි නගරයෙහි, කුෂාම්බ නම් ඍෂි-යකු විසූ හෙයින් ඒ නම ලද්දේය. **සිරුරුවළඳ**, ශරීරකෘ-ත්‍යය, මලපහකිරීම; **දුකුළු**, දුක්කට ඇවැත්; (දුක්කට-දුකට-දුකුළු) **වනබරතෙරුන්**, විනයධර තෙරුන් විසින්; **කියූ**, කියන ලද්දයි; "**හොනාවුසො ආපත්ති**" යනු ඒ කියනලද්දවේ. **ලද**, ලබ්ධිය-දෘෂ්ටිය; **උබෙව්නිකම්**, උත්ක්ෂේපනීය කර්මය, වරද කළ භික්ෂුව භික්ෂු සමාජයෙන් ඉවත්කිරීම උත්ක්ෂේපනීය කර්මයයි. (උත්ක්ෂේපනීය-උබෙවුනිය-උබෙව්නි) **කම් නොකියූ සෙයින්**, මෙහි 'කම්' යනු කෙළේය යන ක්‍රියාව හා සම්බන්ධවේ. විනයෙහි නොකියූසේ ඤත්ති නබා කර්මවාක්‍ය කියවා උත්ක්ෂේපනීය කර්මය කෙළේය. යනු අර්ථයි.

**ඤත්ති**, සඞ්ඝකර්මය කරන්නට ප්‍රථමයෙන් ඒ බව සඞ්ඝයාට දැන්වීම. **කම්වදන්**, කර්මවාක්‍යය; (වචන-වජන-වදන්) **අඩ්ඩ-මාසයෙහි**, අඩමසක් පාසා; **දුමුවිසඹි දළවිසඹියෝ**, දැකිම් මාත්‍රයෙන් මිත්‍රවූවන් හා දෘෂ්ටිමිත්‍රයෝ; (දිඨ-දිට්ඨ-දුටු) සං, විශ්‍රම්භ, පාලි, විස්සම්භ-විසබ-විසඹ-විසඹි) **අලොළ**, කාලබලය; "**උකොකප**

**ඛානං ධම්මිකෙනවායං කම්මෙන උක්ඛිත්තොති ලද්ධිං"** උක්ඛෙපනීය කර්මය කළවුන්ගේ, මෙතෙමේ දැහැමි කර්මයෙන්ම ඉවත්කරන ලද්දේය යන ලබ්ධිය, **උක්ඛිත්තානුවත්තකානං**, ඉවත්කරනු ලැබූ භික්ෂුවට අනුවර්තක වූවන්ගේ; **උක්ඛිත්තය** යන බැහැරකරන ලද්දේය යන; **උක්ඛෙපකයන්**, ඉවත්කළ භික්ෂූන් ගේ; **කුපිතකෙයහි**, ශීඝ්‍රයෙහි; **ආමෙණ්ඩිතයි**, පුනරුච්චාරණයයි. **ආසෙවත්වා** ආදීනව; **පවුරුන්**, පවාරණ; **අතුරුකොට**, මැදි-කොට; **නීහරණ**, පැහැරගැනීම; **සාටකැටලිහිණ**, කිජුදමු කැටකිරිල්ලිය; **සාට** ශබ්දයෙන් සිසාතලද යන අර්ථයද ගත හැකිය. එහෙත් මෙතනට කිජුදමු යන අර්ථය වඩාත් ගැළපෙන්-නේයි. **ලණ්ඩංසාටෙති** (බෙට්දමයි) ආසාටිකංසාටෙති (ඉහද දමයි) යනාදිය සමගත් සසඳා බලනු.

**"ලාපසකුණයොනියං, ලාබවටු පක්ෂියොන්හි නොහොත් කැටකිරිල්ලියොන්හි ගොම වැරැපි ලිහිණියෝ යෙත්මෙ"** යනු ජාතක ගැටපදයි (සකුණග්ඝිය ජාතකය) **පත්නවාළයහි**, ජාතක පාලියෙහි පංචක නිපාතයෙහි; **එක්නවායෙහි**, එකක-නිපාතයේහි; **උපගමනාපගමන අභිණ්හ ඕවාදදී කාමුලුවෙ-හෙස**, උපගමන ලඟට එළඹීම, **අපගමන**, ඉවත්වයැම; අභිණ්හ ඕවාදදී නිතර අවවාද දිමාදී කායමූලික වෙහෙස, (උස්සාහ-උසහ-උසා) වූවිරි, පෙර සිදුවූ; (භූත-බූය-වූය-වුය්-වූ,) (පූර්-පුරි-වුරි-විරි) (භූතපූර්) **පරිසමාප්තියවට**, අවසානාර්ථයෙහි වැටේ; [දීඝිති-දිග්හිටි] **බවස්හි**, අවකාශයෙහි, [ඕකාස-ඔවස-ඔවස්] **ගොපිදඬුගහණ**, තොගල දඬුමුගුරු ගැනීම, **පි**, යනුපිය හැරුම්හි **ද**සින් නිපන් අතීත කෘදන්තයි. **"සුහරණො සුරතො නාසසහාවොසොරච්චං"** යහපතෙහි ඇලුනේ, සුරතනම්ද ඔහුගේ ක්‍රියාව සොරච්චනම්ද වෙයි. හෙමලක්සිල්වේ, **"හෙබලත්"** යනුත් පාඨාන්තරයි, 'හෙබලත්' යනු ශුද්ධ පාඨය වියහැකිය. හෙ, ඒ සුරතබව; බලත්, කුමක්දැයි බලන කල්හි; සිල්වේ යනු අර්ථයි.

**ඝිහිම්**, ඉවසීම; **සහ**, ඉවසුම්හි ධාතුයි. **නමහමගත් අවිහි-ඝිහිම්**, තමා මරනු පිණිස ගත් අවි ඇත්තහු කෙරෙහි ඉවසීම; තමහට ගත් අවි යමෙකුන් විසින්ද හේ තමහට ගත් අවිනම්. **සහවනුවහු**, ඉවයන්තෝවවු; **"විසෙසෙන අපකඨොවුපකඨො"** විශෙෂයෙන් බැහැරවූයේ වූපකඨ නම්, **අනාමන්තකථා**, නො අමතා; **අනාපුච්ඡකා**, නොවිචාරා; **වසනුවා**, වසන්නහු විසින්; **මුවළැවුහි**, **මාගවනයෙහි**; මෘගයන්ගේ අභය භූමියක්වූ හෙයින් ඒ නම යෙදුනේය. (දව-ලැබු) **"සමග්ගභාවෙන උප්පජ්ජනකං පීතිසොමනස්සං සාමග්ගිරසො"** සමගි බැවින් උපදනා ප්‍රීතිය

හා සතුට සාමග්‍රීරස නම්. "සමග්ගා න අහුම්හ" සමගිනූනෙමු; වතළෑවු, වතසඞ්ඛ්‍යාතදවය; සංඋපසංකමි, එයට ගියේය "යෙන මග්ගෙන අගමාසි, ඒ මගින් ගියේය; තස්මිං සාමග්ගිං සමෙන්තෙයොනසති" උන්වහන්සේ සමගිකරන කල්හි; උවසරමත්‍ර-වකුද්, සත්කාර මාත්‍රයකුත්; නහඹ, තරුණ; [අපරාධ-අවරජ-වරජ] අවහාසං, අපට; [උපඨාන-උවටන-වටන] [පොතක-පොවු) දිසන්, දිය ශබ්දය කම්විබත් බුහුබස් ගත්තැනි, නැංගාහු නැංගාවූ මගේ; ගහනුගෙහ්, ගපන්නාහු: මුළින්, සමූහයෙන්, වටාවක්හු, උපස්ථායකයකු; (උපට්ඨාපක-උවටවය-උවටවා-උවටා-වටා) එලන්, එල ශබ්දය නම් විබත් බුහුබස්ගත්තැති, උවසර, සීමාව; ගමේ අනතිම ගේ ළඟ සිට මැදුම් පිරිමියක්හු ගැසූ ගල වැටෙන තැන් දක්වා ගාමූපචාරය වෙයි, නරසාදී, වලස් ආදී; වාලමුවන්පරිවත්, වනමෘගයන්ගේ උවදුරු; (පරිපන්ථ-පිරිවතු-පිරිවත්) සැහැත්ව, උත්සාහවත්ව; (උස්සහනතාහුඛා-උසැහැත්වැ-සැහැත්ව) වැරහනාසිඛිල්වස්, වීර්‍ය අඩුනොකොට; සෙවිත, සේවය-උපස්ථානය; "අභිසමාචාරිකා අභිසමාචා-රො" අභිසමාචාරො එව ආභිසමාචාරිකං, උතුම්. හැසිරීම අභිසමාචාරනම්ද අභිසමාචාරයම ආභිසමාචාරිකනම්ද වෙයි සවාර්ථයෙහි ණික ප්‍රත්‍යයයි. පොසෙහාහුවකැසි, හැකි (පොසෙහා සත්) සෙදයකැය.

දඬුසෙල්බෑ, දඬුවක එල්බ තිබෙන; කණ්ණිකෙන්, කණු මවත - උලෙන්; වනවිදගියා, සිදුරුවී ගිය - පසාරුවී ගිය-ධම්කියා, ධම් කථා; [කථා - කයා - කියා] එකලා, තනි එකනක-එකත-එකල-එකලා] විවෙකාළුවා, විවෙක කැමැත් තනු කරා; [කානනක-කළු] ගණනැගණින, ගණසඞ්ග තික. යෙන් යුකතව; [සඞ්ගණිකා-සැගණික-සැගණිය-සැගණි) ඉඟි අදහස-කැමැත්ත; [ඉංගිත-ඉඟිය-ඉඟි] නොදින්, නොදී යත් නෙහි අනාතලොපයෙන් සිඩය; නාගවගෑ, ධම්මපද 23 වන නාග වර්ගයෙහි; පලවැල, කුඩා මහත් ගෙඩි; (ඵලාඵල-පලවැල) (පරිභොග-පිරිභොග-පිරිභො) විපාකාවරණයෙන් ආවූන බැවින්, තිරිසන් යොනිහි ඉපදීම මෙහි විපාකාවරණය වය. එයින් ආවූන බැවින්; ඉත්වම්භූත ලක්ෂණයෙහි තෘතියා, මූලින් නො පැවැති තත්ත්වයකට පසුව පැමිණීම [වෙනස්වීම] ඉත්වම්භූත නම්. ඒ ඉත්වම්භූතය ලක්ෂණ කොට ඇති තෘතියාව ඉත්වම්භූත ලක්ඛණ තතියාව වෙයි. සාධනනම්, හෙතු; මමත්ව, මගේය යන හැඟීම; යමාමාති, නැසෙන්නෙමුයි;

6. කොසම්බෑ වත්.

අනුපුබ්බෙන කසිරමානාකථා, පිළිවෙළින් කරනු ලබන කථාව; වට්ටජ්ඣාසයහට, සසර පිළිබඳ අදහස් ඇත්තාහට; විවට්ටජ්ඣාසයහට, නිවණ පිළිබඳ අදහස් ඇත්තාහට; දුට්ඨධම්ම සම්පරායිකි, මෙලොව සහ එලොව; කම්මහෙතු, කර්ම හෙතුවෙන්; උක්කමෙමි, ඉක්මවමි; බැලවැ; කුලීකාරියක්ව; දුවැත්තියක්, පුලුස්සන්තියක්; නැසිනී, සැඟැවුනී; ගම්වලඳුහට; ගමේ ප්‍රධාන මූලාදෑනියාහට; භදන්තු; සවාමීන් වහන්සේගේ; තලගුලා, තල කැවුම්; (58 සුධර්මසථවිරවත්‍ථු බලනු) පියනා, ප්‍රියනාක්දෙය; වැජිය යුතුවෙර්, බැහැර කල යුත්තාහු වෙත්; [වජ්ජිතුං-වජ්තු-වජ්ත-වජිය-වැජිය] තුහුබඳිමින්, ලුහුබඳිමින්; සිරිවත් වරනුවවස්, උව දුරැ දුරැකරනු පිණිස; "එවං මං ජනො සමභාවෙස්සති" මෙසේ මට ජනයා සම්භාවනා කරන්නේය; "එවං මෙගුණාපාරිපූරිං ගමිස්සන්ති" මෙසේ මගේ ගුණයෝ සම්පූර්ණ බවට යෙත්; පලස්කුලාරම, පලසින් සැදූ කුඩාරමව; කුලාරගෙ, කූටාගාර සඞ්ඛ්‍යාත ගෘහය, සජාය්, සදු (විතක-සියන-සියය්-සියා) සියායෙන්, විතකයෙන්; හයන, අදනා; අක්ෂෙන්, සඞ්කුයෙන්; (අකු + එන්) සංකු-හකු-අකු) යත්, කියත්හොත්; කැඩි කැඩි කොට, කුඩු කුඩු කොට; අසොබ, අසුභ; හැපි, හටගත්; [සණ්ඨිත-සැපිය-හැපිය-හැපි] නොමැලයි, මලානික නොවූවා; (මිලානා-මැලැයි) නොකැලකිළි කලානත නොවූවා; ඉපිණි, අති ප්‍රණීත; [අති-අති-ති-ඉ] [පණීත-පණිය-පිණිය-පිණිය්-පිණි] හැකිළියෝ, [හැකිළි + ඕ] වකුටුවූහ; [සංකුචිතා-හැකිළිය] නොපිරියනත ඝරනුවැ, [බලා] ඇතිවීමක් නොකරන්නක්ව [අනෑපන කරව] සෙහනු, විනාශය; සෙ ධාතුව ක්ෂයවීම් විනාශවීම යන දෙ අර්ථයෙහිම පවතී. (ක්ෂය-කය-කිය-හිය-සෙ) අනිස්ලවහු, එකාන්තයෙන් අනිත්‍යයහ; (වත-වල-ලව) සෙබුමුසබරහු, කාම රූප අරූප යන තුන් භූමියට අයත් සංසකාරයෝ; උදයවයපියෙව් ඇතියහු, ඇතිවීම හා නැතිවීම සවභාව කොට ඇත්තාහු වෙත්; අනුපා, නො ඉපදීම; (අනුප්පාද-අනුපය-අනුපය්-අනුපා) වරහසු, ඇවිටේරිය, කැප්පෙපියා යයි ද කියත්.

සගිසෙර, සඛසසෙළර; හගනාසෙල, අලුත් සඛසයා සිටින කෙලවර; (තවක-තවු-තව්-තා) සගුන්, සගයන් - බාලයන්; සෙලපිළින්, සුදු වස්ත්‍රයෙන්; නොරැඳුනායෙන්, පඹු නොගැසූ හෙයින්; නිවැසිවමෙ, උපසපන්ව වසක්වත් නොසිටම; බිහිලි, බහුල කොට ඇත්ඉත්; පවසින්කෙළැ, ප්‍රපාතයාගේ කෙලැවර; (පපාතන-පවසින-පවසින්) ඉත්ථිපුරිසාකාරහා සුභාකාරගහණ දෙජ්, ස්ත්‍රී ආකාරය (ස්ත්‍රියක් බව හඳුන්වන පයොධරාදිය) සහ

පුරුෂාකාරයද (පුරුෂයකු බව හඳුන්වන ලකුණු) සුභාකාර ග්‍රහණයද (අවයවයන් සහ ක්‍රියාවන් ශුභයයි ගැනීමද) යන දෙක; නිමිත්තග්ගාහ, නිමිත්ත ග්‍රහණය; කෙලශොත්පත්තියට මූල කාරණය වන හෙයින් ස්ත්‍රී පුරුෂාකාරයන් සහ සුභාකාරය නිමිත්ත නමි.

පුනප්පුනං පාලකරන බැවින්, නැවත නැවත පහළ කරන හෙයින්; [පාකට-පකට-පහල-පාල) ශරීරාවයවයන් හා කෘත්‍යයෝ අනුව්‍යඤ්ජන නම්හ. ඔවුන්ගේ ග්‍රහණය අනුව්‍යඤ්ජන ග්‍රහණය වෙයි. පිරිශේජනේ, සෙවීම්; යපෙන පමණ, යැපීමට සෑහෙන පමණ; විසජ්ජන්, ඉවත් කිරීම, නුහන, නැති ගුණ පෙන්වීම; තුන්විතක්, කාම, ව්‍යාපාද විහිංසා යන කල්පනා තුන; "කුච්ඡිතංසිදතීති කුසීතං" පිළිකුල්ව හිඳිනුයි කුසීත නමි. සම්පදන්වැර, සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යය; හෙලා, බිම දමයි. ණිඛිය; වගා; (සණික-සණිය-ණිහිය)

### 6 මහාකාල මහ තෙරුන්වත්.

ලබු, ලාභය; (ලාභ-ලබු) නිවහලු, පිහිට නැත්තෙක් වෙයි. නිප්පච්චසො යනු නිප්පච්චයො යි විය යුතුයි. (උපකාර-උවහලු-වහලු) නිපූජීයි.. හා යනු දකාරාර්ථයෙහි නිපාත. (ඉසා-ඉහා-හා) සැපයුණු, ප්‍රමාණවත්විය යනු අර්ථයි. බජන, පැසෙන-මෝරන (පාචන-බජන) දිශ අරන, දිය ගෙනෙන; පූරණ, පූරනය වන ශොක විනෝදන, ශොක දුරු කිරීම; සහය්, සහාය (මිත්‍ර) වෙයි. මණික නම් මහසැළියයි නොසිලියනුය, නොසැලෙන්නේ වෙයි. සිලිය යනු චලිත ශබ්දයෙන් ආදේශය (චලිත-සලිය-සිලිය) 'යස්ස ඉදමාති වදනතා බහුතරා නොසම්මතෙන ඉදමාතී කපි, කාය කථාය" යමෙකුට දෙමුයි කියන්නෝ බොහෝ වෙත්ද ඔවුන්ගේ මතයෙන් දෙමුයි කී කථායෙන්; වදුරා, සංවිධානය කොට සකස් කොට; තුල්මස්, සන (ථූල) මස්; (ථූලල-තුල-තුල්) ජසරා ඉබේ හටගත් විල්; (ජාත-ජය-ජය්-ජා-ජ) ඛැණෑ, සාරු; (ඛණිත්වා-කණිය-කැණිය-කැණෑ) අඩයම්, විසිතර අතින (දමා ගසන) හුල් විශෙෂයක්; (අඩයසි-අදයටි-අඩයටි) හිසින්වට පෙරවැ, හිසින් යුක්තව ශරීරය හාත්පස පෙරවගෙන; "සහසී සෙන ගසිසං සරීරං ජාදයිත්වා," හිසින් යුක්තව (හිසත් සමග) ශරීරය වසා; කිසිවක් යන්නානු, කිසියම් තැනෙක්හි යන්නානු; පිරික්සන්නම, සොයන්නට; පිළික්මා, පස්සට පැන; (පටික්කමිත්වා-පිළිකමය-පිළික්මය-පිළික්මය්-පිළික්මා) වැලගී, වැලැක්විය; (වැළකී වැලගී) වැරැජීම්නම්, විරොධයක් කෙළෙම් නම්; නොලැඹෙන් නොපැමින් විමෙනැයි, අනුපායෙන් නොපැවත්විමෙන්;

### 7 දෙව්දත් තෙරුන්වත්.

(උපකරණ-උවහරණ-උවාරණ) අඞ්ග ප්‍රත්‍යඞ්ග, ශරීරයෙහි ප්‍රධාන කොටස් හා අප්‍රධාන කොටස්; කලි, කාලයේ. නාම ධාතුක ක්‍රියාය. පිහුවූ, පිහිටි; (පතිඨා-පිහුටු) ජනෙනති, මව්; පස්වවන, පොෂණය කරන; පියදූ, මෙහෙයූ; (පයොජිත-පියොදිය-පියදූය-පියදූ) රූන්, රූපයන්; රූ ශබ්දය කම්විබත් බුහුබස් සත් තැනි. මෙසඳබාන්, මේ තෘෂ්ණා බන්ධනය; සද, යනු ඡන්ද ශබ්දයෙහි. (බන්ධන-බහන-බාන-බාන්) පරිච්ඡින්නාදිහි, විනත නාථයෙහි; අනාගාරයෙන්, නිබ්බුත ශබ්දයට මුලින්; "යස්සායං ඊදිසො පුත්තො නිබ්බුතා නූන සා මාතා" නිබ්බුතො නූන සොපිතා, යම් ඇත්තන්ට මෙබඳු පුතෙක් වෙයිද ඒ මවුපියෝ නිවුනාහු වෙත්; නැඳය, නැන්දගේ; තිසය, සරසවිය, බගිනිය, වෙසමිණිය යනාදිය සමගද සමකර බලනු. මෙහි 'ය' විබත පාලි 'යා' යනුව මැයි. [විප්පකාර-විපුවර] උකැටි, කලකිරුන; (උක්කණ්ඨිත-උකැටිය-උකැටි) පණ්ඩරපව් පාත්හි, පාණ්ඩව පර්වත ප්‍රාන්තයෙහි; (පණ්ඩර-පඬර) (පාද-පාත-පාත්) පිළිලද, ප්‍රතිලබ්ධ-ලබන ලද; "අපරිගතනං කරිත්වා" නොසැහුනක්-තෘප්ත නොවූ වක් කොට හෙවත් ආලාර උද්දක දෙදෙනා කෙරෙහි මග පල වෙසෙසක් නොදක ඔවුන් කෙරෙහි ආදරය නොකොට; කවි, කවුක; (කටුක-කටු-කවි) අභිනීහාර, ප්‍රාර්ථනා; ඌරුබඩාසන බඞපර්යඞ්කය; පසනොව, ප්‍රත්‍යය (හෙතු) නොව; නොමුසිද, නොමිදේද; (මුඤ්චති-මුසියි-මුසිය්-මුසි) ලොවිසිත්, ලෞකිකසිත් (ලොකික-ලොකිය-ලොවිය-ලොවි) ආශ්‍රවශෙෂ, ඉතිරි කෙලෙස්; නොමුතු, නොමිදුනේය; පෙළෙ, එල ශබ්දය පළමු විබත්ගත් තැනි. නොගුණ බැවින්, ඛීණ නොවූ බැවින්; නොසෙජ්ජෙන හිරුහිමෙ, හිරු අස්තයට ගිය කල්හිම; සම්පජ්ජන (පැලවිම්) අර්ථයෙහි යෙදුන 'හැප්ස' ධාතුව කඩ්ඩාවිතරණි ගැටපදයෙහි 72 වන පිට බැලීමෙන් දතහැකිය.

නොඑප්සෙන (අමා වතුර) නොඇප්සෙන-නොහැප්සෙන (ස. රතනාවලිය) යනුත් පාඨාන්තරයි. නොපෙනෙන යනු අර්ථයි. [සම්පස්සන-හැප්සෙන) අයුහව අතීතභවය; (අතීත-අතිත-අයිය-අයුය-අයු) පූබ්බබූ නිවස්ඥණ, පුබ්බේනිවාස ඥාණය හෙවත් පෙර විසූ තත්වය දතහැකි නුවණ; රූව අරමුණු අලුකරන දිවසක්ඥණ; රූපාරම්මණය ආලොක කරන දිබ්බචක්ඛු ඥාණය; මේ චුතූපපාතඤාණං' යනුව තේරු සැටිය. සත්ත්වයන්ගේ චුති උත්පත්ති දෙක දතහැකි ඥුවණ චුතූපපාත ඥාණය නම්. බමුන් බම්නව පසවන ආකරකි, බම්යන් බම්යන්ට ප්‍රත්‍යය වන ආකාරයෙහි; (ආකාර-අයර-ආර) පටන් පූවරුමණකි, පඨාන ප්‍රකරණ

යෙහි; ඨානාඨාන, (ඨාන + අඨාන) කරුණු නොකරුණු දන්නා නුවණ; යම් ධර්ම කෙනෙක් යම් ධර්ම කෙනෙකුන්ගේ උත්පත්තියට හේතු වෙත්ද ඔවුහු ඨාන නම්හ; යම් ධර්ම කෙනෙක් යම් ධර්ම කෙනෙකුන්ගේ උත්පත්තියට හේතු නොවෙත්ද ඔවුහු අඨාන නම්හ.

නිය්‍යානධම්ජානනබැවු, නීය්‍යානික (නිවනට පමුණුවන) ධර්ම යන් දන්නාබව; අනන්තරයිකරුධම්' ස්වර්ගමොක්ෂ දෙකට අන්තරාය කර ධර්ම; විසරුබවු, විශාරදභාවය; (විසාරද-විසරුව-විසරු) ආවේණිකධම්, පරපුරෙන් පුරුදුකරගෙන ආ උතුම් ධර්ම; සතාසනු-සත්සතිය; (සත්තාහ-සතහ-සතු) (උස්සහ-උසහ-උසා) ආශයානුසයඤාණ, සත්ත්වයන්ගේ ආශය (චිත්තසන්තානය)හා අනුසය (කාමරාගාදී ථාමගත කෙලෙස් සත) දන්නා නුවණ; ඉන්ද්‍රියපරෝපරියඤාණ, විනෙයජනයන්ගේ සද්ධා විරිය සති සමාධි පඤ්ඤ යන පස් ඉඳුරන්ගේ උස් පහත්කම දන්නා නුවණ. ආලාරකලම් හා උදුරම්පුත්, ආලාර නම් කාලාම පුත්‍රයා හා උදක නම් රාම පුත්‍රයා; කාලාම පුත්ත, රාමපුත්ත යන දෙශබ්දය ගොත්‍රවාචක වේ. (උදකරාම-උදකරම-උදුරම-උදුරම්) පධනා, ප්‍රධාන භූමියෙහි; යොග, තපස්; අනුසැරැ, සිහිකොට; (අනුස්සරිත්වා-අනුසරඵ-අනුසැරැ) අධියරැ, ප්‍රාර්ථනාව; (අධිකාර-අදියර) ඉසුන්, සෘෂීන් මුවලැවුයි, මුවවනයෙහි; (දව-ලැවු) ඤණසක්, (එකබුපාලවිජු 9 පිට බලනු) විසෙනිදවස්, පක්ෂය පිළිබඳ පස්වන දිනය; නිබිඳු කළකිරීම; (නිබ්බිද-නිබිඳු) නුහු, දසදහස; (නහුත-නුහුය-නුහු, මනැයි, ප්‍රමාණයකැයි; ආදීනොබඩා ආබඩා, මූලපටන් බඳනා ලද්දහු; නොසුපච්චාබඩා, ඔවුන් කෙරෙහි නැවත නැවත බැඳුනාහු; පෙරහැර, සත්කාරය; ගන්නහම, ගනු පිණිස; රියසියෝ, රථසියයක් සියෝ යනු සිය ශබ්දය ප්‍රථමා බහු බස් ගත්තැනි; ගලග්හි, කඳු මුදුනෙහි; (කල්ලු-ගලු-ගල්) සමජ, නෘත්‍ය පවත්වන- විශේෂයෙන් නොයෙක් නෘත්‍ය පවත්වන ස්ථානයද, නෘත්‍ය යද යන දෙ අර්ථයම සමජ්ජ ශබ්දයෙන් කියවෙයි. සමජය වර්ණාන සරිතස් නම් ක්‍රීඩාවට සමානවිය හැකිය.

පියවිසින්, මෙහි ප්‍රකෘතිය පාළි පෙකඛ විසූක යන දෙ ශබ්දයෙන් ආ පිය විසි අනුව යයි පරණවිතාන මහතා බදුලු ලිපියට කළ විවරණයේදී කියන ලදී. "ගම්හි පියෙයිසි වැසිතැන දන්වූ තැතින" යනු බදුලු ලිපි පාඨයි. (ඇ. ශෙ. 3-75) එහෙත් මෙහිලා ශුඩ පාඨය සේ සැලකිය හැක්කේ 'පියවිගින්' යනුවය ප්‍රකෘති හෙයින් හෙවත් සිරිත හෙයින් යනු අර්ථයි. සාමාන්‍ය සමජ්ජය ගිරග්ගසමජ්ජයවූයේ කඳුඋඩදී කළ හෙයිනි. ඤාණනුපරිවාගිය

බැවින්, ඤාණය මෛරීමට ගිය හෙයින්. (පරිපාක-පරිවය-පරිවිය්-පරිවා) විවටගැමිණි, විවට්ටගාමනී-නිවන්කරා යන; වාසියැ-නොසැපිරෙනුයෙහිමෙ, සියවසක් සම්පූර්ණ නොවූ කල්හිම; හරනේ, ගත යුතුය. 'පඤ්ඤායන්තං පණ්ණත්ති නාම පණ්ණත්ති එතෙසන්ති අපණ්ණත්තිකා, තෙසංභාවො අපණ්ණත්තිකභා-වො' පෙනීම පණ්ණත්ති නම්ද ඒ පෙනීම නැත්ති අපණ්ණත්ති-කානම්ද එසේ නොපෙනීයැම් බව අපණ්ණත්තිකභාව නම්ද වන්නේය. මුස්නහව, මිදීම පිණිස: හෙබලත්, ඒ මොක්ෂ ධර්මය කුමක්දැයි බලත්හොත්; මගහා මගපුහා පිළිවැත-නිවන් කියනුමේ, මාගීය හා මාගීයට පූර්වභාග ප්‍රතිපදාවද නිවනද .කියන්නේම වෙයි. සිංහාවලොකන න්‍යායයෙන්, සිංහයාගේ බැලීම් නීතියෙන්, සිංහයා ඇතට දුවගොස් තමා මුලින් සිටි ස්ථානය දෙස හැරී බලන්නාක් මෙන් සමහර වාක්‍යයෙක්හි මුලින් කී පදයක් අග පදය හා සම්බන්ධවන්නේය;

"මෙපිපනයනාඑවං විනනසිංසු කිං එත්ථ ඔලොකෙතබ්බං අත්ථි, සබ්බිමෙ අපසනෙන වයස සතෙ අපණ්ණත්තිකභාවං ගමිස්සන්ති, අමෙහයි පන එකං මොක්ඛධම්මං පරියෙසිතුං වට්ටති -පෙ- අනන්තො මොක්ඛධම්මං ගවෙසිතුං වට්ටතීති" මේ වාක්‍යයෙහි මුල පෙනෙන (චිනනසිංසු) යනුව වට්ටතීති චිනනසිංසු'යි යොදනලද්දේ සිංහවිලොකන න්‍යායයෙනි, තුටු පහටුයේ, තුටුපහටුවූයේ. නොසියමනා සැහැවියේ, තමාගේ නොවත (නොසතුටු) සිත් ඇතියකුගේ සවරූප ඇත්තේ (සකමන-සියමනා) පීසොම්නසින්. නොගන්නාලද සිත් සැ-හැවියේ, ප්‍රීතියෙන් හා සතුටින් යුක්තව නොගන්නා ලද සිත් ඇත්තකුගේ සවභාව ඇත්තේ! පරබ්‍යාවෘතාර්ථ, අනුන් කෙරෙහි නොගොත් අන්තැනෙක නොඇලීම් අර්ථ; !ලැබැවුයි, ලාභයෙහි (ලාභ-ලැබැහු-ලැබැවු) ලැජ්ජ, ලබ්ධිය-ඉගැන්වීම; (ලද්ධි-ලැජි-ලැජ්ජ) නොකියේකුදු, නොකියනලද්දකුදු; සංකථා, සාකච්ඡා; අනන්මන, ඔවුනොවුන්; ඉළියනලදය, සොයාහන්නාලද්දේය; පුවරකඩ, ලැලිකැල්ල; කච්චිආවුසො ඛමනීයං,। ඇවැත්නි සැපසනීපහේම කොහොමද? ඔවප් යනු 'ඔහස්' යී වියයුතුය. ඔභාසය-කානාතිය යනු අර්ථයි. නොසරස් ආසෙයසිම්, අලූත පැමිණි යෙමි. (නවිරසං-නොසරස්-පිරියුණුවූ, පරිපූර්ණවූ; (පරිපුණ්ණ-පිරිපුණු-පිරිහුණු-පිරියුණු) සොයාපැන, සොතාපත්ති; නො උප-දනහව, නො ඉපදීමට "තුවෙප අසාරෙසමයෙ විවරථ" හිස්වූ-අසාරවූ-ලබ්ධියෙහි හැසිරෙහුය; එබැවි, කිණිස්සක්බවට;(උළුඛක-උළුක-උළුව-එව-එව්-එැ-එ)

**උපාත්තවිෂයපංචමී**, පූර්වක්‍රියාවක් අධ්‍යාහාර කිරීම විෂය කොට ඇති පංචමියයි. "වාපියා අපක්කම්ම වාපිභාවතොමුඤ්චිත්වා උදකුම්භගහාවප්පත්තිවිය" සැළිබැවින් මිදී කිතිසසක් බවට පැමිණීම මෙන්; වාරක, භාජන-මූඩි යනාදී අර්ථයන්හි යෙදේ. (පැතෙහු පැතෙවු) ඤාක්ඛ්‍යාතය, මතාතොට දෙසනලද්දේය. **පස්උවදන්බඳුහ**. පඤ්චූපාදානසක්ඛන්ධයාගේ; (උපාදන උවදන-උවදන්) **අනුපා**; අනුත්පාදය; (අනුප්පාද-අනුපය-අනුපය්-අනුපා) **නිවත්**, උපන්; (නිබ්බත්ත-නිවත-නිවත්) **සැර**, චරිතය; (චරිත-සරිය-සැරිය-සැර) **පහන්**, ප්‍රභාණය; ඤැණහ, ඤැණයාගේ **සැෂැවිඝයුතු**, ඉවසියයුතු හෙවත් විඳියයුතු, සහ ඉවසුම්හි ධාතුයි. **මහජ්ජැයක්**, මහත් දෙයක්; **සල්හුවැ**, ඉක්මණීන්; **හූරක්හු සාලතැනින්**, ඌරකු විසින් (සාව) මඩකල තැනින්, **නිපයනු වම**, නිපදනු පිණිස; **සජන**, අලංකාර කිරීම; **එවැනි සැපසුම්** එවැනි අයුරු; **සෙගි**, සෙවනෙහි; **උක්කිපිත්වාඛායනං උජ්ඛායනං'** පහත්කෝට සිතීම උජ්ඣායන නම්.

**අගසවුවනට නිසි පුරෙ පැවිජිසන්තබා=** අගසව්වනට සුදුසු පෙර පැවිදිවූ භික්ෂූන් සිටියදී; **දෙන්නෙන්**, දෙන තැනැත්තේ; **පිළිවිජුන**, අවබොධකරණ; (පටිවිජ්ඣන-පිළිවිජුන] **අසවුදු**, අග්‍ර ධර්මය පැතූ පරිදි අසන්නහුද; (අසහුද-අසවුදු) **අත්නොලා**, අත නොතබා; **ඛැන්කොට බඳනාලද**, කරල් ඉහලට සිටින සේ බඳනාලද; සිංහල කරල් ශබ්දය (කරාල) යී පාළියට පෙරළෙයේද නැතහොත් පාළි කරාල ශබ්දය කරල්'යී හෙළුවට ආ යේදැයි සොයනු. කණිකා ශබ්දය වුවද 'කරල්' යි හෙළුවට ආහැකිය. (කණ්ණිකා-කරණිය-කරළිය-කරළි-කරළ්) **පුළුවකල්හි**, (42. මහසුබ් මහතෙරුන්වත බලනු.) පුළුව යනු එලිත ශබ්දයෙන් මෙන්ම පුළුත ශබ්දයෙනුත්, ආ හැකිය **දනකලකපත කල්හි**; (දායන-දයන-දන-දාපියා, කපාදම්; **කොල**, හොයම්; "කිටඨසම්බාධ" යනාදී තන්හි පෙනෙන ; කිටඨශබ්දයෙන් කොල යනුව ආහැකිය. **වෙණිවටනකල**, වෙණි අඹරන කල්හි; **නිගෙන**, ගෙනයන; **අසිරා**, අධික; (අතිරෙක-අසිරය-අසිරය්-අසිරා) **සුසැණි**, මනාව පුරුදුකරනලද; (සුචිණ්ණ, සුසිණි, සුසැණි) "නදුග්ගතිං ගච්ජති ධම්මචාරී" ධර්මයෙහි හැසිරෙන්නා දුගීතියට නොයෙයි. **නොයනුත්**, නොයැමද; **ගණබඳමෙන්**; සමූහව; **සිරුැරුනා**, ශරීර සියල්ල; **දවන**, පිච්චීම; **ජල**, ගින්න; (සං, ජ්වාලා, පා, ජාලා-ජල) විදුහුනු, ගැලවීගිය; විදහ විදනිමෙහි දයින් නිපන් අතීත කෘදන්තයි.

**නිඑවාරයි**, නාටිකාගාරයෙහි; පොහොවර, **මෙහෙණවර** පියන්ගල (පධානඝර) යනාදී තන්හි වර, ගල, යන දෙරූප යෙන්ම සිටියේ 'ඝර' ශබ්දයයි. මෙහි 'වාර' යි සිටියේ අගාර ශබ්ද යයි **උවනිසා**, උපනිශ්‍රය;- හේතුව; **පිළිලබනි**, ප්‍රතිලාභයෙන්; පිළිලභ ශබ්දය කරණ විබත් ගත්තැනි, **ආයුනු**, ආයුෂයාගේ; **කෙලෙ**, අන්තයෙහි; **නොසරස්සෙහෙන සෙයින්**, වහා පතිතවන්නා සේ; **ගලනුවට'** ආයුෂයෙන් ගිළිගිමට; **මෙ**, මෙය; **තුමා**, තමාගේ; **මහදෙවනන්**, නාකිකම; **මුළුලොවටවුබුදුහු**, මුළුලෝකයා පිණිස (බුදු) වූ බුදුන් වහන්සේ; **දුන්හයත්**, දුන්නාහුදැයි කියතොත්; **පසන්**, පිටිසර (පච්චන්ත-පචන්ත-පසන්ත-පසන්] **ඉසනාක්**, කැමති දෙයක්; (භණ්ඩාගාරික- බඩකරික- බඩගරික- බඩැරිය- බඩැරි) **අයකැමි**, භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල දනය සැපයීම පිණිස ක්‍රමානුකූලව වියදම් කරන්නා අයකැමි ශබ්දයෙන් අදහස් කරනලදී එහෙත් ආයුත්තක යන පාළි ශබ්දය සාමාන්‍යයෙන් ඒ අර්ථයෙහි නොව ප්‍රදෙශ පාලකාර්යයෙහි යෙදුන බවට නොයෙක් නිදසුන් ඇත්තේය. ආයතමම්ක ශබ්දයෙන් මිනා ආයුත්තක ශබ්දයෙන් 'අයකැමි'යි එන්නවද නොහැකිය' මෙය තවත් සොයා බැලියයුතු තැනෙකි.

**සුන්ඝනවත්නිවැසුවෝ**, කැබැලි කැබැලිකොට සිඳ මැත ලද කාෂායවස්ත්‍ර හැන්දනු; (සීව්‍යන-සිනු-සුනු-සුන්) නිවාසක-නිවැසු) **පමුණුවන්නි**, මෙය සත්‍ර ලිඩගික නොවේ. 'පමුණුවනුයි' යනුවම සකස්වූ සැටිය. (පමුණුවනුයි-පම්ණුවන්යි-පමුණුවන්ති-බසියි-බස්සි, වදියි-වද්දී යනාදිය හා සමකර බලනු. **පෙන්දෙන්නා**, පින්දෙන්නේ වෙයි යනු අර්ථයි. **ජනන**, උපදවන; **සණ්ඨිඹංසාට කෙසු**, ගෘහසන්ධි සහ සිවුමංසන්ධින්හි; (පටිවෙධ-පිළිවෙය-පිළිවෙය්=පිළිවේ) "**සහපවත්නාපංසුකිළාසෙසං**" සමග පැවැති වැලි කෙළිය යමෙකුත්ගේද, (තෙ සහපංසුකීළිතා) "**ඉධලොකසන්ධා නොඅත්තභාවෝ ඉධලොකත්තභාවෝ**", මෙලොවයයි කියනලද ආත්මභාවය ඉධලොකත්තභාවයනම්. **සජනහු**, ඉල්ලන්නාහු වෙති [යාචන-යචන-යජන] යජනමතු, ඉල්ලීම පමණක්; (පළුවි-පළුම්) (අභිසද්දයන්) ශ්‍රෙෂ්ඨශුතයන්; අන්බවු, ආනුභාව; **ලකුණාතම්සාවැ** සිරුරුහිනිපැන්. දෙතිස්මහා පුරුෂලක්ෂණාදිය ආත්මකොට ඇතිව සිරුරෙහි උපන්; **කොලෙස්සියන්**, කෙලෙස් කැමැති පියස්ස; [ඡඳන-සියන-සියන්) ඇතිය, ඇති; 'ඇතිය යනු ඇති ශබ්දය පළමු විබත්ගත්තැනි. **න ආහරෙය්‍ය**, නොඑලවන්නේය; **පාසිම්වයි**, පාමුල-පාසම්පයෙහි; **සාම්පසන්නම්**, සම්පාර්යෙහි සන්නම්විශකතීයි.

පෙලෙකි, එලයෙහි-ගෙඩිවල; බජ්ජඅධිච්චෙනෙක්, ඔජාව අධික කොට ඇති වස්තුවක්; බජනබජ්ජනෙහිමෙ, පිසන භාජනයෙහිම; "අප්පායනොවනසණ්ඩො ඉමං අස්සමං අනුප්පත්තො" සම්බුදුයන් වහන්සේ ඒකාන්තයෙන් අපට වැඩ පිණිස මේ අසපුවට වැඩියසේක. පච්ස්, ප්‍රමාද; [පපංච-පචස-පචස්- ඉඩවත්හුගේ, සෘඩිමත් පැමිණියහුගේ; "යස්මාඅම්හෙනෙනයො තස්මාමුහුත්තෙන නෙවඅාහරිත්වා පඤ්ඤපෙසුං" යම් හෙයකින් සෘඩියගේ මහත්බව නොසිතිය හැකිද එහෙයින් මොහොතකින් මල්ගෙනවුත් [අසුන්] පැනවූහ. පඨම ඣන්හිපවා සමෑවැජ, ඤමවන් ඣන්විවස්මින්, ප්‍රථමධ්‍යානයෙහි පටන් (සමාපත්තියට) සමවැදී (ඒ සමවදින ලද) ධ්‍යානයන් විපස්සනා කෙරෙමින් හෙවත් බලමින්; ආකිඤ්ච-ඤ්ඤසින් පවා අවුජ්, ආකිඤ්චඤ්ඤායතනය දක්වා අවුත් එසමවැජ්ැනැගි, ඒ ආකිඤ්චඤ්ඤායතනයට පැමිණැ (එයින්] නැගී; දෙවැමෙකින්, දෙවරකින්; සිත්අපවත්නිරොධසමවැතට, චිත්තයාගේ ප්‍රවෘත්තියක් නැති නිරොධසමාපත්තියට; [ආකිඤ්ච-ඤ්ඤායතන- ආකිඤ්චඤ්ඤයතන-ආකිඤ්චඤ්ඤයිත-ආකිඤ්චඤ්ඤ-සින්] [වාර-වර-වට-වැට] යථරුස්න, කැමැති පරිදි; [රුච්චන-රුචන-රුසන-රුස්න) සාමාන්‍යවචනයෙන්, 'භමපිහිකබු' යන තැන පෙනෙන භික්ඛු යන සාමාන්‍ය වචනයෙන්; ඔවුන්ම කී-හයන් මුනවමෙ, ඒ අනොම සථවිරයන් වහන්සේම කීහයි කියනත් යහපත්ම වෙයි. සිරිවැජ යනු පිරිමැජ යි වියයුතුයි. කල්පනා කරබලා යනු අර්ථයි. නුසිනා, යොග්‍යතාක්; මස්, රුවුළු (මස්සු-මසු-මස්]

තිච්චරංච පනෙනාච-වාසිසූචිච බන්ධනං
පරිස්සාවනෙන අඩේතෙ-යුත්තයොගස්ස භික්ඛුනො

යුත්තයොගස්සභික්ඛුනො, භාවනායෙහි යෙදුන භික්ෂුව හට, තිච්චරංච පත්තොච, තුන් සිවුර සහ පාත්‍රය ද; වාසිසූචිච බන්ධනං, වාසිය හිදිකටුව පටිය යන මේවාද පරිස්සාවනෙන එතෙ අට්ඨ, පෙරහන සමග මේ පරිෂ්කාරයෝ අටදෙනෙක් වෙත්. මෙහි කී වාසිය නම් දැලිපිහිය නොව දැහැටි ඉරටු වේවැල් ආදිය කුඩ කිරීමටත් හිස රැවුල් බෑමටත් පාවිච්චිකල ආවුධ විශෙෂයෙකි. පිළිමුතුවෝ; යෙදුනාහුය; හත්ථපාසාරණ, අත දිගුකිරීම; එහි භික්ඛු උපසම්පදාවට, බුදුන් එව මහණෙනී, ශාසන බ්‍රහ්මචය්‍යාීයෙහි හැසිරෙව, යී වදාරන වචනමාත්‍රයෙන් පිහිටන උපසම්පදාවට, සහකාරිකාරණ, අප්‍රධාන හෙතුව; සුරු, හැසිරෙන ලද; (චරිත-සිරිය-සුරුය-සුරු) උපාදන් කරුණු,

කාර්‍ය්‍යය පිණිස ගනු ලබන කාර්‍ය්‍යයෙන් යුත් කාරණය. කළු සවහණ, මෙඝයෙ; (මෙඝ-මේ] භාසුපඤ්ඤ, වහා වැටෙනෙ නුවණ; [ආකාර-අයර-ආර] ඉජිනෙයෙහෝ, සමාධිවන්තේදේ හෝ; [ඉජිනු+ඒ-ඉජිනේ] (ඉඤ්ඣන-ඉජන-ඉජිනු] අනාඅඤ්ඤණ, අනාගතයෙහි වියයුතුතාක් දෙය දක්නා නුවණ; (අනාගත-අනගත-අනගය-අනයය-අනය-අනය්-අනා] නුවිජා, හිස්; බහුනාකාලෙන, බොහෝ කාලයකින්; අකාසිමහ, කෙළෙමු.

අධියර, අධිකාරය-පෙරකළපින; මෙහි පෙරකළ පින හැරි යට ගත යුත්තේ බුදුන්ට දුන් දනයයි. ආසන පඤ්ඤපන භොජන පවිසාදන ඈගි, අසුන් පැනවීම් බොජුන් පිළිගැයෙළ කිරීම් ආදියෙහි; හසත, රියන්; සවින්, යෂ්ටියෙන්, ලජපස්මා විපොරි පස්වැන්තකොට ඇති; [ලාජපංචමක-ලදපස්මය-ලද පස්මා] [ලාජා-ලජ] හෙලසිද්දතු, ඌදුඅබ; (සෙත-සහල, සිඩත්-සිදුහතු-සිද්හතු-සිද්දතු) පැනවස්,පනවා;(පඤ්ඤපෙත්වා-පඤ්ඤවය-පනවය-පැනවය-පැනවය්-පැනවා) භූමනින්, බහුමානයෙන් යුකතව; 'දක්ඛනෙයිවඩ්ඪනෙති එනාගාති දක්ඛිණා, මේ කරණ කොට ඉදිරිපස තබත්තුයි - පිළිගන්වත්තු යී දක්ඛිණානමු. "තදත්ථාසදියමානං උදකං දක්ඛිණොදකං" ඒ දක්ෂිණාව පිණිස දෙනු ලබන ජලය දක්ඛිණොදක නම් වෙයි. (පුබ්බභාග-පුභාය] පිළිගාවා, දනය පිළිගන්නහුගේ; (පටිගාහක-පිළිගහක-පිළිගහය-පිළිගහා-පිළිගා) දුනුවේ, දෙනලද්දේවේ.

සනපා, වැළදැවීමෙන් සතුටු කොට; නැතමහාතුජ්, නැතත් යනු අර්ථයි; අභියර, සත්කාරය-පින; මතුයෙහි පුරනනා පැරූ මට, අනාගතයෙහි පුරනනාක් පාරමිතාවට; එතරන, බැස ගැනීම හෙවත් ආරම්භය; (ඔතාරණ-ඔතරණ-එතරණ) ගිහි සැහැවිවූවාමෝ, ගිහි සවභාව ඇත්තාවූම අපි; නත්ථිදින්නං........ 'සම්මාපටිපන්නා' දුන් දෙයෙහි විපාක නැත, ගිණසඛ්‍යාත මහා දනය, පහෙනක සක්කාරය (දනය සකස් කොට සිටින තැනට ගෙනගොස් දීම) යන මෙහි විපාක නැත. යහපත් අයහපත් කර්මයන්ගේ ඵලවිපාක නැත. එලොව මෙලොව, සහ මවු, පියෝ නැත, ඔපපාතික (ඉබේ පහළවන) සත්ත්වයෝ නැත, යහපත් මාර්ගයෙහි ගමන්ගත්-යහපත් මගට පිළිපන් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නැත. සහවිවස්නාමග, විදර්ශනාව සහිත මාර්ගය; ඵල විමුත්ති, ඵලයට පැමිණ කෙලෙසුන්ගෙන් මිදීම; පස්විධුන්සඳණ, පච්චවෙක්ඛණ (සංස්කාර තත්ත්වය මෙනෙහි කරන) ඥානය; සංකල්ප, විතර්ක;

8 සඤ්ජය පිරිවැජ්ජාවන්, අගසවුවන්;

හැව්ලිලිඅහරයි, ගෙයක් ගෙයක් ගානේගොස් පාත්‍රයට අවුලා ගනුලබන ආහාරයෙහි–සිහාගනුලබන ආහාරයෙහි; [සංපිණ්ඩන–හැවිඩිනි–හැවිඩිලි–හැවිළිලි) නොපමිජ්ජිසයුතු, ප්‍රමාද නොවිය යුතුයි. [පමජ්ජිතුං–පමජ්තු–පමජ්ත–පම්ජ්ජය) භිකාසිගනුමුත්තං භික්ෂාව සිගනු විනා; අයුතන පරියෙසන විසින්, නුසුදුසුව සෙවීම් වශයෙන්; පසපිරිසෙස්සෙන්, ප්‍රත්‍යය සොයන භික්ෂූන් වහන්සේ; පැමුණුනේනම්, ප්‍රමාද වූයේ නම් වෙයි. උද්දිස්සඨානං උත්තිඨං නසම්ං උත්තිඨෙ, උදෙසා සිටීම උද්දිස්සඨානය නම්. උත්තිඨ ශබ්දය සප්තමි විබත් ගත්විට උත්තිඨෙ,යි සිටී. (සුචරිත–සුසිරිය – සුසිරි) ධම්සුරුශේ, සුචරිත ධම්යෙහි හැසුරුනු තැනැත්තේ; සුඛවත් සෙරෙයි, සැපයෙන් සුකතව වෙසෙයි.

(චරති–සරයි–සරෙයි–සෙරෙයි) අනනානුවාදනිය, තමා තමා වම දෙස් කීයතැයි යන බිය; පකිණ්ණකයෙහි, ජාතක පාලි යෙහි පකිණ්ණක නිපාතයෙහි; පතන, පදිංචිවන (පිවිසෙන) යන අර්ථය සලකා යෙදිතැයි සිතේ; අධිශර, ප්‍රධාන කාරණය; තුමාතුන් මගුල් කියා, තමන් වහන්සේගේ තුන් මගුල් කියා; අභිෂෙක, ගෘහ ප්‍රවෙශ, විවාහ යන මඟුලයන් වෙනුවට බාලයන් නොසෙවීම, පණ්ඩිතයන් සෙවනය කිරීම, පිදිය යුත්තන් පිදීම යන තුන් මගුල් කියා; ජනවිෂයෙහි, ජනපදයෙහි (ජනපද–ජනවය–ජනවිය) කලණ, කල්‍යාණීය හෙවත් රූප ශොභායෙන් අගතැන් පැමිණි තැනැත්තිය; භූමන් ලදිය, බහුමාන ලද්දියව; (ලඩාය–ලදය–ලදිය) බටමස්, තොල්; කෙස, මංස, අසි, ඡවි, වය යනු පාළි පොත්පත්වල සටහන් වන පංච කල්‍යාණය වෙයි. එහෙත් මෙහි නහාරු කල්‍යාණයක් ගැන කියවෙන්නේය. භ්‍රමයක්දැයි සොයා බලනු. අඞලුලී, (අඞ + උලුලී) අඞක් පිරූ; (උල්ලිඛිත–උලුලි–උලුලී) ඉප්මහුන ලකඛණ නෘතියා, ඉප්මහුනය ලක්ෂණ කොට ඇති නෘතියාවයි; මූලින් නොතිබුන වෙනස් ආකාරයකට පැමිණීම ඉප්මහුන නම්.

හි, වැටී; බ්‍රහ්මුජ්ජුගතනවන බැවින්, බ්‍රහ්මයාට වැනි සෘජු ශරීරයක් ඇතිවන බැවින්; සටන්, විලාසය; (සණ්ඨාන–සටන–සටන්) නිකුඹනු, නිඛිකුමහිනු; (තිඨ–තියි–තිය්–තී) "දනබඛෙඛනාව ආදනබඛෙඛනාව දශාදවත්ථු කෙදවදශජ්ජ." දියසුත්තේය යන අර්ථයෙන්ද ගනසුත්තේය යන අර්ථයෙන්ද දශාදවත්ථු යයි කියනු ලැබේ. ඒ දශාද වත්ථුවම දශජ්ජ නම්. සටාර්ථයෙහි ණ්‍ය ප්‍රත්‍යය විය; සෙවන, ඡායාව; සෙවන යනුව ඡදන ශබ්දය ප්‍රභව කොට ඇත්තේ යයි සිතේ. ඡදන ශබ්දය සියන, සෙවන යන දෙරූපයෙන්ම හෙළයෙහි සිටී, පාළියෙහි එකම රතන ශබ්දය රියනත් මැණිකත් කියයි.

එහෙත් ඒ රතන ශබ්දය හෙළයෙහිදී රියන, රුවන යන දෙරූපය වෙන් වෙන්ම ගෙන සිටී. කම්කෙලෙස්වට විවාවට පසවන බැවින්, කම්මවට්ට කිලෙසවට්ට විපාකවට්ට යන මොවුන්ට ප්‍රත්‍යය වන බැවින්; අනුසනුලදු, අනුව යන ලද්දේය; වැටගී, සංසාරයෙහි; වටගු අනුගියේ, සංසාරය අනුව ගියේ වෙයි· පැල, පිඩා; (පීඩා-පිළ-පැළ)

සද්ධාධනං සීලධනං-හිරිඔත්තප්පියං ධනං
සුතධනංච චාගොච-පඤ්ඤාවෙසත්තමංධනං

ශ්‍රද්ධා, ශීල, හිරි, ඔත්තප්ප, සුත, චාග, පඤ්ඤ යන මොවුහු සප්තාර්‍ය්‍ය ධනයෝ නම් වෙති. (අරිය-අරිය්-අරි) දියකෙරෙමි දයාද කෙරෙමි; (දායාද-දයජ-දයය-දය-දිය) අරවන, ඉල්වන (හරාපන-හරවන-අරවන) සියදුගෑමි, සකෘදගාමි, (සකදගාමි-සියදුගැමි) බ්‍යාපාද, ක්‍රොධය; තුනු, තුනී; (තනු-තුනු) නොපවුජුවත්වා, පැවිදි නොකෙරෙත්වා; අවුපතියෙහි, කාරණ අභෝතපපත්ති) යෙහි; (අට්ඨුප්පත්ති-අටුපති) මෙහි අර්ථ ශබ්දය කාරණය නිදානය යන අර්ථයන් කියයි. උකටලියෙමි, කලකිරුනෙම් වෙමි; (උක්කණ්ඨිත-උකටීත-උකටිති-උකටිලි) ගළවනුවට, යෙදෙන්නට=දරන්නට යනු අර්ථයි, අන්‍යොන්‍ය සම්බන්ධය හෙවත් ඔවුනොවුන්ගේ සටනාවද ගළවනු ශබ්දයෙන් ගතහැකි අර්ථයෙකි, මෙහි ලැබෙන සටනාව හෙවත් සම්බන්ධය වනාහි බ්‍රහ්මචර්‍ය්‍යාවත් නැඳ සර්විරයන් වහන්සේත් අතරේය. හුනුබවට, හීන භාවයට; (හීන-හිනු-හුනු) නවත්නෙමි, ගිහි බවට පෙරළෙන්නෙමි යනු අර්ථයි, ගමන් ආදිය ගොස් පෙරළා ඊමටත් නැවතීම යයි පැරැණියන් කියූ බවට නිදසුන් තිබේ. ආර, ආකාරය; දම්, දගිය; (ධාම්-දම්-දම්) (තණ්ඩුළ-තගුට-තගුල-තගුළ්) දම්වනරියක, දගිය වැදිරියක; වැටුමට, උපස්ථානයට; ආචන්, ආ අය; නුසී, නිසිය; පරීසා, සමානාර්ථ ඇති වචනය; සුළු මව් රුජන, සුළු මව්වූ රාජිනියගේ; රහත්නොපත, රහත් බවට නොපැමිණියහොත්; සුරුබුම්සරින්, හැසිරෙන ලද ශාසන බ්‍රහ්මචර්‍ය්‍යායෙන්, දෙව්ලොව එකැති තැන් ගැන කියත්,

දෙව්ලොව එකාන්ත ස්ථානය (වන බව) ගැන කියත්, "එකැතිතුන්" යන පාඨය මැනවයි ගතහොත් එකාන්ත දිව්‍ය ස්ත්‍රීන් යන අර්ථය හෝ දිව්‍ය වෙශ්‍යාවන් යන අර්ථය ගතහැකිය; බැලිකුලිය; (භති-බත-බල-බැල) විකැණගත්නා ලදුයෙහි, මිලදී ගත්තා ලද්දෙහිය; වෙලෙඳුයේ, ලජ්ජා වනුයේ; "අගාරසඤ්ඤිකං අගාරිකං-කසිවණිජ්ජාදි කං එපත්ථයන්ති අනාගාරිකං-

ජ්ජං" ගිහිගෙට හිතවූයේ අගාරියයි. එනම් කෘෂිවණික් ආදී කර්මාන්තයි. ඒ කෘෂිකර්මාදිය මෙහි නැත්තුයි අනගාරිය නම්. එනම්- පැවිද්දයි. ඒ අනතුරුවූ, එයට ඉක්බිතිවූ; ජැනැ, දැන; (ජානිත්වා-ජැනැය-ජැනැ) සපයා, සම්පාදනය කොට; (සම්පාදෙත්වා-සපයය-සපයය්-සපයා) විස්විබුන්සඳණ, පච්චවෙක්ඛණ ඤාණය; පාතී, ප්‍රකාශ කෙරෙයි.

ජැ, ජාතිය: (ජාති-ජැයි-ජැය්-ජෑ-ජැ) බිණු, ක්ෂීණවිය; (බිණ-බිණු) පරිඤ්ඤා, දුක්ඛ සත්‍යය හාත්පසින් දැනීම; පහාන, සමුදය සත්‍යය (තෘෂ්ණාව) බැහැර කිරීම; සච්ඡිකිරිය, නිරොධ සත්‍යය (නිවණ) අවබොධ කිරීම; භාවනා, මාර්ග සත්‍යය වැඩීම්; පිළි, නැවත; ජැනි, දත්තේය; (ජනී-ජැනි) තියෙනසේ, යනසේ; [නියාන-තියෙන) එක්තෙරෙක්, එක්තරා කෙනෙක්; ඇස්වන්, ඇසුවන්) ආශ්‍රවයන්, (ආසව-ඇසුව) සපියුතු, යුත්; (සම්පයුත්ත-සපියුතු) සාක්ෂාද්ධර්මයෙහි, ප්‍රත්‍යක්ෂ කිරීම් අර්ථයෙහි; "අයං මෙමග්ගො භාවිතො" මා විසින් මේ මාර්ගය වඩන ලදී. "ඉදංඵලං සච්ඡිකතං" මේ ඵලය අවබොධ කරන ලදී. පච්චවෙක්ඛණඤාණින්, මා විසින් මේ මග වඩනා ලදැයි ද මේ ඵලය අවබොධ කරන ලදැයි ද තමා කෙරෙහිම උපදනා ඥානය පච්චවෙක්ඛණඤාණ නම්. එයින්. අව, මම; (අහං-අහ-අව) සනාන; සන්තානයෙහි-චිත්තයෙහි සවඤ්ඤණින්, සර්වඥ ඤාණයෙන්; සුවහිසි දුක්හිසී නොකැපි, සැපෙහිත් දුකෙහිත් කම්පා නොවේ; (කම්පති-කපියි-කපිය්-කපී-කපි) කම් අනුරිවින්, කර්මානුරූපව; එමුලුඅනුනය, ඒ සැප දුක් දෙක මූලික කොට ඇති ප්‍රීතිය; නතුරුමැදහත්හිමෙ, තත්‍රමජ්ඣත්තතායෙහිම; සැප දුක් දෙක්හි මැදහත්ව පවත්නා චෛතසිකයක් එනමින් හඳුන්වනු ලැබේ.

දුෂෙවු, තපුරු කොට සොයන ලද; (ඡාදිත-වදිත-සවීය-සෙවීය-සෙවුය-සෙවු) හවුන්සැනි, භාවනා සන්තතිය; (සන්තති-සතති-සයති-සැයති-සැති) මිස, මිථ්‍යා; (මිථ්‍යා-මිච්ය-මිච්-මිස) මිච්ඡා ශබ්දයෙනුත් ආගැකිය. මිච්ඡා-මිච-මිස, යි, (ඡිද්ද-විද-සිද-සිද්) අඹකොට, ආමිස කොට ගෙවත් ඇමක් කොට; (ආමිස-අමිහ-අම්-අම-අඹ) (වාණිජ්ජ-වණිජ-වෙණෙජ-වෙණෙජ්] ගඩබුවන්, බූරුවන් [ගද්දභ-ගදබු-ගඩබු) සං; 'ගර්දභ' ශබ්දය, පාලියට ගද්දභ යී සිටියි, 'ගද්‍රභ' යනු ගර්දභ ශබ්දයාගේම අපභ්‍රංශයකැයි හැගේ. ධම් යනු ධම්ම යී අශොක ලිපිවල පෙනෙන්නා මෙනි. විහිජන, විකිණීම [විස්සජ්ජන-විසජන-විහිජන] දැන, බඩු විකිණී ඉවරවන වේලාව දැන; පිරිවට, අගල මතුපිට; [පරිඛා-

**පිරිය**–පිරි] පිඕ ශබ්දයෙන් ආ 'පිටි' යනුව 'පිරි" ශබ්දය හා එක්වී මෙන් 'වට' විය. **ගලවනුවට**, ගලපනු පිණිස; **පුවස්කෙළෙසි**, ආශා කෙළේයි; [පිපාසා–පුවස්] (කටඨ–කැහැටු–කැහැටි) **සඞ්ඛාතාති**, [ශඞ්ඛ + ආඛ්‍යාති) හකකට බඳු; **වටා**, වඩා; (පරා–වරා–වටා) වටි, වෘත්තිය; (වට්ට–වට–වටි] **පොළොඩා**, ප්‍රලොභ [ආශා]කරවා; **චතුක්කකයෙහි**, ජාතක පාළි චතුක්ක නිපාතයෙහි;

## 9 නඳතෙරුන්වත්.

---

[චුන්ද–චුදු–සුදු–සුදු) **විශි දෙනැළියක ධනක් දක්නේ**, වී නැළි දෙකක ධාන්‍යයක් දක්නේය; **කැණගෙන**, වී දී උෟරු පැටවුන් ගෙන; **පැලදෙර**, ගේ පිටිපස්සෙහි; **ගොවුද**, ගව හල; (ගොවජ–ගොවද–ගොවුද) **රුවා**, රොපනය කොට [රොපෙත්වා–රොවය–රුවය–රුවයි–රුවා) **ඉදිමී**,(උද්ධුමාසිත්වා–උදුමැය–ඉදිමැය–ඉදිමැ) **සජ්පිපිගෙනැය්**, පහර පිපිගෙනයනු අර්ථයි. **සිරිමුගුරෙන්**, හතරැස් පොල්ලෙන්; (චතුරස්‍ස–සියරැසි–සිරැසි–සිරැහි–සිරිහි–සිරි=සිරි) **පොයය්**, තළා [පොථෙත්වා–පොයය–පොයය්] **දෙවළු අතුරෙහි**, දෙතලු අතරෙහි; (දෙතලු–දෙයලු–දෙවලු] **උගුරපවා පැටවූ**, උගුර දක්වා තබන ලද; (පට්ඨපිත–පට්පිත–පටවිය–පවවුය–පැටවුය–පැටවූ] "**පක්කාවඨිතං තං ආවිලාගුණ්ඩා නිකාව මති**" කකියන ලද ඒ ජලය කැලැත්ව නික්මෙයි. **තුනුවූයේ**, තුනීවූයේ, පැහැදිලි ජලය කුනු රොඩු ආදියෙන් මිදුන හෙයින් 'අච්ඡං' යනුවට මේ අර්ථය කිහයි සිතේ, **තණසිළුවදලෙන්**, තණ හුලු ගින්නෙන්; **වැලක්**, සමීප; **ජේනුවහටමෙ**, ජීවත් වෙත්දිම; ජේ, ජීවත්වීමෙහි යනු ධාතුයි.

(ජීව–ජෙව–ජෙවි–ජෙ) සැරදෙ යන තැන පෙනෙන 'දෙ' ධාතුව මේ ජෙධාතුවම ප්‍රභව කොට ඇත්තේය. "**යථාවණ්ණෙන විලයං ගච්ඡති**" යම්සේ මොගොතකින් දියවී යයිද හෙවත් විනාශවී යයිද; "යම් හෙයකින් කෙණෙකින් දුද එහෙයින් අධි පරිලාහ ඇතියා අවීචි සන්තාපයැ".

මේ වාක්‍යයෙහි පෙනෙන 'ඇතියා' යන ක්‍රියාව යෙදුන සැටි සැලකිල්ලට භාජන කළ යුතුය; අවීචි සන්තාපයැ යනු එයට කතෘයි. ඇත්තේ වෙයි යනු අර්ථයි. **අධිපරිලාහ**, අධික තැවීම; (කූටාගාර–කුළුවාර–කුළුආර–කුළාර) **වටගෙයක්**, රවුම් ගෘහයක්, **මාකුජ්ගිනිපත් සත්හු**, මවගේ කුසෙහිවූ ගින්නට පැමිණි සත්වයෝ; **උදරොම්බෙයෙන්**, උදර ගින්නෙන්; මෙය තවත් සෙවිය යුතුය. **නොවිශිදද**, දියවී (විනාශවී) නොයෙත්ද; **කම්**

සුරුකුආර, කල කර්මයට සරිලන ආකාරය; (සරික්ඛක-සුරුකු) දුටුදම්වෙනියකම්හු, දිඨ ධම්ම වෙදනීය කර්මයාගේ; (වෙදනීය) (වෙදනිය-වේයනිය-වෙනිය) උවසෙවෙනි කම්හු විවා උපනට අරමුණුකි නිමිත් වැටහුණෙස්, උප සේවනීය කර්මයාගේ විපාකය, උත්පත්තියට අරමුණුවූ ස්ථානයෙහි නිමිත්ත වැටහූ පරිදි, මෙහි, උපසේවනීය කර්මයාගේ විපාක යයි කීයේ වුන්දසූකිරිකයා කල ඌරන් මැරීම සඞ්ඛ්‍යාත කර්මයාගේ විපාකයයි.

උපනට අරමුණුහි නිමිත් යයි කීයේ ගති නිමිත්තටය, (උපසෙවනිය-උවසෙවෙනි) (විපාක-විවහ-විවා) පැවිකරනුවට, යටපත් කරනු පිණිස; එමෙපස්හිජ්, ඒ පසෙහිත් මේ පසෙහිත්; (ස්තිත්වා-සිතිය-සිටිය-සිටැය) හවියසනිශ්‍රිතීමඤ්ඤ, වන්නේ යයි හඟිමු; ඉස්නා, කැමතිවන; දික්හි, දුකෙහි; "කම්මසරික්ඛකං ඵලං" කර්මයට සරිලන ඵලය;

## 10 වුන්දසූකරිකයාවත්.

හෙලා, බහා-ලියා; පිඩුවා, පිණ්ඩපාතය; (පිණ්ඩපාත-පිඩුපය-පිඩුවය-පිඩුවය්-පිඩුවා) අනුකුරුවැ, අනුකාරව-සමානව; අදුසර, අදහස; පිරිවහව්; (පරිවහථ - පිරිවහහු - පිරිවහවු - පිරිවහව්) හදරව්; පැවිසෝ, පිරූහ; සතිපට්ඨාන සූත්‍රය කියන්නට පටන්ගත් හයනු අඊයි. සුදුවන්, සිඳුව අගුවයන්; (සිඳුව-සිඳුව-සිදුව-සුදුව) හයනාල්හි, අදනාකල්හි; (හයන කල්හි-හයන අල්හි-හයනාල්හි) අස්හි නොපිරියත්, ඇසීමෙහි තෘප්ත නොවූයේ;

## 11 ධම්මික උපාසකයාවත්.

විථරා, විස්තර කොට, (විත්ථාරෙත්වා-විථරය-විථරය්-විථරා) "යෙසපිස්සඤ්ඤා"යම් ඇත්තෝ පොරොන්දුවූවාහුද; බොහොසු විසින්, බෙහෙවින්; (බහුසො-බුහුසු-බොහොසු) පිරිපුණු, සමෘඬවූ, (පරිපුණ්ණ-පිරිපුණු-පිරිහුණු-පිරියුණු) වටකෙළියෙන්, බුහු ගැසීම් ක්‍රීඩායෙන්; පිරිගා, පරිග්‍රහ-ආරක්ෂා; (පරිග්ගහ-පිරිගහ-පිරිගා) නොලබනමෝ, නොලබන්නමෝ වෙමු; සිස්පෑ කුඹට දකියදුන්වයි, හිස් පාත්‍රය කුමක්නිසා දක්නට දුන්හුදැයි; (පාති-පැයි-පැය්-පෑ) දුන්ව මධ්‍යම පුරුෂ (නශබ්දකාරක) බුහුබසි, නොවැදියදෙම්හයි, (වැදිය නොදෙම්හයි) පැමිණෙන්නට අවකාශ නොදෙනු ලබම්හයි; සිස් පෑ දික්කියදුන් දෙසින්, හිස් පාත්‍රය දකින්නට දුන් දෙෂයෙන්; ඵල විසරණෙ, ඵල ධාතුව විසිරීමෙහි වැටේ; දිවසිවින්, දිව්‍ය කැවුණෙන්; සත් පමණ රස නහර දහසුන්, රස නහර දහසේ ඒවා හතක් පමණ හෙවත් රස නහර සත් දහසක් පමණ; පතුළු, පැතුරුණේය; පතුර ධාතුවෙන් නිපන් අතීත කෘදන්තයි.

ඉඟිකෙළන, සිත්සේ ක්‍රීඩා කරන; සුළුවටුවා, (සුළු + උවටුවා; චූල-(සුළු) උපස්ථායකයා; (උපට්ඨායක-උවටක-උවටු) ඉකිළිය, සැළිය; (උක්කලි-ඉකිලි) මිළි, බඳුනක් මධ්‍යයෙහි කණිණිකාවක මෙන් සිටිනසේ සාදනු ලබන අවයවය; (මකුල-මුහුල-මිහිලි-මිළි) සඟබේකඳුයෙන්, මහවග්ග පාළියෙහි සඞ්ඝ භෙදක්ඛන්ධකයෙන් (අත්ත - අත - අත්) කමතුන්, කර්මාන්තයන්ගේ; විසා, රට, (විසය - විසා) බැඩිපෙළි, බඩු පොදිය, (භණ්ඩක-බැඩිය-බැඩි) ව්‍යවසායාර්ථයෙහි, නිශ්චයාර්ථයෙහි; අප පැවැජෙනුවට සනිටුහන්වූ බැවින, අප පැවිදිවීමට නිශ්චයවූ හෙයින්; වටනුවට, පැවැත්වීමට; හඹා, ප්‍රමාණයි-සෑහෙයි; (සමත්ථ-හමය-හඹය-හඹය්=හඹා) අලං නිපාතය සමර්ථාර්ථයෙහිත් වැටෙයි. සකුන්, ශාක්‍යයන්ගේ; නහන ලදහයි, නසන ලදහයි; 'නීහරිත්වා පාතිතාති නිප්පාතිතා' පැහැරගෙන නසන ලදනුයි. නිප්පාතිත නම්. අව, මම; (අහං-අව-අවි)

පිරිදරු, සේවකයා; (පරිවාරක-පිරිදරු) කැපිය; කප්පක යාය-හිසරැවුල්බාන්නාය; (කප්පක) කපය-කපිය-කැපිය-කැපි) තිමින, මාතරහිතවූවක්; තුමමපෑගි, සප්තමී අර්ථයෙහි; තෙවිජ, ත්‍රිවිද්‍යාව-පුබ්බෙනිවාස දිබ්බචක්ඛු ආසවක්ඛය යන තුන්නුවණ, සාධකනම, නිදසුන්; (පුබ්බෙනිවාස-පුවේනිවස්-පූර්වෙනිවස්) අසවුන්ඛය, ආශ්‍රවයන්ගේ ක්ෂය; කුසලාගිසැසු. කුශලයෙන් නිපන් විශෙෂ ඥානය; ධ්‍යානයටම නමි. කුමරුසඬන්, කුමාර වෙශය; පලදනෙයින්, පලදනායෙන්; පස්වටනෙමි, පාලනය කරන්නෙමි. [ආඝාත-අගය-අනය්-අගා] නීවරණාවස්ථා බැවින්; පංචනීවරණයන්ගෙන් යුක්ත අවස්ථාව බැවින්; නිවන් මග අවුරණ හෙයින් කාමච්ඡන්දදිය නීවරණය නාමය ලබයි. 'සහචිත්තුප්පාදෙන ඉධිනොපරිහායිත්වා' සිත පහළවීමත්, සමගම සෑඩියෙන් පිරිහී; (ජිණ්ණ-ජිණු-ජුණු) වියඅතට, වයස් පැත්තට-නාකිබවට; පිළිපය, පාවාදෙනු මැනවි; "වබලංඅසනි බාදනීති බෙලාසිකො බෙලාසිකොත්වංති පච්චෙනාවාදෙ බෙලාසිකවාදෙ" බෙලා, කෙල, අසනි, සේයි, බාදනීයි, කානුයි බෙලාසිකො, බෙලාසිකනම්. තා එබඳු කෙලකොල්ලෙකැයි පැවැති වාදය බෙලාසික වාදයයි.

පුවසම්හණ, අපරාධකාරයෙකැයි ප්‍රසිඬ භික්ෂුව; උපයොග නමි;; අහං භගවන්තං හන්ත්වා බුද්ධොභවිස්සාමි" මම භාග්‍ය වතුන් වහන්සේ මරා බුදුවන්නෙමි. දත්තුජ්, දත්තා නමුත්; (දත්තිතූජ්-දත්තුජු) අභිභූතව, මඩනාලදුව; "තස්මිං රජ්ජෙ පතිට්ඨිතො" ඔහු රාජ්‍යයෙහි පිහිටි කල්හි; ආණත්තිවිසං කෙතන

යෙන්" නියමකළ අවස්ථාව වැරැදවීමෙන්; "පිතරං හන්ත්වා රාජා හොති" පියා මරා රජවෙම; ඉති බැවින්, එසේ හෙයින්; දුනුවාවන්, ධනුර්ධරයන්, [ධනුග්ගාහ-දුනුගහ-දුනුගා-දුනුවා) තුමන්ගෙ ගියකල්හි, තමාගෙ ගෙදරවලට ගියකල්හි; වතරමනු යයි, යවකලමනායයි; (අවත්ථර-අවතර-වතරැ) සෙල්ලෙන්මෙ ගලින්ම; සනින්සලා, පිහිටි තැතින් චලනයකොට; වජ්‍රකාය වන බැවින්, වජ්‍ර (දියමන්ති) යකට බඳු ශරීර ඇති බැවින්, සැලි පහරහොතුඳ්, ශෛල (ගල්] පහර වේතත්; (සෙල-සැළි) ලේබුයි නොවියයෙත්, ලේ බැහැර නොවියයි කියක්; (බහි-බුයි) බුන් යනු අප පාඨයි.

ජීවකයන් අත සැතින්, ජීවකයාගේ අතෙහිවූ ආයුධයෙන්; කුමට කඩවියන්, කුමක් හෙයින් කඩවිදූයි කියතොත් බැවැ, බවයි. (බවය-බැවැය-බැවැ) සිලියයන්, චලිත විදූයි කියතොත්; (චලිය-සලිය-සිලිය) හුණුනවාගිවන සෙයින්, උෂ්ණ වතාගිවත සෙයින්; අනනයවලන, අභ්‍යන්තරවලනය හෙවත් ඇතුලත සැලිම්මාත්‍රයක්, සැඩපජෝවා, චණ්ඩප්පජ්ජෝතයා විසින් (චණ්ඩප්පජ්ජෝත-සැඩපජෝත-සැඩපජෝව) "අත්තනො ජීවිතං සඤ්ඤපරිච්චජිත්වා" තම ජීවිතය බුදුන් වෙත පුදා; තස්මිං දිවසෙ සන්නිපතිතානං අට්ඨාරස කොටිසඞ්ඛ්‍යානානං" එදවස රැස්වූ අටලොස් කෙළක් පමණවූ රජගහනුවර වැසියන්ට; වාඩදුවිල අසින් පෙරෙනුජ්, වෘඩයන් හා දූවිල අයගෙන් අත්‍යවූවන් යනු අර්ථයයි සිතේ, සෙවිය යුතුයි. [පරෙන-පෙරෙන්) පෙරෙනුජ්-පෙරෙනුජ්) "අප්පකංගණනුපගංනහොති"-ස්වල්පය ගණනට යන්නේ නොවෙයි. අනුපූකියා [6: මහාකාල තෙරුන් වත් බලනු) අසූනවායෙහි, අසූවන නිපාතයෙහි; (අසීති-අසිති-අසියි-අසුයි-අසුය්-අසූ) ජා, ජාතකය; (ජාතක-ජතක-ජයය-ජය-ජය්-ජා) "රඤ්ඤොමාරිතත්තා නෙව තථා පාකටං අහොසි" රජමැරවීමෙනුදු නාලාගිරිහු හැරීමෙන් පමණ දෙවදත්තයාගේ ක්‍රියාව ප්‍රකට නොවීය. යම් සෙයින් නාලගිරිහු වුහුව් හෙයින් පාලවිද, නාලාගිරිහු හැරීමෙන් යම්සේ ප්‍රකටවීද, අනෙක් ක්‍රියාවන්ගෙන් එසේ ප්‍රකට නොවීය,

සෙල්පවයින්හෙයිනුජ්, ගලපෙරලූ හෙයින්වත්; (පපාතන-පවයන--පවයිත--පවයින්). මූඑබන්, [මූලිකයාට දෙතබත) මේ වතාහි පාළියෙහි එන ථාලිපාක ශබ්දයට දුන් අර්ථයවේ. මනොරථපූරණී පපංචසූදනී ආදියෙහි 'වරපුරිසානංදසන්නං ථාලිපාකභත්තානං' යී කීහෙයින් උතුම් පුරුෂයන්ට දියයුතු බත ථාලිපාකභත්තය නම්. එක ථාලිපාක බතක් දශ දෙනෙකු

සැහෙන බවද කියන ලදී. සිංහල පොත්වල මූළුබත් නමින් හැඳින් වෙනුයේ මුල්වල බඳනාලද බතය. පුටභත්ත, බත්මුල යනාදිය විමසනු. කොහොන්, කුහක; (කුහක-කොහක-කොහොන-කොහොන්) "කුහනායසකම්මං කොහඤ්ඤං" නැතිගුණ පහළකරන්නාගේ කර්මය කොහඤ්ඤනම්. යාවජීවං ආරඤ්ඤකා අහුං" ජීවිතාන්තය දක්වා අරණ්‍යයෙහි වසන්නාහු වෙත්වා; පස්වතුන්, පංචවස්තූන්; රැළුබැවිහි, රූක්‍ෂභාවයෙහි; විඤ්ඤත්ති, ඇල්ලීම; විසි, වචනය; (වචී-වසී-විසි) තුමාපසයෙහි අපිබැවු, තමා සිව්පසයෙහි අර්පි බව; සක්බිඳුමට, සසුන් රියෙහි රෝද වැනි සඬසයා බිඳීමට; (සරිකබ-සුරැකු) එකකහෙදය යනුවට විනය අටුවාහි අර්ථියේ "ආණාභෙදය" යන්නෙති, අණකැඩීම පණිස යනු අර්ථයි.

"කපපටසිකාවෙළෙන් සගජීවසිටි බැවින්, කල්පයක් පවත්නා එලයෙන් බරව සිටි බැවින්. අජවාපවිය; අදදින පවත්ය; අජවා යන තැන 'වා' යනු වක ශබ්දයෙන් ආයේය; (වක--වය-වය්-වා) සබ්බධම්ගි ඔසවන ආරෙන් උපදනාඤාණ, සියලු සඞ්ඛත ධර්ම යන්හි බියපීම් ආකාරයෙන් උපදනා නුවණ; (ඔත්තපන-ඔත වන-ඔසවන) අයිතායටවැටෙනුවා, අහිත පිණිස පවත්නා දෙය; සුවකටැකියෝ, සුවසේ කළහැක්කාහු වෙත්; කරනාල්කි; (කරන + කල්හි)මෙවැනි සමහර තැනෙක. කකාරලොපය හෙළු යෙහි සිරිති. දෙනාල්කි (දෙන + කල්හි) යනුත් මෙවැනි ම තැනෙකි. (දුක්කර-දුකර-දුකට) කන්ධරා ශබ්දයෙන් ආ කදට යනුව හා සම්කර බලනු. උදන්, ප්‍රීතියෙන් හෝ සංවේගයෙන් පිට කරන වාක්‍යය උදානයයි. ධම්සංවෙගෙන් ඉතිරගිය නෙපුල, ධර්මසංවේගයෙන් ඉතිරීගිය වචනය; සුවකට, සුවසේ කළහැකිය. 'කට යනු කෘත ශබ්දයෙන් ආවකි. උදියක්හු, සත්පුරුෂයක්හු; (සුධි-හුදී--උදී) ලමුවා, ලාමකයා; රැසියෙන්ද, රුවිකෙරෙන්ද ලහා, සලාක; (සලාක--සලක-සලහ-ලහා) ලදරුස්වනුවන් පමණ දන්නා හට හා නරකරනුවමට, ලබ්ධිය රුචිකරන්නන්ගේ ප්‍රමාණය දැනගැනීම පිණිස හා එය දැඩිකරනු පිණිස; ගුල්හක විවටක සකණ්ණජප්පන විසින් ගන්වන හුණුපතුකඩ ආ, සලාකනම්, මෙහි විසින් යනුව ගුල්හක විසින් විවටක විසින්, සකණ්ණජප්පක විසින් යි යෙදිය යුතුය. රහසිගතවද ප්‍රකටවද සියකණට කෙඳිරීමෙන්ද ගන්වනු ලබන උණපතුරුකැලි ආදිය සලාකනම්.

වැජිරම, විශාලාමහනුවර; (වජ්ජි - වජි - වැජි) සමය, ඉගැන්වීම; ත්‍රිකොටිපාරිශුද්ධ. දිඨ, සුත, පරිසංකිත යන තුන්තැන පිරිසිදු; පස්වනට, ජීවිතාන්තය දක්වා භික්ෂූහු ආරණ්‍යකවෙත්වා, පිණ්ඩපාතික වෙත්වා පාංශුකූලික වෙත්වා වෘක්ෂමූලික වෙත්වා, මස්මාංශ නොකත්වා, (නවක-නවග-නවා) එවං නෙ මනො, තාගේ සිත මෙසේය; ඉතිපි නෙ මනො, තාගේ සිත මෙබඳුද වෙයි. පෙළහර, ප්‍රාතිහාර්යය-ජනයා පුදුම කරවන ක්‍රියාව; දක්වාය්, දක්වා; බුද්ධවිෂයෙහි බුද්ධත්වයෙහි (කොකාලික-කොකාලික-කොවලිය-කොවැලිය-කොවැලි) (අගසාවක-අගසැවය-අගසැවිය) නහම්විස්වැසෙ, විශ්වාස නොකරව; ලමුඉසයන්, ලාමක ඉවජාවන්; අසත්සහ-උපෙතගිඉස, අයහපත ඉවසීමෙහි · (පිළිගැනීමෙහි) ඉවජාව; නිකාතෙහිකබු, තාගේ භික්ෂූහු (සැරියුත් මුගලන් දෙනම විසින්) ගෙනයන ලදහ; ජණ්ණුකාගිපපාතෙන, දතින් ගැසූ පහරින් පටිසඵරින් වැමෙනසූලුවන, පිළිසඳරින් යුක්තව පවත්නවුන්ගේ (සිලනාතං=සුලුවන) එකනූනවාගෙහි, එකානූවන නිපාතයෙහි; (නිපාත-නිවය-නවය-නවය්-නවා) සරනුවා, හැසිරෙන්නා; පිහිකරනලදුයේ, වසනලද්දේ; (පිහිත-පිහිය-පිහි) පැසුම් කල්හි පශ්චිම කාලයෙහි; (පශ්චිම - පචිම - පසිම - පැසුම - පැසුම් "කෙසගගමතෙතාපිආඝාතොනත්ථි" කෙසගක් පමණවත් ක්‍රොධයෙක් නැත්තේය.

සැවින් සැව, සර්වප්‍රකාරයෙන්ම-සම්පූර්ණයෙන්ම; (සබ්බන-සබ්බං-සැවිනසැව-සැවින්සැව)හදුරත්මෙ, කියන්මය;(සංධාරති-හදුරයි) "දසෙසාඵවංඑතං" මට බුදුන් දක්වවි; "මෙ දුසාක + අලාභා" මගේ දුක්ම නොලැබීම; පියවිසි, ප්‍රකෘතියවේ. නිපුණු සෙසින්, නිර්ගුණසේ; (නිගගුණ-නිගුණ--නිපුණු අසා චිනබ්බයාවනකම්හු, නොඉල්විය යුත්ත ඉල්ලීම් කමිය; බහය් බිමනබා; (ගොපඵක-ගොපක-ගොපුය-ගොපු) හනු ඇටහු, හනු ඇටයාගේ; භවසැඳහු, සර්වඥයන් වහන්සේ; කම්විබනි, පුරිස දම්සැරියා, නොදමියහැකි පුරුෂයන් දමනය කිරීමෙහි සාරථි යකුවැනි බුදුහු; සිඝපින්ලකුණු, නොයෙක් පිනින් උපන් ලකුණු; "සතපුඤඤතොනිබ්බතතලකඛණංසසස" නොයෙක් පිනින් උපන් ලකුණු යමෙකුටද (හේ සතපුඤඤලකඛණ නම්) අනත් අපිරිසේ, සක්වලෙහි අනන්ත අපරිච්ඡේද සක්වළෙහි; එකි එකී පින් සතගුණකොට කලෝනම්, එක එක පිණක් සියක් ගුණ කොට කොලාහුනම්; එතෙක් ජනකල එතෙක් කම්, ඒ තාක් ජනයා විසින් කරන ලද එතෙක් කුශල කර්මයන්; සතගුණ කොට

කළ පිනින්, සියක් ගුණකොට කරනලද පිනින්; "අනන්තෙසු චක්කවාළෙසු සබ්බසත්තා එකෙකං කම්මං සතක්ඛත්තුං කරෙය්‍යුං, එත්තකෙහි ජනෙහි කතකම්මං බොධිසත්තො එකොව එකෙකං සතසතගුණං කත්වා, නිබ්බත්තො" යනු අටුවා පාඨයි.

(සුමඞ්ගල විලාසිනී හේවාවිතාරණ 774 පිට)

'ආපාණකොටි' දිවිකෙළවර අවසන්කොට; අනුශ්‍රවාපිකි, ගුරුපරපුරෙන් ඇසීම් අර්‍ථයෙහි; රුහිරුප්පාද, බුදුන්ගේ ඇඟින් ලේ සෙලවීම; පංචවත්ථුයාචන ඇසි, පංචවස්තුව ඉල්ලීම ආදී; (ආදි–ඇයි) (උපනිස, හේතුව; (උපනිස්සය–උවනිසය–උවනිස) කන්සිළි, කන්සුළිය; (චූලිකා–සූලිය–සිලිය–සිලි) පරිණාසා, පරිණාහය (උසමහත) පමණ; (පරිණාහ–පරිණා) කළවා, කළ උපකාරය; (කතක – කළව – කළවා) නොජන්නවු (නො ජන්නහු) හට, නොදන්නාට; නාහමනුවහට, සොඳන්නාහට (නිසාමනක–නහමනුව) නොමඅපියහෙනු, සතුටුකළ නො හැක්කේය;

ජ, ජාතකය; යටැඅඟ, පිටි අඟෙහි; කිසෙලි, කොඩි; (කදලි – කිදෙලි – කිසෙලි) පිඟු, දුඹුරුපාට; වෙනෙන්, වේගයෙන්;

## 12. දෙව්දත් තෙරුන් වත්.

---

රුසි අනුරූ කිසසන, කැමැත්ත හා අනුකූලවූ කාර්‍යයන්, සකපනුවට, වැළඳවීමට; (සන්තප්පන–සතපනු) මෙමෙහෙයි, සේවය–චතාවත්; දුනගෙගසිනො, දත්ගෙහි සිටියේ; සගබෑ, බාල සහෝදරය; චුවු, පැතිරගිය; (විද්ධ–විදු–වුදු–චුවු) කඳුළු මොස මොණ, කඳුළු මිශ්‍ර මුහුණ නොහොත් කඳුළු වැහෙන මුහුණ (මිස්සක–මිසක–මිස–මුසු–මොස) යමක ඉදිරිපැත්තට මුණය යනු නමි. මොණවූයේ ඒ මූණ ශබ්දයමදූයි සොයනු. මුහුණ වූයේ හකාරාගමයෙනි.

## 13. සුමනාදෙවියා වත්.

---

ලදී, හෘදය (සිත) දී; (උර-ඔළු-ලු) ශබ්දය නිෂ්පන්නයයි කියනු නොයෙදේ. සම්වයම්හි, සම්මාවායාමයෙහි; (සම්මා-සම්) පිළිසැඹියා, විශිෂ්ට ඥනය; (පටිසම්භිදා-පිළිසැඹියා) අත්. අර්ථයෙහි ප්‍රභෙදගත ඥනය; හෙතු, ඵල, නිර්වාණ, විපාක, ක්‍රියා යන පස මෙහි අර්ථනම්. ධර්ම, ධම්මපටිසම්භිදාව; එනම් ප්‍රත්‍යයෙහි ප්‍රභෙදගත ඥණයයි, නිරුක්, නිරුත්තිපටිසම්භිදාව; එනම් සකල ශබ්දශාස්ත්‍රයෙහි ප්‍රභෙදගත ඥණයයි- පිළිහන්, පටිභාණපටිසම්භිදාව; එනම් අර්ථ, ධර්ම, නිරුක්ති යන තුන් තන්හි ප්‍රභෙදයට ගිය ඥාණයයි. උදාත්තස්වරයෙන් යොදාකරන අජ්ඣායන, උදාත්තස්වර යුක්තකොට කරන හැදෑරීම, අකුරු මුවහ නොකොට-ශබ්දය උප්පනත් නොවනසේ-සමතාලයෙන් යුක්තව කීම, සරභඤ්ඤසඞ්ඛ්‍යාත උදාත්තස්වරයෙන් යුක්තකොට කීම වේ. "අකුරුනොමුවහකොට නාදඝොෂාකරන සජ්ඣාය සරභඤ්ඤ නමයෙන්" (140 වන පිට 59 වනවාසික තෙරුන්වත්) පදභාණ පෙදෙහි පෙදෙහිම පැවති ස්වර ඇතියේයි, පදභාණය වනාහී පදයක් පදයක් පාසා පැවැති ශබ්ද ඇත්තේ වෙයි. "පෙළපිරවීම්= උපුරුවන බණ" යනු ජාතක ගැටපද පාඨයි. (දළදරජා) මනොරථපූරණී තිකනිපාතවණ්ණනාහි (පස්වන චුල්ලවග්ග අටුවාව බලනු) පදභාණක තෙරුන් පාළිය කියා ධර්මාසනයෙන් නැගුනවිට දීඝභාණක මහතෙරුන් චතුපච්චය සන්තොෂ භාවනාරාම මහා අරියවංසය ආරම්භකළ බව කියන ලදී.

මෙයින් පෙනෙනුයේ එක ස්ථවිර නමක් පෙළකියා නැගිට්ට විට තවත් ස්ථවිර නමක් ඒ පෙළ තේරූ බවය වර්තමාන ආසන දෙකේ බණ යමකිසි මූලක් ඇතිව සිදුකරන්නක් බව මෙයින් පෙනේ. පාළිය තෝරන භික්ෂූන් වහන්සේ අට්ඨකථා භාණක නම්හ. අණුකරණව පැවැති ස්වර ඇ, සමානව පැවැති ස්වර ආදී; අටළොස් මහ ගණගණයන්ට, අටළොස් කොටසකට අයත් භික්ෂූන්ට; (මහා ආරක්ෂාව සඳහා තෙවළාව අටළොස් කොටසකට බෙදා පළෙත් අටුවාවත් නොනසා පරපුරෙන් පරපුරට පවත්වනු පිණිස භික්ෂූන්ට පවරණ ලදී. ඒ භික්ෂූහුද තෙවළාවේ කොටස් ගණනින්ම අටළොසෙක්වූහ.) එනම්:-

1. සුත්තන්තික 2. වෙනයික 3. ආභිධම්මික 4. දීඝභාණක 5. මජ්ඣිමභාණක 6. සංයුත්තභාණක 7. අඞ්ගුත්තරභාණක 8. ඛුද්දකභාණක 9. ජාතකභාණක 10. ධම්මපදභාණක 11. උභතොවිභඞ්ගභාණක 12. ඛන්ධකභාණක 13. අට්ඨකථාභාණක 14. කොට්ඨාසභාණක 15. මහාපකරණික (සමන්තපට්ඨාන) භාණක 16. ව්‍යඤ්ජනභාණක (ව්‍යාකරණ හදාරන්නෝ) අක්ඛරභාණක යනුත් මොවුන්වම නම්. 17. මාතිකාභාණක 18. නිද්දෙසභාණක (සැකසහිතයි) යන මොහුයි,

**සුලාක්**, සවල්පයක්; (සුලහක්-සුලාක්] සවල්පවාචක සුලභ ශබ්දය සිංහලයෙහි ප්‍රසිද්ධය (සං, ක්‍ෂුල්ලක, පාලි, චුල්ලක-ඝුලක-සුලභ) **නොසිහියෙහෙතුයේ**, ඉවසනු නොහැකිවූයේ; **ධම්මකථිකා**, ප්‍රශ්න විචාරන්නා; **හැමපෙළි**, සියලු ත්‍රිපිටක පාලිය; **සංගීතිකාරකයන්** විසින් පෙළගැස්වූ බුද්ධදෙශනාව පාලියයි. පෙළගැස්මේදී උන්වහන්සේලාත් එයට නොයෙක් දේ එකතුකළහ. (පසංසිත-පසසිත--පසසිය-පැසසිය) **ඛීර**, හුන්කිරි, දධි, මිදුන කිරි, තක්ක, දී පෙරළිදිය හෙවත් මෝරු; නවනීත, **වෙඬරු**; **සප්පි**, ගිතෙල්; **සඬගනාප**, සබඬාව; **පිණ්ස්වාගෙනැ**, පාවාගෙන; **කොටැසි**, කොටස්කාරයෙක්; **පිළිවායනලදුවන්ගේ**, නැවත බාරදෙන ලදුවන්ගේ; (පටිපාදන-පිළිවායන) "**යථාගොපාමිකා ගොරසස්ස භාගිනො එවං සාමඤ්ඤස්සභාගිනො**" ගවහිමියෝ ගවරසයට යම්සේ හිමිකාරයෝ වෙත්ද එසේ ශ්‍රමණභාවයට හිමිකාරයෝ වෙත්; **පිරිහුන්**, පරිපූර්ණ; (පරිපූර්ණ-පිරිපුන්-පිරිහුන්) **සම්පන්න සීලස්ස**, සම්පූර්ණසිල් ඇත්තහුගේ;' **ආගමබුහුසුවා**, ආගම්බහුශ්‍රැතයාගේ; "**නදුස්සීලස්ස විසෙසනකථෙසි**" දුස්සීලයාගේ වශයෙන් නොකීයේය, ධම්මපද අධිකාරයෙන්, ධම්මපදය ප්‍රධානකොට ගැනීමෙන්; **පාති**, ප්‍රකාශ කෙරෙති; **පෙජෙහිත්**, පදයෙහිත්; **සච්ඡිකාතබ්බනිවන්හය්**, අවබොධ කටයුතු නිවන් සහ; **භාවෙතබ්බ මහුජ්**, භාවනාකළ (වැඩිය) යුතු මාර්ගසත්‍යයත්; **සුමුදු**, සමුදයසත්‍යය; (සමුදය-සමුදුය-සුමුදුය සුමුදු) **සච්ඡිකරොනෙනා** අවබොධකරන්නේ; **තදඞ්ගවික්ඛම්භන්සුමුචෙසි පිළිපසද නිසරැණු විමුනතින්** විසින්, තදඞ්ග විකඛම්භන සමුච්ඡෙද පටිප්පස්සද්ධි නිස්සරණ යන විමුක්තීන්ගේ වශයෙන්; **පුභා පිළිවුවාසෙහි තදඟ විඛඹුන්, මගැසුමුසේ, පෙළෙහි පිළිපසද් මගඵල දෙතැන නිසරැණු**, විමුනති ලැබෙයි. පූර්භාග පතිපදයෙහි තදඞ්ග විකඛම්භන යන දෙවිමුක්තියද, මාර්ගයෙහි සමුච්ඡෙද විමුක්තියද, ඵලයෙහි පටිප්පස්සද්ධි විමුක්තියද මාර්ගඵල දෙතන්හි නිස්සරණ විමුක්තියද ලැබේ.

**අධිකරණාර්ථයෙහි**, ආධාරාර්ථයෙහි; **ඉධලොක පරලොක පරියාපන්නා**, මෙලොව එලොව දෙකට අයත්; **පච්චත්තයි**, ප්‍රථමාර්ථයෙහි; **උපාදන්නෙනන්**, උපාදනයන්ගෙන්; **අසෙඛධම්**, අසෙඛ ධර්ම; (අසෙක-අසෙකි-අසෙයි) **ගෙකෙකා**, ගෙයෙක්හි; ගෙය යනු'ගෙකායි පැරැණියෝ ව්‍යවහාර කළහ. විත (වී) යනාදිය සමගද සම්කරනු.

**11 දෙසභා තෙරන්වත්.**

යමකවග අටුවා සන්‍ය නිමි.

---

කොසඹෑනුවර, 'කුශාම්බ' නම් සෘෂිවරයාව වාසස්ථානවූ හෙයින් කෞශාම්බී නමින් ප්‍රසිද්ධයට ගිය නගරයෙහි; (කොසක-ගොසු) "බ්‍යසතිවිපත්තිප්‍රධනතිබ්‍යසනං" සුඛය විනාශ කෙරේනුයි බ්‍යසන නමි. "විනැස්, විනාශ; විච්ඡින්දිත්වා අසනං ඛිපනං ව්‍යසනං" සැපය සිඳදමීම බ්‍යසන නමි. අහිලේසත් ලගා, උතුම් සේසත් ඔසොවා; (ලඞ්ඝිය-ලඟිය-ලඟය-ලඟය්-ලඟා) ජීරනුවා, දිරන්නහු; කම්විබති, සමනින්, යටත් පිරිසෙයින්; පියයුතුනාවත් පියූ එසඳ අනතනම්, පියයුතුනාවත් පියූ, අත හැරියයුතුනාක් වස්තූන් අතහැරිය; එසඳ ඒ පරලොව යන කාලය; අනත නම්, ජීවිතයාගේ අවසානය නමි. එකල්හි පිය සුතුවන් අනනයෙහි පියූ බවින්, එකල්හි ඒ පරලොව යන කාලයෙහි, පියයුතුවන්, අතහැරිය යුත්තන්ගේ; අනනයෙහි, අවසාන යෙහි; පියූ බැවින්, ශරීරය අත්හළ හෙයින්; පරලොව යන්නහු සියලු වස්තූන් අත්හළ ඉක්බිති අවසාන වශයෙන් ශරීරය අත් හරින හෙයින් මෙසේ 'අනතමසො'යි කියන ලදී.

අත්බරම, භාගීාවට; 'න ජීවිතුං අසක්කොන්තා පබ්බජිතා' ජීවත් වන්නට නොහැකිව පැවිදි නූනෙමු; සැඟැණි, සංසගීය; (පටඨාය-පටාය-පටාය්) නවසිරිම්, තපස්හි හැසිරීම්; සවනබුදුනු පාහි, සවීඟ (බුදු + අනුපාහි) බුදුන්ගේ අනුත් පාදයෙහි; (අනුප්පාද-අනුපා) හැත්ඛත්, ඇතුන්ට කානන-ඇතුන් සතුටු කරන; නම්දිවැ, 'නම්දිවු' යනුත් පාඨාන්තරයි. නම්දී යනු අර්ථයි. (දත්වා-දය-දියැ-දිව) දියැ, දිවැ, දී, දිවු යන සිව්රූපයම පෙනේ. එයින් දියැ යනු පැරැණි රූපයයි. හැත්මුළු පරිණා, ඇත් සමූහයේ නායකයා; (පරිණායක-පරිණායු-පරිණාය්-පරිණා)ලැහෙණුවට, නැහෙනු පිණිස; උපනාමෙමෙනා, නමමින් ලංකරමින්; සඳලුම්ඹුවෙහි, චන්ද්‍රාලෝකය සඳහා සිටින මඩුයෙහි; එය හෘහ මස්තකයෙහි බෙහෙවින් සාදනු ලැබේ.

රාජලඤ්ජනය, සිල්එක; ඇත්ගිජුලිහිණියෙක්. ඇතෙකුට බඳු සටහන් හෝ ඇතෙකුට බඳු වීර්‍ය ඇති ගිජුලිහිණියෙක්; යනුවට පහලපියාවිහිජ්, යනු පිණිස පහරණ ලද පියාපත් විහිදා; ඛිරිජියවී බැවින්, ඛිය ප්‍රකෘති කොට ඇති බැවින්; (භීරුක-බිරු ඛිරි) වතුළේසි, පැමිණියේ; වතුලේසි, යනු පතුයේ, යී වීනම්; මැනවි. "අධිච්චප්පතෙනා අජ්ඣප්පතෙනා" නිසා-නිමිති කොට පැමිණියේ යනු අර්ථයි. අසමහවයට පලමුවැ, නැතිවීමට (නික්ම යන්නට) ප්‍රථමයෙන් (තවත් සෙවිය යුතුයි) හුණු, පතිතවිය; වෙළෙපැලෑශැ පතුල බැවින්, විටපයෙහි වැල් පැතිරිගිය

හෙයින්; (ලතා-ලයා-ලැයැ) **මස්රුවින්**, මෘගයන් යැනු අර්ථයි. **උප ලක්‍ෂණ**, යම් ශබ්දයක් ස්වාර්ථයත් එයින් බැහැර අර්ථත් දෙයි නම් එය උපලක්‍ෂණ නමි. මෙහි මිග ශබ්දය එවැන්නකි. 'කාකෙහි‍යොභිලං රක්ඛති' යනුත් තිදසුති එහි කාක ශබ්දයෙන් කාක්කන් මෙන්ම තල වනසන අනෙක් සතුනුදු කියවෙයි. **එප්සෙන කල්හි**, නො පෙනී යන කල්හි; පැලවීම් අර්ථයෙහි යෙදෙන 'හැප්ස' ධාතුව කුදු ඇත්තේය. (කඩ්ඩාවිතරණී ගැටපද 72 පිට) ඇප්සෙන යනුත් පාඨාන්තරයි. (අපස්සන-ඇප්පෙන-එප්සෙන)

**කැමැජිවාහු**, කර්මයෙන් හටගත් වාතයෝ; (කම්මජ-කමජ-කැමැජි) කම්හුබුයි සිරුරැහි රැජන්න බැවින් 'කම්මපච්චය උතුජවාතයට කම්මජවාත'යි කිවෙත්, කර්මයන් බහි ශරීරයෙහි රුදු කරන බැවින් කර්මය ප්‍රත්‍යය කොට ඇති ඍතුයෙන් හටගත් වාතයට කම්මජ වාතයයි කිවාහු වෙත්; **සුළුහු**, චලිතවූහු, (බහි-බුයි) සුවෙන් වටන ලැදියට, සුවසේ වැඩුන තැනැත්තියට; එධ වෘද්ධෞ, එධ ධාතුව වැඩීමෙහියැ; **අලුවනාල්හි**, එළිවන කල්හි දෙනාල්හි යනාදිය සමග සමකාරනු **ශබවුවූහන්**, ගැබ නිහිවීම; (වුඨාන-වුට්ඨහන-වුට්ඨහන්) වෙලෙහි (වලා+එහි) වම්යෙහි; (වලාහක-වලහා-වලා) **උයු**, ඍතුව; (උතු-උයු) "**උතුං ආනෙසිඅගගහෙසිනිළුදෙනො**" ඍතුව ගෙනායේනුයි උදෙන නම්වේ. **මිනිසක්මු**, මනුෂ්‍ය සත්‍රියක් වෙමි. සත්‍රී අර්ථයෙහි උප්‍රත්‍යයිය. **දැබිඳුමෙන්**, ජාති භෙදයෙන්; **නොසම්ජසිහයි**, අසමාන ජාති ඇත්තවුන් සමග (ජාති-ජයි) **මුවිමෙන්**, මුසුවීමෙන්; (මිස්ස-මුසු-මුහු-මු-මු)

යෙනකෙනචිවණ්ණෙන-මුදුනාදරුණෙනවා
උබ්‍ඹරෙදීන මත්තානං-පව්ජ්‍ජාධම්මං සමාචරෙ

මෘදුවූ හෝ දරුණුවූ හෝ යම්කිසි වෙශයකින් දීන (පහත්) වූ ආත්මය එයින් නගාගත යුතුය. පසුව ධර්මයෙහි හැසිරිය යුතුය. **කැත්න**, ක්‍ෂත්‍රියයන්ගේ; **පුවුසි**, පොෂණය කොලේය. **නොවපුලෙසිවූ**, (නොවපුලෙහිවූ) නොවපුල ඉඩම්වලඇතිවූ; **අස්වැසෙන**, සැනසෙන; **වසඩක්**, වස්ත්‍රාඪයක්; (වාස-වස) **පිනපුව**, පුත්‍රයායයි කිවොත්; **මෙයට කිසෙසින් ආමහ යනුවහට**; මේ ස්ථානයට කෙසේ ආවෙමුදැයි යන්නට; **අලි**, ගෙනායේය; **දිවන**, දීපනය (ප්‍රකාශ) කරන; (දීපන-දිවන) **උෂශෝශ**, කම්; (ඝොශ-ඝොය-ගෝ) **ශුජන**, ශුබකරණ; (ශුජ්ඣන-ශුජන) '**පුතනපරම්පරාශ වලඤ්ජනකරජ්ජං**' පුත්‍ර පරපුරෙන් වළඳන රාජ්‍යය; **මඟනිමන**, මාගේෂප කරණ; 'සතර වාසලින් නිමන පුත්වත් අයදුන්න' (උම්මග්ගජාතක කකණ්ටක ප්‍රශ්න) 'එනුවරට නිමන

සතර පුගලෙහි අයින්, (පූ. වලිය රතනසාර සංස්කරණය 81 පිට) යනාදී තන්හි තිමන ශබ්දය උපදින-ගෙනයනු ලබන යන අර්ථයන් ගෙන දෙයි. (නියමාන-නියමන-නිමන) වන, වන්තොත්-පැමිණියොත්; නික්මෙත්ම, නික්මෙන කල්හිම; හමුඑසෑදූ, හැමූ කල්හි; හම, හැමීමෙහි දයින්තිපන් අතීත කෘදන්තයි.

මිනය අටුවාහි අභිවාතක රෝගයට 'මාරි' රෝගයයි කියන ලදී. එය විෂවාතය හැමීමෙන් ඇතිවිය හැකිය. සාදිකින්, බඩගිනි දුකින්; (ඡාත-සය-සය්-සා) ජේනුවාමෙ, ජීවත්වන්නා වූම, (අතිරිතන-අතිරිය-අතිරි-ඉතිරි) මනොක්කුමකට මෙනුය, මතොක්, (පාපකමිය) සවල්පය. (එබැවින් කුමක් කළහැක්කේදැයි) (මතාක්-මතක්-මතොක්) නවවෑද, අලුතින් වැදූ; "යනානෙකන අනෙපානනනකං" යම් පමණකින් ප්‍රයෝජනද එපමණ; අනතා, ප්‍රථමාර්ථයෙහි නෘතියායි. තොමෝයි අර් කියේ එහෙ සිති. පිණෑත්තිලව, ඒකාන්තයෙන් පිණැත්තිය; පරහු, අන්‍ය යන් විසින්; වදමවනොයන්, වඳවන්නේ නොවේද යන්; දුවහට; දුයකයාහට; (දුයක-දයක-දයව-දුව) අරන බැවින්, ගෙන දෙන බැවින්; දෙයලක්, දෙවරක්; [කල-යල] රැයිම්මෑ, රාත්‍රිය අවසන් නොවූ බලවත් උදසන්හිම; රැයින්මෑ, වගනරස්, ව්‍යාඝ්‍ර යන් හා වලසුන්; (තරවඡ-තරව-තරස-තරස්;) වලමුවන්, වන මෘගයන්, (වන-වල) අනුකරණ, සුසු ශබ්දයෙහි අර්ථය නොව ශබ්ද මාත්‍රයම ගන්නා හෙයින් එය අනුකරණ ශබ්දයි.

පැක්සෑ, දුවගොස්; (ප්‍රසකන්ද-පැක්සිය-පැක්සෑ) "ස්කන්දිගිතිශොෂණයොඃ" සකන්දි ධාතුව ගමන් වියලීම් යන අර්ථයන්හි වැටේ; පොයන, ගසන [පොථන-පොයන] අමරය්, අවුරා; (ගන්ධමාදන-ගඳමදන-ගඳමහන-ගඳමහන්) හන්, ගඳනා ලද; හනි, සවාමිනි; දුපපමවසය, නොදනහැකිය යනු අර්ථයි. මිනිස්ජෑයෑ නිවන්, මනුෂ්‍ය ජාතියෙහි උපන්; (විරූඩ-විරූජ-විරූජ්) තුරි, ප්‍රකටය; දෙමළ "තෙරි" ශබ්දයෙන් ආහැකිය. අදුරූ කිරිය, සෘජු ක්‍රියා; (සෘජු-අදුරූ) නොහැජ්, ඇදහැති; ජෙජ්, සිත් දෙක; ඉදිසිත් නොඇදසිත් යන දෙක; නොහුනජ්, නොපිරිහුණත්; හිමෙන්, ක්‍ෂයවීමෙන්; ආඇනජ්, ආයුෂය ඇතත්; ආයුක්ඛය මරණ, ආයු ක්‍ෂයවීමෙන් සිදුවන මරණ; කොවාමරණ, කොපයෙන් සිදුවන මරණ (කොප-කොව-කොවා) සම්භව වන, ඇති වන; එක්ෂෙනක්මිනු, එක චෙතනාවක් පමණක්, (චෙතනා-සෙයන-සෙන) අවරි අවරී සෙයින්, අපර අපර චෙතනා; වෙන්කිවෙත්, වෙන්ව කීවාහු වෙත්; එක්තමෙ, එක්වම; එක්,

සතක්හු, එක් සතකු විසින්; අනන්තර උපථම්භවුවද, ඔවුනොං වුන්ට උපත්ථම්භක [ආධාර] වූවද; [අඤඤමඤඤ-අඤමඤ-අන මන-අන්තන්මන] "ශාවතායුකං ඨත්වා උපරි උපරි නිබ්බත්තන්ති" ආයු ඇතිතාක් සිට මතු මතුයෙහි උපදී; දෙවජ්, දෙකවත්; පුණ්‍ය කර්මයක ඇති චෙතනා බහුත්‍වයත් ශක්ති බහුත්‍වයත් යන දෙක වද; පින්කමක් කිරීමේදී ඒ පින්කම සමග නොයෙක් පුණ්‍ය චෙතනා ඇතිවෙයි. එසේම එක්කෙනෙකු නොයෙක් පින් කිරීමද සිරිති.

මෙසේ පුණ්‍ය චෙතනා බහුත්‍වයද නොයෙක් පින් කිරීමද යන දෙකරුණෙන් බහු පුණ්‍යකර්මය වන්නේය. විපරී විසින් පුරුතුපින්, ඉහත කී බහු පුණ්‍යකර්මයට විපරීත වශයෙන් සවල්ප පින්; [විපරීත-විපරිය-විපරි] (පරිත්ත-පුරුතු) ආබාහෝ හෙවෙයි පිළිසැඳහුනු, බොහෝ ආයු ඇති භවයෙහි ප්‍රතිසන්ධි දුන්; මහත් කොටැලු, මහත් කොටුවෙක දමන ලද; අනතුරා ළෙහිමෙ, අතරෙහිදීම, දෙව්ලොව සම්පූර්ණ ආයුෂ ප්‍රමාණය ඉක්මෙනතුරු එහි නොසිට අතරෙහිදීම; යනු අර්ථයි. ආයි එස නට නොපැමිණිය, ආයුෂයෙහි අවසානයට නොපැමිණ (ආහි-ආයි) (ඔසාන-ඔසන-එසන) අහරසද සිහි නොකිරීමෙන්, ආහාර වැළඳිය යුතු කාලය සිහි නොකිරීමෙන්; ගිණිකා, ගණි කාවක්; (ගණිකා-හණික) දූ පුත් දෙදෙනාගේ විශෙෂ ස්ත්‍රී පුරුෂ භාවයන් නොතකා ඔවුන්ගේ සාමාන්‍ය මිනිස් බව පමණක් සලකා මෙබඳු තැන් නපුංසක ලිංගයෙන් යොදනු පෙළ සතු දෙබස්හි සිරිති. එබැවින් 'කිංජාතං' යන තන්හිද ඒ නපුං සක ලිංගය වියි. සාමාන්‍ය පුංසවන බැවින්, යී කීයේ එහෙයිනි.

එක්වජන්, එකවචන; නටද නොපිරිහිණක් කියපිවෑ, විනාශවුවත් අලාභයක් නැති බව කියනු කැමැතිවෑ; වක් හා කරණ හා නකත්යෝ; වක් (දින) ප්‍රථමා [පැලවිය] ආදී තිසෙකි කරණ, භවාදීතිසෙකි. නැකැත් අශ්විනී ආදී තිසෙකි. යෝ, යොහ; විෂ්කම්භාදී සත්විස්සෙකි. විස්තර නක්ෂත්‍රයෙන් දත්තේය. ගෙහිමුඹුව, ගෘහයෙහි මහාමාත්‍යව; [මහඅඹුව-මුඹුව) ගැල්පුරය, රියේ ඉදිරිපැත්ත; විෂාදයි, (විෂාදහි) ශොකයෙහිය; බැරිලව් කම්, අතිශයින් බැරෑරුම් කර්මයෙකි; සොවල්හු, අසවලා විසින්; මෙලේයි ශන කිසැයෙක්, මරණ ලද්දේය යන කෘත්‍යයෙක්; යක් පහරනාලදුයේ යි, යකුන් විසින් පහර දෙන ලද්දේ; සොරපවයිනම් පවුවට, එනම් පර්වතයට; (පපාත-පවත-පවය-පවයි) පවයින්, බෑවුම්; (පපාතක-පවයිත-පවයින්) සැපෙනුයේ

හැපෙතුයේ-වදිනුයේ; කිරිඳු, කිරිදිවැල්; කොදෙක්හි, (කොජව-කොද්‍ර) කොද්‍රපලසෙක්හි-විල්ලුද පලසෙක්හි; උළුබජනුවම බඳුන් වන්කලතැන්, උළු පිච්චීමට භාජනයක් මෙන් කල තැන; (පචන-බජන-බැජනු) සූලාය, පෝරණුව; නොසම්ජැපිනෙක්, අවජාත පුත්‍රයෙක් (සම්ජාතී-සමජැයි-සමජැ) හැනයරැ, අනතිකාරම; [සච්චකාර-සචකරැ-හැසයරැ] බඩුගණනා බව කැමැතියා, බඩුගැනීම බව හෙවත් බඩු ගැනීම කැමැත්තහු විසින්; "නංනඝාගච්ඡනතං ආහ" එහි යන ඔහුට කිය. වටකෙළි, බෝලවලින් කරණ ක්‍රීඩා විශෙෂයකැයි හැගේ. [ජිතිංසු-ජිතිහු-ජුනුහු] ජුනුනා වටවලාජිනය්, දිනු තාක්බෝල පෙරළා දිනා; [වටා-වළා] නැවත යනු අර්ථයි. නිබඳකිඹු, පැරැත්ත කෙළෙය. නොකොමැ නොමිය් සහහෙසි, නොකොට; ඒ ගුල ක්‍රීඩාව නොකොට මිදුනහොත් නොසැහෙසි. තවත් සොයනු.

වෙළෙව, ඉක්මන්වෙව; විසාදුපිහි, ශොකාපියෙහි; තුමා පුත්හු මරණැ විෂාදහා, තමාගේ පුත්‍රයාගේ මරණයෙහි ශොකය හා; මොහුජුනුයෙහි අහරැ, මොහුගේ දිනීමෙහි නොකැමැත්ත; දූහැවිශෙක්, ක්‍රොධ කල කෙනෙක්; මෙයින්, මේ තැනැත්තාත්; [මෙයිදු=මෙයින්] අධි, අධික; [අධික-අධිය-අධිය්-අධී] සපරහි, පරලොවදී; (සංපරා-සපරා) දුමුදූමියෙහි, මෙලොවදී; (දිඨධම්මික-දුටුදූමිය) පරිහාණ, නින්දැබිණීම; සව්සවහරණ, සියලු ධනය පැහැර ගැනිම; සව නම් ධනයයි. නොදූහැවියවුන් කෙරෙහි, කොප නොකල යුත්තන් කෙරෙහි; දශපිලාකරුණෙන්, දශවිධ පීඩා කාරණයන්; වෙදනං ඵරුසංජාතිං යනාදී ගාථාත්‍රයයෙන් දශවිධ පීඩා කරුණු විස්තර කරන ලදී. (බලවත් දුක, පින්හා යසස් ආදියෙන් පිරිහීම, අත්පා කපනු ලැබීම් ආදිය, බලවත් රොගය, උන්මාදය, රාජොපද්‍රව, දරුණු බැණුම්, ඤාති විනාසය, සැපත් වියොගය, ගෙවල් ගිනිගැනීම, යනුයි.)

පැල, පීඩා; "කායස්සභෙදා දුප්පඤ්ඤො නිරයං සොපපජ්ජති" නුවණ නැති හෙතෙම මරණින් මතු නිරයෙහි උපදී; මෙඝජ්ඣමහමෙගාවූ, මෙඝයෙන් වක්නොවූ; සුත්කැමියා, ප්‍රදෙශ පාලකයා; සිවාණන්ව අයත් නිඤ්ගම් ආදිය පාලනය කරන්නා යනු අර්ථයි. සගරාක්, සඞ්ග්‍රහයක්; දහකනැ, වසත්‍ර වාටියෙහි කෙලවරෙහි; වසත්‍රයෙහි වාටිය දශාවයි. "පාතො අසිතබ්බං පාතරාසං" උදේ කැයුත්ත පාතරාස නම්.

අවුණම, කඬේව; (සොනක-සනහ-සනා) ජනබාමෙහිකරා, ඒ කඬේට යැම හැර මාගේ පුත්‍රයාට සත්කාරකරව; "සිටිශේයුහු" යනු සිටිසේයුහුයි විතම් මැනම්. හිශෙන්, හිසයෙන්; "ඉෂෙමි

එසීන්වවහයි" යනු පෙම් එසින් හවයි, කියාවීනම් මැනවි. හවසි; හවගනී; (සංජායිති-හවයි) හවිද, හවගනිද; පදිවස, පුරාද්ද, වැඩියි, වඩිනය වෙයි; (පාදමූලික-පිගම්ලික-පියමිලිය-පියමිලි) "ගචජනානං අමහාකංපපකෙඩුවා භවිස්සති" යන අපව ප්‍රමාද වත්තේය; අසකැමියා, භාණ්ඩාගාරිකයා; කිස්සෙදර, ඉහ ඉද්දර; බඩුන් පිරිසෙයි, භාණ්ඩයන්ගේ පරිවෙජ්දය; (පරිවෙජ්ද-පිරිසෙය-පිරිසෙයි) පානසරාව, පාන භාජන; සිවිකා, දෙලි; නිෂිරි බෝලව, ඒකාන්තයෙන් කාලකණ්ණිහු වම්හ; හම්මන්නට, උපුලන්නට; සව්සියෙන්; සියල්ලෙන් සියය බැගින්; පිරිංගලි, විනාශ කෙළේය. හැයි, ඇද්දේය, කිසෙසයෙන් නිඃවූහු කෙසේ පිහිටවූද; (තිස්සය-තිසය-තිස) විශවුළු, තිපුකනවුයේ; (වශාවට-වියවට-වියුවු-වියවුළු) වියගලන්, වයස් ප්‍රමාණයන්; [ගණන-ගලන-ගලන්] 'ණ' හට ලවනු හෙළයෙහි සිරිති. 'වාණිජ්ජ' ශබ්දයෙන් වෙළෙඳ,යී ආසැටි බලනු.

ඝුද්දුමුව්රි, පෙර නොදක්නා ලද; විරි,සි සිටියේ පෙර ශබ්දය මැයි. "ජීවනකෘායනකෙඛානතා" ජීවත්විම පිණිස (සොයක සිටුවරයාගෙන් ලැබියහැකි උපකාරය ගැන) සිතන්නාහු; මිනිස පින්, මේ ආකාරයෙන්; (මේ-මී) (නීහාර-නිහර-නියර) ළුහුඹුහු ඹවට, වැදූ මවටද) වදනු ලැබුවහුගේ මවටද යනුඅර්ථයි. (විපත්ති-විපෙනි-විවත්) යාසැඩල, පලසැබොලිය; අඩයවි, අනින ආයුධ යක්; කනයමයසිද කියත්; පෙපෙරෙවි, යනු පෙරෙයි විනම් මැනවි. පූජියෙහි යනු අර්ථයි. (ආලොල-අලොල) සැණ, නියමිත දිනෙක කරන උත්සවය; ගුහනලද්, සොභණය කරන ලදී; යි සාවුළු දොරු, සිංහ කවාට වාරයෙහි; ප්‍රධාන ජනෙලය සිංහකවාටය නම්. මෙහි සිංහ ශබ්දය ප්‍රධානාර්ථයෙහි වැටේ යයි සාරත් දීපනී විනයටීකායෙහි කියන ලදී හස්සරවා, සිල් නබවා; බිසසෑ, අනිමෙන කොට (අභිසිඤ්චිත්වා-අභිෂෙසිය-බිසෙසිය-බිසෙසෑ) සැඩපජෝවා, චණ්ඩපජ්ජෝතයාගේ; (පජ්ජෝත-(පජෙවය - පජෝවා) සනිවුහන්, නිශ්වය; සන්නිට්ඨාන-සනිටුහන සනිටුහන්; කවැනක්හු, ලීයෙන් කළ ඇතකු; එබව එබවට, ඔබ්බෙන් ඔබ්බට; සැක්මෙන්, සක්මන් කෙරෙත්; සඳ; සැනය; සවසේ, සියල්ල සුදු; (සබ්බසෙත-සවෙසය-සව්සෙය-සව්සේ) මින තෙරගු සාසයින් සමිදිවිහැ සුනත්වියඑැත් කෙරෙමින් සැඩපජ්ජෝ උදෙනාගන්මියි මහනෙල් සිවි කැටැක් දක්වයි ගනැයි කුමට කිඳුහ පිළියක්, මහා සර්වරයෝ කච්චායන සමමාදිසි සූත්‍රය ව්‍යාඛ්‍යාන (අටුවා) කෙරෙමින් චණ්ඩපජ්ජෝතයා මහනෙල් සිවියට බදු (පාට ඇති) කාංඩ

හස්තියකු දක්වා උදෙන රජු අල්වා ගත්තේ යයි කුමක් නිසා කිවාහුද යි කියතොත්; ඇදුරෝලෙහි, ඇදුරුකුලයෙහි; (ඇදුරුකුල-ඇදුරුකොල-ඇදුරුඔල ඇදුරොල) මගබුමුකොට, මග කියන්නකු කොට; 89 සංකිච්චසාමණේර වතද බලනු.

බුමු යනු 'භුමක' ශබ්දයෙන් ආ හැකිය. මග පෙන්වීමට මග බුමු කිරීමයයි එකල ව්‍යවහාරයක් තිබුනා විය හැකිය. 'බුණු' යි සිටියේ නම් භාණක ශබ්දයෙන් ආ හැකිය. සොයනු. පිරෙදි, පෙදුරේය. සකටබ්‍යුහයෙන්, "සකටබ්‍යූහ නම් ගැලැත්තක් බදු සෙනාසන්නිවෙස ක්‍රමයි" යනු ජාතක ගැටපද පාඨයි. උදෙන රජු මැදිවනසේ දෙපැත්තෙන් දෙසේනාවක් විසින් වට කිරීම සකටබ්‍යුහයෙන් වට කිරීම නමි. (අනුබන්ධි-අනුබදි-නුබදි-නුහු බදි-නුහුබද්) උදෙනා අරණුඇත්හුවරා, උදෙනරජු නැංග ඇතාට වඩා; ජවඇතිකොට, වෙගය ඇතිකොට; (පරා-වරා) ජැවඩුහු, දිවවූහ; තනු, සත්‍ය-හැබෑ; (තත්ථ්‍ය-තතු) ගැන, ගෙන; විසියව, වසගයට-යටතට; (වසං-වස-විසි) ජගහරුවන් වරද කාරයන්; (ජනකරු-ජගහරු) පනු, පාතයයි; පෙපෙළවා, පොළො වෙහි; හැමියෙයෙන්, හටගත්තේ යයි කියත්; (සංජාත-හැජීය-හැදිය-හැටිය) ගහන උවසරින්, මන්ත්‍රය ගැනිමේදී කළයුතු සත්කාරයෙන් යුක්තව; ගණන යනුත් පාඨයි.

ගණහණසමයෙන, ගැනීම පිළිබඳ උපචාර විධියෙන්-මන්ත්‍රය ගන්නා කල්හි කළයුතු පූජාවිධියෙන් යුක්තව; සමය ශබ්දය පූජාර්ථයෙහිදු වැටේ. පුවහට, කීවහුට; "කිං ත්වංමංවඤ්චයසි" මොකද නුඹ මට වදිනවද? (ආඥ-අඤ) නිගනායුතුවක්හට, නිග්‍රහකළ යුත්තෙකුට; වැජැරිය යුතු, නියමකළ යුතු; (විචාරිතුං-වැජැරිත-වැජැරිය) සුරගජිනා, නිහීය තෙපුල්කීම; පිළිසෙවා. කොරගැහැනිය (පිඨසප්පි-පිළිසපි-පිළිසෙවි-පිළිසෙව) අළෙ කුද, එම්බල කුදිය; (අරේ-අළෙ) බොළින්, බහලහෙයින්; නො පිරිවැටිය හෙයි, පරිවර්තනය නොකළ හැකිවෙයි යනු අර්ථයි. සහවා, එක්කොට; සෙලෙක්මතු උවසරවස් තිබුයේ, ස්වල්ප මාත්‍රයක් උපචාරය පිණිස තිබුනේය. මාතරපළාතේ "රළක්" යි අද දක්වාත් තිබෙන්නේ මේ වචනයාගේම විකාරයකැයි හැගේ. මූලකිප තැනකම 'සුළාක්' යි දක්නා ලැබුනේත් මේ වචනයමැයි.

අභිසාරපිහි; අනන්තරාපිහෙයෙහි; සිජ්ඣඝණ අධිසරු, ශිලා ඉගෙ නීම් සඞ්ඛ්‍යාත ප්‍රධාන කෘත්‍යය; කාලවමනක්කිය, කාලයුත්තක් කියව; අක්ගිය; අයත්;-අතටපැමිණියක්; පුණු ද්වාය්,භාරකොට; අවුළුවනලද බැවින්, ආවට්ටනය (ආවේශවීම) කරනලද බැවින්; (ආවට්ටාපන-අවුළුවන) වටනලද බැවින්, පවත්වනලද බැවින්; විසිගිවනලද බැවිනැ, වසඟයෙහි පවත්නා බැවින්; කිසෙසින්, කෙසේ; කොලගරගුණයසින්, භූතයන් මෙන්; වෙරුබුමුසියෙන්, ශරීරයෙහි ආවේශවියයි කියත්, (අභිමුච්චති-අභිමුසියි-බුමුසියි-බුමුසි] නොබිම්සැමි, අවෙශ නොවීම; අවස්මර, අපස්මාර; සිත්සැති, චිත්තසන්තතිය; (සන්තති-සැයැති-සැති) ඇපි-ඇපියෙහි) කැමැති කැමැති දෙයෙහි; වත්වා, පවත්වා; ගෙහෙකාකප්, ගෙයකද; කොණෙසි, හැන්ද; ශඨාදෙවිපසින්, සේදූවනම පාත්‍රයෙන් යුක්තව; පිරියුණු; සම්පූර්ණ; බුමන්ගන්හු, බහුමාන ලැබූ අය-සවාමීන් වහන්සේ; ශූනු, පිළිවෙළ කළ, පස පිහිපිණයන්; පංචාඞ්ගයක් බිමතැබීමෙන් (දෙදන, දෙඅත, නළල යන පසඟයි) ගළවනුවට, ගතළමට; (ගත-ගළ) ධම්හ, ධම් යාගේ; ඉජිවා, සමෘධවේවා; (ඉඩා හවතු-ඉජිවයු-ඉජිවය්-ඉජිවා) හැමිමනාකජ්හු, සියලුම යහපත් සංකල්පනාවෝ; ජොතිරජනම් ඇති, ජොතිරස, යන නමක් ඇති; "ජොතිසොරසනති විසා-රනති එනසමානි ජොතිරසො" මෙයින් රශ්මිහු නික්මෙත්නුයි ජොතිරස නම්.

රස්කලඹින් පිරියුණුද, රශ්මිකලාපයෙන් සම්පූර්ණද (කලාප-කලඹ) සවකම්ද, සියලු කැමැති දෙය දෙන; (දද-දය-දය්-ද) පිගිවාවන්, පසුම්බි; (පසිබ්බක-පිහිවය-පිහිවය්-පිහිවා) හළදෙරකැමියෝ, ශාලාවාරය ආරක්ෂාකරන්නෝ; එකතුලස්, එකහාසමාන; (තුලිත-තුලිස-තුලස-තුලස්) රොජා, තජ්නයකොට; බෑවිය, හගකොට, හායිත්වා-බැවිය (නිගම්ගම්හි, නිගම්ග්‍රාමයෙහි-විශාල ග්‍රාමයෙහි; (නිගම-නියම-නියම්) අගහො-තුරු කරන තැන්, ගිනිදෙවියා පුදන තැන්; (අග්ගිහොත්‍ර-අග හොතුරු) රිවූහි, රූපයෙහි; (රූප-රුවු-රිවු) ශිලි, චලිතවිත-කැලඹුනේය; කමත්පියාළලි, කම්‍රාන්ත හැර දූම්මේය; බුම්නිය, බුහුමන් කරන්නව; (බහුමානිතුං-බුහුමනින-බුහුමනිය-බුමනිය) වෙරඹුවා, වෙරම්බවාතය; (වෙරම්බ-වෙරඹු) (වාත-වය-වය්-ව-තුණුවෙදයන්, ත්‍රිවෙදයන්; (තිණ්ණං-තිණු-තුනු) රාඅධිහුපිය රාගාධිකයාගේ පාදය; (රාග-රාය-රය-රය්-රා) (අධික-අධිය-අධිය්-අධි] පුලාක්පිය ඇගින්හැසිරෙව්, පාපිවිය හා සංසකතවෙයි හෙවත් පිය අගින් සවල්පයක්, එබෙයි. (සංසකත-හැසිය-

හැකි) දෙස්සිරිහු. දොසචරිතයාගේ; (චරිත-සිරිය-සිරි) පල්වා බබා ඇක්මෙන බැවින්; පූර්වාදයබබා ගමන්කරන බැවින්; (පෙරපය-පල්වය-පල්වා) විසුද්ධිමග්ගසන්නයෙහි කර්මස්ථාන ග්‍රහණ නිර්දේශය බැලීමද ප්‍රයෝජන වනී. (කා: ධම්මරතන ශුද්ධිය 271-396 පිටු) මොහු සිරිහුපිය, මොහචරිතයාගේ පාදය; (මොහ-මොහ-මොහු) තිවිත්හුණු, තිම්තන පතිතවූ සක්ලක්ෂණෙන්සැදී කෙනධාදිස්නා පියවෙයි, චක්‍රලක්‍ෂණයෙන් සැදුණු (අලංකාරවූ] ත්‍රිවිධලොක ධාතුව දක්නා උතුමෙකුගේ පාදයවෙයි.

"උදකපාතියං කුම්භිලෙ පස්සනසිලා" දියබඳුනෙහි කිඹුලන් දක්නාසුලු තැනැත්තියක; දියපැයි කිඹුලන්දක්නාක්හු, ජලපාත්‍රයෙහි කිඹුලන් දක්නහු විසින්ද; ගෙමැද සොරුන් සනජ්නහු දක්නාක්හු, ගෙමැද සොරුන් සැතපෙනු දක්නහු විසින්ද; නොම ඇතියක්හු ඇති දක්න සෙයින්, නැති දෙයක් ඇතැයි දක්නා පරිද්දෙන්; පස්කම්ගුණවලජනුවක්හු පියෙයි දන්හි, පස්කම් ගුණ අනුභවකරන්නෙකුගේ පාදයයි දන්නෙහි; (පාති-පැයි] ඥාපක හේතුවක්, යමක් හඳුන්වන හේතුව ඥාපක හෙතුවනම්වේ. "කම්මස්ස කතත්තා, උපචිතත්තා, උස්සන්නත්තා විපුලත්තා උප්පන්නංහොති චක්ඛු විඤ්ඤාණං" [කර්මය) කළ හෙයින්-වැඩූහෙයින්-අධික හෙයින් බොහෝ හෙයින් - චක්ඛු විඤ්ඤාණය උපන්නේය. යනු නිදසුනී. චක්ඛු විඤ්ඤාණය වනාහි පෙරකුසල් කළබව හඟවන හෙයින් ඥාපක හේතුව වෙයි. මහාභිනික්මනහි පටා කුමාරිකා පලොගන අවසන්කොට ඇතිනාවන්; මහාභිණිස්ක්‍රමණයෙහි පටන් මාර දුහිතෘන්ගේ පෙළඹවීම අවසන්කොට ඇතිකාක් කථාවස්තුව; කපක්කොට, නිදසුන්කොට; ඔබට මගේ දුව දෙන්නෙම්යි මාගන්දිය බමුණා කිව්ට, තුඹගේ දුවගෙන් මට වැඩක් නැතැයි සෘජුව නොකියා සිය අදහස අන්විධියකින් හඳුන්වනු සඳහා මහාභිණිෂ්ක්‍රමණයෙහි පටන් මාර දුහිතෘන්ගේ පෙළඹවීම දක්වා ඇති කථාව බුදුහු වදාළහ. ඒ කථාව උන්වහන්සේ පස්කම් ගුණ නොවලදන බවට නිදසුනක් විය. එහෙයින්ම එය ඥාපකහේතුවකුදුවිය.

කපක්, (කප + අක්) මෙහි 'කප' යනුයෙන් අභිසඳ්දහනය-විශ්වාසකිරීමට කාරණය අදහස් කරනලදී. (කප්ප-කප] නැළවීම්, පෙළඹවීම්: කිරිසවුළු, මල (කුණු) යෙන් පිරුණු තැනැත්තිය; [කරීසපුණ්ණ-කිරිසපුණු කිරිසවුණු-කිරිසවුළු) අජ්කොටැස්හි එසන් මූත් හා, ආපොකොටසැහි අවසානයැවූ මූත්‍රද; පිළිකුල් භාවනාවෙහි ආපොකොටස පිත්ත ශබ්දයෙන් ඇරඹෙයි. පළමි

කොමැස්හි එසන් කරීස ගහණින්. පළවී කොටසෙහි අවසානය වන කරීස [මල) ශබ්දයාගේ ගැනීමෙන්; (ඔසාන-ඔසන-එසන-එසන්) කළෙබරං, මළසිරුර; "මාගණ්ඩියාපිතො ආඝාතංබන්ධි" මාගණ්ඩියද ක්‍රොධබැන්දය; මාගණ්ඩිය කුලෙයි පහලකුලකොමැස්, මාගණ්ඩියගේ කුලයෙහි ප්‍රසිඬ අනෙක් කුල කොටස්; (කුලෙහි-කුලෙයි] විය-වයස; යී වීනම් මැනවි. 'සපුවයෙන් යනු සපු මෙන්, යී වියයුතු සේ පෙනෙතත් සපුව යනුත් ප්‍රකෘතිය සේ ගතහැකිය. 'සම්පද' ශබ්දයෙන් ආහැකි හෙයිනි. එසේබඳු, එවැනි; "අනප්පං මේ අවරි" මට අනර්ථයක් කෙළේය.

පුණ්ණුස්වා, පාවාදී; නළුවරන්, නෘත්‍යකරන සත්‍රීන්; (නටකාර-නළුවර) [තෙල්වර-තෙලකාර) යනාදිය සමගද සමකරබලනු. අකාරවැළිඤ්දික්වූ, අකාරය වනාහි දික්විය; වසසරතන යනු 'වස්සාරත්ත'වූයේ ඒ දීඝියෙනි, අරඤ ආමෙණකි, අරඤායතන යෙහි; (ආයතන-අයයන-අයන-ආන) අළ්ප්පමණ ඇතියක්, සවල්ප ප්‍රමාණ ආත්මභාවයක් ඇත්තීයක්; [අල්ප-අලුපු-අලුප්) "සුඤරංවතසියා" ඒකාන්තයෙන් යහපත් වන්නේය; (තණ්ඩුල-තැඩුල-සැඩොළ) උඳුමුහුඹු. උදු සහ මුංවලින් සාදන සූප; (සූප-සුවු-හුවි-හු) සූපය වනාහි සුප්වැනි බීමකැයි සමහරුන් කිය තත් එය කෑමක් බවට නොයෙක් නිදසුන් ඇත්තේය. කෑම රුචිකරනුත් බඩේ දෙෂ නැතිකරනු ත් සඳහා කුළුබඩු යොද සාදන ලද්දකි. කැබලිවලට තපා සකස් කළ සූපය බත් අනු භවයට පෙරාතුව අනුභවකළ බවත්, වැඩිවශයෙන් මුංවලින් සාද පෙරුම්කායම් දුම්ගැස්සූ බවත් පෙනේ. මුංවලට "සූපශ්‍රෙෂ්ඨ" නාමය යෙදුනේ ඒ නිසාය. ථනපා, කිරිබොන; සිදත්සඟරාහි 'තනපා' ශබ්දය තනකිරි අර්ථයෙහි යොදන ලදී. (ථනපායී-ථනපය-ථනපය්-ථනපා) ථනපායක ශබ්දයෙනුත් ආහැකිය.

මිශෙහි ලැගි අමිස් පිය වනුව වස් මුව විසල්වා, මුඛයෙහි රුඳුන ආමිසයන් බැහැර කරනු පිණිස මුඛය සෝදවා (ආමිස-අමිස - අමිස්) (විසාලාපෙත්වා - විසලවය - විසල්වය්- විසල්වා) "ඉදානි උපොසථඞ්ගානි අධිට්ඨහන්තො උපඩ්ඪුපොසථ කම්මං ලභිස්සති" දැන් උපොසථ අඞ්ගයන් අධිෂ්ඨාන කරන්නා අඩ පෙහෙකමක් ලබයි. "උපොසථනියමෙන සමාදාතබ්බ සීලානි" උපොසථ නියමයෙන් සමාදන් විය යුතු සිල්; "ඉමංචරත්තිං ඉමංචදිවසං" මේ රැයද මේ දවාලද මුලුල්ලෙහි; පෙහෙවිශා නොවේ, උපොසථය කරනලද්දේ නොවේ. සිල්රැකියාවෙ මතුව, (සිල්රැකියා මතුවවෙ) සිල්රැකීම් මාත්‍රයෙක් වෙයි

"**උපොසථඞ්ගවසෙන සමාදියිස්සාමි**" උපොසථඞ්ග වසයෙන් සමාදන් වන්නෙමි, **උපොසථකම්මාභෙදනං**, උපොසථ අඞ්ගය, උපොසථ කර්මය හා එක්කොට ගෙන; **උපොසථ කම්ම නොදුරුවන් උපොසථ නාමයෙන්ගත්** සිල්දු නොදුරුවන බැවින්; උපොසථ නාමය නොදුරුවත් උපොසථ නාමයෙන් ගත් සිල්ද නොදුරුවන බැවින්; (සොයනු) බසඳන, සුවඳ; **මාලාදි විරති**, මල් ආදිය පැලඳීමෙන් වෙන්වීම;

**චතුමධුර**, ගිතෙල්, මීපැණි, උක්සකුරු, මිදිඵල; **අපිස්සෙය් සුබැවින්**, අපවිජ්ජ පරිද් කී බැවින්; **බුත් ඉතිරිබත්බිජ්**, වළඳ ඉතිරිකළ බත් අනුභවකොට; **වරය්**, වඩා **පෙහෙවූමෙ**, පෙහෙවූ තැනැත්තේම; **සටපෙළ**, පහත භූමියෙහි; **වහල්**, උපකාර; (උපකාර - උවහල - වහල - වහල්) **පිරිවැෙවි**, පරිවත්තය වෙයි- පැද්දෙයි; **දඬුවැටින්**, විලක්කුවෙන්; **ශාසනසමය**, ශාසනයෙහි ඉනැත්වීම; **වනගඳපිළුම්ලි**, වණ්ණය හා සුවඳ බැහැර කළ මල; (මල-මලි-මිලි) **කසල** මෙ වැනි බැවින්, කසලක් කුණක්) ම වන හෙයින්; (කචවර - කසළ) කසට ශබ්දයෙනුදු ආඛ්‍යාතිය. **බුදුහු මමෙ යන ගහණ**, බුදුන් මගේමයයි ගැනීම; **ගැවුරෙන්**, ගෞරවයෙන්; **ඇඟිලිහුවා**, දෙහොත් ඔසොවා; (ගාරව-ගැවුර) (උස්සාපෙත්වා, උහුවය-හුවය-හුවය්-හුවා) **අභිනිහරු**, ප්‍රාර්ථනාව; **එජයෙ**, ඒ ජාතියෙහි; "**පාථෙය්‍යං සජ්ජං කත්වා**" මාගෝපකරණ සකස්කොට; **අවජාදන**, හැදීම; "**සුඤ්ඤාගාරෙරබො තථාගතා අභිරමන්ති**" තථාගතවරයෝ වනාභි ශූන්‍යාගාරයෙහි (ජනසම්බාධ රහිත ස්ථානයෙහි] ඇලෙත්; **සපසනුසෙයහි**, සයපනුයෙහි,යි විය යුතුයි. වළඳනස්ථානයෙහි; (සන්තප්පන-සතපනු-සයපනු) **අනුමොදන**, දුන් දනය අනුව සිතා සතුටුවීම; **සැතපිසෙයි**, වැලඳුගෘහයෙහි; (සන්තප්පිත-සැතපිය-සැතපිය්-සැතපී) **බණකියනෙයි**, බණකීයනු මැනවැයි, (කියනේ-යි-කියනෙයි] **වළපෙන**, සිරිත; (බහුස්සුත-බහුසුය-බුහුසු) **සාඅයං**, යම් මේ බුජ්ජුත්තරාවක්; **උදුළු**, උඩටගිය; (උද්ධූත-උදුළු) "**උද්ධගගානි අවජිනි යෙසූවාතපානෙසු තානි උද්ධවජිනි**" උඩුකුරු සිදුරු ඇති ජනේලයෝ උද්ධවජි නම් වෙත්; "**මාගන්දියා නාගරානං ලඤ්ඡං දත්වා පලාපෙථාති ආහ**" මාගන්දිය නුවර වැසියන්ට අල්ලස්දී පලවාහරිවියයි කීවාය.

**දසඅක්කොසවත්ථූනි,** (හොරෙක්වෙහිය, බාලයෙක්වෙහිය, මොඩයෙක්වෙහිය, ඔටුවෙක්වෙහිය, ගොනෙක්වෙහිය, බූරුවෙක් වෙහිය, තිරිසනෙක්වෙහිය, තිරිසනෙක්වෙහිය, තට සුගතියෙක් නැත්තේය, තා විසින් දුගතියම කැමතිවිය යුතුය) යන දසවිධ ආක්‍රොශ වස්තූයෙන්; (ගදුභ-ගද්‍රභ-හඩුබු) **"අධිකරණියෙනො උපසමනීයෙනො අධිකරණං"** අධිකරණියතො, සේයි, උපසමණි-යතො, සංසිඳවියයුතු හෙයින්, අධිකරණං අධිකරණය නම් වෙයි. **තුමහට යම් කවරිකිසයෙක්,** තමා පිළිබඳ යම්කිසි කෘත්‍යයෙක්; අව; මම; ගුළු, (ගලිත) ගිළිහුණු; (ගලිත-ගලිය-ගිලිය-ගුළුය-ගුළු) **නිර්දිෂ්ටවිෂයපංචමී,** දක්වන ලද ක්‍රියාව විෂය කොට ඇති පංචමිය "වාපාතො පතිතංසරං' යන තැන පතිතං යන කෘදන්ත ක්‍රියාව දක්නා ලැබේ. **උපාත්තවිෂයපංචමී,** අධ්‍යාහාර කළයුතු ක්‍රියාව විෂයකොට ඇති පංචමිය; වාපාතො පතිතං සරං, යන තැනට මුඤ්චිත්වා යනුවක් අධ්‍යාහාර කළවිට, වාපාතො මුඤ්චිත්වා පතිතංසරං, සී සිටී. **ඉක්මපැවැති නෙපුල්,** ශිෂ්ටයන්ගේ සීමාව ඉක්මවා පැවැති වචන-නින්දා වචන; **සෙහෙද,** ඉවසයිද; **සමු දයාවසී,** පිණ්ඩාවසී; **යස්මා බහුජ්ජනො දුස්සීලො තස්මා නං අසඤ්ඤාපෙත්වා තස්ස අතිවාක්‍ය මෙව තිතික්ඛිස්සාමි"** යම් හෙයකින් බොහෝ ජනයා දුස්සිලද එහෙයින් ඔහුට නොදන්වා බහුල ජනයාගේ නින්දාවචනයන් ඉවසන්නෙමි; **දැමුනක්මෙ,** දැමුණු ඇතෙකු පිටටම; **කෙලෙස්පොපිසුනුයෙක්මෑ,** කෙලෙස චලනය සිඳදැමූවෙක්ම; **ජායේ,** ජාතකවූයේ; **ජා,** උපන්; (ජාත-ජය-ජය්-ජා) **සම්කාරක්,** යම් ආකාරයක්; **යම්සංඥවක්** යනු අවයි.

**වරජ්,** වඩාත්; **තුමහමෙදමනලදරාත්ව,** ආනම්ය දමනය, කළ රහත් වහන්සේම; **විවසුන් මගඑල තුමා පියවින්වූ** බැවින්, විදර්ශනාව සහිත මාර්ග ඵලය තමාගේ ප්‍රකෘතීන්වූ බැවින්; **අවුළු,** ව්‍යඤ්ජන; එලවූළු යන තැන පෙනෙන 'වුළු' යනුව සමගත් සසඳනු; **වෙණෙදෙණියෙහි,** වීණාකදෙහි; වීණා කද සාමාන්‍යයෙන් ඔරුකඳක හැඩහුරුකම ඇත්තේය; **පිදහි** වැසීය; **සුය්ඔන්නේ,** පිඹින්නේ; **විෂාදහි,** බෙදයෙහි; **සුව,** කිවාය; **සාමාවතිය,** සාමාවතියගේ; (සාමාවතියා-සාමාවතිය) **සිරිනැතියේ,** කාලකණ්ණියෙක්වෙයි; **නොහික්නාහු,** නොහික්මූනාහු වෙත්; (හසිකඛිතා-නොහික්තා) **විනෂටනොපවතුවහු,** විනය සිඛිය නොපවත්නාහු වෙත්; **පවුහසර,** පාපයෙහි හැසිරීම-පාපයෙහි පුරුද්ද; (සංචාර-හසර) **ගිවසාලෝ,** නැවතදී හැරියාහ ; තමාවෙත එවනලද්දක් හෝ වස්තුස්වාමීන්ට නො

දත්වා, හොරහිත නැතිව ගත්දෙයක් හෝ නැවත දීමට ගිව කිරීමයයි කියති. ගිවශබ්දය භණ්ඩදෙය්‍යාර්ථයෙහිත් වැටේ. (ගීව-ගිව) ජුලුහැනක්බඳු, දිලිසෙන ලද්දක්, දිලිසුනක්බදු– "ශරයක් ජීයෙහි බැඳ දුනුමිටගෙන කඩපහා මදක් නැගුව බිමින් මුත-දහම්මිත දුනු" මේ වාක්‍යය අශුද්ධයේ පෙනේ. "දහසක් බර දුනුදියෙහි බැඳ දුනුමිටගෙන ලැගුසද නොබිදෙහදුනු"(35 විඩූඩ-භයාගේ වත්] "එදුන්නෙහි දියතහා මධ්‍යම පුරුෂයන් දහසක් දෙනා උසුලන පමණ සිහිවල් පලු ඇ කිසි නවරහාරයක් දුනු දිය මැද බැඳ දුනුමිට ගෙන අහසට නගනකලැ ශරයක් හිඳුවා අදනා පමණ නැමෙත්මිස එයින් වඩා නොනැමී බරගෙන අහසට නැගෙන දුන්නගෙන කීයේ" (මහාබෝධිවංශ ගැටපදය 43 පිට) මේ කිහුම් අනුව සලකන විට එකී වාක්‍යය, "සහස් හරයක් ජීයෙහි බැඳ දුනුමිටගෙන කඩපහා මදක් නැගුව බිමින් මුතද හම්මත දුනු" යි වියයුතුය. දහස් දෙනෙකුන් විසින් ඉසිලිය යුතු බරක් දුනු ලනුයෙහි බැඳ, දුනු මිට ගෙන ඊය ඉවත්කොට මදක් එසවුවහොත් බිමින් මිදුනත් උසුලන දුන්න, යනු අර්ථයි. අට්ඨවාහි සහස්සත්ථාම දුන්න තේරු සැටිත් මෙයම සරිලයි.

ගලස්, ගලපා–සම්බන්ධකොට; (ඝටෙත්වා–ගට්ය–ගලය–ගලස්) පෙරෙහි, ඉදිරියෙහි; "සමන්තනොමුඛ්‍යහාමි සම්මුඛ්‍යහාමි" හාත් පසින් (සර්වප්‍රකාරයෙන්) මුලාවීමි. "පමුඛමුඛ්‍යහාමි පමුඛ්‍යහාමි" ඉදිරියෙහි මුලාවෙමි; නොවඩහයි, අවබෝධනොවේ; බියනහනුව, බියනසනු මැනවි; "ශම්භං සරණං ගතානං සරණං භවජ" මම යමෙකු ශරණගියෙම්ද උන්වහන්සේ සරණ යව; අතිරෙක තරං, අධිකව; තුමාවරජ ඇති සිතින් නොදහයි හැගැ, තමාගේ වරද ඇතැයි යන සිතින් කෝප නොකෙරේ යයි සිතා නොහදයි' යනු නොදහයි, යි විය යුතුය. ඉස්නාක්, කැමති දෙයක්; ගුනතහාසනෙ, රහස් කීමෙහි: ප්‍රත්‍යාශංස ප්‍රාර්ථනා; පස්මත් උතුරු සලිසියෙන්, උතුරුසළු පත්සියකින් පමණ; (සාටක–සළු–සලි) "එකං වත්ථං ගන්ත්වා එකවත්ථා" එක වස්ත්‍රයක් බැගින් ඇති ස්ත්‍රීහු එකවත්ථාතම් වෙත්.

මස්, ඇඳ; (මංච–මච–මස–මස්) අතුරුණු, අතුරන ලද්ද; බුර්සිවිරක්නාම, භූමියෙහි මතුපිට කල පරිකර්ම ආරක්‍ෂාකිරීමට; "මහාකිකාශමද්දිතා" මැටි සමග අහා; එකෙකකි ගම, එක එකක්ම; සැල්, වර; (සාල–සල–යල–සැල්) පසිලිඅග, පංසුකූලි කාංගය; (පංසුකූල–පසුලි–පසිලි) පාසාද ජිද්දදසන, කූකකූම

පෙසන, සපපමොවන, පෙහෙයෙහි සිදුරු දකිම කුකුලන් හැරීම, සපියා මුදහැරීම; අදූණු සඳහා කෙලෙසී ගුණව වැපිණ, අගුණ ප්‍රකාශ කරනු සඳහා කලදෙය ගුණය පිණිස පැවැත්තේය; (කතක-කෙලෙසි) සිළී, කුඩා; (චූල-සුළු-සිළි) කොවාර, ගබඩාව; (කොට්ඨාගාර-කොවාර) බුසී, පිටත; (බහි-බිහි-බුහි-බුසි) හිඳි-යෙහි, ඉදිරියෙහි; (සම්මුඛ-හමුය-හමිය) ගෙණෙක්. (ගණ+එක් කෙණෙක්) 'කෙණෙක්' යනුව නියත බුහුබස්වූයේ ගණශබ්දයෙන් අං හෙයිනි, තා ආගතාගබෙහ පවෙශෙසබා” ආවාවූ ඔවුන් කාමරයකට යවා; “අනු අමතං අපරිවජ්ජනං අගගං යසා” අනු යේයි; අමතං, නොදතනැකි; අපරිවජ්ජනං නොපිරිසුන්; අගගං, කෙලවර; යසා, යම් තැනෙක්හිද, සසර නියර සවන් ඥණින් නොදත් බැවින් කියත්, සංසාර තත්ත්වය සමිඥ ඥත ෂෙත් නොදත් බැවින් කියත්; වෙසින් පරිගා කම්ඨන්, වෙදනා පරිග්‍රහ කම්ස්ථානය; (පරිගගහ-පිරිගහ-පිරිගා) සෙවිම යනු අර්ථයි. (වෙදනා - වෙයින - වෙයින්) සිම්ජිත, පරීක්ෂාකරන; (සම්මජ්ජන-සමජන-සිම්ජිත) පස්ගියීන් කවරගියි; පංචගති යෙන් කවර ගතියෙක්හි; දෙව් මිනිස්, තිරිසන්; ප්‍රේත; අසුර යනු (පස්ගතිහුය; ගති-හයි-ගියි-ගි) පිරිසා, පිහිට; (පරායෙ, පිරියා) මොහබාන් ඇතිය; මොහ නමැති බන්ධන ඇති (ලොකය) භව්‍යබ-ද්‍රව; සුදුපුවූවක්සේ; කර්තෘ හි හෝ 'බබ' වනු, කර්තෲර්ථයෙහි හෝ 'බබ' ප්‍රත්‍යය වත්නේය. එය පෙනෙන්නේ “හබබ” යන තන්හිය, කෙලෙස් උපධි; කෙලශ සඞ්ඛ්‍යාත උපධි: අපාය දුකට හෙතුවන හෙයින් කෙලශයෝ උපධිනම් වෙති. සසති සමව; සදකාලිකයේ; තහවුරු සපිර; (ථාවර-තහවුරු)

සතබිදෑ, අවිද්‍යා අඳුර බිද; සසති සෙසමක්, සසති (සද කාලික) සමවූවක්; වෑර ඇතිසාව, විසසි ඇතිව-නිතර; සැක වචනුයෙහි වෑරනොවිහිජය්, සැක සහිතව පැවැත්මෙහි වියයීය බැහැර නොකොට; (විසසජෙතවා-විහිජය-විහිජය්) අසක්හිඛිලි-යෙම්, සැක බහුලකොට ඇත්තෙම්; (ආසඞ්කා-අසක-අසක්) ආදිනොසඞ්කිනං ආසඞ්කිනං, පරිනොසඞ්කිනං පරිසඞ්කිනං” මුලපටන් සැකකරනලද්දේ, ආසඞ්කිතනම්ද භාත්පසින් සැක කරනලද්දේ පරිසඞ්කිතනම්ද වෙයි. ඇනිළි, කට්ලොකු විශාල හට්ටිය-පස්තැලියක් දියගන්නා බඳුන; (අතළු-ඇනිළි) පසා, පිසවා-බදවා; (පාචෙතවා-පසය-පසා) “සා යනු ඛාපායු සනානි සිත්තා අපු” කවරකථාවකින් යුකතව සිටියාහුද? ඕනං අප නෙතුකාමා, සියල මුදනු කැමැත්තාහු; අපසිහි පවත්වියානෙනි ඒ කම්යාගේ ඉතිරිව තිබුන ප්‍රවෘත්ති විපාකයෙන් (අවසිඪ අව-

සිටි) රජවටනමාගම්, රජුට උපස්ථාන කරන ස්ත්‍රියක් (උපට්ඨාන- උවටන-වටන) විජනාදී, පවන්සැලීමාදී; වැටතියක්, උපස්ථාන කරන ස්ත්‍රියක්; (වටනංගු) (වටති-වැටති) රන්මලාවක්, රන් තලියක්; විවෙසින්, විපාකයෙන්; (විවෙයංගුන්) විපාක-විවය] අටමත්දලවලසින්, ඇත්දත්වලලු අවක් පමණ; වලයාති වල සින්) තවුකැල් නොතවුකැලි බවුජැනීශපි අභිප්‍රායෙන්, කුදිය දූත් දලවලලු අට පිළිබඳ තාවකාලික භාවය හෝ තාවකාලික නොවන (ස්ථිර) බව දැනගනුකැමැති [අදහසින්; හිමවනන-හිම වන-හිමවය-හිමවිය-හිමවු)

පවුබෙසද, පවුපාමූල, යටට නැමීගිය පෙදෙස; නොසට වුහුමෙ; නොතැපුතාහුමය; දලවලා, ඇත්දත්වලලු; (වලය-වලා) පාරිවරියානුත්තරිය; රත්නත්‍රයට මෙහෙකිරීමෙහි ශ්‍රෙෂ්ඨබව (සංගීති සුත්තවණ්ණනා බලනු) (හේ. වි. ග්‍රන්ථය 759 පිට) සංසග්ගවාසනා, ගිහියන් සමග එකවිට විසීම පිළිබඳ සංසාර පුරුද්ද; නොපුහුන් බැවින්, ප්‍රගීත නොවූ බැවින්; පහසින් පෙළි, පසාධන (ඇදුම්) පෙට්ටිය; (පෙලා-පෙළී] අප්පමාද ලක්ඛණ, අප්‍රමාද (ස්මෘතිඅවිප්‍රවාස) යෙහි ස්වභාවය, අප්පමාද පච්චය, අප්‍රමාද හේතු; අප්පමාදපටිපදා, අප්‍රමාද ප්‍රතිපදාව අප්පමාදපටිපක්ඛාදී, අප්‍රමාදයට විරුඬ දෙය ආදිය; සංඥානන විසින්, දැක්වීම් වශයෙන්; එරෙයි, බසියි; (ඔතරති-එතරයි-එය රයි-එරයි-එරෙයි) "පාදතලචාරීනං සත්තානං" පයින් හැසි රෙන සත්ත්වයන්ගේ; ඇගියෑ; අග්‍රවිද; (ඇගීදූ-ඇගියැ) කාම වැජැරිය; කාමාවචරික-කාමලොකයෙහි හැසිරෙන; (කාමාව- චරික-කමවජරිය-කමවැජැරිය) සමාධිපැන්හැවුවවපිසී; සමාධි ප්‍රඥාභාවනාව භාවනා කලොත් වටියි; (පඤ්ඤා-පඤ-පැන-පැන්) පිළිවෙත්පිළිපනුවන්, ප්‍රතිපත්තියට පැමිණියන් විසින්; හෙතු ඵලාදිරූපයෙන් අපමාගිමෙ එකසෙරනුවෞ, හෙතුඵලාදී සව රූපයෙන් අප්‍රමාදයෙහිම රැස්වූවාහු-එකතුවූවාහුවෙත්; (ඔසරණ- ඔසරණුඑසරුණු-එසරෙණු) කරණීයාකරණීය, කළයුතු නොකළ යුතුදෙය; "පජානාති ඉමිනාතිපදං" මෙයින් යෙත්නුයි පදනම්. යෙති මෙසින්සී, මෙයින් යෙත්නුයි;

මොට සි හැසි, මූලාසිහිය යසි; (මුඨා-මොට) (සති-සිහි-සී) සිපිළිවක්ව උපන් සතරකන්, අවිද්‍යාව මුල්කොට ඇති එක ප්‍රමාද යක්ද තෘෂ්ණාව මුල්කොට ඇති තුන් ප්‍රමාදයක්ද ඇත්තේය. ඒ කඳුහතර ස්මෘතියට ප්‍රතිපක්ෂව උපදී. (නෙත්තියෙහි 32 පිට) බැලිය යුතුයි. (කඳු-කන්) සිවිගිජ්මහ, ස්මෘති විප්‍රවාසයගේ සිහි

නැතිකමගේ"වොස්සජ්ජති එතෙනානිවොස්සග්ගො, වොස්සජ්ජනං වොස්සග්ගො" මේ කරණකොටගෙන බැහැර කෙරේනුයි වොස්සග්ගනම්. කරණාර්‍ථයෙහි සිඩය. වොස්සජ්ජනං වොස්සග්ගො බැහැර කිරීම වොස්සග්ගනම්. භාවයෙහි සිඩය. දෙසෙස්නිඤ්, දෙව්ධියෙන්ද; [සෙය-සෙය්-සේනි) සේනි, කරණවිබනි. මුළෙයි මූළාවූ තැනැත්තේ; (මූළ්හක-මූළ්‍රෙයි) ජැසිඋක්මෙනුවට, ජාතිය ඉක්මවීමට; (ජාති-ජැයි) සසර පිරිසිඳුනාකම් නොකරන හෙයින්, සංසාරය මෙතෙකැයි ප්‍රමාණකරනකම්(පින්) නොකරන හෙයින්; සසර 1. එනක හෙයින් පරනැතියි නොපිරිසූනු, සංසාරය මෙපණ හෙයින් තවත් (පර) නැතැයි පිරිසුන් නොවීය. (එනනක-එනක) අප්පමාදමෙව ලක්ඛියති, අප්‍රමාදයම ලකුණු කරනු ලැබේ=ප්‍රකාශ කරනු ලැබේ- ගනජ්, ගත්තත්! "ලක්ඛියති එතෙනාති" මේ කරණකොටගෙන ලකුණු[ප්‍රකාශ)කරනු ලැබේ.

උපදිසෙස් මරණයෙහි පටය්, උපාදි (පංචස්කන්ධය) සෙස් (ඉතිරිවූ) මරණයෙහි පටන්: (පට්ඨාය-පටය-පටය්) තුමාසනනැ තමාගේ චිත්තයෙහි (අප්පමාද-අපමය-අපමය්-අපමා) ]සඞ්ගහ-සගහ-සගහ-සහා) නොඋපජනම්ලබහුජ් පුනාලක් නොම්-යෙන් (උපජ නොලබහුජ් පුනාලක් නොම්යෙත්නම) උත්පත්තිය නො ලබන්නාහුත් නැවත නොමැරෙන්නාහුත් නම් වෙති. (පුනකල් - පුනාල්) අක්ප්‍රත්‍යයයි පමා මිරණින් ප්‍රමාද සඞ්ඛ්‍යාත මරණයෙන්; (පමාද-පමය-පමය්-පමා) ආවො-සුණුව වැටෙන මිරණවුව බැවින්, අචෙතනව පවත්නා මරණයක්වූ බැවින්; (අචෙතන-අචොයන-අචොයුනු] "යථාපිමතා තථෙවහොන්ති" මළාහු යම්සේද එසේම වෙත්; පමත්ත, ප්‍රමාද වූ; මත, මළ; තාදිධම්ම නැත්තො යනු තාදිසධම්මතැත්තො, සී විනම් මැහවි.

එබඳු ස්වභාව නැති නොවේදැයි; යනුවනාට, කියන්නන්ට; පමත්තයට සිතිවිලි උපදී. දරකඩට නූපදී. එබැවින් පමත්තයා දරකඩකට සමාන වන්නේ කෙසේද යන ප්‍රශ්නය උපදී. සිත් පවත් කිසි බෙහෝවතුජ් යනාදීන් ඊට පිළිතුරු දෙයි. සිත් පවත්කිසිබොහෝවජ්, කිසියම් චිත්ත ප්‍රවෘත්ති කෙනෙකුන් බොහෝ වුවද; කොරතුරු, වෙනස; සෙවුජෙනෙ, දක්‍ෂ ජනයා (ජෙක-සෙවු] 'සෙවිත' ශබ්දයෙනුදු ආහැකිය. ඒ අරුත්නොනා හයියෙනු, ඒ අර්ථය නොහසා කියනුයේ; ''අප්පමාදම්හි පණ්ඩිතා මෙධාවිනො සප්පඤ්ඤා'' අප්‍රමාදයෙහි පණ්ඩිතවූ (දක්‍ෂවූ,) මෙධා

---

1. එක්තක

වූ, සප්‍රාඥවූ යනු අර්ථයි. 'යෙනු යන්න 'කියනු' යන්න හා සම්බන්ධය. එබැවින් එඅරුත් නොහගයි යෙනු,............අර්ථ කියනුයි වාක්‍ය යොදගෙන, ඒ අර්ථය නොහසා කියන තැනැත්තේ .........අර්ථ කීයනු,යි අර්ථ ගතයුතුය බුහුජනයානුවනට, ඔවුහු කවරහුදැයි කියන්නට; "අත්තනො අප්පමාදධනා අප්පමාදං වඩ්ඪන්ති" තමාගේ අප්‍රමාදයෙහි පිහිටා අප්‍රමාදය වඩත්; "එතෙසංච විසෙස කාරණං ජානන්ති" ප්‍රමත්තයන් සසරින් නොමිදීම අප්‍රමත්තයන් සසරින් මිදීම යන මොවුන් පිළිබඳ විශෙෂ හේතුවද දනිත්.

හඬසී, සුදුසුයි. වලසී, පවත්; (පඩාය-වලහය-වලහයි) ජනවූ ඉපදවූ; 'සතතං පවත්ත විරියං සතතං, තස්ස නියුත්තා 'සාතතීකා' නිරතුරු වැ පැවැති වීර්‍ය්‍යය සතත නම්ද එහි නියුක්තවූවෝ සාතතික නම්ද වෙත්. රූකුළුමාත්‍රවැර, ආරම්භ මාත්‍ර වීර්‍ය්‍යය; පිළිවකුන්සහන, ප්‍රතිපක්ෂයන් ඉවසන; නවත්න, නැවතීම; [නිවත්තන-නිවතන-නවතන-නවත්න) (ඔසක්කිත්වා-ඔසකිය-ඔසකැ) හලත්ද, ගිල්වත්ද; "යොගෙ සොහෙව දනකි උපඳාව හිඳුම්" මේ හෙළ අටුවා පාඨය සිතිය යුතුයි. මතුහඬයි, පමණක් සුදුසුයි.

### සාමාවතියාවත්.

---

(රොග-රොව-රොව්) (ම්සසු-මසු-මස්) බැලවුවන්, කුලී කාරයන්; (හතක-බැළවු) (චොදන-සොයන) මෙහෙයවන යනු අර්ථයි. නිදනුවන් ශොබයන සොයනකම්. නිදගන්නවුන් පිබිදවීම පිළිබඳ වූද ඔවුන් කටයුත්තෙහි මෙහෙයවීම පිළිබඳ වූද කාර්‍ය්‍යය, ප්‍රබුද්ධවන, කම්හි නොයෙදෙයි කුමට හිඳුවයි සොයන කම්හි, ප්‍රබොධ කිරීම් කම්යෙහි හා, කටයුත්තෙහි නොයෙදී කුමට හිඳිව්දැයි චොදනා කිරීම් කම්යෙහි; (යොජ්ත්වා-යෙජෙය-යෙජෙයි) නයබඳු. පිළිවෙල කරවස්සේයි, ක්‍රමානුකූලව පිළිවෙල කරව යනු අර්ථයි. වාසයාදින් හඬජනියයුව, කවුඩු ආදීන්ගේ හඬ දන්නෙතැයි කී කල්හි; මහ ධනවතක්ගු හඬයන, මහ ධනවතෙකුගේ හඬකැයි යනු; ජැනියසත්, දනුතේද යත්; [ජැනිද-ජැනිය] ක්‍රමභදනා ප්‍රභෙද සියල්ල; නිම, උපකරණ-වියදම; නිබැදැ, පැරැත්ත කොව; පාමාලවා නොපිසවා නොනවත්න සෙසින් පෙළා, පමා ලවා නොපිසවා නොනවතින සේ පීඩා කොට, විරොද්‍ද, බාන්-වැල්; විරොද්‍ද යනු වරතා ශබ්ද යෙනුද්‍ද ආකැකිය.

**එහෙත්** (විච්රෝද්ද-වීරෝද්ද-විරෝද්ද,සි ගැනීම වඩාත් යෝග්‍ය සේ පෙනේ. ඇද වියන ලද (රජ්ජු) වැල්, යනු අර්ථයි. **උදය්, දෙය් කියා** (උජ්ඣායිත්වා-උජ්ඣිය-උද්දිය-උදය උදය්) පතුරුවා, දෙය් පතුරුවා; **හුස්,** තැන්ද; (සස්සු-ස සු-හු සු-හුස්) **ඉපිළෙන ආරක්,** උඩඟු ගතියක්; **අවයනම්න්මතුවක,** මම උසස්මියි, යන මානමාත්‍රයක්; (පාරිජුඤ්ඤ-පිරිජුඤ්ඤ-පිරිජුනු) නිසිද්හට; **සිදුරක් නොමැත්තාහට;** (තිසිදිහට-තිසිද්හට) **සැහැවුන්නවය, සංයත** තැනැත්තහුට; (සැහැවුනු=හට-සැහැවුන්නට) [සැහැඅවුනු-සැහැ වුනු] සැහැ, ඉවසීමට; අවුනු, (ආපන්න) පැමිණි යනු අර්ථයි. **තල කුළුඇයින්,** තරාදියෙන් වංචා කිරීමාදියෙන්; (තුලා-තුල-තල) (කූට-කුළු) (ආදීනි-අයිනි-ඇයිනි-ඇයින්) යසුණුජව, යකඩ කුඩු දමා; ගන්නාකල්, අනුන්ගෙන් බඩු ගන්නා කල්හි; **මානකූට,** මැනීමෙන් වංචාකිරීම; **කංසකූට,** ලෝහයෙන් වංචාකිරීම; තඹ බදුන් සමූහයක් මැදට රන් බදුනකුදු දමා රන් බදුන පෙන්නා රන් වලන්සේ තඹ වලන් විකිනීමෙන් කරන වංචාව; **ඉතිඉතියට,** ඒ ඒ තැනට; **නියනු,** පැමිණවීම;

## 16. කුම්භඝොෂකයාවත්.

---

**නිසය්, තිසා;** (නිස්සාය-නිසය-නිසය්) **නිශනුවට හීසි,** ගෙන යාමට යෝග්‍ය; **පළමුවලදෙරින්,** ඉස්සරවෙලා හැරිය දෙරින්; (වරිත=වළ) **ගබවුවුහන්,** ළමයා බිහිවීම; **ගොරෙන්මිස්ම,** ගභී භාරයෙන් මිදීම; (වුඨාන-වුට්ඨහන-වුට්ඨහන්) ගොර+එන් ගොරෙන්; (ගරු-ගුරු-ගොර) **ගෙවලජ,** ගෘහ භාණ්ඩ; **සඟවය්** තැන්පත් කොට; **සිළි, සුළු පියා;** සිළි යන්නෙන් පමණක් සුළු පියා නොකියවෙතත් මහා පිතා (මැහැවි,) යනුව හා යෙදුන හෙයින් අර්ථයට බාධාවෙක් නොවේ. **මහැවි,** ලොකු පියා; ජනපද, සෙනාපති යන ශබ්දයන්ගෙන් ආ ජනවි, සෙනෙවි ආදිය හා සමකර බලනු. **මුන්න, මුත්තා; මුන්නු,** ගැනු මුත්තා; **තැසපසු,** තපෙවා (සම) යන්න පස්මැති කොට ඇති; **පබ්ජ්වය්,** පැවිදි කරවා; (පබ්බජ්ජාපෙත්වා-පබුජ්වය-පබුජ්වය්) **කොකනද,** රත් පියුම්; සුදුපියුමැයිද කියත්. **නොකසවු,** ඉවත් නොවූ; **කදසෙනා** සමූහයෙන්; **වොරජනනු,** බබලන්නනු; **බුදුනුසිකම්ඨන්, බුඩා-නුස්සති කම්මට්ඨාන;** (බුඩානුස්සති-බුදුනුසිසි-බුදුනුසි) 'අඞ්ගී රසං විරොචමානං අනාලික්ඛ නපනනමාදිවවම්ච" අගෙනකී බබලන සූර්‍යයා මෙන් බබලන සර්වඥයන් වහන්සේ; **පැහැ,** ප්‍රකාශ කොට; (පකාසෙත්වා-පැහැසය-පැහැසැ-පැහැහ-පැහැ) "ශරදුල්ලං පදුමං අවිනශන්ධං එවං අවිත භූණ

"ගන්ධං අඞ්ගීරසං" පිපුන-පහනොවූ සුවඳ ඇති-පියුමක් යමේසේද එසේ පහනොවූ ගුණ සුවඳ ඇති සම්බුදුහු වනත්සේ; අවටවා, ආවර්තනය කරවා; (ආවට්ටාපෙත්වා-අවටවය-අවටවය්-අවටවා) දද, මෝඩ; උද්දෙස්ගහණෙපි නොසල්ලුවක්හු, උද්දෙසය [පාලිය ]කියවා ගැනීමෙහි ඉක්මන් නොවූවෙකු; "උද්දිසියතීති උද්දෙසො-පාළි, තස්සගහණං උද්දෙසගහණං තස්සකාලෙ උද්දෙසගහණකාලෙ" උදෙසනු ලැබේ නුයි උද්දෙස නම්.

එනම්:- පාළියයි ඒ පාළිය ඉගෙනීම්වශයෙන් ගැනීම උද්දෙස ගහණය නම්. ඒ උද්දෙසය ගන්නා කාලයෙහි; ගරහසිනාකෙළි, ගර්හාපූර්වක සිනාසීම් ක්‍රීඩාව; "පරිහවිත්වා හසනං පරිහාසො සොඑව කිළාධිප්පායෙන කතත්තා පරිහාසකෙළි" නින්දාකොට සිනාසීම පරිහාස යයි, ඒ පරිහාසයම ක්‍රීඩාභිප්‍රායයෙන් කළ හෙයින් පරිහාස කෙළි නම් විය. නදුරනු, කිම "කුමාරෙන භතො කුමාරභතො සොඑව කොමාරභච්චො" කුමරහු විසින් පොෂණය කරන ලදුයේ කුමාරභත නම්ද එහේම කොමාර භච්ච නම්ද වෙයි. බද්ධනාබද්ධ මල් නම්, ගෙතූ නොගෙතූ (පුෂ්ප) මල් නම්. වාස චුණ්ණ ධූප, සුවඳ සුණු සහ සුවඳ දුම්; ඔසද කල්ක, සුවඳ කල්කය; "බුද්ධොපමුඛො එතෙසං" බුදුන් ප්‍රමුඛ වූයේ මොවුන්ටනුයි බුඩ පමුඛ නම් වේ. මගඵල පවා, මාර්ග ඵල දක්වා; "විරූළ්හි ධම්මා යස්සසො" වැඩෙන ස්වභාව යමෙකුටද හේ විරූළ්හි ධම්ම නම්.

"අම්හාකං නිවෙසනෙ භික්ඛං ගණ්හථ" අපගේ ගෙහි භික්ෂාව ගනු මැනවි. නිමතුණු, ආරාධිතා; සැකැකිය, සක් ලකුණෙන් සලකුණු කරන ලද; (චක්කඞ්කිත-සකකිය-සැකැකිය) "චක්කලක්ඛණෙන අඞ්කිතං තලං යස්ස" සක් (හක්ගෙඩිය) ලකුණෙන් සලකුණු කරන ලද හත්තලය යමෙකුටද; ගඳෙල පොමොසෙහි, ගඟකිළිය ඉදිරියෙහි; ආගච්ච, ආලින්දය; (පමුඛ පුමුව-පොමො) පැදුම්දසැමිණිය, නැගෙනහිර දිශාවට හැරුවූ මුහුණු ඇත්තේ; (මුණු-මූණු-මිණි) මූණ ඇත්තෙක්ව යනු අර්ථයි. "පුරත්ථිමාය දිසාය මුඛං යස්ස" නැගෙනහිර පැත්තට වූ මුහුණ යමෙකුගේද හේ පුරත්ථාභිමුඛ නම්. පියලිය, වස්ත්‍රය; (පිලොතිකා-පියලිය) රජකසකරනු, රජස් [ධූලි] ඉවත්කරනුය; (ගන-ගස-කස) උපනිබද්ධ, උපනිබන්ධනය-යෙදවීම; ඉජිය, සෘජුව-එකවර වම; [උජුකං-ඉජිය] කලම්බයි, කලඹයි; තෙරුන්ට, තෙරුන් ගේ; නොසන්හිඳි, නොසන්සිඳෙයි. ඉතිබැවින්, එසේ හෙයින්; විසුජ්, විසුඩ; හඹයි, සංසිඳුවා; (සමෙත්වා-සමය-හමය-හඹයි)

එරවියපිවෑ, අවතරණය කරනු කැමැතිව; බස්වනු කැමැතිව; “කාලො භන්තෙ නිට්ඨිතං භත්තං” සවාමීති දනයට වඩින්නට මේ සුදුසු කාලයයි. දනය සකස්කොට ඉවරයි.

කල්ගෙහු කල්ගි, කාල ඝොෂා කළ කල්හි; (ඝොසිත-ඝෙසිය-ගෙහුය-ගෙහු) හුණුයේ, සිටියේ; හිරුරැස්හුණු අතින් සුළුදියෙන් කිලුටුවී, හිරු රැස් වැටුන පැත්තෙන් වැගුරුන දහදියෙන් කිලිටි වීය. (වලිත-කිලිය-සුලුය-සුලු) [පුරත්ථාභිමුඛ කොට හිඳුවනු මෙතකාමෙ, යනු සම්බන්ධයි. පෙරදිගට මුහුණලා හිඳ වූයේ මේ අර්ථය තක්කාමැයි. තෙරුන්, තෙරුන් විසින්; ඔවස්, [ඔභාස-ඔභස-ඔවස-ඔවස්) පැනෙනසෙයින්, පෙනෙන්නාක් මෙන්; විවෘවහට බහස්ති ඇතුළුවූනා පැනෙන සෙයින්, විදශීකායාහට; ඔභාස (ආලෝක) යෙහි ඇතුළුවූතාක් දෙය පෙනෙන්නාක් මෙන්; එතක්, !මෙපමණක්; [එත්තකං-එතක-එතක්] බුඩ ඔභාසය හා බුදුහු සිතට වැටහීම; බුදුන් ඉඩය, බුදුන්ගේ කැඩියයි.

1. ජිවුවා බත් අගැහිඳ තෙරුන් පුරෙට හුණුවක්හු සෙයින් පැනෙනා, ජීවකයාගේ දන ශාලායෙහි හිඳ තෙරුන්ගේ ඉදිරියට පතිතවූවක්හුසේ පෙනීම; හත්තගගය [බතග] නම් දන ශාලාවය. 'භත්තංඝජ්ජන්ති එත්ථාති භත්තග්ගං,යි මුගලන් හිමියෝ විවරණය කෙරෙත්. උපොසථග්ග, ධම්මසවනග්ග, සලාකග්ගයනාදී නොයෙක් යෙදුම්ගැන සිතනවිට ඒ අර්ථය[බත්සසනය[අනුභව] කරනහෙයින් භත්තග්ගවීය යන අර්ථය] නොගැලපෙනසේ පෙනේ. රජස යනු මේනිරුත්, රජස් යන මේ නාමය, මෙහි නිරුත්' ශබ්දය නාම වාචකය. පච්චත්ත වචන, ප්‍රථමා විභක්ති; “අභිසඞ්ඛරොන්තීති ඛො භික්ඛවෙ තස්මා සඞ්ඛාරෙ” ති එවං නිඞ්ධාරෙත්වා සහෙතුකං කත්වා වුච්චමානා අභිලාපා නිරුත්ති නාම” යනු අත්ථසාලිනී පාඨ හෙයින් යම්කිසි ශබ්දයක අක්ෂරවාරයෙන් ගතයුතු අර්ථය (නීතාර්ථය) නිරුක්ති නම්ද ඒ නිරුක්තීන්ගේ පථය හෙවත් මාගීය නිරුක්ති පථ නම්ද වෙයි. “රාගසොසතං අධිවචනං රජොති යනු නිරුක්තියි.

“රාගොරජොනවපතරෙනු වුච්චති” යනු නිරුක්ති පථයි. මිථ්‍යස්නෙහි ගැහැත්ව..............විදශීතායෙහි සංයතව; උදෙශ සිරිපුස් විසින් ගතුවක්හට සෙයින්, උදෙස (පෙළ කියවා ගැනීම) හා පරිපුච්ඡා (අර්ථ අස්වා ගැනීම) වශයෙන් තොවලාව උගත්තෙකුවෙයේ; පෙළගිශාවුණු, ත්‍රිපිටක ධර්මයෝ අවබොධ

1. දූජිවුවා

වශයෙන් ආහ; දන්පිළිනාවා අත්හි දන් පූහාසෙයහි දූවා සිය අතීත් හෙලනදියෑ, දත් දීමට පෙරටුව දත් පිළිගත්තාගේ අත්හි දායකයා විසින් හෙලන ජලය; (පටිග්ගාහක-පිළිගහක-පිළිගහව-පිළිගහා-පිළිගා) (පුබ්බ-පුව-පුව්-පූ) (භාග-හග-හක-හය-හය්-හා) (දායක-දයය-දය-දය්-ද) කම්මකර ආලපන, කම්කරුවන්ට කරන ආමන්ත්‍රණ; සාම්‍යාලපන (සාමි + ආලපන) සවාමියාට ඇමතීම; ඉඩපත්හු, සෑඩියට පැමිණියහු විසින්; දූතහුආසෑදෑ, දූතයන් ආකල්හි; (දූත-දූය-දූයි) ඉඩපත්හු කළනා කිරිය නොඉවුවජ් ඔෑවුවවුන් විසින් කරන බෑවින්, අධිෂ්ඨාන නොකළත් සෑඩිප්‍රාප්තයා විසින් කළනාක් ක්‍රියාවත් (ඔහු විසින්) මවනු ලැබූවන් විසින් කරන හෙයින්; උපාතක විෂය පංචමි, මූල කියන ලදී.

‘‘තිපිටකෙහි ආදාය සඞ්ඝාගෙහසො’’ තුන්පිටකයෙන් කරුණු ගෙන පිරිස කළඹා; තෙවෙළෙසින්, ත්‍රිපිටකයෙන්; (වෙළෙ + ඉන්-වෙළෙසින්) පිටක (පෙළය-වෙළෙය-වෙළෙ) වන වළා යනාදී තන්හි පිටක ශබ්දයෙන් ආ වළා යනුව පෙනේ. (මාලෙය්‍යා-සලය-සලය්) මණ්ඩල මාලය, රවුන් ගෘහය, බුදුන් වැඩිවිසූ ජීවකම්බවන විහාරය මණ්ඩලාකාර බැව් මෙයින් පෙනේ. ගන්දකුළෙපාමො, ගන්ධකුටියෙහි ඉදිරිය; (ගන්ධකුටි-ගඳකුළි-ගඳකොළි-ගඳෙළි-ගඳෙළ) ගඳෙළි යනු ගඳ කිළි ශබ්දය ප්‍රභව කොට ඇත්තේය. ඇදුරොළ, රදෙළ යනාදිය සමගත් සමකර බලනු. (පමුඛ-පුමුව-පොමොව-පොමො) ඇව්ජ්ඣිත, නොඉක්මවූ; ගඳ වසින් වසන ලද, ගන්ධ සඞ්ඛ්‍යාත වාසයෙන් සුවඳ කවන ලද; ‘‘වාසෙතීති වාසො, ගන්ධා එව වාසො ගන්ධවාසො, සුරභි වාසො ගන්ධවාසොවාති සුරභිගන්ධවාසො’’ සුවඳ ගමානුයි වාස නම්ද ගන්ධයම වාසවූයේ ගන්ධවාස නම්ද සුරභිවූයේත් එයමය ගන්ධවාස වූයේත් එයමනුයි සුරභි ගන්ධවාස නම්ද වෙයි.

ධසදඅෑ, සුවඳ කල්ක ආදිය; වස්සුණුදුම්අෑ, සුවඳසුණු දුම් ආදිය; සිහුන්හෙවුන්බඳ, සිංහයන්ගේ ශයනයට බඳු; සෙණුවක්, තිරයක්; (සාණි-සෙණු) ‘‘සමන්තතො පසාරෙතනාවිය’’ වටේට දිගහරින්නාක්මෙන්; අනුතුරුධැම්හි, අනුත්තර ධර්මයෙහි; චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයට වඩා උතුම් ධර්මයක් නැති හෙයින් එය අනුතුරු ධම් නම්. ‘‘මත්තවර වාරණාවසීහාව මත්තවර වාරණසීහා, තෙසං වික්කන්තං ගමනං, තස්සවිලාසො ලීලා’’ මතැත් හුද සිංහයෝද මත්තවරවාරණසීහයෝය. ඔවුන්ගේ වික්‍රාන්තය (ගමන) මත්තවරවාරණවික්කන්ත නම්ද, ඒ ගමනෙහි ලීලාව

මත්තවරවාරණසීහ වික්කන්ත විලාස නම්ද වන්නේය. **"සමහිම පියෙයහි පියෙයහි ලැමෙහන පියුම්, විසිරනරස්, ප්‍රභාතවය්, නොනප්නහිරු, විරෙන මල් රොන් ඈ නොඑක් සුවෙන් උමෙළෙවා ගමන්"** සම (උස් පහත් නොවූ) බිම පියවරක් පියවරක් පාසා නැගෙන පියුම්, ශරීරයෙන් නික්මෙන කාන්තිය, ප්‍රභාත වාතය, රශ්මි මඳිනැවූ හිරු, වැගිරෙන මල් රේණු ආදී නොයෙක් සැපයෙන් යුක්තවූ බුදුන්ගේ ගමන; බුද්ධලීලං, (බුදු ලීලාව) නම්.

ප්‍රභාත වාතය නම් උදේ වාතයයි. එබැවින් සවස් කාලයෙහි එය නොලැබේ. විමසිය යුතු තැනෙකි. (වාත-වය-වය්) (විසිරෙන-විහිරෙන-විරෙන-විරෙන) (උපෙතක-උවෙතු-උවෙළ) උවෙළ + ආ=උවේළවා) යුක්තවූවහුගේ යනු අර්ථයි. (ලීළ්හා-ලිළ්හ-ලෙළ්හ) **කසිකිවිසිළවි,** කැසීමක් හෝ කිතිසීමක්; **බව ගලදූමෙවා,** බියගන්වන ලද්දහු; **සුමුවූහනා,** උපදවන; **පසු.** පුච්ජා-විචැරිම; **මජ්බිඳු,** පාලි නිඝණ්ඩුව බලනු. **මා එන පෙරටව,** මා එන්නට ප්‍රථමයෙන්; **අපරියොසිතා,** ඉවරනූන; **මා ආගෙන්,** මා ආ හෙයින්; **අරියෑ,** ආරාධනා කොට-ගුරුවරයා සතුටු කොට; (ආරාධෙත්වා-අරියය-අරියෑ) (උපකාර-උවහර-උවාර) **මගෙපිව,** මග වියදම (පරිබ්බය-පරිවය-පිරිවය-පිරව) **ඉතිරි බලි දඬකරවූවර ඇසින්,** අතිරෙක බලි කරවූවර හා දඬ කරවූවර ආදියෙන්; අයබද්ද වශයෙන් දෙන කරය බලි කරවූ වරය නම්ද වරදට දඬුවම් වශයෙන් දියයුතු කරය දඬ කරවූ වරය නම්ද වන්නේය. **සිසකහාපණ,** එක හිසකට එක කහවණුවක් බැගින් අයකළ බද්ද; දූන් ඇගබද්ද නමිනුත් මධ්‍ය කාලයේ මෙලාට්සි නමිනුත් අදහස් කරන ලද්දේත් මෙයමැයි.

**පුනප්පුනසමගි,** නැවත නැවත සවන්නෙහිය. **"ඉදං ගණ්හාමි එතං ගණ්හාමි"** මෙය ගණිමි එය ගණිමි. **"අහම්පි එතං කාරණං ජානාමි"** මමත් ඒ කරුණ දනිමි. **එවියනා බඳුය සොරහට,** සොරහට, සොරාට, එ, "සච්චසි සච්චසි, අහම්පි එතං කාරණං ජානාමි" යන වාක්‍යයන්, වියන බඳුය, කියන්නාක් මෙනී, (නාපිත-නැවිය-නැවි) **මස්ලිසනකම්,** රැවුල කැපීම් කම්ය (මස්සු-මසු-මස්) **කොමු බිඳු,** මොටවූවාක් බඳු විය; **පහස්හි පහස්හි.** හපන්නෙහිය, **හපන්නෙහිය; එකනිපාතයෙහි,** ජාතක පාලියෙහි එකක නිපාතයෙහි; **ජාතෙ,** ජාතකයෙහි; **දෙස්සකාල්හසි,** දෙශය හා කාලය හා; **විසකුණු,** නුවණැත්තා; **සුම්නාක්ගු සෙසින්,** පිඹින්නාක්සේ; (පුම්බනා, පුම්නා) **සාමිලිකැඩියා**

රාත්‍රි, සිව්පිළිසිඹියා සහිත රහත් බැව්හි; (චතු-සතු-සය්-සා) විදසුන් ඤන්හි බජවන බැවින්, විදර්ශනාව වනාහි ඤාණයෙහි බජාව එන බැවින්; (චූලපන්ථක-සුළුපතු)

### 17. සුළුපතු තෙරුන්වත්.

---

නොහනලදු, නොමණ්ඩයකරනලදී. ජනමුලට, ජනසමූහයට; "සභං අරහතීති සබ්භං නසබ්භං අසබ්භං" සභාවට සුදුසුවූයේ සබ්භ නමුත් සභාවට නුසුදුසුවූයේ අසබ්භ නමුත් වන්නාහ. සිතන අෑ, සිතීම් ආදී; බැමිහිනා බජව සිටි ඤණින්, සියලු ධර්ම යෙහි බජසව සිටි ඤණය-විදර්ශනා ඥානය; වෙළුරු, වෛඩූර්‍යය; (වංසවණ්ණමනි, යනු විභංග අටුවාහි. උණගසේ වර්ණයට බඳු වර්ණ ඇති මැණික්) සලය, ශිලා; "කාලසිලා, පණ්ඩුසිලා, සෙත සිලාති ආදි භෙදෙ සබ්බාපිසිලා" යනු විභඞ්ග අටුවාහි.

### 18. බල්සෑණවත්.

---

ගොගෙහි, (ගොහ + එහි) ගුහායෙහි; (ගුහා-ගුහ-ගොහ) කිසුණුඅළු, කසිණය වැඩීමෙන් ලැබෙන ආලෝකය විස්තර අභිධර්මාර්ථ සඞ්ග්‍රහයෙන් දතහැකිය. පැමයුවන්, (පැමයු + අන්) ප්‍රමාදවූවන් (පමත්ත-පමතු-පැමයු) සියු හා උවවැත්, චුතිය හා උත්පත්තිය (චුති-සියු) (උපපාත-උවවැත-උවවැත්) අසබෑඳ, මෙය සෙවිය යුතුය පාළිපාඨය ඌනසේ පෙනේ. නොපිරිසුනු, පිරිසිඳිය නොහැක්කේය. කිවිඅපින්, උන්නත (උස්) අර්ථයෙන්; සියුතජ්ඣන් සමවැජෑ, සතරවන ධ්‍යානයට පැමිණ; (සමාපජ්ජිත්වා-සමවැජිය-සමවැජැ) පිළිවුවා, ප්‍රතිපදාව; (පටිපදා-පිළිවුවා) පුහුන්, ප්‍රහීණ කරන ලද; සොකසල්ල, ශොක නැමැති හුල්; උපරිපාසාදෙවා, මතු පහයෙහි හෝ;

### 19. මිහසුප් මහ තෙරුණ්වත්.

---

"අරඤ්ඤකෙවා ආරඤ්ඤකො සොවසො විහාරො" අරණ්‍යයෙහි වූයේ ආරඤ්ඤක නම්. අරණ්‍යයෙහි වූයේත් හේමය විහාරය වූයේත් හේමතුයි. ආරඤ්ඤක විහාර නම් විය. නොඋකුම්වාමෙ, නොඉක්මවාම; සුරුකුවෝ, සමානවූහ; (සරික්ඛ-සුරුකු) වලදෙදිය හය්සෙස්සි, හරින ලද දෙර ඇත්තේය යන අර්ථයි. වජන්නොසහනුයේ, වචන නොඉවසන්නේ-නො පිළිගන්නේ; නොපටවය්, ඔහු නොසනහා-නොසංසිඳුවා අවවාද

නොදී යනු අර්ථයි. පදන්සැමියා, වීර්‍ය කරන්නා; අප්පමාද නම් යි ප්‍රධන් සතර කඳු අප්‍රමාදයයි කියන ලද (නූපන් අකුසල් නොඉපදීම උපන් අකුසල් දුරු කිරිම නූපන් කුසල් ඉපදවීම උපන් කුසල් දියුණු කිරිම) යන කොටස් සතර; අකුරු කබල් සජනුවට නොපත්කල්, අගුරු කබල් සාදන්නට නුසුදුසු කාලය; ජ් ඇරජ, ඒ නිදීම හැරදමා; එහි, ඒ නිදීමෙහි; සජය. සද; (සජ්ජනා-සජය) සිව්ගිජ්ජමෙහි, සිහිය බැහැර කිරිමෙහි; (සති-සිහි-සී) සිජගුරු, සමෘති නැමැති නොනිදීම; පමානිදිගැනුම්, ප්‍රමාද නැමැති නින්ද; පජ්, පාදය; (පාද-පය-පජ්) ජිතනජවං, සිඳින ලද ජවය; සුණුජව; සිදුන වේගය;

## 20. දෙසබඳ මහණුන්වත්.

---

කැණිමඩුල්, ගෘහ කණිණිකාව; මිදුන උස්ව සිටිනසේ හතරැස්ව හෝ රවුම්ව සාදනු ලබන ගෘහයන්හි මුලප්පරාල උරවනුයේ කැණි මඩලෙහිය. එයට කුරුපාවෙක් නැත්තේය. පරිවිතක්කිාම්, කල්පනා කිරිම් අර්ථය; ශෙෂහයයි නකම්, ශක්‍රයා යයි සිතාගත් ශක්‍රයා වැනියෙකැයි සිතමි.

බුදුන් 'දිට්ඨි' යනුවගු කියා, සොහිනූන යනතැන පෙනෙන 'සො' ශබ්දය වනාහී; බුදුන්, බුදුන් විසින්, දිට්ඨි යනුවහු, මම දුක්කෙමියි, කියන ලද්දහු; කියා, කියයි; බුදුහු විසින් 'මම ශක්‍රයා දුක්කෙමියි' යම් ශක්‍රයකු ගැන කියන ලද්දේද 'සො' ශබ්දයෙන් කියන ලද්දේහේය. තුමාවිතකුවගුකියා, තමා විසින් ශක්‍රයා යයි සිතාගත් ශක්‍ර ප්‍රතිරූපකයා කියයි. "එමෙ කියා සක්ක පති රූපකො" යි, සකක පතිරූපකො, යි ශ්‍රක්‍රයා බදුවෙකැයි, එමෙ, ඒ තමා තර්කණයකල ශක්‍ර ප්‍රතිරූපකයාම, කියා, කියයි. 'ඒතොප දිට්ඨි යනු සක්නොවනුය, නුඹවහන්සේ විසින් 'මම දුක්කෙමි' යි කී ඒ තැනැත්තා වනාහී ශක්‍රයා නම් නොවන්නේය. ජන්නා නැන් ගැනා සඳහා කියත්, දන්නා ස්ථානය ගෙන ඒ සඳහා කියත්; මේ තැන ශබ්දයෙන් ස්ථාන අවස්ථා යන දෙඅර්ථයම ගත හැකිය. අවස්, ආවාසය-අම්බලම යනු අර්ථයි. (ආවාස-අවස-අවස්) "මුහුනෙනන විනතිනා සහස්සං අත්ථානෙනසො සහස්සනෙත්ථ:" යමෙකුන් විසින් මොහොතකට දහස් අර්ථයෙක් සිතන ලද්දේද හේ සහස්සනෙත් නම්. සහස්සනෙත් යනු සහස්සක්ඛ වූයේ වර්ණ විපර්‍යාසයෙනි. "සහස්සං අක්ඛීනියස්සසො සහස් සක්ඛො" දහසක් ඇස් ඇත්තේ යමෙකුටද හේ සහස්සක්ඛ නම්.

**අර්ථසහස් වැටෙන පැන ඇස්,** අර්ථ දහසක් වැටහෙන නුවණැස්; වැටෙන යනුයෙන් කියවෙන ප්‍රධාන අර්ථය නම් පවත්නා යනුයි. එහෙත් මෙහිදී එයින් අවබොධාර්ථය කිය වෙනසේ පෙනේ. වැටෙන යනුව වැටහෙන යන තැන හකාර ලොපයෙන් වුවද සිදුවිය හැකිය. **අනුවත් වනබැව්,** අනුව පවත්නා බව; (අනුවිත්තක-අනුවතු-අනුවත්) **මේදෙ,** මේ ඊශ්වර්‍ය්‍ය හා අධිපති බව් යන දෙක; **මොනොව,** මොනවට-මනා කොට; (මොනවට-මොනොට) **පුස්නාවෙනෙම්,** පොෂණය කරන් නෙක් වන්නෙමි. ධුභෘඤ්ධාතුව **දරීම් පොෂණය** කිරීම් යන දෙඅර්ථයෙහිවේ. චායෘපූජාතිශාමිතයොඃ, චායෘ යන ධාතුව පූජා ඇසීම් යන දෙඅර්ථයෙහිවේ. **මාතුමනන,** මව් ප්‍රමාණ; **විසඹ නොපුල්,** විශ්වාස වචන (විශ්‍රම්භ-විසඹ) **සාෂවු,** බැහැරවූ; **වුහුවූ තැග,** හැරිය ත්‍යාගය; **දුන්** දෙය ගැන නැවත නොසෙවීම; (විස්සට්ඨ-විසුටු-වුහුටු) (ත්‍යාග-තැග) **දෙව්,** සේදූ (ධෝවිත-දෙවිය-දෙවි) **'පයතොධොතො පානි යස්ස'** පයතො, සේයි; ධොතො, දෙවන ලද, පාණි, අත; යස්ස, යමෙකුවද; **පීමෙහි,** ත්‍යාගයෙහි-දීමෙහි; **'වොස්සජ්ජනං අත්තනියස්සවත්ථුස්ස පරෙසං පරිච්චජනං, තත්ථරතො වොස්සග්ගරතො,** වොස්සජ්ජනය නම් තමා සන්තක (අත්තනිය) වස්තුව අනුන්ට දීමය, එහි ඇලුනෝ වොසගරත **නමි.**

**යදිවන්, ඉල්වූ** වස්තුව; (යාචිත-යවිත-යදිය-යදි) **'යාචිතුං යොගො,** ඉල්ලන්නට යොග්‍ය; **සංවිභාගහි,** බෙදීමෙහි; **දිඹම්,** දෙය්‍යධම්ම-දියයුතු දෙය; (දෙය්‍ය-දෙය-දිය-දිය්-දී) **වළඳනු යෙන්,** අනුභව කරන දෙයින්; **සබව,** සැබෑ; (සබ්භාව-සභාව-සබව) **නොනහය්,** නොනසා; **නොඅරවය්,** ආරොපණය නො කොට; **පිළින,** ප්‍රතිඥා-පොරොන්දුව; (ප්‍රතිඥා පටිඤ්ඤා-පටඤ-පිළින) **වසකි,** වංචාව; (වංචක-වසක-වසකි) **පියනෙමි,** බැහැර කෙරෙම්; **දුනුපියා,** ජනක පියා, (ජනක-ජනය-ජනුය-ජුනුය-ජුනු-දුනු) (විජාත-විජය-වැජය-වැජුය-වැජු) **නහාපන,** නැවීම; **සම්බාහන,** ඉලීම; **පාරිචර්‍ය්‍යා,** සේවාව; **"මාතාපිතරො භරතිපොසෙතිති මාතාපෙත්තිභරො"** මාතාපිතරෙ මව්පියන්; භරති, පොසයි; පොසෙතීති, පොෂණය කෙරේනුයි, මාතාපෙත්තිභර නම්.

**දුනුකුලා,** උපන් කුලය; (ජනිත-ජනිය-ජනුය-ජුනුය-ජුනු-දුනු) **උපස්ථාන ආසන දුන ඇයි,** උපස්ථාන කිරීම ආසන දීම ආදියයි. **අලුක්සමාසව,** පෙර පදයේ විබත් ලොප් නොවන සමාසව; කුලෙ යන තැන විබත් ලොප් නොවිය. **"නෙ අපචා**

සිතං සීලංයස්සෙතං කුලෙජෙට්ඨාපචායිනො" ඒ කුලදෙටුවන් පුදන සවභාව ඇත්තහු කුලෙජෙට්ඨාපචායිනො නම්හ. සඛිලාය, සම්භාෂාවචන් ශබ්දය; "සඛිලාසම්භාසො යස්සෙසො සඛිල සම්භාසො" මෘදු මොලොක් වදන් ඇතියේ සඛිලසම්භාසනම් පහනුවා, බැහැර කරන්නහු; (පහාතක-පහතු) 'පියං සුඤ්ඤං කරොතීති පිසුණො, තස්සකම්මං පෙසුණෙය්‍යං, තංජහිතුං සීලං යස්සෙසො පෙසුණෙය්‍යප්පහායිනො' මිත්‍රභෙද නැතිකරනුයේ පිසුන නම්ද ඔහුගේ ක්‍රියාව පෙසුඤ්ඤ නම්ද වේ. ඒ පෙසුඤ්ඤය බැහැර කරන සවභාව ඇත්තාහු පෙසුඤ්ඤප්පහායී නම්හ. යුතුවා, යෙදුන තැනැත්තහු; අයුති, අයත් දෙය; 'තස්සකම්මං මච්ඡෙරං, ඒ මසුරාගේ කම්ය මච්ඡෙර නමි. සොතස්සවිනයෙ යුත්තො සොමච්ඡෙර විනයෙ යුත්තො, යමෙක් ඒ මච්ඡෙරය දුරු කිරිමෙහි යෙදුනේද හේ මච්ඡෙරවිනයෙයුත්ත නම් වෙයි. (කොධ-කොය-කෝ) කොධංඅභිභවතීති කොධාභිභූ, ක්‍රොධය මැඩපවත්වානුයි කොධාභිභූ නමි. ගම්සාමි, ග්‍රාමයෙහි දිපුණු-වත් සාමයත් පිණිස හිතවත්දෙය-තඩු විසඳීම නොයෙක් කටයුතු සඳහා තම තියම ඇතිකර ගැනීමාදිය වේ. වෙරගැසෙන සිරුරෙහි හැපෙන; ගමිලදු, ගමේ මූලාදූතියා; අයුඤ්ජිතබ්බං කම්මං අයොගො තස්මිං අයොගෙ, නොයෙදියයුතු කම්ය අයොගයයි. ඒ අයෝගයෙහි; පොලකොටන දින්දන ඇ නන් නියරගිසාමින්, පොළොව කෙටීම, හටගත් ගස්වැල් කැපීම ආදී (ජනිත-දීත-දින්) නොයෙක් විධියෙහි කම්ාන්ත; (කම්මන්ත-කමත්-කමත) කළාලෙන්, පැදුරෙන්, (කටසාර-කළහර-කළාර-කළාල)"නානා මං නිස්සායතුම්හෙහ කිංනලභථ" දරුවෙනිමාතිසා නුඹලා කුමක් නොලබත් තහුද; කියව, කියහුද; සග්ගගාමිනමග්ග සවගීයට යනමග; සගගියමග් වේ. සංගික-සවගීයට යන සවගීයට හිතවත්-මාගීය වේ.

සග්ගි පැහැර සිපි බැවින්, සවගීයෙහි ගැටී සිටි හෙයින්; මංගල සම්භරණ භානිස පඤ්පන ඇ, මගසම කිරීම පින්තාලි තැබීම ආදී; මජ්ජමංසාහරණ, මාලු මස් ගෙන ඊම; දසසහසති ගාමපටිලාභ, දස, ඇත්, ග්‍රාම යන මොවුන් ලැබීම; මුඛ්‍යඵල, ප්‍රධානඵලය; ඵල සඳහස් වැඩුරිකැසෙ පිපිහොවක් සෙයින් ඵල පිණිස වැඩූ වෘක්ෂයෙහි හෙවණ පරිභොග කිරීමක්සේ; (පරිභොග-පිරිහොව) පෙඵලෙසි, ඵලයවේ. "චතුන්නංමහාපථානං සන්නිපාතට්ඨානං චාතුම්මහාපථො" සිව් මහා මගක් එක්වන තැන චාතුමමහා පථ නම්. සිව්මංසන්ධියයි. සභාජන,හලක් සැතපෙන ශාලාවක්, අම්බලමක්; රුකුලෝ, කළහ. "සභාතිං

සාතුං නාදංසු" පින්කරන්නට තුදුන්හ; "කණ්ණිකාමෙහාගගං රුක්ඛං" කැණිමඩලට සුදුසු ගසක්; නගන, ඔසොවන-තබන; හෙරිකරානම්, කොවස් කාරියක් කරවී නම් හෙවත් සම්බන්ධ කරවී නම්; මේ ග්‍රන්ථයෙහි සැම තැනම "හෙරි" ශබ්දය පෙනෙතත් ජාතක ගැටපද විනයාර්ථ සමුච්චයාදියෙහි ආයේ "හෙරි" ශබ්දය මැයි. (බන්ධනාපමුඤ්චන්තා) යනුවට හෙරීයෙති ගුළ'සි' පාරාජික පාළියට හෙළයෙන් ලියූ සන්නයෙහි අර්ථ කී බව විනයාර්ථ සමුච්ච යෙහි කියන ලදි. හෙරියෙති, තැවීමෙන් හෝ සම්බන්ධයෙන්, ගුළය, ගිළිහුනේය යනු අර්ථයි.

ඒ හරිය මේ හරිය ඉතිරි හරිය යනාදී තන්හි කොටස් වාචක හරි ශබ්දයකුදු පෙනේ. අභයගිරි ශිලාලිපියක 'පැන් තබන හාරයෙහිත්'යි පෙනේ. දෙරපැනවය්, ශාලායෙන් පිට පනවා; සඞ්ඝාන ගැන්වූහු, සලකුණුදුන්හ; ඇතාට මිනිස් බසින් කථා කළ නොහැකි හෙයින් යම්කිසි සංඥවක් දෙනු දුනුදු සිරිති. පාද ධොවන තෙලම්ඛන, පාසේදිම පයෙහි තෙල් ගැල්වීම; සම්බා හන ඇසි, මිරිකිම් ආදිය; පිණ්ඩඛජ්ජක, පිටියෙන් තැනූ කැවිලි; පායාස, කිරිබත්; මිස්සකටහාරාදී, ඇඳුන් සහ කලාල් ආදිය; අනලපුවරම,' අතුරනලද-තබනලද ලැල්ලට; (අත්ථත-අතත-අතට-අතළ) (පදර-පදුරු-පවුරු-පුවරු) නැගපියන් පිටට නගන විසින්, තගිනු කැමැත්තන් පිටව නැංවීම් වශයෙන්; නොනැඟි යනම, නොනගින්නන්ට; ගැන, ගෙන; කොබලල රුක්, කොබෝලීල ගසක්; (කොවිළාර-කොවිළල-කොවළල-කොබළල) මල්ගන්නා පක්ගන්නා රුක්, මල්ගන්නා රුක් පක්ගන්නා රුක්, යනු සම්බන්ධයි. (පක්ක-පක-පක්) "පුප්ඵ ගහණකාලෙ පුප්ඵං උපගච්ඡන්තීති පුප්ඵූපගො" මල් හට ගන්නා කල්හි මල් පිණිස ලංවේනුයි පුප්ඵූපග නම්, පුප්ඵත්ථාය උපගන්තබ්බා පුප්ඵූපගො" මල් පිණිස ලංවිය යුත්තෝනුයි හෝ පුප්ඵූපග නම් වේ; දිවපාන්නක්, දිව්‍යපානයක් (පාන-පනු) (පනුවක්-පත්වක්-පත්තක්) උපන්වන, ඇතිවන; "අවංසිරො යෙසං තෙ අවංසිරා" යටටලූ හිස් ඇත්තෝ යමෙකුන්ගේද ඔවුහු අවංසිර නම් වෙති.

රහ සුන් සඳ, රමනය සිදුන කල්හ; නොතුමන් තන්බවු දැනැ, තමාගේ ස්ථානය නොවනබව දැනැ; තුමන්තන් මෙ ගන්ම හයි, තමන්ගේ ස්ථානයම ගන්නෙමුයි. මෙජෙල්ගම, මවලග්‍රාම යෙහි; (මවල-මජල-මෙජෙල-මෙජෙල්) නිශ්‍රාඥයෙන්, අප්‍රධාන ඵලයෙන්; ආශ්‍රිතඵල ආශ්‍රයයයි ඵව හල් කළපින් නිශ්‍රාඥය සුනු; ආධෙයයෙහිඵල ආධාරයෙහි දම් ශාලාවකළපින් නිශ්‍රාඥයයි කීහු;

ආධාරය විසින් උසුලනු ලබන වස්තුව ආධෙය නම්ද ඒ ආධෙයය උසුලන්නා ආධාර නම් ද වන්නේය "මේසේ උඩ පොතක් තිබේ" මෙහි මේසය ආධාරයයි, පොත ආධෙය යයි මෙසේ ආශ්‍රිත ආශ්‍රය යන දෙශබ්දයෙන් ආධෙය ආධාර යන දෙ අර්ථය ගැනෙන නමුදු යමකගේ ආශ්‍රයෙන් යමක් ඇති වීනම් ඒ හෙතුඵල දෙකටද ආශ්‍රය ආශ්‍රිත යනනම් යෙදිය හැකිය. මෙහි ලැබෙනුයේ ඒ අර්ථය බැවු සැලකිය යුතුය. ශාලාව කිරීම වනාහි ඒ නිසා ඇති වන පුණ්‍යඵලයට ආශ්‍රය වෙයි, පුණ්‍යඵලය ආශ්‍රිතය වන්නේය. ගෞණ ඵල, අප්‍රධානඵල; විජයන්පහා, වෛජයන්ත ප්‍රාසාදයාගේ; සාඵලෙ, අප්‍රධාන ඵලය යනු අර්ථයි. සාමපාහො (මාසේ පෝය) යනු වගා සමකර බලනු.

ලාඛරසෙහි රැජ් පුලුන්පෙද, ලාකඩදියෙහි දමා සායම්කළ පුලුන් රොද (ලාඛා-ලහ-ලා) යකඩ, ලෝකඩ, තඹකඩ යනාදී තන්හි පෙනෙන කඩ යන්න ගැනද සිතා බැලිය යුතුය. (ප්‍රසඥ-පෙද) බඳුවදමල් වැනි ලාරස පුලුන් පෙද වැනිය, පඹුපුල්සලස්න පොකුරු වදමල් වැනි වණී ඇත්තේත් ලාකඩදියෙන් රදගත් පුලුන් පෙදකට බඳුවණී ඇත්තේත් වෙයි යනු අර්ථයි. සලතෙ-ලක්, ගල්තලාවක්; සිරිර සම්භරක්, සිරුරෙන් බාගයක්; "දෙව ලොකස්මිං කිරතිරච්ඡානගතානහොනති" දෙව්ලොව වනාහි තිරිසන්නු නොවෙත්; විවාගෙන්, විපාකයෙන් (ස්බබනඵ-සවන-හවන-හාන්) රසු, කුඩා ගෙජ්ජි; ආනක, තම්මැට, රබන් ආදී එකැස්බෙර; විතත, බෙරදවුල් ආදී දෙයැස් බෙර; ආතත-විතත, සර්ප්‍රකාරයෙන් සමින් වළඳනා ලද බෙර විශෙෂ; ඝන, ලොහතැටි ආදිය; සුසිර, හොරණෑ ආදී පිඹින භාණ්ඩ; (සද්ද-සද-සඬ-හඬ) (මිස්සක-මීසු-මුසු) හඬුව, සංගීත (ගන්ධබ්බ-ගඳබ-ගඳැව-ගඳැව්) නැටුම් සම්ජ්, නෘත්‍ය සඞ්ඛ්‍යාත සමජ්ජය; "නච්ච සඞ්ඛාතො සමජ්ජො නච්චසමජ්ජො" නෘත්‍යය සඞ්ඛ්‍යාත සමජ්ජය නච්ච සමජ්ජ නම්. නළුසමජ්, නෘත්‍ය කාරයන්ගේ සමජ්ජය; (සමජ්ජ-සමජ-සමජ්) නච්චනතීති නච්චා තෙසං සමජ්ජො නච්චසමජ්ජො, නටත්නුයි නච්චයෝ නම්හ. ඔවුන්ගේ සමජ්ජය නච්චසමජ්ජයවේ. නොයෙක් නෘත්‍ය විශෙෂයන් එක්තැනෙක පෙන්වීම සමජ්ජයයි තතොරමණීයතරංකිර අඤ්ඤං ඨානං නත්ථි, ඊට වඩා සිත්කළු අනෙක් තැනෙක් නැත්තේය. දෙදෙවුලොවුහි, චාතුර්මහාරාජික තාවතිංසයන දිව්‍ය ලොකවලයෙහි දෙපංචමී, පූර්ව අපර, දෙපක්ෂයෙහි පස්වැනි දෙදින; පැරැණියන් මේ දෙදින බණ ඇසීම පිණිස වෙන් කරගත් හෙයින් උපොසථ දිනයක් හැටියට සලකන ලදී.

මිනිසුන් අයින්, මිනිසුන්ගේ ආයුෂයෙන්;(අයු + ඉන්-අයින්) (ආයු-අයු) පූනිමින්, දෙව්ලොවින් චුතවීමට ප්‍රථමයෙන් ඇතිවන,-චුතවන බව හඳුන්වන කරුණු; (පුබ්බ-පුබ-පුව-පුව්-පූ) මාලාමිලායනති, පැලඳි මල්මලාහිනවෙත්, වත්ථාණි කිලිස්සනති, හැඳිවත් කිලිටිවෙත්; කාචෙජගිසෙද මුච්චනති, කිහිලි වලින් දහඩිය වැගිරෙත්; කායෙවෙවණණියං ඔක්කමති, ශරීරයෙහි විවර්ණ භාවය (ඉලින් තිබුන වර්ණයට විරුද්ධ වර්ණ (පාට) ඇතිවීම් බවට බැසගනී) දෙවො දෙවාසනෙනාභිරමති, දෙවියා දෙවාසන යෙහි නොඇලෙයි. උපන් මරණබිය සිංනානකටදී මොහ උපයනුවෝ, උපන් මරණ බිය සිහි කරන්නට ඉඩනොදී මූලාව උපදවන්නාහු. මෙහි පාලිපාඨය ආඩුයි. බෙහෙක් ලිහිණියක්, හෙකින්නක්, (බක-බහක-බෙහෙක-බෙහෙක්) හතාරාගමයවිය, පරිභාෂ විස්මයයකි, තීත්ද සහිත විස්මයෙහිය; පෙලවය්, හවට කමින් පිඩාකොට (පීඩාපෙත්වා-පිලවය-පෙලවය-පෙලවය්) ලජ්ජා වට පමුණුවා යන අර්ථය ද ගතහැකිය. එසේ නම් පාඨය වෙලවය,යි සිටිය යුතුය.

තුමහමෙ මිලමිසුන්, තමාම (තමා විසින්ම) මල මත්සයයන්; සේය්, විය ලී;(පුසසිත්වා-පුසිය-පුහිය-සොහිය-සෙහිය-සේය-සේය්) නොහැරිය හැකිකොට, අනුන් විසින් පැහැරගත නොහැකි කොට; (හරිතුං-හරිතු-හරිත-හරිය-හැරිය) දෙව්දූනී, දෙවියන් විසින් දෙනලද; මිනිස්නට වැලදෙනුකොට, දෙවියන් දුන්, මිනිසුන් විසින් වැලඳිය යුත්තක් කොට දෙවියන් විසින් දෙන ලද්ද; අසාධාරණවූ, අසමානවූ; "වෙපචිත්ති අසුරින්දපුප්ඵදම මදසි" වෙපචිත්ති අසුර නායකයා මල්දමක් දුන්නේය. රුස්වයි, කැමති කරවා ගනියි. නෝරාගතියි යනු අර්ථයි.

තිවරුස්නාක්හට, තීවකැමති කෙනෙකුන්ට; දෙයි, දෙවයි; (දෙතියි-දෙසියි-දෙසිය්-දෙයි) මහජෙව, නාකි; (මාපෙත්වා-මවය-මවය) මහජෙවෙයිවින්, නාකි සවරූපය කරණකොටගෙන; අසුරන්කෙරෙන්, අසුරයන්ගෙන්; අක්කොස්ලිලදූයෙන්, ආක්‍රොශ-බැණුම්ලද්දේ යයි කියත්; (අක්කොසන-අකොසිති-අකොසිති-අකොසිලි-අකොස්ලි) මැව්යසන්, මැවීදයත්; පුබ්බසන්නිවාස හඳුන්වනුවට කරුණුකොට කියන බැවින්, පෙර එනට වීසීම; හැඳින්වීම පිණිස හෙතුවක් කොට කියන බැවින්; වරාජ, වඩාත්; කල්ගේ, කැමති පරිදි; (කානත-කත-කල-කල්) නොඅගියි, නොඅගනේයයි; සුජශ ඇස් ගනුත්, සුජාවගේ ඇස් සතුටුකරත් හොත්; (සුජාය-සුජය) තිස්සාය-තිසය, දෙවාය-දෙවය යනාදිය සමගත් සමකරනු, හඹය්, සමවයි; (සමත්ථ-සමත-හමස-හඹය-

හබය්) සොවුන්වෙස් කිවැතිය හොසි, යොවුන වෙසය සොබදු වත්තව ඇත්දෙහෝයි; පූර්වපරිචයෙන්, පෙරැ පුරුද්දෙන්; “සහනිවාසො සනානිවාසො” සමග විසීම සන්නිවාසයයි; “සං·නිවාසො සන්නිවාසො” සමාන (නොවෙනස්) වාසයෙන් සුකතාව විසීම; සල්වාස, මධුරවාස; හැමසැනිඳු, හැම අයුර්න් මද (සෙයිනිඳු-සේනිඳු, සෙනිඳු) ප්‍රේමෝත්පත්තිය, (ප්‍රේමයාගේ උපතට;) හැවි, හටගත්; (අතීත-අතිත-අතිය-අතුය-අයුය-අයු) (සංජාත-සැජිය-හැජිය-හැදිය-හැවිය-හැවි) “උප්පන්නාහා පෙමෙන අජ්ඣාසවහදයා” උපන් ප්‍රේමයෙන්, (මහොසයකින් මෙන්) යටකරනලද-මඩනා ලද සාදය ඇත්තී; නොවැරිය හැකිවෙයි. ඇති බැවින් නොවැලැක් විය හැකි වෙග ඇති බැවින්; (වරිතුං-වරිතු-වරිත-වරිය-වැරිය) (වේගවෙය-වෙයි) නාමිත සිය මුහුකුල මිහිණියව. දශීතය කල වුන්ගේසිත් මෝහයට පැමිණවූ මොහිණියට; (මොහිණී-මිහිණී) වෙලෙනු වෙර්, ලජ්ජා වන්නාහු; (ව්‍රීඩනක-විලතක-විලනු-වෙලනු-වෙලෙනු) නලවනුලදුමෝ, රවටන ලද්දමෝ; නුහුබඳහු, ලුහුබැන්දහුය; (අනුබඳහු-නුංදහු-නුහුබඳහු) මෙසිම්වයි, මේ සමීපයෙහි; (සමීප-සමිව සිමිව) වෙයි ගැන දුවනරියෙන් සුනුබවට නෙමහයි, වේගය ගෙන දුවන රථය කරණ කොටගෙන සුනු (කුඩු) බවට පැමිණෙම් හයි; “වරිතබ්බන්තා ඉච්ඡිතබ්බන්තාවරං” වරිතබ්බන්තා ඉච්ඡිතබ්බන්තා, කැමැති වියයුතු බැවින් වරං වරය නම්. (සඥාසඳ-සඳ-සත-සත්) ඇත්දීශෙයි, යටජලයෙහි (අනෙතා-ඇති-ඇත්) වජිරැ, දියමනති; (ආයුධ-අයුය-ඇයිය-ඇවිය-ඇවි) දහසක්මත් දහසක් පමණ; (ආදී-ඇය-ඇය්) “භුඤ්ජියතීති භොගො” අනුභව කරනු ලැබේනුයි භොග නම්. සම්පත්තියයි, “නත්ථි භොගො එතස්ස දුභොගො” මොහුට සම්පත්තිය නැත්තේනුයි දුභොග (දිළිඳු) වෙයි. “තස්සභාවො දෙභග්ගං” ඒ දිළින්දගේ තත්වය දෙභග්ග නම් ද මිනිසුන් අතර සිටින එබන්ද මනුස්‍ස දෙභග්ග නම් ද වෙයි.

## 21 සක්වත්.

නොපහල, අප්‍රසිඞ; (පාකට-පගඩ-පහල) පියෙවි, ප්‍රයොග; (පයොග-පියොවු-පයෙවු-පියෙවි) අකුසල් වාසනා ඇ විසින්, අකුසල් පුරුද්ද ආදිය කරණකොට ගෙන; සම්වයම්, සැමමා එහා යාමය; පෙරගත් 1 තිසරුවට වඩා පූර්වයෙහිගත් ආකාරයට එඩා

1 තීසරැවට.

(වෙතස්සොව) (නීහාර-නිහරු-නියරු) ලැවුගිනි, වනයේ හට ගන්නා ගිනි; (දව-දවු-ලැවු) පසයන්, ප්‍රත්‍යයන්; ආරම්මණ ශබ්ද පච්චයෙහි, "ලභනිමාරො ආරම්මණං" යන තන්හි සේයි. ආරම්මණ ශබ්දය ප්‍රත්‍යයාර්ථයෙහිය. ලභනි මාරො ආරම්මණං, (මාරයා ප්‍රත්‍යය ලබයි) යන තැන මෙනි. හවුන්වතු පැමිණෙනු වට, භාවනාවට පමණක් පැමිණීම පිණිස; පස පිළිලදූසි සේයි. ප්‍රත්‍යය හෙවත් ආරම්මණය ප්‍රතිලබ්ධවිය යන අර්ථයි. අධොභාගිය, අධොගාමීන් උපදනා පංච ශුද්ධාවාසයෙන් පහළ කොටසට අයත්; පස්-සංයෝජන්, සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාස, කාමරාග, ව්‍යාපාද යන සංයොජනපස; උඩංභාගිය, පංචශුද්ධාවාස සංඛ්‍යාත උඩකොටසට අයත්; රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යන පස.

බුදුබඟස් විහිජෑ, බුදු සිරුරින් නික්මෙන ආලොකය විහිදුවා, හමියෙහි, හමුයෙහි; (ගාථා-ගාථ-ගය්-ගා) ප්‍රාකෘතයෙහි ගාථා යි ඊටි. ගලනුමයහි, ගිල්වනුයෙහි; (දෙසිත-දෙසිය-දෙසුව-දෙසු)

## 22. අඤ්ඤතර මහණක්හුවත්.

නිජ්ජූසි. ඡූවජා (සිව් පසයෙහි අභිලාෂාව) නැති; ගිඡ්, ගිජුකම ඇලීම; (ගිඩ-ගිජ-ගිජ්) 1. හුණුපිණ්පසයෙහි. හීනවූ ප්‍රත්‍යයෙහි හා ප්‍රණීත ප්‍රත්‍යයෙහි; ජුණු ප්‍රත්‍යය නම් කුණුවූ හෙවත් පිළිණිවූ ප්‍රත්‍යයයි. කායිකපවිවෙකින්, කාය චිත්ත විවෙකයෙන්; (කාය-කය-කය්-කා) (පවිවෙක-පවිවෙය) අරදූවිරි, පටන්ගන්නා ලද වීර්‍ය ඇති; (ආරබ්-අරජු-අරදූ) උච්ඡහය් සමුච්ඡයි, නැගිට මිනාකොට නැගිට-නිතර යනු අර්ථයි. (36. පතිපූජ්කාවත් බලනු. අරජවිරියවගි) සියාහැම පැවැති වැරැ දිනි, සිතෙහි හැම තැනම පැවැති වීර්‍යය උපදවා; (චිත්ත-චිත-සිත-සිය-සියා) (ජනිත්වා-ජනිය-ජනිඃ-ජනි-ජීනි-දිනි) ගෙයි, එකට මිශ්‍රව විසීම; ගෙහසිත පේ්‍රමයෙන් හැනුමණි, ගෘහය ඇසුරුකළ ප්‍රේමයෙන් මිශ්‍රවූයේ; වැලඡීයුතුමනුවක්, වැළඳිය යුතු ප්‍රමාණයක්; රුළක්එව, රූක්‍ෂ (කටුක) දෙයක් හෝ; හුණුවක්, හීණ දෙයක්; (හීණ-හිණු-හුණු) පිණියක්, ප්‍රණීත දෙයක්; (පණීත-පණිය-පිණිය) සානා-ජක, නිවුඩු හාලේ බත්; චතුම්ධුර, මුලදී කියන ලදී.

දිඹුල්, අට්ටික්කා; (උදුම්බර-උදුඹුර-උදුඹුල-දුඹුල-දුඹුල්) (කීරක-ගිරවු) අන්නන් රුකම, අන් අන් ගහකට; (අන් + අන්-අත්තන්) සංස්කෘතයෙහි (රාජන් + ඉහ-රාජනිහ) යනාදී

---

1. ජුණුපිණිපසයෙහි.

තත්හිද, දෙමළෙහි පොන් + අරිදු-පොන්නරිදු (රත්රන් දුලිහසි) විණ් + ඉඩිත්තදු-විණ්ණිඩිත්තදු (අහස ගෙරවිය) යනාදී තත්හිද ලැබේ. අකුරුපත්, අඩතුර සහ පත්‍ර; කිසෙසින් කපිසත්, කෙසේ කම්පාවේදයත්; (කම්පති-කපිසි-කපි) ආශ්‍රය කම්පාවෙන්, ආධාරය කම්පාවීමෙන් අධෙයද කම්පා වෙයි. ශක්‍ර භවනය මෙර මුදුනෙහි පිහිටි හෙයින් ආධාරය වන මෙරු පර්වතය කම්පා වන විට ආධෙයයවූ ශක්‍ර භවනයද කම්පා වෙයි. ආධිපත්‍ය මාත්‍රයෙන්, අධිපති මාත්‍රයෙන්-අධිපතිකමේ ප්‍රමාණයෙන්; අයො ද්‍රව්‍ය සන්නිධානයෙහි, යකඩ ද්‍රව්‍යයන් ළඟ; අයස්කාන්ත, කාන්දම්; කම්පනයෙසින්, චලනය වන්නාක් මෙන්; ආශ්‍රය සල නැතිවම, ආශ්‍රය චලනය නැතිවම; (චල-සල) ගරණොතර, සපිර බවහු හා අතිසපිර බව; සික්වී, වියළවීය. සිද්අසිද්, ලොකු කුඩාසිදුරු; හැම්, හවගත්; විගිජ්ජේයි, විහිදුවන්නේයි; විවෙත්, විපතති; (විපතති-විවති-විවත-විවෙත-විවෙත්) පිලි; එල, (එල-පල-පලි-පිලි) කොලාපෙ, වියලී ගිය වෘක්ෂයෙහි; (54 උපුල්වන් තෙරීන්වත් බලනු) වෙලෙවියන් විටපයන්-(ලොකු අතු විහිදී ගියතැන)

හොලවූයෙහි, වියලී ගිය වෘක්ෂයෙහි; කොලාපයන්හට රාජ මූරරි ජාතක සන්නයෙහි 'පවතින් හඩන්නාවූ' සිද පපංචසූදනි යෙහි 'නිසෙනානං' සිද අර්ථ දක්වා තිබේ. පූ. වලිය, සිදත, උදුමහ සෑගේ පුලියන්කුලම් ලිපිය යනාදියෙහිත් හොල ශබ්දය පෙනේ. එය සුකබ ශබ්දයෙන් ආයේදැයි සොයනු කොලාප යන තන්හි පෙනෙන කොල යනුත් පිරික්සිය යුතුයි.

## 23. නීගම්තිස් තෙරුන්වත්.

දෙවන අප්පමාදවග්ග අටුවා සන්න නිමි.

---

සාලිය රටෙහි, වාලුකාය රටෙහි, එය නැගෙනහිර බස්නාහිර වශයෙන් දෙපරිදි විය. තුමහමේ, තමාගේම; විසුරුවාඇයි, වචනය සහ රූපාදිය; හසින් හසාඩුවියෙහි, ගොයමින් සම්බාධවූ සථානයෙහි; (සංසඨ-සසටු-සසඩු-හසඩු-හසාඩු) හිමවු, ඊතල සාදන වඩුවා; (උසු-උහු-ඉහි-හී) රුක්අලියෙහි, දඬු අධාරයෙහි; මෙහි රුක් ශබ්දය කොටය-දඬුව කියයි.

(ඖද්‍රාරික-ඔළාරිය-ඔළාරි) පටවයනෙඩ, සිව්පසයෙහි ගිජු කම; ගණසංසගග, සමූහයා හා ගැටීම; පිළිවුවාහා පිළිවෙදෙසු, ප්‍රතිපත්තිය හා ප්‍රතිවෙධය දෙසු; සැදූ නම් ඇති සෙනහෙන්, ශ්‍රද්ධා යන නමක් ඇති සෙනහ (ආදර) යෙන්; ද්‍රවයෙහි, කරුණා

යෙන්; **චඞ්කමණ**, සක්මන් කිරීම; **නිසජ්ජාදී**, හිඳීම් ආදී; **ආවරණීය දූෂින්**, කාමච්ඡන්දාදී නීවරණධර්මයෙන්; **සොධෙන**, ශුද්ධකරණ; (සොධන-සොදන-සොයන) නිපොසි, වලනය නොවීම; **පුබ්බෙනිවාස**, පෙර විසූ තත්ත්වය දතහැකි නුවණ; **දිබ්බචක්ඛු**, ස්වර්ගාදියෙහි උපදන, එයින් චුතවන-හීන ප්‍රණීතාදී සත්ත්වයන් දකින නුවණ; **ආසවක්ඛය**, කෙලෙසුන් විනාශ කරන නුවණ; **ඉද්ධිවිධ**, තනිව සිටගෙන බොහෝදෙනෙක්ව පෙන්වීමාදී සෘද්ධි විකුර්වණ කළහැකි නුවණ, **දිබ්බසොත**, සිටි තැනම සිටගෙන දෙව් මිනිසුන්ගේ ශබ්ද ඇසියහැකි නුවණ; **චෙතොපරිය** තමාගේ සිතින් අනුන්ගේසිත් පිරිසිඳ දන්නා නුවණ; **ලා**, දමා; **අග්ගදක්ඛිණෙය්‍යබවු**, දන් පිළිගැනීමට සුදුස්සන් අතුරෙන් අග්‍රබව; "**දක්ඛිණා වුච්චති දානං තං අරහතීති දක්ඛිණෙය්‍යො**" දානය දක්ෂිණාවයයි කියනු ලැබේ. ඒ දක්ෂිණාවට සුදුසු හෙයින් **දක්ඛිණෙය්‍ය** නම් වේ.

**ආගම්මසෙය්**, ආගමසේ; **ආලය**, ගෘහය; '**උදකසඞ්ඛාතා ආලයා**' ජලය යයි. කියන ලද ගෘහයෙන්; **මාරස්සෙවබ්ධෙය්‍යං විධෙය්‍යං** මාරවෙධෙය්‍යං, මාරස්ස, මාරයාහට; වෙධෙය්‍යං, සේසි; විධෙයනති යටත්වූ තැන, මාරවෙධයං, මාරවෙධෙය්‍ය නම්. **කෙලෙස්** වට හෝ සසරයි.

## 21. මේඝිය තෙරුන්වත්.

---

**පච්පණෙයක්හි**, පච්චන පාද (මූල) යෙක්හී; (පබ්බත-පවය-පව්-පච්) (පාද-පය) (සනවාස-ගලවස-ගලවස්) **නන්ගොමැසි රෙසෙන්**, මධුර ලවණාදී නොයෙක් කොටස්ඇති රසයෙන්; **ඵාසු තැනකට**, සුවසේ විසියහැකි තැනකට; **කාසවීමක්**, වෙන් වීමක්; **සිහිවුහුවුපීලයාච**, ඉක්මවූ සිහියෙන් යුත් ප්‍රකෘතිය.

සඤ්ජීවො කාලසුත්තොච-සඞ්ඝාතොචෙවරොරුවො
අථාපරො මහාවීචි-තපනොච පතාපනො

**සඤ්ජීවය**, කාල සූත්‍රය, සඞ්ඝාතය, රෞරුවය, මහා රෞරුවය අවීචිය, තපනය, පතාපනය යන අටමහ නරකයෝ, (සඨ-සළු) **මහලුවන් වටගකල්හි**, සර්විර භික්ෂූන්ට උපස්ථාන කරන කල්හි; **ගෙලඤ්ඤ**, ගිලන් බව; **කියවත්**, සඞ්ඝ සම්මතයෙන් ස්ථිර කර ගත් නීති; (කථාවත්ත-කයවත-කියවත-කියවත්) **වාග්පරිචය** වචනයට පුරුදු කිරීම-කටපාඩම් කිරීම; **ගේගෙනු**, ක්‍රමයෙන් විනාශවීම; **වණ්ණාමරණ**, බලාපොරොත්තු නොවූ පරිදි **සැණෙ** විපතකින් සුදුවන මරණ; **සම්මුඛ මරණ**, ගස මළේය, **යතා**

නාත්හි ලැබෙන ලෝක සම්මත මරණය; විෂයොපචාරයෙන් විෂයෙහි මෑ කියේයි, විෂය සමග හැසිරීමෙන් කම්සථාන යනුද විෂයෙහිම ලා කියේය යන අර්ථයි. ලොවිඅගිඤ්ඤණු, ලෞකික ඥනයෝ; මගින් නිපන් ඵලසුවෙන් නැගි, මාගීයෙන් හටගත් ඵල සැපයෙන් නැගී; උවනිස, හේතු සම්පත්තිය; පසුන ගමන් කොටින්, පසු ගමන්කොට හෙවත් පසුව අනු ගමන්කොට; සිහිය හැකිද, සෑතු ගුණාදිය ඉවසිය හැකිද; 'ධම්මතුං සක්කා' ඉවසිය හැකිද; 'යාපෙතුං සක්කා' යැපෙන්නට පුළුවන්ද; කෙනාසල කුළුවද, කලාතන තොවූද; අවුළු සහිත වුවයි, අවුළුපත් සහිතවූ; විකෙවු, විකෂප; (විකෙඛප-විකෙවු)

## 25. අඤ්ඤතර මහණගුවත්.

---

උකැටි, කළකීරුණ; රී, රුවිය; (රුචි-රුසි-රිසි-රිහි-රී) කුලෙවු, නිතර කුලයට එළඹෙන; (කුලූපග-කුලොවු-කුලෙවු) ලහබත්, මුලදී කියන ලදී.

'සපතිකො ආගතං සාපතෙයාං' ධන සවාමියාගෙන් ආයේ සාපතෙයා නම්. (අභිදම්-බිදම්) නාම රූප ව්‍යවස්ථාන, නාම රූපයන් නියම කිරීම-නිශ්චය කිරීම; අනොලොකියට්ඨාන ඔලොකන, නොබැලියයුතු තැන් බැලීම; ඉච්ඡාවිහාරයට; කැමැත්තේ හැසිරීමට; වහළු, වැහැරී ගියේ; රුළු, අපිරිසිදුවූයේ; වසන්, ව්‍යසන-විපත්; "අනයොවසොබ්‍යසනංචාති, අනයබ්‍යසනං" නොසැපයද විපතද දෙකම එකක්නුයි අනයව්‍යසන නම්.

## 26. උක්කණ්ඨිත මහණගුවත්.

---

නග, බාල සහෝදරිය; (දෙමළ-තඞ්ගෙ) (භාගිණෙය්‍ය-බගිණිය-බහිණිය-බැහැණි-බැහැණ-බැණ) ගමක් වෙහෙරෙක්හි, ග්‍රාමයෙහිවූ වෙහෙරෙක්හි; (ගමක-ගමත්) මෙහි පෙනෙන 'ත' යනුව ආධාරාර්ථයෙහිය. සං-ත්‍ර, පාලි-ත්ථ-ප්‍රා-ත, හිදන, පාලත යන අශොක ලිපි පාඨයන්හි එය යෙදී තිබේ. තොගොත් ගාමනන යනුයෙන්ද එය බිඳගත හැකිය. වස්විසිපිළී, වස්වුසු වනට පුදන වසත්‍ර; දවහල් දවස් ලියසුතුතැන්, දවල් කාලය ගතකළ යුතු තැන්; ලා-හැරීමෙහි දක්ත් නිපති 'ලිය' යනුව; හැකැරීමෙම්, සහකාරයෙක් වෙමි. (සහකාරක-සහකරුය-සහකැරුය-හැකැරිය) දුහැමිවියහැකි, දූකසේ පිහුටුවිය හැකිය. (දුසණ්ඨාපය-දුසැට්වය-දුහැටිවිය) ගැටෙලක්හි, කරත්තයෙක්හි;

සරත්තවාවී 'ගැල' ශබ්දය සකට ශබ්දයෙන් ආහැකි වුවද ක්‍රමය අවුල් සහිතය. කාශ්මීරි බසෙහි 'ගොඩි' කියාද සින්ධියෙහි 'ගාඩො' කියාද, ගුජරාටි මැරැටි දෙක්හි, ගාඩී හෝ ගාරී කියාද, ඇසැම් බසෙහි, ගාරි කියාද, බන්ගලි නෙපාලි දෙක්හි ගාරි කියාද, බීහාරි හින්දි දෙක්හි, ගාරී කියාද, පන්ජාබියෙහි ගඩ්, ගඩී, ගාඩී, කියා ද පෙනෙන්නේලු. එබැවින් හෙළයෙහි ලැබෙන ගැල ශබ්දය සකට ශබ්දයෙන් නොව ඉහත කී ගාඩී, ගාරී ආදි ශබ්දයකින් ආවකැයි අපි සලකම්හ.

**කැහැවින්**, කැවිවෙන්; (කාෂට-කහව-කැහැව) **ආව, ආහුද** නසද කරුබුහුබසි; **නොසඟිසියි**, නොහැකියෙහිද? (සක්ඛි-සඟි) (නොසඟියෙහි-නොසඟිසිහි) **දුරජ්වූ, දුරවූද; සපිණිසන**, පිළි ගන්නා (සම්පටිච්ඡන-සපිළිසන-සපිණිසන) **සැහැවි**, සවභාව ඇත්තේය. (සභාව-සැහැවි) (සූනන-සූන-හුය-හුය්-හු) (**කණ** ණික-කැණිය-කැණි-කැණ) **වනවිහා, වණි** හෙදය; (වතු-සිහු) **සින්හු වැසෙන**, විතානයන් වාසය කරනු ලබන;

## 27. සඝරක්ඛිත බෑන තෙරුන්වත්.

---

**හෙදිමුල**, ගව සමූහය. ගවයන්ට හෙරි නාමය යෙදූනේ අනෙක් සිවුපාවන්ට වඩා ඔවුන් ගෞරව ලබන හෙයිනි. **වකාර පාඝි**, අවක්කාර පාත්‍රයෙහි, පාත්‍රයෙහි යැපෙනපමණක් තබාගෙන ඉතිරි පිණ්ඩපාතය දමන භාජනය අවකකාර පාතියයි. (අවුක් කාර-අවකාර-වකාර) **බුත් ඉතිරි බත්**,,, වළඳා ඉතිරි බත්; **සඳින් අඳන්හු**, දුර්භික්ෂයන් බෙදයට පැමිණියහු; (ඡාත-වත-සය) **නැග්**,! උත්සාහ; **සැව නියරකි**, සියලු ආකාරයෙහි; (සබ්බ-සව-සැව) (නීහාර-නිහර-නියර) **වත්ඛඳකි**, මහවග පාළියෙහි වත්තක්ඛන්ධකයෙහි;

**ඉපිණි**, අතිප්‍රණීත-ඉතා මිහිරි; (අතිපණීත-ඉපිණිය-ඉපිණිය්-ඉපිණි) (අති-අයි-යි-ඉ) **සබ්‍රම් සරණට**, සමාන බ්‍රහම් චරියාවාසය ඇත්තනට; (උපකාර-උවහර) **නගුල් සැජ්**, නගුල සහ ඒ හා බඩ අනේක උපකරණ (89 සංකිච්ච සාමණේරවත් බලනු ) පූ වලියෙහි සැති; **අනිසි**, අනිත්‍යවෙයි. **විපරිනාම දුකින්**, වෙනස්වීමනිසා ඇතිවන දුකින්; **හුස්**, නැන්දෑ;(සස්සු-සසු-සුසු-හුසු-හුස්) (පටික්කනතක-පිළිකතක-පිළිගතු-පිළිකුතු) **විපිළිසැරි**, පශ්චාත්තාපයට පැමිණි "විරූපපටිසරණං විප්පටිසාරො සො එතස්ස අත්‍ථීති විප්පටිසාරී" පශ්චාත්තාපය විරූප පටිසරණය නම්.එය මොහුට ඇත්තේනුයි විප්පටිසාරි නම්වේ. (කාළකණ්ණී-

කාලකණ්ණි-කාලවණ්ණි-කළුවණ) කර, දලිඳුහිය; ගහණ, ඇතිල්ලීම; සෑත්නිහත, ආයුධ මුවහත් තබන; (නිශාදන-නිසදන-නිහයන නිහන) "ඉමස්මිං තෙවාරෙ විරාධිතං" නුඹ විසින් මේ වාරයෙහි කල්ගත කරන ලදී. සංසජ්ජති එකී භවති එතෙනාතිසංසග්ගො මේ කාරණකොටගෙන එක්වීම වේනුයි සංසග්ග නම්. "අගම්භ පකතිකාභාවා" නොගැඹුරු ප්‍රකෘතිකොට ඇති බව; අ[illegible]වියරා, අභිමුඛ ප්‍රකාශකොරෙයි. (ව්‍යාකරොති-වියරයි-වියරය්-වියරා) පිළිලබ, ප්‍රතිලාභය; බොපැකිධම්, සිව්සස් දම් අවබොධයට උපකාරවනධම්;(බෝධිපක්ඛික-බොධිපැකිය-බෝපැකිය-බෝපැකි නිරනුසයසන්තානෙහි, අනුශය කෙලෙශ,නැති සිතෙහි; පීවන බැවින්, බැහැරවූ බැවින්; කළුල්, පැහැවී; (බලලාට-කලට්ටු-කලුට්ටු-කලුළු) බක්මල, බක්මාසයෙහි පිපෙන හෙයින් නොලොම්මලට විශෙෂ නමක් වියහැකිය. වෙසක් මල්මෙනි වල්කලා, ගස්පොතුතලා සාදගත්තා වස්ත්‍ර වර්ගයෙකි. තවුසෝ හඳිති. හෑසුඩු, සම්බාධ-ගහණ; (සංඝට්ඨ-හැසටු-හෑසුඩු) බ්‍රාහ්මණ ශබ්දය දෙමළයට පිරාමන කියාද එයින් හෙබවට පිරිමිනී කියාද එයි, පසුව මූලාර්ථය වෙනස්විය. අඩනැලියක්මතු, ;සේරු එකහමාරක් පමණක්; අඩමනාක්, තුන් කාලක් පමණ, මනාශබ්දය නැළිවාචක බව ජාතක ගැටපදයෙහි පෙනේ. (ජයතිලක සංස්කරණය 99 පිට) !!මානතාහි අට්ඨනානංනාළිනං නාමං චතුණ්ණං අඩ්ඪමානංච-නාමයාව නාළිමෙයාතුමෙබා නාම" යනු ජාතක පාළියි (හේ වි. මුද්‍රණය 1-393) මාන යනු අට නැළියක්ට නම්. සිව් නැළිය අඩ්ඪමානය නම් තුඹ යනුත්-සිව් නැළිය මැයි. වන, තණ; "වීනා" යනු ඉන්දියානු ව්‍යවහාරයයි. (වරාක-වරය-වරජ-වරා) (කුද්දලක-කුදලු-හුදලු)

## 28 චිත්තහත්ථ තෙරුන් වත.

---

පබොජ සඳහාය්; පබොජ යනුයෙහි අර්ථය පැටලිලි සහිත හෙයින් උතුම් හොජනය සඳහා යන අර්ථය දනට පවසම්හ. (හොජ්‍ය-බොජ) කිලිබුරන්, කලෙබරයන්; හිස්නුත් සිරුරු කලෙබර නම්. ගහාව, භයජනක; කිච්ඡි, කබුහුත් යැමි-ප්‍රතිශ්‍යාය; (බිපිතක-කිච්චු-කිප්සු-කිච්ඡි) ජනනා, උපදවන; පක්සඳ, පැසිඉවරවූ කල්හි; දූපනන්, ධූපනයක් තෙම්පරාදුවක්; කිලේම්බරණ, ඛණික මරණ; (ඛණික-කණිය-කිණි) පිරිගණන්, නුවණින් විමසන කල්හි; මේ පාඨය මෙහානට වැඩියයි සිතේ, එලවස්, බය වය පිළිබඳ සිහිය ඇතිකරගෙන; (ආරොපෙත්වා-එරවය-එලුවය-එලවය) බල නැති බව නම් ඇති දුබල් අමින්,

බල නැති බවය (අබල) යන නමක් ඇති දුබ්ලාවියෙන්; නොඇද තිය බැව් නම් ඇති, අනඩතිය භාවය (බොහෝකල් නොපවත්නා බව) යන නමක් ඇති; (අඩතීය-ඇදිගිය) ගොපුරසිරිංග පවුරු මුදුනෙහි, ගොපුර මුදුනෙහි හා සිරිංග පවුරු මුදුනෙහි; වෙසි [පු] කු, වීපිඝයෙහි සිව්මංහන්දි; (වීපි-වෙය-වෙය්-වෙ) (චතුෂ්ක-සිපුකු) කොළක-කොටය-කොටිය) කවජී, තව්වය-සන්නාහය; (කවච-කවජ-කවජී) කසු, කඤ්චුකය-යුධ සැට්ටය; (කඤ්චුක-කචුක-කසුක-කසු) ගුළු කල්හි, පතිතවූ කල්හි, (ගලිත-ගිලිය-ගුලුය-ගුළු) අරජව්වසු, ආරඬම්පසසක.

**29 අරජ ව්වසු මහණවත්.**

---

පුතිභූතගාත්‍ර ඇති, කුණුවූ සිරුරු ඇති; ලදී, හාදයදී-හකන්මත්ව යනු අර්ථයි. (උර-ඔළ-ළ) සිද්හතුම්තුපමණහු, අබ ඇට පමණවූ; මෙහි "මතු" යනුව අධිකයක් දූයි සොයනු, ඩෙබර; මසන්; ඇඹුළු, තෙල්ලි;(ආමලක-ඇමුලු-ඇඹුලු) බෙල්බෝබොළු, නොපැසුන බෙලිගෙඩි; වත්මාන ගොබොළු යනාදී ශබ්දයන් ගැනත් සැලැකිය යුතුය. නොපිළිජෑගිය හැකි, ආරක්ෂා නොකළැකි. සුවනොකලහැකි නොහොත් සාත්තු නොකලහැකි; දුල්පු, ආස්මි; එඩිපු යනුත් ඊටම නම්. විසුඩිමගගසනනයෙහි "ඉඩිපූ" යි කියන ලදී. ජාලාකාරයෙන් කරන ලද අප්‍රුපජාතියෙක යෙත්" යනුත් එහි පෙනේ.

අවුණු, බාල්දිය; (අමමණ-අමුණු-අවුණු) (සංසිඛා-ගසිය-ගසය-ගහය්) පියව්නොගොන් නෙතිය, ප්‍රත්‍යතිශයන යෙන් ගය නය කරන ලද; ඉජිවණින්, සෘජු විධියෙන්ම; ඍජුවිලාසයෙන්ම; සිටිවණිම සිටියේය. යනාදියද -සලකනු (වණණ-වණ) බුහුරු, සිදුරු; ජුණිවා, දිරාගිය; (කම් විබති) (ජිණණක-ජිණුව-ජුණුවා) හැදපාසිඅළු, ඇදකකුල්වලට තබන කොර් තැබෙලි; පාළිඤ්, නොදෙව්පාතබන ලෑලි තැබෙල්ල; පුවරුපිවු, ලෑලි බංකුවක්; ගෙනෙනවි, ගන්නට; පියා ඇට නුජ්, පියාපත්වල ඇටන්; රෙසෙහි බත්පක්කල්හි, මාංස රසය සහිතව බත් පිසූකල්හි; බුදුන් අරහත් එලය, වැලදූ අරහත් එලය,(බුදුනු-බුදුන්) වළදනා ලද; "බුදුන්" යනු බුදුනු,යි වීනම් මැනවි (භුතත-බුතු-බුදු)

**30 පුතිගතන තිස්ස මහ තෙරුන්වත්.**

---

සකීරණි, ඝනය සහිත වූ; උවාරණි, උපකරණ; (උපකරණ-උවහරණ-උවාරණ-උවාරණි) "යථා අතනනොකුවුඹාංරකබණි" යම්සේ තමාගේ සැපත් රකිද, පැල, පිඹා; .වොළොාව, විලොපය-

පැහැරගැනීම. පිරිණම, මෙරිම; වෛරියෙක්, වෛවරියෙක්; වටක්, විලක්; (ආවාට-අවට-වට) මිදුබ්බි, මිත්‍රද්‍රෝහී; (මිත්තදුබ්බි-මිතදුබ්බි-මියදුබ්බි-මිදූබ්බි-මිදිබ්බි) මෙතනාදී විසබිවරජනහුය, කුඹුරු ආදිය කෙරෙහි වැරැදි කරන්නහුය; නොසේ. අනියම් පරිදි-වරදවා; "සඤ්චාරානකම්පිතං" බුදුන් විසින් නොවදරනලදී.
නිඹවුවද්, අවසන්වූවත්; "උදනසුත්තනෙත්තත විත්ථාරෙතබ්බා කථෙතබ්බං" උදන සූත්‍රයෙන් විස්තරකොට කියයුතුයි.

## 31 නන්දගොපාලයා වත්.

උපනුවා, උපන් දෙශනාව; දුටුවෙනිපවකැමින්, දිට්ඨධම්ම වෙදනීය (මේ අත්බැව්හිදීම විපාක විඳයුතු) පාප කර්මයෙන්; (දිඨවෙදනීය-දිට්ඨවෙයනිය-දුටුවෙයනිය-දුටුවෙනිය-දුටුවෙන්) දිඨ ධම්මවෙදනීය (දුටුදම්වෙයනිය) යන තැන මධ්‍ය පදලෝපය විය. පිරිමිනිසඨන්, පුරිසසණ්ඨානය-පුරිස්වෙස; පුරිසනිමිත්ත පුරුෂයකු බව හඳුන්වන හේතුව-පුරුෂලිඞ්ගය; කුතන, කෘත්‍යය; ආකප්ප, වෙශය; අවරවිරියෙවති, අපරාපරිය වෙදනීය-සසර ඉඩ ලැබුනු තැනකදී විපාක දෙන; අපරාපරිය (අවරවරිය-අවරවිරිය-අවර විරි) ඉත්ථියො අභූත පුබ්බා නාම, ස්ත්‍රීහු නුවූවාහු නම්; තරාල් කුලෙක්හි, සවණ්ණකාර කුලයෙක්හි; (තුලාධාර-තලහර-තරහල-තරාල-තරාල්) "පරදාරෙසු භවං පාරදාරියං නාංච නාං කම්මං වාති පාරදාරියකම්මං" පර ස්ත්‍රීන් කෙරෙහි වූයේ පාරදාරිය නම්. ඒ පාරදාරිය වූයේත් කර්මය වූයේත් එකක්මතුයි පාරදාරිය කම්ම නම් වෙයි. කඩකොටැ, අතහැර; පිණිපස, ප්‍රණීත ප්‍රත්‍යය; හැකැවී, කැලඹී; (සඞ්බුභිත්වා-හැකැවීය-හැකැවීය්-හැකැවී) එකත්, හුදකලා; (එකත්ත-එකත-එකත්)

## 32 කොසෙරය්‍ය සිවුපුත්වත්.

තුන්වන චිත්ත වග්ග අටුවා සත්‍ය නිමි.

පොළොවකියයි, පොළොව පිළිබඳ කථායෙහි; බුදුන් උවට නාවි, බුදුන්ට උපස්ථාන කරනු පිණිස; බිගිල, බහුල; හකුරු, ගල්කැට; ඉන්ද්‍රියබන්ධයෙන්; ඉන්ද්‍රියන් හා සම්බන්ධයෙන; නිජික හැනෙයගිවූ, සවකීය අභ්‍යන්තරයෙහි වූ; (නිජකජ්ඣත්ත-නිජයහැන-නිජියහැන). අජ්ඣත්තභවා අජ්ඣත්තිකා කාචනා පඨවීවාති අජ්ඣත්ත පඨවී, අභ්‍යන්තරයෙහිවූවා අජ්ඣත්තිකානමු. අභ්‍යන්තරයෙහි වූවාත් ඕමය පෑපිවිය වූවා ඕත්ම තුයි. අජ්ඣත්ත පඨවීනමු. ලාකැකුලන්, බාලමොට්ටු ලා යනු දෙමළ "ඉලෙ" ශබ්දයට සමානය. (කලිකා-කලිය-කකලි-කැකලි-කැකුළු) මැලාවන්, මලානිකාවූවන්; ගැටජාවන, හටගත් ගැට ඇතිතවුන්.

## 33 ගන්ඩිගයක් මහණුන වත්.

පිරිහුනැවැතිකම්ඇන්, පිරිගුව නිමිතිකොට පැවැති කම්සථානය, ළුලගින් සාජන පිවිරුස්සෙම. ළුලගින් වලනයවන සුයසීරගමීනම; පිරික්සනැනිබල්නට. පරීක්ෂාව නැති බාලයන්ට; (උපට්ඨානි-උවට්හයි - වටහයි) ධම්සුමුහිය, ධර්මසමූහයක් හැර; (සමූහ-සුමුහ-සුමු) (මුසුව්ත්වා-මිසිය-මිසය-මිසැ) දියසිඑ, ජලස්‍රොතස-තදින් බැස යන වතුරපාර; නොඇඩනි අපින්, අනඩනිය (බොහෝකල් නොපවත්නා) තාවකාලිකාවීයෙන්; උවක්මෙන්, උපක්‍රමයෙන්; (උවකුමෙන්-උවක්මෙන්) නොසහතු, නොඉවසීම හෝ සිදුනොකිරීම, පිරිසුනු. පරිච්ඡින්න (සීමා) වීම; (පරිච්ඡින්න පිරිසින-පිරිසුණු) "ගණනං ගය්හං නං උපගච්ඡතීති ගය්හුපගා ගහණය ගය්හ නම්. ඊට එලඹි නුයි, ගය්හුාග නම් වේ. කිණි, ඛණික-වහා; (ඛණික-කණිය-කිණිය-කිණි) 'වටු' වෘත්තයයි, සංසාරයයි; කම්කෙලෙස් විවහ විසින්, කම්වට, කෙලෙස්වට විවාවට විසින්; (විපාක-විවහ) නම් ලදුවන, නම් ලද්දන්;

## 34. පෙණුපමවත්.

---

දියසිලින්, දියදහරින්; (සොත-සිලු) ජලය කැරකෙන තැනට දියසුලියයි දන්කියති. වැතිරැ, පැතිර-යට වී; (පත්‍ථරිත්වා-පැතිරිය-වැතිරය-වැතිරැ) නූගෙන, උපදින; "බන්‍ධුලකුමාරොකපෙපසොනා ආගමාසි" බන්ධුලකුමාරයා කපමින් ගියේය! මෙසේහොත් නොකැපියහෙයි. මෙසේවුවහොත් කැපිය නොහැක්කෙක්යයි; යලහසීලා, යකඩකූරුදමා; (අය-ය) සලාක-සලක-ලසක-ලහක-ලහයි) පමුණුවට, ප්‍රමාණයට; වේ, වෙගය; (වෙග-වෙය-වෙය්-වේ) පමණනා නන්හි කෙලින්සිටි හුණුකලඹ අසින් කඩමින්, ප්‍රමාණතාක්‍තැන කෙළින් සිටුවා තිබුන උණ මිටි කඩුවෙන් කපමින්; (කලාප-කලප=කලඹ) එක්වෙයින් එක උණමිටියකට ගැසූ වෙගයෙන් (අනෙක් උණමිටින්) සුණුවේ, ඡින්නවෙයි. හැම්කලඹ එකි එකි සිඳිවෙයි. හැමමිටිම එකක් එකක් පාසා සිඳිතලද්දේ වෙයි; එක්කලඹයින්, එකමිටියක් සේ; ගින් ශබ්දය ආකාරාවියෙහි වැටෙයි.

සෙද්වී, ඡේදවෙයි - සිඳෙයි; (ඡේද - සෙද - සෙද්) අනුකරණි, අනුකරණයවෙයි; එසෙසින්, එසේ; පවුරා අසින් නොපහල බැවින්. වේගය පුරාකඩුයෙන් නොගැසූ බැවින්; ජාතිත්වා (ජාතිය) ජැතය-දූනැය-දූතැය්) (උස්සාහ-උසහ-උසා) නොපිරියෙයන්, පුණිනොකෙළේයයි කියත්; සුලවුන්, සුහෘදයන් - මිත්‍රයන්; සුහෘද - සුහළු - සුළුහු-සුලවු) පෙමෙණින්, ප්‍රමෙණියෙන; (පමෙණි-පමෙණි-පෙමෙණි) හියග, සතත-නිතර; වැටියටි, උපස්ථානකරනු කැමැති; (උවැටි යටි-වැටියටි) නොපතැනසිමැ, නුඹවහන්සේගේ ස්ථානයෙහි

සිට; භික්ඛගණනියන, භික්ෂුසඞ්ඝයා හික්මවන; සිවිනනරපදු නවෑ, අන්කටයුත්තෙක යෙදී; පවස්, ප්‍රමාද; (පපංච-පවස්) සනපනුවට, වැලදවීමට; (වසිත- වසිය-විසිය - විසි) හේ, හේතුව; (හෙතු-හෙයු-හෙය්-හේ) සේ කොටළු, සිදීම කළහ; (ඡේද - සෙය - සෙය් - සේ) මෙති ඡේදයනම් බැහැරකිරීමවේ.

හුසුහු, නැසුහ. යනු අර්ථයවිහැකිය. උච්ඡේද-උහුස-හුය-අතීතාඛ්‍යාතය හුසුහු (76 සැරියුත් මහතෙරුන් වත් බලනු) ඇදුරු, ආදර; පිරික්හි පිරික්හි, වටපිට බලබලා-ඕනවට එපාවට; පිරික්ස පිරික්සා-පරීක්ෂාකෙරෙමින්)වලහත්, වළකත්-සභවත්; 1. කිජ්බොජ්ඇසිවත්, කතබොතආදී දේවල්; [බජ්ජ-කජ්ජ-කිජ්ජ) බොජ්ජ-බොජ්ජ-බොජ්) රුළක්; කටුක දෙයක්; (රූක්ෂ-රැළු) සිපෙපි, ඉතිරිවිය.

පිරියුණුවු, පරිපූර්ණවූ; "කාමනියශඑනකාමා උපභොග පරිභොගභණ්ඩානි" කැමැති වියයුතු අර්ථයෙන් කාමයෝනම් වෙති. එනම් උපභොග පරිභොග භාණ්ඩයෝය. සබ්බවකෙ කාමාවෙති සබ්බකාමා, සියල්ලවූවාහුත් ඔවුහුමය කාමවූවාහුත් ඔවුහුමතුයි සබ්බකාමනම්හ. පරනිපානකො, අගටයොද; තෙ අස්සසනති සොසබ්බකාමසමිඩ්ඩි, ඒ සවිකාමයෝ යමෙකුට ඇත්තාහුද හේ සබ්බකාම සමිඩිනම්. ධම්මූපසංහිත, ධර්මයෙන් යුත්; මස්අවුලෙන් මසින් සම්පාදනයකළ ව්‍යඤ්ජනයෙන්; උප සිංචනති එනෙනාති උපසෙචනං මංසෙහි සම්පාදිතං සෙචන. මංසූපසෙචනං, එයින් මිශ්‍රකෙරෙත්නුයි උපසෙචනනම්. (ව්‍යඤ්ජ-නයයි) මසින් සම්පාදිත උපසෙචනය මංසූපසෙචනයයි. (ජාතක ගැටපදය ජයතිලක '170 පිට ලලනු) හොඩහමු, කුදුඈනම් ධාන්‍ය විශෙෂය;

(සාමාක-සමක-සමු-හමු) හූරුහැල්, ඉබේහටගත් හැල්; උපයවති, උපදවති; (උප්පාදයති - උපයවති) වළදසිජ් වළඳසිද යනු අර්ථයි. විසත්වෑ, විස්වාසව; (විස්සත්ථ-විසත-විසත් ඇතියනුනො, ඇත්තාහු නොවෙත්ද; නොයනු ප්‍රශ්නාර්ථයෙහි) නිපාතයි. "ජානසං සමොධානෙතෙනා ආහ" ජාතකය අවසන් කෙරෙමින් වදාලේය. [ ] බිසෙසෙව, සමීපයට; (අභ්‍යාස-අබියස-අබියෙස) "සනතිනතිකචවිනනයිංසු" රැස්වසිතුහ. ඉතිරි, අති-රිකත-අධික; ඇතියා, ඇත්තේය; පැතියා, පැමිණි තැනැත්තිය. සිලිපියා, සුලුපියාගේ (සුළු-සිළි] ආර, ආකාරය; (ආකාර-

1. ආකිජ්බොජ්.

අයර-ආර] ඇයි එකතැපිසෙහිබුජුනාවිපැය්, එක තැපිසෙහි අනුභව කරනු පිණිස ඇයට ප්‍රකාශකොට; බිසෙසි, අභිෂෙක කෙළේය. (අභිසෙසි-බිසෙසි) සැහැවු, සවභාව; (සවභාව-සැහැවු) (බධිර-බිහිරු-බිහුරු) කුසිය, තිසිය, යොග්‍යවෙයි යනු අර්ථයි. "අනිව්ඣවරං ලභිතුං අනුවජජිකා" වරලැබීමට අනිශයින් සුදුසුය. කුලසැනි, කුලසනතක-කුලයට අයත්; කුලසනතක-කුලසතක-කුලසතු-කුලසැති) වැටෙන, පවත්නා; පොතලු, රෙදි, දල, ලී ආදියෙන් සාදනලද්දවූ හෝ රෙදි ආදියෙහි අඳින ලද්දවූ රූපයෝ පොතලුනම්වෙති. (පොත්ථලිකා-පොතලිය-පොතලි-පොතලු) "නාපිමාතා පිතරො එතියොති නිමමානාසිතිකා" යමකට මව්පියෝ නැත්තාහුද ඇය නිමමානා පිතිනාතවූ. අතුරක්, සිදුරක්-හැදින ගතහැකි වෙනස්කමක් කලහලි, කලබලයක්; (කලකල-කලහල-කලහලි) පෙරහැර, සත්කාරය (පරිහාර-පෙරහැර) අසිද, පැහැරගෙන; (අවඡින්දිත්වා; [අවජින්දිය) අසිදිස-අසිදය-අසිදැ) සිඳා, විත්තෝය; ජෙට්ඨ, ජ්‍යෙෂ්ඨද-උතුම්ද; ඇරනියකට, ගෙනඑන්නියකට; (හරණ-අරණ) අරන ශබ්දයා කෙරෙන් ස්ත්‍රී අර්ථයෙහි 'ඉ' ප්‍රත්‍යයව ඇරනිව්ය. එළිසෙය්, නුවරදෙර එලිපත්තෙහි; "ආරක්ඛායනි-යුත්තා ආරක්ඛිකා" ආරක්ෂායෙහි නියුක්තවූවෝ ආරක්ඛිකනම් වෙත්, ඔවස්, අවකාශ; (ඔකාස-ඔවස-ඔවස්) නෑඹපවා, බොස්-ගෙඩිය දක්වා; දුනුදියසෙළි, දුන්නෙහි ලනුව ඇදගලේය.

"පංචරාජසතානි විනිවිජඣිත්වා" රජුන් පන්සියයක් සිදුරුකොට; සනනාහ' යුදඇඳුම්; නාභිසථානයෙහි, බුරියලඟ; අළි, [අලෙ) බොල; [අරෙ-අලෙ-අළි) සංථපෙත්වා, සිටුවය-සිටුවය්) වැජ්‍රීයයුතුනා, විධානයකල යුතුතාක් දෙය; (වීවාරිතුං-වීවාරිතු-විවාරිත-වැජැරිය) වැටෙවයි, පවතුවයි; නිමුල්දරුවන් ලුහුවූ, තිබුන් (යමක) දරුවන් වැදුවාය' කුළුසමන්, බොරුනඩු; "විනිචඡයනියුක්තා විනිචඡයිකා" නඩුවිසඳීමෙහි යෙදුනාහු විනිචඡයිකනම්වෙත්; "විනිචඡයාමයසං අපිනෙවිනිචඡයිකා" විනිශ්චය යමෙකුත්ට ඇත්තේද ඔවුහු විනිචඡයිකයෝය. "අනත්ථංමෙවරිස්සතීති" මට අනතුරක් කරනැයි; අඟා, ක්‍රොධ; (ආඝාත-අගය-අගය්-අගා) නොහොයි, නොහැකිවිය, සිප්ශතු-වා-තුමාසෙනවියා, ශිල්පය උගත් තමාගේ සෙනෙවියා; තුමා-මෙයොජනුලජ්, තමා විසින්ම යොදනලද; හිඟ, ඉතෙහි; මහතෙරුන්කියතීයිනා, මෙවැනි තන්හි සඬකායෙහි කපුවිබන යෙදෙනැයිද එය එක බසින් සිටිනැයිද සමහරුන් කියනත් ඒ අසත්‍යය. මහතෙරුන් යනු කැවිබත් බුහුබසි. ප්‍රථමාවිසි

කම්විබත් ගෙදෙනු හෙළයෙහි සිරිති. ණීන්, ලේලිවරුන් (සුණිසා - ණිසිය - ණිසිය - ණිසි - ණි) මනංපදෙශසනිම- නොපදෙසා; හියදූෂණය කෙරේනුයි මනොපදෙස නම්වේ

වැත්නා, වනී-නොරතුරු; මුහුවු හරින ලද (විසසඨ-වුහුටු) නහන ඔවසක්, නසන අවකාශයක්, බංගවජනෙවාමර උණියිස පාදුකා, කඩුව, පුදු කුඩය, චාමරය, තලල්පට, සපත්තු දෙක යන මේවා; ඛකුඛභාණ්ඩ, රජබව හඳුනවන ප්‍රධාන භාණ්ඩ; මෙහෙකරනියකා, සේවිකාවක්; මෙහෙකරන ශබ්දයාගෙනෙරන් සත්‍රී අර්ථයෙහි "ඉ" ප්‍රත්‍යයවීමෙන් මෙහෙකරනි ශබ්දය නිපනි විරීගේ ඇතිමයකි, විරලව්‍යාංයාව හෙවත් අඩුවූ සෙවන ඇත්තෙනි; ඇතීමෙහි යනු ඇති ශබ්දය සප්තමී එකවචනයට වරනැගුනු තැනී. කිසුමයාමැමෙ, කියන ලද්දක්කොටම; ශබ්දවජලමයන්, ශබ්ද ව්‍යාජයෙන්; (අතීත-අයිය-අයුය-අයු) නොහනනුවෝ, නො නසන්නෝ; (හනන-හනනු) "සළපථනහනනනීති සපථඝාතකා, නසපථ ඝාතකා අසපථ ඝාතකා" ආයුධයෙන් නසත්නුයි සපථඝාතක නම්හ. ආයුධයෙන් නොනසන්නෝ' අසපථ, ඝාතකයෝය. ඛික්නාමෝ, හික්මුනෝවෙමු; කලඅත් ඇතයමෝ පුරැදුකළ අත් ඇතියම්හ. වැඩියමෝ කරන ලද උපස්ථාන ඇත්තෝවෙමු, දුනුවාවමෝ; ධනුර්ධරයෝ වම්හ; (ධනුග්ගාහ-දුනුගා-දුනුවා) පොරලකාවසුදර ඇතියහ, පෙරවූ කවච (යුධ ඇඳුම්) දැරීම් ඇත්තාහ; (පාරුත-පොරල) පලහුරු කන්සිදුරු ඇයින්, පලිස් අතරෙන් හා කන්සිදුරු ආදියෙන්; (ඵලකනතර-පලතුරු) පලතුරෙන් නික්මෙමින් දෙකන නගත් එළලයි කලෙල නොදක්වයි. පලිස් අතුරෙන් නික්මෙමින් කන්දෙකට නැගෙන කල්හි පලකයෙහි කැළල (සලකුණ) නොදක්වා; ඵලපුවරු පලිස් සහ ලෑලි; නොහී, පතිතනොවී; "දෙකන නගත්" යනු හැක සහිතය.

මාපියා මවගේ පියාගේ-මුත්තාගේ; (මාතු-මවු-මව්-මා) මුස්නාව පසන, මිදීමට හේතුවක්-ප්‍රත්‍යයක්; ලේනෝ, ලේගහ; (සොත-සොය-සොය්-සෝ) තුමහමේ මේඛලහි උතුමැයි, නමාම මැරෙන ලද්දේ උතුමැයි; නිසිහි සිරිවතුදු සිහිනැතිව ඉපරළෙතුදු බඳහස්, බැඳ; (බන්ධාය-බඳහය-බඳහය්) ඉලිසා, සොයා; කුමුදුවා, කිම්දින්නන්දියෙහි කුමුදුවා; වැටැල්ලෙන්, පහන් එලියෙන්; (වැට + අලු=වැටැලු) වත් අතුරෙන් නනු වතුඅතරන්,යි මුයේ නම් මැනවි. (අන්භූඩම) වතුඅන්තරයන්; ඇල්වැයි, හිමවැයි; මනහදල මතු නොපත් සඳමි. කැමැත්ත සාර්ථක නොවූ කල්හිම; (මත්ථක-මත-මතු)

"පුප්ඵංපචිනිස්සාමීති සකල පුප්ඵාරාමෙ, මනංපෙසෙසි" මල් නෙලමියි මල්වත්තෙහි හැම තැනම හිතයවයි. තාක්, හැම තැනම; නොපිපීමෙයන්, මල් නොනෙලූ හෙයින්; රුස්නොකළ හෙයින් යනු අර්ථයි. (නොපචිත-නොපිපිය) ගස්තායෙන්, සියලු ගස් වෙත, නොහොත් ගස්සියල්ලෙන්.

## 35 විඩූ ඩහගාවත්.

---

චුතීන් මිතුමෙයහි, චුතියෙන් මත්තෙහි; සස්වන කිරිය, සත්‍ය ක්‍රියාව, මා විසින් මේ පුණ්‍යය කළ බව සැබෑ නම් ඒ හේතු වෙන් මා අදහස මුදුන්පත් වේවායි පැතීම සච්චකාරයයි. 1. ඇවිකම් නිපයන කිරිය, අභිමත කර්‍මයන් නිපදවන ක්‍රියාව; (අපික-ඇතිය-ඇවිය-ඇවි), අරජවිරියවෑයි, පටන්ගත් වීර්‍ය්‍ය ඇත්තෙක්ව; (ආරබ්ධ-අරජ) සම්මජ්ජන පරිභණ්ඩ කරණ ඈ, හැමදීම් ගොම පිරිබඩ ගෑම් ආදිය; මෙමවුනිඥ්, මෛවාත්-මෙවුනුත්; ඈසිනුඥ්, ආදියද; (ඉමිකාතිව-ඉමෙවුතිජ-ඉමෙවුතිජ්ජ-මෙවුනුජ්) (ආදීනිව-ඇසිතිජ-ඇසිතිජ්ජ-ඇසිනුජ්) එන්නීසී, එනතැනැත්තිය; යන්නීසී, යන තැනැත්තිය; එකොක් එකොක් පියවරැයි, එකි එකි පියවරෙක්හි; ධම්සඟුනෙහි, ධම්ම සඞ්ගනී ප්‍රකරණයෙහි; සිතුපා කණ්ඩයි, චිත්තුප්පාද කාණ්ඩයෙහි; කම්වැජැරි කුසල විතනු දදසයෙහි, කාමාවචර කුසල චිත්ත උද්දෙශයෙහි; පෙරෝ පනෑස්, පණහට අධික; සජන, සදන-අලංකාර කරන; ඔනපුවන් සැණ, පචට ඔියවූවන්ගේ නුවණ (ඔතත්තපිත-ඔතපිය-ඔතපුව-ඔතපු) සිසරිවින්, සවරූපයෙන්; දෙව් පිත්, දෙව් පුත් තෙමේ; දහසක් දෙවසරන් පිරිවරය්, දහසක් දිව්‍ය ස්ත්‍රීන් පිරිවරා; තිවත්නැන්, (තිබ්බත්ත) උපන් තැන්; බික්ඛියිසෑ ගමවිආ මහණුන්, පිණ්ඩපාතය නිමිතිකොට ගමටආ භික්ෂූන්;

පතිපූජිවෑ, ස්වාමියා පුදන්නියක්වෑ; "එවං අප්පායුකානං මනුස්සානං පමාදෙ නාමඅතිවිය අයුත්තො" මෙසේ ස්වල්ප ආයුෂ ඇති මනුෂ්‍යයන්ගේ ප්‍රමාදය වනාහි අතිශයින් අයුතුය. ඔවුන් නොනගවුරුසෙස්හැඟියන් උපජනසංවෙ, ධර්‍මයන් අතිස්ථිර සේ හැඟී යතැව්ට උපදනා සංවේගයයි. පුරුතු, ස්වල්ප; (පරිත්ත-පුරුතු) දිවිගලනේ සිතය්, ජීවිතය ගිළිහෙන්නේ යයි සිතා;

## 36 පතිපූජිකාවවත්.

---

1. ඇවිකම්.

**විනයසුතු**, හික්මවියයුතු; **සාඅන්**, බඩගිනි දනෙන සිත; (ශාත-සය-සර්-සා) **කොමුපිරුණු කබලුපුවක්**, කොමු පිරුණු කැවුමක්; (සං, කුල්මාෂ, පා, කුම්මාස, සිං, කොමු) යන ශබ්ද වලින් කියවෙනුයේ එකම අර්ථයෙකි. කොමු ශබ්දයෙන් යව ඊට ආදියෙන් කළ පිට්ටු විශේෂයක් වාච්‍ය වන්නේ යයි බොහෝ අය කියති. කබලු පූ ශබ්දයෙන් පැණියාරුම්-බිබික්කන්; විශේෂයක් අදහස් කරන ලදැයි හැඟේ. **නැරඑසුතුයෙන්**, පොල්කුඩුවලින්; **දපැඩිලි** පැඩිලි, හටගත් පණ්ඩර (සුදු) වර්ණය; (ජත-ජය-ජය්-ජා-ද) (පණ්ඩර-පඬර-පඬෙලි-පැඩිලි) පණ්ඩර ශබ්දයෙන් සුදු පාටත් මදක් රතට හුරු සුදු පාටත් දෙකම කියවෙන්නේය. **ජය**, හටගන්නේය; **පතුළු**, පැතිරී ගිය-ඉල්පී ගිය; (පත්රිත-පතරිත-පතිරිය-පතිළිය-පතුළුය-පතුළු) **මෙබවට** ගියෙසි, මෙබදු තත්ත්වයට පැමිණියේ නමුත්; **ගලන්නාක්හුමෙන්**, ගිලින්නාක්හු මෙන්; **ද්‍රව්‍ය**, ධනය; **විසිරුවැ**, වචනය රුවය කොට හෙවත් ශබ්ද කගා; (වචී-වසි-විසි) රාවෙත්වා (රාවිය-රුවිය-රුවැ) **එක්වෙ**, එක **විපිනක**; (විපි-වෙය-වෙය්-වේ) **වාස** ඇතියවුනම, වාසය ඇතිය වුන්ට-වාසය කරන්නවුන්ට යන අර්ථයි. **බෙහෙවෙක්හි**, බොහෝ දෙයෙක්හි; (බොහොව-බෙහෙව) **ඔවුන් විසින්**, ඔවුන් කාරණකොටගෙන-ඔවුන් ගෙන්; **තිට කිමෙක්ද**, තිට කවර ප්‍රයෝජනද; **කුමියනකම්**, කුමතැයි කියන කටයුත්තක්; **විනොදය** නොහු, හික්මවන්නහුද; **මුළුළු** සැඩොල්, නොකැඩුන සහල්; **සිදි**, දෙරට දමන පොල්ල; (සූචි-සිදි-හිදි) **ලෙහි**, හෘදයෙහි; (උර-ඔළ-ළ) **නිපොප්කොට**; සංසිඳුවා-නිවාකොට; **මසුරු කෙලෙස්**; **පරිසුරුනා** පැමිණිය නොදිය, මසුරුකම නැමැති කෙලෙසයාට නැග සිටින්නට ඉඩ නොදී යනු අර්ථයි.

**ජැල්කවුළු** දොරහි, ජාලකවාටවාරයෙහි; දලක මෙන් සිදුරු ඇතිවනයේ සාදන කවුළුව දැල්කවුළුව නම්. යාපවුවෙන් ගෙනා දැල් කවුළුවක් දළදා කොත්‍රනාගාරයෙහි තිබේ. මසුරු සිටාණන් ගේ ගෘහයෙහි ප්‍රධාන කවුළුව වන්නේ යොදන ලද්දේ දැල් කවුළුවක් බව මෙයින් පෙනේ. සිහාසක්ර යන නන්හි තිබෙන 'සිහ' ශබ්දය ප්‍රධානාර්ථයෙහි වැටෙන හෙයින් සිහාසක්රය නම් ප්‍රධාන ජනේලයයි ශාරීපුත්‍ර මාහිමියෝ කියති සාරත්ථ දීපනීයෙහි; **ඉලිය නුවන්නෙ**, සොයන්නවුන් ගේම; **සැක්මෙනුමෙහිජ්**, සක්මන් කරන්නෙහිද; **සිඳෙවි කණින්**, කැවුම හැන්දේ කොතින්; (දබ්බි-දබ්-දෙව්) **සාග කොණෙලහිජු**, යාගය නම් මහා දානයෙහි, **පුළෙල්ද**, ප්‍රකට වූයේද, හෙවත් බැබලුනේද; **පුළකොට**, ප්‍රකට කොට-පහළ කොට; (ප්‍රුට-පුළ) **සිමු හෙරණ ලවා**,

සිටු හායණීව ලවා 1. (සරණි–ගෙරණ) හිණුකිස්, තරප්පුවේ මස්ත; හම්මන පැලඳන්, බඩට ඉඹිලියගැකි පදම්–ඇතිවතතුරු; "යතතපෙයන අපෙක්ඛානතනකංඛාදී" යම් පමණකින් ප්‍රයො ජනද ඒපාක් කැයේය. පෙරවින් හළුවා, දිරියෙහි දමන ලද්ද; බැඹිල්, පබ්භාර–වෙයද; තුස්සි, විසිරවීය; (සමමුඛ–සමුඛ–හමුය–හමු) පොහොසලකිරුවා, ක්ලාන්ත නොකොට–හිත අසතුටු නොකොට; මිසුම්ැසි, මීමැසි; (මධු–මිසු) රස්ගෙරාන්. රස (මල් පැණි) මිශ්‍ර කෙරු; සුරුසාරුණෙන්, හැසිරෙන ලද කාරණයෙන්; (චරිත–සිරිය–සුරුය–සුරු) ගෙනැසි, ගෘහ කමීාන්ත නැති; අක්රික් දෙවන බඳු උවාම විසින්, මෙද තරමක් ගැටලු තැනෙකි. එබැවින් එය යෙදී තිබෙන තැන් කීපයක් පළමු කොට දක්වාලිම මැනවැයි සිතේ. 1. අකඛබහඤ්ජනම්වව, සකට යහපත් වන පිණිස අකුරක දෙන වදනක් මෙන්ද (වි. ම. ස. 1–73) 2. අකඛස්සබ්භඤ්ජනං යථා, අකුරක්හි දෙන වදන යම්සේද (වි. ම. ස. 1–95) යනු ධයින් දෙතැනෙකි. මේ අනුව සලකනවිට පෙනෙනුයේ අක්රික් යනුයෙන් රථයෙහි අක්ෂය හෙවත් අලවංගුව අදහස් කල බවය. එය (අකුරක–අක්රක–අක්රික–අක්රික්) යි සකස්විය හැකිය. දෙවන යනුව 'වදන' සී ශුඩවිය යුතුසේ පෙනේ. එය අබ්භඤ්ජන ශබ්දයෙන් ආවා වන්නට පුළුවන. (අබ්භඤ්ජන–අබ්ජන–අවජන–වජන–වදන) යනු ආසැවීය. එයින් අබ්භඤ්ජන (ගැම්) අර්ථය කියවෙන්නේය. කාරුණු මෙසේ හෙයින් රථාක්ෂයෙහි තෙල් ආලෙප කිරීම බඳු උපමා වශයෙන් යන අර්ථය එයින් ගතයුතු යයි සිතමු. අකුරට රිකිල්ල යයි ද ජාතක ගැටපදයෙහි අර්ථ කියා තිබේ. (ජා. ගැ. ජයතිලක සංස්කරණය හාඅදිවිසාල ජා. බලනු) අකුර යනු මහාරාෂ්ට්‍රයෙහි එන අබරි, ආබරි යන දෙශබ්දයෙන් එනකින් ආහැකිය.

වණ පිළිමසශනා, වණයක් සහවන හෙවත් වෙලන; (පටිච්ඡාදන–පිළිසසන–පිළිසෙයන) කෙසඇසි 2. අදඇතිකම්ඩන්, කෙස් ආදී අජ්ඣත්තික (සිය සිරුරෙහි පිහිටි) දේ නිමිති කොට ඇති කමීස්ථාන; සිඛවලද විහිසෙහි "අද ඇති බැහැරි" යන තැනත් අජ්ඣත්ත ශබ්දයෙන් ආ 'අදඇති' යනුව පෙනේ. (සං–අධි–ආත්මික; පාලි; අධි අත්තිත–අද ඇතිය–අද ඇති) සිරිමඳුනෙන්, පරිමාජිතය (මෙහෙහි කිරීම) කරන්නේ; (විකාර–විගර–වැකැර) එක්කරනක, එක්තරා එකෙක; දෙජන් කොරහු, දෙදන කොරහු වෙති. බ්‍යාණ්හු, බකලවුවාහු වෙත්; (වකු–වකර–වකල–

1. දෙරණ. 2. කද ඇණි.

බකල) වැහැජීයෝ, හටගත් ව්‍යාධි ඇත්තෝය. (ව්‍යාධි-වියදී-වැහැජී) ජී, හටගත්; (ජාත-ජය-ජය්-ජා) සිඳු බුණු, සිටු ශබ්දය කම්විබත් එක බස ගත්තැකි.

## 37. මසුරුසිටුපුවත්.

---

මනෙජා, තජිතය කෙරෙයි. බවසි, හයගත්වයි. මෙසේයින් ගහාද, මෙසේ ගනහොත්; "එක්හිතතියගෙහෙ මනුස්සානං පටිසුවජිත්වා සකාරාහට් තිඳුනා ආසන පැනවීහ" යනු කෙළෙටවා පාඨයි. එක්හිතතියගෙහෙ මනුස්සානං පටිපුවජිත්වා, ඉක්බිති (සමීප) ගෘහයන්හි මිනිසුන් අතින් විචාරා; සක්කාරා........ තිදුන්ට හිඳිනා අසුන් පැනවූහ. 'මනුස්සානං' යනු කාමීවාචියෙහි ෂෂ්ටියි, සිම්බයෙහි, සමාන වෙයි; පටිවිස්සක මනුස්සානං යනු එක්හිත්-තෙන් "වුත්තන [යෙන]" යනුවක් අධ්‍යාහාර කරනු; පටිවිස්සක මනුස්සානං යනුවට ඉක්බිති 'වුත්තනයෙන' යනුවක් අතින් දමනු එවිට වාක්‍යය 'පටිවිස්සකමනුස්සානං වුත්තනයෙන' යි වේ. සමීප ගෙවල මිනිසුන් කී පරිදි යනු අර්ථයි මුද්‍රිත ධම්මපදට්ඨ කථායෙහි "පතිවිස්සක මනුස්සානං ගෙහං අල්ලගොමයෙන උපලිම්පිත්වා ලාජපංචමානි පුප්ඵානි විකිරිත්වා සත්‍ථුනිසීදනත්ථාය මහාරහං ආසනං පඤ්ඤාපෙසුං" (අසල්වැසියෝ ඒ ගෙය ගොම හා ලද පස්මල් විසුරුවා බුදුන්ට හිඳිනු සඳහා උතුම් අස්නක් පැනවූහ) යි දක්නා ලැබේ. පස් පිහිටියෙන්, පංච පතිඨිතයෙන්-පංච ස්ථාන යක් බිම තැබීමෙන්; සක්කාරෙතුං නාසක්ඛි, ඉවසන්නට නොහැකි විය. සිත් ගැන්වියනොහෙ, සිත සතසා ගන්නට නොහොත් සතුටු වන්නට නොහැකි විය.

හැම්මිය, උසුලන්ට; අනුසැරූ, සිහිකොට; (අනුස්සරිත්වා-අනුසරිය-අනුසැරූ) පුළුවූ සිත, අන්අනක යොමුවූ (මුද්‍රාවූ) සිත; නොසමරූ, සිහි නොකොට-සිතා නොබලා; මැරැණු සිඳුනා බඳු කෙපුලින්, මර්මස්ථානයන් සිඳින්නාක් බඳු වචනයෙන්; යම් ස්ථානයෙක කුඩාවූ හෝ තුවාලාදියක්වූවිට මරණය සිදුවෙයිද ඒ ස්ථානයෝ මර්ම ස්ථානයෝ නම්හ. (මම්-මරම්) වක්ෂනෙරනට, උපාධ්‍යාය ස්ථවිරයන් වහන්සේලාට; උපාධ්‍යාය (උපජ-උප-උද-වද්-වත්) සෑහෙනයි, වෛත්‍යාඞ්ගනයෙහි-වෛත්‍යයාංගණ ඇද ලෙහි, පොහොවරූ, පොහොය ගෙහි; (පොසථාගාර-පොහොයාග වර-පොහොමවර) ගිනිහල්හි, අග්නි ශාලාවෙහි; තැම්බුදිය සඳහා වතුර උණු කිරීමද ශරීරය උණුසුම් ගැන්වීමද පිණිස ඇත්තා ශාලාව ප්‍රයෝජනවත්ය. කිසැනැ-[illegible]යම, කොබ්දු සවගාව ඇයත්,

හවු; රෑදෙවෝ, රෑ දවල් පෙනෙත; රෑදෙව ශබ්දය බහුවචන් ගත්තැයි රජරජ්. තැවත තැවත; (88 දීඝායු කුමරුවත් බලනු.) පසුව ඝොරඝොර' වූයේත් මේ නිපාතයමැයි. (රජ රජ-ජර-ජර-ජෙරජෙර-ඝොරඝොර) විචක්ෂෙහි, විදශීනඃයෙහි.

## 38. මාතික ආජීවකයාවත්.

වච්නාව්, උපස්ථානයට; අබ්‍රහ්මචරිය විරතිහා විකාල භොජන පියවින්මෙ ආයෙ, අබ්‍රහ්මචර්‍ය්‍යා විරතිය ද විකාල භොජන විරතියත් ප්‍රකෘතියෙන්ම ආ පරිදි; පියවින්මෙ, ප්‍රකෘතියෙන්ම-ස්වභාවයෙන්ම; සෙවුයේයි, දක්ෂවූයේ; (ජෙක-සෙවු-සෙව්-සේ-සෙ) ජනවත්, උපදවත්හොත්; සරණතන්ගම, හැසිරීම නම් යනු අර්ථයි. හදරම්භයි, ඉගෙනගනුම්හයි. උදෙස්ව, පාඨය කියනු මැනවි. ආජරාපුණ්‍යවා, ආචාර්‍ය්‍යයාට (පාඩම්) දෙයි; නිමයාවද, දෙයි යනු අර්ථයි. (නීයාදෙති-නියොදෙයි-නියාදෙ) පිහිනුත් වන්නා සයින්, පරිපූර්ණ වර්ණය හා සංස්ථාන හැඩහුරුකම; ගිරිතිල්, කටරොලු; මෙමනාව, මොනතාවට-මනාකොට; සුනමුවාසුදණඩද, ශ්‍රැතයෙන් උපන් ඥාණ නැමැති සුගන්ධය;

## 39. ජනපාණී උපාසකයාවත්.

සැරඅනුරුවිසින්, චරිතයට සුදුසු පරිදි; (චරිත-සරිය-සැරිය-සැර] අගිරති, කැමැත්ත; අනන්මන බුහුනන්සැමියෝ, අන්‍යොන්‍ය සහෝදරියන්ගේ ස්වාමිහුය. බුහුන ශබ්දයෙන් වැඩි විශයෙන් අක්කා කියවෙතත් මෙහි එයින් සාමාන්‍ය සොහොයුරිය කියවුණු බැව් පෙනේ. ඇලලිය, සොලවන්ට; මගනිම, මාගෝපකරණ; ජෙලෙන්, ජවයෙන්; සමන්වියක, ප්‍රකටවූ තැනැත්තියක; ඔවමස, තොල්; [ඔඨ-ඔට) මැලිවැල්වැලබඳු, කෙම්වැල්වල ගෙඩිබඳු; [ඵල-පල-පැල-වැල] සුවුණු, මනාවර්ණ ඇති; (සුවණ්ණ-සුවුණු) සොමෙයි, උස්මිටිකම් නැතිව සම්ව පිහිටියාහුය. සම්වන්ඇසින්, ස්‍යාමවර්ණාදියෙන්; තද නිල්පාට ස්‍යාමවර්ණයයි. කැලිය, කලුවූ තැනැත්තියගේ; හෙලලිය, හෙලලු [සුදුපාට) තැනැත්තියගේ; අවතුරාසියක්, අටක් අධික කොටදෑ ඇති සියයක්; [අඩ්ඨුත්තරසත-අටඋතුරාසිය-අවතුරාසිය] පාලව, ප්‍රභවව; කකිත්, කොහිත්; කාවත්හටපු, කිසිවෙකු හටත්; සමැජා, සමානජාති ඇති; (සමජාති-සමැජැයි-සමැජා] උදෙසන, කියන; අලසපයි, අලස ස්වභාව; මෙහි 'ජයි' යනුයෙන් ස්වභාව-ගතිය අදහස්කරනලදී.

නොජීවියයුතුවට, නොදිවියයුතු බවට; [යුතු + අට-යුතුවට] කසගලා, අමුඩුගසා; ණිගිස, ඉක්මනින්; [සණික-සණිය-ණිගිය] ලෙළහයෙන්, ලීලායෙන්; (ලීළහ-ලිළහ-ලෙළහ) නාති-විලම්බ ඉතා ශීඝ්‍ර නොවූ; 1. විකිණිබද්ධාමෝ, විකිණිය යුතු බඩු වත්තෙමු; සිවිගේ, දෝලාව; (සිවිකා-සිවික-සිවිය-සිවි) යාගඟ, ඇත් අස් ආදී වාහන; කැණතැනඇතියා, තුවට්ටුවක ස්ථානය ඇතිවෙයි; (කාකණික-කැයණිය-කැයණි-කැණි-කැණ) පෙමෙණි, පමණ; විදුරුතොළෙස, වජ්‍ර [පලිඟු] තුඩක් සේ, මුල්පතිබණින්, මූල්ප්‍රාර්ථනායෙන්; [සමන්විතා-සමන්විය-සමන්වි) වජාල, සංවිධානය කළහ; (මහාලතා-මහලිය-මහෙල-මෙහෙල] පස්ගුණෙණක, සවණිපසක්; පස්කළඳක් සවණියෙකි. එවිට තිකක් තම් රන් විසිපස්කළඳක්වෙයි.

සතරමස්වියලුවක්, සිව්මසක් කල්; සියහගෙහු, නිතර සොභණකරනලද; (සොභිත-සොහිය-ගෙහුය-ගෙහු] බත්-බජනඇසී, බත්පිසීම් ආදී; [පචන-බජන] පිළිවච්චියන්, වාත්‍රයෙන් කළ පහත්වැටී ගිසැගැන්වූයේසී ගිසෙහි පැලැත්-දූයේසී. ගැටවවුවෝ, ගාංචු; ගැටවවූ යනුව 'ගණ්ඨිවට්ටං' සී පාළියට පෙරලූ බව සමහර පොත්වලින් දක්ක හැකිය. එහි තිබෙන වටූ යනුත් බිජුවට, ලාවට යනාදී තන්හි එන වට යනුත් එකාර්ථයෙහි යෙදුනයේ පෙනේ. ගැටය ගුලියක හැඩහුරුකම ඇති හෙයින් ගැටවටූසී කිවාවියහැකිය. මලහූ, ඒ ගැටන් අමුණන මලය මෙසින් අදහස් කරන ලදී මලින් (පාසයෙන්) යුත් නූල් යනු අර්ථයි. උම්මංදයෙහි එන "ගැටහුපලඳනා" යනුව හා සසඳ බලනු. ගලවලූයෙහි, බෙල්ලේ ඉදිරිපැත්තෙහි තිබෙන වළවැනි තැන- (ආවාට-අවළ-වළ) දෙදත්, උරහිස්දෙක; (ජත්තු-ජතු-දත්) දෙකිළිඇළයෙහි, කටි (උකුල] යෙහි දෙපැත්තෙහි; "ගීවාචම්මණ්මයා පිළන්ධානිචම්මණ්මයානි" ග්‍රීවාවද මිණියෙන් කරනලදී පිල්ද මිණියෙන් කරනලද්දහු වෙත්; පිල්, මොනරාගේ පිහාටුවල ඇති පුල්ලි; (පිච්ඡ-පිදු-පිල-පිල්) පත්නළහු පිහාටුවල මැදින් තිබෙන කද හෙවත් නාරටි; තිගිරිජ්ලි, කොසෙය්‍ය වස්ත්‍ර; පටපණුවන් තම්බා ඔවුන්ගේ බඩෙහි තිබෙන කොෂයක ඇති නූල්වලින් වියන රෙදි විශෙෂයක් කෝසෙය්‍ය නමින් අදහස් කරනු ලැබේ. හෙළුයෙහි එන තිහිරි ශබ්දය වෙනුවට පාළියෙහි පෙනෙනුයේ කසර ශබ්දයයි. කැහැරි යනුත් පාඨාන්තරයි.

---

1, විකබඩුවමෝ

**පිරුණුවන්**, පිරුණු ශබ්දය කම්විබත් බුහුබස් ගත්තැනී; පිරුණාවූ යනු අර්ථයි. **පහසින්ගන්වන** දසුන්. ප්‍රසාධනය ගන් වන- ආභරණාදිය පළඳවන දසින්; වණ්ණදසී ශබ්දය වේශ්‍යා- ර්ථයෙහිත් යෙදේ. **ගොවුදෙයි**, ගවහලෙහි (ගොවජ-ගොවූජ] ගොවූද) **අනන්මන**, ඔවුනොවුන්; අඤ්ඤමඤ්ඤ-අඤ්ඤමඤ්ඤ- අන්නමන-අනන්මන) හබා, ප්‍රමාණයි 'අලං' නිපාතය තෘප්තාර්ථ යෙහි මෙන්ම සමර්ථාර්ථයෙහිත් වැටෙන්නේය. හබා යන්නෙන් මූලදී කියවුනේ ඒ සමර්ථාර්ථයයි. පසුව එය තෘප්තාර්ථයෙහිත් වැටෙන්නට පටන්ගත්තේය. (සමත්ථ-සම්ත-සමය-හබය-හබය්- හබා) **සෙණිහු** යනු පෙරරූ ගැන්මෙන් සෙණිහී, සි විය ණිඹගේ, ලේලියගේ; (සුණිසා-ණිහිහ-ණිහ-ණිය) (පොථෙනා- පොතෙය-පොයෙය-පොයය-පොයය්) **ඔම්බරා**, මෙහි තරව්; (මෙහි-මේ) **බැවැ**, බවයි (බවයි-බැවැයි-බැවැ) හැසැවගියාකොටැ, සංස්කෘතවගියාකොටැ - ගැවසීගියාකොට; | (සංසත්ත - සසත- හැසැත-හැසැය-හැසැ) **හිකුත්**, හිලූ (සික්ඛිත-සිකිත-හිකිත- හිකුත-හිකුත්) ආසන්න-අසන-අසන්, **අජෙලු**, අවෙලක) නිර්වස්ත්‍ර; [අවෙලක-අජෙලක-අජෙලුය-අජෙලු) (සුඩ-සුදු-හුදු) **විළිබිඳින්** ලජ්ජාවාසක හයින්; (හීරු-බිරු) හුස්, නැන්ද; (සස්සු- සසු-සුසු-හුසු-හුස්) මුද්‍රිත ධම්මපදට්ඨකථාහි සස්සු ශබ්දය වෙනුවට 'සසුර' ශබ්දය පෙනේ. තැනට ගැලපෙනුයේත් එයමැයි.

**ගරුහාකොට**, නින්දකොට (ගරහා-ගරුහා) **මහසාළුවණ**, මහකාලසාණිණියක්; **හුදුකිරිබත්**, ශුඩ (අමිශ්‍ර) කිරියෙන් පිසුබත්; **පසස්ව**, පසකට-අන්දෙසකට වඩිනු මැනව යනු අර්ථයි. (පසත්ව- පසස්ව) **සොයවු**, වරද නිවරද විචාරා ශුඩකරවූ; (සොධෙථ- සොයහු-සොයවු) **ඉලියව**, සොයවු-පරීක්ෂාකරවූ; **"අසුචිඛාද නොකිවදති"** අශුචි කන්නෙනැයි කියයි. **අනතුරෙහි**, ඉක්බිති යෙහි; 'ආහ' යනු 'නික්ඛාඩාථ' යන්නට පසුව යෙදිය යුතුය යනු අර්ථයි. **වලවාවිජායාපශන**, අශ්වධෙනුව වැදූවාය යන; **පිරුණත්**, තාවකාලිකවගත්; **ඔබාෂ්**., වලදවා, **අසල්**, අවල- සපිර; **පිළිපජනාවි**, පිළිපදින්නාවි; **තිහි**, පිටත; (බහි-බිහි) **යොජනි වූ**; යොදුන්වූ; (යොජන-යොජනී) **"දිනනදනසසළලං"** **දුන්දනයාගේ** ඵලය; **උපපාමෙනො**, උදුරා; **උබබත්නෙනො**, **පෙරලා**; **පරිවවජනො**, පරිත්‍යාගකොට-බැහැරකොට; **විනිවවත්**, **කවත්වන** කල්හි; **නිගමන් කාන කහනයි ශෙෂී මෙමම**, නිගමන්, **ශෙෂී** කතකනක,යි සේයි, **තරන ලද** අනතය (අවසානය) යන

1. **ණියන්ගේ**

අර්ථය වේමය; නිසදහසින්, නය (ක්‍රම) දහසින්; (සාණි-සණි-සිණි-සෙණු) සාධනරාසාණ, කඩතුරාතොණ; කඩ (වස්ත්‍ර) යෙන් කළ අතුරුව කඩතුරාව නම්; පාදිවු හඬතුසේ, පිරිපය අනගානුසේ; (සංබාහනක-සඹනු-හඹනු) "සංවෙනනං අජ්ජජානාසි" ඒ කෙත අද දනිම්, හිනයවචස්, හිනපිණීස; (පච්චය-පචය පසුය-පසු-පස්) විලම්දෙපි, හළුදෙර ඇතියක්; වශ්‍ර යනු වර-විවෘත කිරීමෙහි ධාතු යෙන් නිපන් අතීත කෘදන්තයි. පහන්ශර, ප්‍රසන්නගතිය; (ප්‍රසන්නාකාර-පහනකර-පහනයර-පහන්යර) සලලහුසං පසාධනං, සැහැල්ලු ආභරණය; මිමුනුබුරු, මහමූනුබුරා-මූනුබුරාගේ මූණුබුරා, (මහ-මිකි-මී) මූණුබුරු යනුව තවමත් අවිනශ්විත ශබ්දයෙකි. එය දෙමළ මරුමහන් ශබ්දයෙන් එනැයි සැලැකිය හැක්වුවද අර්ථ පක්ෂයෙන් ඒ දෙශබ්දය නොසැ සැඳිය හැකිය. දෙමළ මරුමහන් ශබ්දය නප්තෘ අර්ථයෙහි නොව ජාමාතෘ (බෑණා) අර්ථයෙහි වැටෙන හෙයිනි. මූනුපුරු ශබ්දයෙහි 'පුරු" යනුව දෙමළ "පිරු" ශබ්දයෙන් ආගැකිය. ශබ්ද නිෂ්පත්තිය කෙසේ වෙතත් මූණුබුරු (ශි. ලි. මනුමරක) ශබ්දය ප්‍රධාන වශයෙන් මූණුබුරු අර්ථයෙහිත් අප්‍රධාන වශයෙන් ගොත්‍රාර්ථයෙහිත් පවත්නා බැව් පෙනේ. වා, වශ්‍රී; (වශ්‍රී-වස්ස-වස-වහ-වා) උළුවහිණි, (උක්කුටිකච්චැටුනේය උක්කුටික-උකුටික-උකුටිය-උකුටු-උලුළු) සාහම, ලවනු දෙමළ රීතියි (මුහුර්ත්තම්-මුලුත්තම්) යනු නිදසුනි.

ගැටමොසාමබැඳ, ගැටියක්-පොදියක් කොට බැඳ, අටුවාහි (භණ්ඩිකං) යි පෙනේ. එය වඩාත් සාර්ථකයයි සිතමි. නොසිසාළු සිහිනොකළාය; කළු, යනු කරධාතුයෙන් නිපන් අතීත කෘදන්තය (කාරිතා-කරිත-කළිය-කළය-කළු) කුළුයනුත් පාඨයි. සගවා, නැන්පත්කර තබයි; (සංගොපයති-සගොවයි-සගවයි-සගවා) ඇලමෙයශි, පැත්තක-අංසකොක්හි; (නිසොණි-නිසෙණි-නිහෙණි-හෙණි-හිණි) මස්රණෙන්, මස්වසුප්නයෙන්; (කටීපාද-කලවය-කලවේ) අය යනුවම ඒ වනු සිංහල රීතියි. උපසරැණි; සමීපයෙහි; "භණනොත ආමඩං" අතින් සපශීකරන ලද්ද; ලසැල්; (ලයව-නල්) පිරිය; (අනිවත්තන-අනිවතන-අනිවතූන-අනිවතුන්) "නසානුභාවෙන නං දිවසමෙව ආගමජ්ජනති" ඒ මූගලන් තෙරුන්ගේ ආනුභාවයෙන් එදවසෙහිම එත්; අණ්ගිණ්, (මිපුරු සිටුනුවත් බලනු) පසසැණීමඩලෙහි, ප්‍රාසාදයාගේ කණිණිකා මණ්ඩලයෙහි හෙවත් ශෘංගයෙහි; වැතිකිළි, වැණිකිළි,යි සිපියේ නම් මැනවි. එය "පාසාදකූට" යන පාළිවචනය වෙනුවට යොදන ලදී. සඩම්රතනාවලියෙහි "කොත" යයිද පූජාවලියෙහි "සැටකළයක් පැත්ගන්නා සතරත්මයවූ ।මහදිය කළ සැටක්'

යසිද දක්නා ලැබේ. පූජාවලිමතය නොපිළිගත හැකිය. විසුද්ධිමග්ග යෙහි එන "සට්ඨි ඵණමත්ත අනුයාපෙත්වා තුලාසඞ්ඝාටං අනාරොපෙත්වා ආකාසෙ කූට ගොපානසියො ඨපෙතුං නසක්කා" යන වාක්‍යයෙහි පෙනෙන "කූට" ශබ්දයට කැණි මඩලයි අර්ථ දක්වන ලදී. මේ කාරණය මෙසේවුවද මෙහිලා කූට ශබ්දයෙන්; ක්ෂයවෙනුයේ කැණිමඩල මුදුනෙහි; තබන විශාල කලයක් වැනි කොතකි. දැනුත් එබඳු කොත් තිබේ. වැණිකිළි ශබ්දයෙහි "වැණි" යනුව කණණිකා ශබ්දයෙන් ආ හැකිය. (කණණිකා-කැණිය-කැණි-වැණි) කිළි ශබ්දය කූටශබ්දය ප්‍රභව කොට ඇත්තේය. (කූට-කුළි-කිළි) මේ ග්‍රන්ථයෙහිම මෙණ්ඩක සෙට්ඨිවත්ථුයෙහි වැණි කබල් (කපාල) යනුද ජෝතිය සිටුහුගේ වත්ථුයෙහි වැණියෙහි (ථූපිකාය) යනුද මේ සම්බන්ධයෙන් සලකා බැලියයුතු දෙතැනකි. ඝනකොටමෙ, ඝනකොට තලනලද යනු අර්ථයි. (ඝනකොට්ටිම-ඝනකොට්ම-ඝනකොටමෙ) සණනීව සකල, පිළිවෙළකල-සකස්කල; රන්කසුකම්, සවණ්ණබව්තකම්; (බව්ත-කසිය-කසුය-කසු) මහමුවාකි, මිහිඳුහිමියන් විසින් ගෙනෙනලද - මෙහිදී තවතවත් දේ එකතුව වඩිනයවු, මහා විහාරිකයන්ගේ අටුවායෙහි; පියගැට, පඩිපෙළ; පාසෙදනි, පයසෝදන තැනයි එය දෙණියක හැඩහුරුකම්, ඇතිව කරවන හෙයින් ඒ නම ව්‍යවහාර වූවා වියහැකියි. ධොවන ශබ්දයෙන් ආවා වන්නවත් පුළුවන.

"සොපාණංච පාදධොවනංච සොපාණපාදධොවනානි, තෙසං අනන්තරං සොපාන පාදධොවනානන්තරං" පඩිපෙළ සහ පාසෝදන තැන සෝපාන පාදධොවන නම්ද ඒ දෙකේ අතර සොපාන පාදධොවනානන්තර නම්ද වෙයි. පාපිස්නී, පාපිස්නාව; "ඉත්ථිසඞ්ඛාතො අත්තභාවො ඉත්ථත්තභාවො" ස්ත්‍රීයයි කියන ලද ආත්මභාවය ස්ත්‍රී ආත්මභාවය නම්. ඉත්ථත්තභාවෙඨිතාය එවරූපො පරිච්චාගො නාම නත්ථි" ස්ත්‍රී ආත්මභාවයෙහි සිටි අන්කෙනෙකුගේ මෙවැනි පරිත්‍යාගයක් නම් නැත්තේය. "මිච්ඡා දිට්ඨිකකුලෙගෙහෙවසමානාය" මිසදිටුහුගේ ගෙහි වසන තියකගේ; 'සුධාමත්තිකාච සුධාමත්තිකං, තස්සලෙපනං එතිස්සාති සුධාමත්තික ලෙපනං" හුණුද මැටිද සුධාමත්තික නම්ද ඒ හුණුමැටි පිළිබඳ ලෙපනය මෝහට නුයි සුධාමත්තික ලෙපන නම්ද වෙයි.

නිම්සෙයි, අවසන්වූයේයයි, "සුධාමත්තික ලෙපනං විහාර ද්වානං දස්සාමි" සුණුමැටියෙන් අලෙව්කළ විහාරදනයක් දෙන් නෙම්ද, අනන්තරෙත්, ඉක්බිත්තෙන් - පසුව; කාද දස්සාමීති

සඞ්ඛපසා ඉඳුනිමයානං පූරිතො" තවද දෙන්නෙම්දැයි කල්පනා වෙක්වීද (එය) දුන් මාවිසින් සම්පූර්ණ කරනලදි. මිසවුළු, මසින් සම්පාදිත ව්‍යඤ්ජන; "උපසිඤ්චනකි එතෙනානි උපසෙචනං මංසං උපසෙචනං එතිස්සාති මංසූපසෙචනං" මෙසින් මිශ්‍රක රෙන්නුයි උපසෙචනනම්ද, මසින් උයනලද ව්‍යඤ්ජනය මේ සලාක බතට නුයි මංසූපසෙචන නම්ද වෙයි. කොබු, බොම නම් ගස් විශේෂයක පට්ටාවලින් වියන රෙදි, වැහැරි, වල්කලා සිවුරැ; (වාකචීර-වැයහිරි-වැහිරි-වැහැරි) අනුව, (මිගාරමාතු පාසාදය) අනුව; පිරිවැමෙන්නී, කැරුකෙන්නී; බත්පිත්ඉතිරිය, බඩ-පිත්තය අධිකවීද; බඩපිත්තය අබඩපිත්ත යයි පිත්තය දෙ වැදෑරුම්. එයින් බඩපිත්තය අධිකවූ කල්හි පිත්තුම්මත්තක නම් වන්නේය. උමැතිවුවහෝ, උමතුහෝවිද, මෙහි 'වුව' යනු සමහරුන්ගේ මතයෙහි නම් බුහුබස්ය. එහෙත් එය 'වූ' යන අතීත කෘදන්තය පලමුවිබත් එකබසට වරනැගුන තැන යයි අපි කියමු. වර, කැමැතිදෙය; රූළ්හි, ප්‍රසිද්ධ; පරියාපන්න ඇතුලත්;

## 40. විසාඛා උපාසිකාවත්.

හර, අරටුව; මුත්පරිස, මුක්ත පරිත්‍යාග; මුක්තචාග යනුත් මේ අර්ථයෙහිම යෙදේ. දුන්දේ ගැන ආශාවෙන් නැවතත් එහිලා සෙවීම් බැලීම් ආදිය නොකිරීම මුක්ත ත්‍යාග ගුණයයි. (පරිච්චාග-පරිචග-පරිචය-පරිසය්-පරිස] අරසනුවම, ඉල්ලීමට සංවිභාගී, ලත්දෙයින් අනුන්ට බෙදාදීමෙහි; සෙලඅහලකුදු, අහල් එකහමාරකුදු; අහල් බාගයකැයිද කියත්.

## 41. අනඳමහතෙරුන් පැණ පුළුවුත්වත.

නොකඩකොට, ගෙවල් අතනොහැර; පිඩුවයි, පිණ්ඩපාතය; (පිණ්ඩපාත-පිඩවය-පිඩුවය්) තුජ්පමණ, තමාගේ ප්‍රමාණය; (තුළු-තුජ්) පිළිබෙව, ප්‍රතික්ෂෙපය; ඉක්මෙනුවම, බැහැරකිරීමට; හැඹිමී සිඹිනාහව, උසුලා සිටීමව; පුලු, පැසුණු; (පුලුක-පුලුං-පුලු) පෙරවිනතුව, ඉදිරියට නැමී; තත්වා, රෙදි වියන්තා; තුන්නවාය-තුනවය-තනවය-තන්වය්-තන්වා) ඛණමතුයෙකින්, ක්‍ෂණමාත්‍රයකින්; (වෙල්ලඛතා-වඩය-වනය් වසා) ලැසිගත්තු, ප්‍රමාදවූහ; තනතනුයේ, කෙදිරිගානුයේ; ඕ දුක්‍ෂහා, අහෝ දුකබයෙකි,-බෙදයෙකි; සුදුබත්, පිසනලද සෝ අම්බු බත්; (සෙදිත-සෙදිය-සිදිය-සුදුය-සුදු) පිණි, ප්‍රණීත; (පණීත-පිණිය-පිණිය්-පිණි) ඉතිරි තෙජ ඇතිහෝයි, අධික තෙජස්

සිවඛකයි කියනලදී. නොපාව, පාජනය පැදීම) නොකරවී, (නො පදුව, නොපසුව, නොපාව) ශ, මේ, (අයං, අය ය) වැමොළ, රවුන් (වට්ටාකාර, වැමොළ) මුවළුව ලොවුන්බික්, මුහුණබලා-යාළනමට දෙන භික්ෂාව, (උපලෝකන, උවලොවුන, උවලොවුන්) පිළිසඵර, සතුටු සාමීචි කථාව, ඩබරාව, ධමකරකය, වතුර පෙරනු සඳහා සකස්කළ-පතුලේ සිදුරක් ඇති-මුව වසා බැඳි රෙදි කඩක් ඇති භාජනය, වතුර පෙරෙන විට 'ධම ධම' යන අනුකාරණය ඇතිවන හෙයින් ඒනම යෙදුණේය. (ධම්කරක, ඩමරක, ඩබරං, ඩබරය් ඩබරා) හෙළවිට, සුදු, උපසංහාර, සමාප්තකිරීම, මුහුත්තස්ස අතික්කන්තස්ස අනන්තරං, මෙහොතක් ඉක්ම ගියාට පසු, පිළිගෙළ කොට, සකස්කොට, (පටිවත්ත, පිළියත, පිළියල, පිළියෙළ) පිසලී භාවය, තෙල් ගුලාව ඩබරාව සෙරෙප්පු පසුම්බිය යන මේවා බැඳ තිබුන රෙදි පොට්ටනිය, හෙරිවෙවසි, පිතව හිම්කාරයෙක් හෙවත් සමාන කොංචස් කාරයෙක් වේවයි, පැහැපෙණ කූජ්, හැළිය කුත්, මුට්ටියකුත්, වදමල පාගෙණ, ශබ්දයෙන් හෝ හානක ශබ්ද යෙන් ආහැකිය. (හානක, බැහැන, පැහැන) වැරී, නුවරට යන එනම්ං ඇහුරුයේය. (පිතුජ්, පිතිජ්) (පවුජ්, පවිජ්) දෙද ඇල්මන් ඇලුම්දෙක, සජ්ජනති සතාලගණනහි එතෙන සංසාරෙති සඩහා-ප්‍රසාදංපාපං, මේ කාරණකොට සත්වයෝ සසරෙහි ඇලෙන්නුයි සඩසනම්. මින්පවු දෙකයි. ඉක්තෙජු, බැහැර කෝ ළේද; බාහන, විනාසය, බාගිත, බහානබන ලද-සම්පූර්ණයෙන්ම බැහැර කළ, යෙම්, කියම්.

### 79. ඛදිරවනිය රෙවත තෙරුන්වහන්.

ජිණ්ණු, ජිණ්වූ, ගිහිණියක් යනු ගිහිණියක්යි විය යුතුයි, ගණිකාවක් යනු අර්ථයි. (ගණිකා, ගිණික, ගිණිය) විරා විරාගය, නො ඇලීම, (විරාග, විරහ, විරා) ඉලියනුවන්, සොයන්නන් විසින්, නො අයිරමණ, නො ඇලෙන, බහස්, ආලෝකය, බහාසදෙසනා තමන් වහන්සේ ගඳකිළියෙහිම වෙසෙමින් දහම් දෙසිය යුත්තා වෙත ආලොක පතුරුවමින් දෙසන දෙසනාව මුනිඳුගේ වට හන බැවින්, මනොද්වාරයෙහි අවබෝධ කරන හෙයින්, තිලමැයි යන තත්හි තිල ශබ්දයෙන් නිලවර්ණය හොව ග්‍රාමාථයෙහි යෙදුනා තිල ශබ්දය දෙමළෙහිත් ප්‍රසිඩය.

### 80. අසැඳෑහර ඉච්ඡාවත්ථු.

---

සත්වන අරහන්ත වග අටුවා සන්‍ය නිමි.

විනිවිද සිටු පිහු, නාවැදී හොස් තිබුන දුබුරුපාටි, තඹදළී, රැවුල, (දාඨිකා, දාළිකා, දාළි) උත්තරෑ සම්නකුජ්ජ, උතුම් සම්මානය කුත්, (සම්මාන, සමන) ලම්බකුජ්ජ, ලාගතකුත්, (ලම්බ x අක්‍-ලම්බක්) වාළිජ තනතුරු, අලුතෝජු සහතුර, උචත්ති, උපදී, උමජති, උච්ජති, උවත්ති) වලඤ්ජ, ඕරිත, දම්දෙසුන් අනුගියා, ධර්මදෙශනා වට අනුගතවූවක්, කියන බණ හැඟියා නොයහනයි සූජ්සි කියන බණ අවබොධ කට ගත්තට නොහැකිවූවක් යනු අර්ථයි. (නොයහනු x යැයි-නොයහනැයි) මූළ්, මෝඩ, (මූඪ, මූළ) අනුලෝමිකඤාණ, හෙතුඵල ධර්මයන් විෂයෙහි පවත්නා නුවණ, ආර්ය මාර්ග ඥානයට අනුකූලවූ භූත ක්ෂාන්තිය යනු විසුද්ධිමාර්ග සන්නයි. (කා. 7–233) හිය දිවනුව්, හිත (යහපත) දක්වන්නක්වූවා, (දීපක දිවනු) හියදිවන්නෙන් හිය නොදිවන පදහා සොදින් වූ නම ලමුණෙම්, හිත (යහපත) දක්වන පදය යහපත නොදක්වන පදය හා සෙදුනේ නම් ලාම්ක වෙයි, සෙහනුවූ සිඩකරන්නාවූ,

## 81. තම්බදාඨිකගාථාවන්.

---

වැජැයි, වැද, ප්‍රවිෂ්ටව, (පජ්ජිත්වා, පැජැය, වැජැය, වැජැය) "කාය සඞ්ඝාතෙන දණ්ඩකෙ" තාණටායයි කියන ලද දඬු, සහමුන්, සමහාවනා, දඬුපලම්, දඬුපංක්තියම, පස පෙළි, දරිය–පරිහරණය කෞශල්‍යය යනු පරිහරි. යන්නෙහි අර්ථයවේ. පසපෙළි යනු යෙනුත් ඒ අර්ථය කියවේදැයි සෙවිය යුතුය. මෙයද අපට අවිෂය තැනෙකි. කෙනැවෙර වැඩිවියයි සේසි. ගෙන, ශරීරයෙහි ගොදන ලද්දේය. යනු අර්ථයි. පොරණිගි ඇතියහ ෟදවිශයෙන්, පුරාණ හිතාර්පි යහපත් ෟදවිෂයක් යන අර්ථය ගතහැකිසේපෙනේ. (හිතාපි හියැති හිඇති) ආසන්නතා සාධර්ම්‍යයෙන් ආසන්නතා සංඛ්‍යාත සාධර්ම්‍යය හෙතුකොට ගෙන, එකුණො කත සමණධම්මා, එක්වූ කරන ලද ශ්‍රමණ ධර්මය ඇති, එකසන දනිඳුරන්මහසෑ, එකක්ඛ (නොවි සුරැණු) ධාතු තිධ ්කල සවණ්මහා සැය. තීඳු යන පදය තිවැරැදි නම් තිදහය (තිධ්තකල) යන අර්ථය එයින් ලැබේ. ඝිණු, ඉතිගෙ, සැපසෙබාට, වළඳත්නට යොග්‍යකොට, නාලිය බුලත් මැල, විශෙෂන, ව්‍යායාමයෙන්, වකය, ගා (මකෙට්ඨා, මකය, චකය, වකය) මෙළෙව්, ඉක්මන්, (දෙමළ විශරෙවු) සහවු, සවනාව සොපු සැදෙහි, ඇස් වට සකියෙහි නවාහි, තාමවතාගී, නපිමෙව් හසී දරථ, තාගේ ප්‍රීතිවෙනය හා ශරීර පීඩාව, පිළිපසද, සංසිදීම (පටිප්පස්සද්ධි, පිළිපසදී පිළිපසද) අනනාරකරං පවිඨමහ පිණ්ඩාය පිඩුසිගීව පිණ්ඩ ගමට ආවෙමු. කිකසියියවස් අතුරු සරවන්

බැවින්, පිඬුසිඟීම පිණිස ඇතුළු ගමට පත් බැවින් යනු අර්ථයි "භික්ඛා සිඟියෑ අතුරු කරවස් වත් බැවින්" යනුත් පාඨයි (භික්ඛිතුං, භික්ඛ, සිඟිය) කබලකරු අහරු, ඔජෝෂටමක රූපය ගෙන දෙන සියලු ආහාර වර්ග, නොලබ විරිනොවෙයි. පෙර නොලබන ලද් දේ නොවෙයි, අවශ්‍ය බැණ නොසිදුවන, ආවශ්‍ය (අවශ්‍යයෙන් ම වියයුතු) ධර්මය සිදුනොවන්නේය, උමෙහි, උපෙක්ෂාවෙහි දරඑ, පිබා, "අන්තරා විථියා ඨිතකොව ධම්මං දෙසෙසි" වීථිය මැදසිට ගෙතම දහම් දෙසූයේක, බණෂජන් කරුණෙකි, ධර්ම යාවන හෙතු යෙන්, රූමතුයෙහි, රූපමාත්‍රයක් වන්නෙහිය. සිංවිසන් විසඳ ණින් ගණනලද් රූමතුව, ප්‍රකෘති මකබු විසඳහණයෙන් ගන්නා ලද රූපමාත්‍රයක්වූයෙහිය. (ගණිගත, ගණත) දූසුජු, ජනිතමන් නේද වෙයි. අස්වන්, ආශ්‍රවයන්-ක්ලේශයන්, (බෙපොච්චා, කෙවය ගෙවය, ගෙවය්, ගෙවාය්) බිප අශිසැසැ ඇතිශවුන් සොඳරකි, වහා ධර්මාවබෝධය කලවුන් අතුරෙහි, දහස් පෙමෙණිණ සිදු, දහසක් පමණ ගාථාද, නොගෙරෙ, සාරනොවෙයි, සෙරෙයි, සාරවෙයි.

## 82. දරුසිරි මහ තෙරුන්වත්.

"සොළසවස්සානි උද්දෙසො සොළසවස්සුද්දෙසො" සො ළොස්වසකැයිකීම සොළසවස්සුද්දෙසනම්. සොළසවස්සුද්දෙසො එතිස්සා අත්ථිති සොළස වස්සුද්දෙසිකා. සොළස වස්සුද්දෙසය මැයට ඇත්තේතුයි සොළසවස්සුද්දෙසිකා නම්. දක්නාට නිසිවි, දක්නට යොග්‍යවූවා, කරාම, සමීපාර්ථවාචක කාර ශබ්දය සපදක් විබත් ගත් තැනි. වෙතට යනු අර්ථයි, දෙමහා, දෙන, (දූත, දෙශ දෙතො) මතිගාමයෙන් කසයෙන්, කුවරි, කවර, පක්, පිසන ලද, කිරිහඹින්, කිරිකෑඳින්, සිදුහතු, අබ, විලජ, වීජපාරි, (වීහිලාජං, විහිලජ, වීලජ, වීලජ,) සුන්වර, කැඹිගිය තවය ශොවත් ගලව ගොඩවන තැන, කෙසුරනුප්, බාහුමූලයෙහි පලඳින වලලුද, වෙර එම්ණ්, සුදුමැණික්, (වෙඩුයර්, වෙඩුරු, වෙරුළු, වෙරළු) දෙරළුම්ණි සජන ලදුවන්යනුවෙ එම්ණින් සජන ලදුවන්සී වියයුතුය, දූසවිශ ද, දෘෂියක් කොටද දූසවිය යනු දූසවී ශබ්දය නාමවිබත් ගත්තැනි. අමුත් දුවූවනට, අමුතුවෙත් දුටුවන්ට, (ආගන්තුක, අවුතු, අමුතු, අමුත්) පිපිකැසයෙන්, පිපිමූසයෙන්, නොකික්කිය, නොකික්මුනු තැනැත්තිය, පුරිස්, ඵරුෂ, නොඉලියා, නොසොයා, හදන් කරනු වට, ලකුණුකිරීම පිණිස (සංජාත, සජන, සජත, සදන, සදන්) සිම්වකි, සීමාවෙහි, නොකිය දෙවන පෙදෙන් යුතුවා, ගීත දීප නය නොකරන පදයෙන්යුත් (ගාථා), ශ්ලෝකි, ඒ අනුෂ්ටුප්ඡන්දසංඛ්‍ය ගාථාව ලාමක වෙයි. ධම්මපියන්, ධර්ම නොමස්, වරජ, මරද වෙයි. පෙළි, පාළියයි.

## 83. කුණ්ඩලකෙසි තෙරණිවත්.

ලඟිය, අනර්ථය, (අහිත, අහිය)ජනුවයි, දන්නහුයයි, හෙවුම්, සැනපීම, පුහිසකම්, එරුෂ ක්‍රියා, තුමේ, තමා, ජනනා, දිනන, පට වනලද, සංවර කරන ලද-සංසිඳුවනලද, කාවිසිහසර, කායවාක් සඤ්ඤාරය, පිළිපද, උපපද,

## 84 අනපථ පුවජන බ්‍රාහ්මණයා වත්

විහජ්මෙන්, වියදම් කිරීමෙන්; හැවූ ඇතුන් ඇති එකක්හු, වඩනාලද ආත්මය ඇති එකෙකුට; (භාවිත-හැවිය-හැවුය-හැවූ) 'තංතො සා එව පූජනා සෙයො' ලෞකික මහජනයාම දන්දීමට වඩා භාවිතාත්ම ඇත්තහුට කරනලද ඒ පූජාවම උතුමය, මෙහි මහතෙරහු, "බඹලොවට පිළිවුවා කියව හගවගෙ බමණහටය" යූහු, මෙහිදී මහ (සැරියුත්) ස්ථවිරයන් වහන්සේ "භාග්‍යවතුන් වහන්ස මේ බමුණාට බඹලොවට යන ප්‍රතිපත්තිය කියනසේක්වා' යි කීහ; බුදුහු, ලොවී මහජනහට.........මහනයූහු, මෙහි බුදුහු යන කර්තෘ යුහු යන ක්‍රියාවහා සම්බන්ධවෙයි. වරා, වඩා; භාවිතානක යනු භාවිත තැනක්හට යි කියයුතුය. ඉතිවත්, මෙසේ වනකල්හි; අයජිය, ආයාවිතය-යාඥාකරන ලද කාරණය; (ආයාවිත-අයජිය) තුමන්සිත් මකක්; තමන් වහන්සේ සිතුමකක්; නොඉති, එසේ නොවේ; කියූ බැවින්, කියූ බැවිනි; කියෙතියත්, කෙසේදැයි කිය තොත්; අත්නිජු, ආත්මයත්ද; බැහැවූ, භාවිතවූ - වඩනාලද; (භාවිත-බැහැවිය-බැහැවුය-බැහැවූ) බමණහට අනුරූමග පිළි-වුවා, බමුණු බවට (රහත් බවට) හේතු අනුරූපවූ මාර්ග ප්‍රතිපදාම; තෙරුන් බමණ හෙයින් නොබලා යජි බැවින් තෙරුන් වහන්සේ බ්‍රාහ්මණයකු සේ නොබලා යාඥාකල හෙයින්; එපිණහෙයි අනුරූ මග පිළිවුවාමෙ කියූහවෙති, එයහැර හෙතුවට අනුරූපවූ මාර්ග ප්‍රතිපදාවම කියන ලද්දේද යයි. (හෙතු-හෙතු-හෙයි)

## 85 මයිල් බමණවත්

86 බැණ බමණවත්හි කියයුත්තෙක් නොපෙනේ. අවුතු-මහට; ආගන්තුකයාහට; (ආගන්තුක-අවුතුව) සුතුකල, සකස් කල; භාජනලොක, මුල තිබුන බජුන් ලොව යනු බලනු, අංශුමෙශා පවාරණයෙන්, ආශ්‍රය අංශ්‍රිත දෙදෙනා ශනාවෙනස්ව ගැනීමෙන්;

"පුඤ්ඤං අපෙක්ඛන්ති ආසංසන්ති පුඤ්ඤපෙඛො" පින බලාපොරොත්තුවේනුයි පුඤ්ඤපෙඛ නම්. අමුතුදනිජ්, අමුතුදනුත්; (දනුජ්-දනිජ්) ඈනී, ඈත්තේයයි හජහය්, අදහා. (සද්දහිත්වා-හද හය-හජහය-හජහය්.)

## 87 සහායක බ්‍රාහ්මණයාවත

(තිස්සාය, තිසය, තිසය්) තවුසිරිම්. තාපසෙහි හැසිරීම්; පලගැනුම් කොළඹ හරවනුවව්, තාපසෙහි එලගැනුම වෙ ගුදොටව ගෙනානු පිණිස; බඩුදී බඩුගැනීම මෙහි "වික්කිණය" නමින් අදහස් කරනලදී. කෙදළුහැව්ත්‍රි, ගෘහ කටයුතු ආරම්භ කොෂල්‍යය. (ගෙදර-ගෙදඬ-ගෙදළු) (සංභාදි-හැවිලි) පුවහගොස ප්‍රවාහයට ගොස්-චූලදී සිටිය තැන හැර අන්තැනෙක වාසයට ගොස්; ඈන්රැය්, අනතරාය; (අනතරාය-ඈතරැය - ඈන්රැය්,) පිළිබඳහනුවව, වැළැක්වීමට; මහණගොමාවැදම්සුරු හා තෙවෙන් පිදීගෙනුබම්, ශ්‍රමණ ගෞතමයන් වැද මාගේ චරිතයෙන් හා තපසින් පිරිහීමට බිය වෙමි; (ගොතම-ගොතම, ගොම-ගොමා) සවසඳුණ. සර්වඥනය; (සබ්බඤ්ඤු-සවසඳුණ) උව, උපාය; (උපාය-උවය-උව) නිම, කුලිය; (නියම-නිම;) සේවාගැල, සේවය පිණිස වූ කුලිය; (හති-බැල) අලුප්, සවල්ප; (අල්ප-අලුප්) සඳඉක්ත බැවින්, සන්ධ්‍යා (කාලය) ඉක්මුණු බැවින්, කිපමණ, කොපමණ; (කති-කිති-කිව්-කී-කි) ඉතිරි; අධික, "අභිවාදනං සසසිලං" වැදීම යමෙකුගේ සීලයවේද; රජරජ, නැවත නැවත (38 මාතික ආජීවකයාවත් බලනු) වදන කිසයෙහි, වැඳීම් කෘත්‍යයෙහි; (යෙදූනහු-යෙදූනවු) "අභිවාදනනාවා නිච්චං පූජගනාස" වැදීමෙන් හෝ නිතර පූජනය කරන්නාහට; ජීවිතහන අතුරුහාක් ජීවිතය විනාශකරන අන්තරායක්; (අතුරුවක්-අතුරුහක්-අතුරු හාක්) ඈයව, ආදියට; පිළිපසුද්කළු, විළක්වනලද; හිමෙහි, සීමා යෙහි; පරිමිතවැපැවති ඈසින් වඩා, පරිමිතව (සීමිතව) පැවැති ආයුෂයෙන් වැඩිය;

## 88 දීඝායුකුමරුවත්

උදෙස් පිරිවුසැ ඈසිහි, උද්දේස පරිපුච්ඡා ආදීයෙහි, පාලිය කියවා ගැනීම උද්දෙස නමුත් අර්ථය (අටුවාව) ඉගෙනීම පරිපුච්ඡා නමුත් වෙයි අනිස් ලකුණු ඈසි බැවීමෙහි, අනිත්‍ය ලක්ෂණ ආදී භාවනා කිරීමෙහි. අරඤ්ඤවාසො සමණධම්මස්ස කාරණානා

ජාතිදෙසනාවා අරඤ්ඤායතනං" මහණ ධම්යට කරුණු වූ හෙයින් හෝ එයට උත්පත්ති ප්‍රදෙශයවන බැවින් හෝ අරණ්‍යයම අරණ්‍යායතනය නම්. (පබ්බජ්ජා-පැවැජ්) (පරිපුණ්ණ-පිරිපුණ් -පිරිහුන්) සාවිවස්නාමඟ, විදර්ශනා සහිත මාර්ගයයි; (සාවිවජ්ජනා -සාවිස්නා) සදූපාණ් හර, වගා ප්‍රාණය දුරුකරන; සිටිසේයි, සිටි තැනැත්තේ, ධහස්, බාධාවක්; වදුරා, විධානය කොට; වදුර යනු විචාර ධාතුයෙන් ආයේය. වසාවත, වසට එළඹුනු යනු අර්ථයි. (වස + අවත=වසාවත)(ආපන්න-අවත) වැලිමඩ, වැලි සංඛ්‍යාත මඩෙහි; වාලිකාය සංඛ්‍යාතෙපුළිනෙ" වැලි සංඛ්‍යාත පුලින යෙහි; කොමු, කුම්මාස නම් පිට්ටු විශෙෂය; තුම්සි, තමා විසින්; මෙහි අන්ත "සි" කාරය සෙවිය යුත්තකි. වසක්, නොවසක්; (වස්සග්ග-වසග-වසග්-වසක්) මුලදී වසග් ශබ්දයෙන් වස් ගණ-තින් වැඩිමහළු පිළිවෙල අදහස්කළ නමුත් පසු කාලයේදී එයින් සාමාන්‍යය කොටසද කියතලදී. "සබ්බසො විරියංකාඩ්වා" සර්ව-ප්‍රකාරයෙන් වීර්‍ය්‍යකොට; දෙව්යහට; දෙවතාවාට; (දෙවතා-දෙවත -දෙවය-දෙව්ය) ගිණිසැජින්, ගිනිගානා උපකරණයෙන්; (අරණි අරිණි-රිණි) සැජ යනුව කුමකින් ආයේ දැයි නොකිය ගැකිය. 59 වන පිටේ එන නගුල් සැජ යනුත් සිතිය යුතුය කරුණු අනුව සලකනවිට (සාධ්‍ය) ශබ්දයෙන් ආයේ යයි සිතේ. (සාධ්‍ය-සැජය -සැජ) බුමුණාම, (68 වන පිට බලනු.) හෙරණ්ගුනස්න මුලි-බියේ, සාමණෙරයන්ගේ නැසීම මුල්කොට ඇති බිය; (මූලික-මූලිය-මූලි) [1]පවිඋනා පස පසවැහයේ, නැවත වනා නැවත නැවත ඔසොවා හෙලන් ඇද, යනු මෙහි අර්ථයේ පෙනෙනත් "පවිඋන" යනුව අපට අර්ශදය මැදනැමී බුන්මුවාත්හි මධ්‍යය නැමී බිඳුන මුවාතෙහි; ශකුළුමත්, හැකිළිම් බවට පැමිණි; හැකුළුණු; වන් යනු ආපන්න ශබ්දයෙනි; හුණුක්ළිලක්, උණගෙඩි බඩයක්; උදුන් මුයෙහි, කෝවයෙහි; උත්‍රස්, නැතිගැනීම; අයිරා, (අතිරෙක) අධික; අසැරු, ඇසුරුකළ; (ආශ්‍රිත-අසැරුය-අසැරු) "ආචරිත" ශබ්දයෙනුත් ආහැකිය. (නැතියහුහට-නැතියවුහට) ගුණු, ඝිණ, (ඝිණ-කිණු-ගුණු) යථතතු පීසින්, තත්වූ පරිද්දෙන්, පිළිදහසුනුජ්, වසත්‍ර සහ වසත්‍ර වාටින්; (දහස් × උන්-දහසුන්) (දසා-දසස-දහස්) මුද්‍රිත ධම්මපදට්ඨ කථාහි එන "නිවත්ථදසා" (හඳින ලද වසත්‍ර) යන පාඨය වඩාත් මැනවැයි සිතේ. කියනුමෙ, කිමෙක්ම වෙයි. ජීවයා, ජීවත්වන්නේ නමුදු; ඛිණි උවසර අවුන් සමාධි, ඛණික උපචාරය සහ අප්පණා සමාධිය (ඛණික-ඛිණිය-ඛිණි) අප්පණා-අපුණ-අවුණ-අවුන්)

---

1 පවිඋත

## 89 සංකිච්ච සාමණෙරයන්වත්

සැපිරුණ් නො සැපිරුණැයි, සම්පූර්ණවූයේ ද නොවූයේද යි ඝඩින්මෙ, වනයෙහිම; දෙමළ භාෂා ශබ්දයෙකි. පරිබණතු කථාකරන කල්හි; සිපිසාකොච්, සිපියකු කොට, අපරොපා, ආරොපණය කොට; මාපියන්, මව්පියන්;

## 90 අධිමුත්තක සාමණෙරයන් වත්

වොලොගෙනැ, පැහැර ගෙන; (විලොප-විලොවු-වොලොව්-වොලෝ) බැඩිගන්, පොදි; (භණ්ඩිකා-බැඩිය-බැඩි) මුළුන්, මුළු ශබ්දය කම්මීබත් බුහුබස් ගත් තැනි. (පුටක-පුළු-මුළු) ලැගි-කල්හි, නැගිටි කල්හි; (ලංඝිත- ලැගිය-ලැගි) තෙරුන් යනු කිහ යන ක්‍රියාවෙහි කර්තෘවේ ප්‍රථමාර්ථයෙහි කම්මීබත් යෙදෙනු හෙළ බසෙහි සිරිති. මහණුවම්හ, ශ්‍රමණයෝ වම්හ;

## 91 ඛාණුකොණ්ඩඤ්ඤ තෙරුන් වත්

උකැමැ, කලකිරී; (උක්කණ්ඨිතා-උකැටිය-උකැටැ) කුළෙක්හි, කඳුයෙක්හි; ගරව්ලෙකැයි, ගැරඩියෙකැයි; මෙහි පෙනෙන 'විල' යනුව ව්‍යාල ශබ්දයෙන් ආයේය. කරවැලා යනුව හා සමකර බලනු. නැව්සෙක්, හිස රැවුල් බාන්නෙක්; පුරාණයෙහි මොවුන්ගේ රක්‍ෂාව මිනිසුන් නැවීමය. නිය කැපීම, හිස රැවුල් කැපීම, නාසයෙහි ලොම් ඉවත්කිරීම, කන්ශුද්ධකිරීම යනාදීයත් එයටම අයත් අප්‍රධාන කාර්‍ය්‍යයෝ වූහ. නාමය ඇතිවූයේ නැවීම මුල්කරගෙන මවී. ශලනැල්, බෙල්ලෙහි තිබෙන සිදුර සහිත බටයක් වැනි අවයවය; (නාලි-නැලි-නැල්) කඳර, ග්‍රීවාව; (කන්ධරා-කදර) සැත් ඇරනම් ආයුධය ගන්නට, වැජවනුවට, ප්‍රවෙශකිරීමට; කෙම, කුඩා ගල් පොකුණ; "ආදිතොලපනං අල්ලාපො" මුලින් කථාකිරීම අල්ලාප නම් සමන්තතො ලපනං සල්ලාපො. හාත් ප සින් කථාකිරීම (නැවත නැවතත් කථාකිරීම) සල්ලාප නම්. (අල්ලාප-අලප-අලප්) ගුළුවැරැ, බැහැර කළ, වියසී, (ගළිත-ගුළු) වැරැපැ-කාරනුවන, වියසිය ප්‍රකාශ කොට ක්‍රියා කරන්නහුගේ; ලක්ඛණ උපනිජ්ඣාන, අනිත්‍යාදී ලක්‍ෂණ අනුව බැලීමෙන් ලබන ධ්‍යානය; ආරම්මණ උපනිජ්ඣාන, පඨවි කසිණාදී අරමුණු අනුව බැලීමෙන් ලබන ධ්‍යානය, නිපයනු (නිපදනු) යෙහි, සැදව්මෙහි;

## 92 සපපදාස මිහතෙරුන් වත

"සොළස වස්සානි උද්දෙසිතබ්බ කාලෙ" සොළොස් වස් ඇත්තියකැයි කියයුතු කාලයෙහි; වමහවක්හුහයි, උපස්ථායකුහා; (උවටහව්ක්හු–වටහවන්හු) කෙළෙළනා, කෙළ් එනාගෙන මෙහි උවා' යනුත් සෙවිය යුතුය. තුසයෙන්, කුඩුවලින්; තුස ශබ්දය ප්‍රධාන වශයෙන් දහයියා කියනත් මෙහිලා එයින් වීකුඩු ගතයුතුය. කළදසුන්, වතුර ගෙනෙන දසියන්; පරන, වී පැහැරීම; කැමැජිවාහු, කම්ජ මාතයෝ, (කම්මජ–කැමැජි) සුළුහු, වලන යවූන; එහුසුයෙන්, ඇවිස්සුන හෙයින්–සිරිය ස්ථානයෙන් චලන–යවූහෙයින්; (තිදස–තියග–තියං) "විජ්ජුලලතාහි ආදිත්තාංචිය" අහස විදුලිය වලින් බැබලුනක් මෙන්ද විය; දියබර හෙතුයෙන්, ජලධාරා පතිතවීන හෙයින්; (ආකාශ–අවස–අවස්) "භස්සිතාය වාසියා ජීඡිතුං ආරභි" අතේ තිබූන පිහියෙන් කපන්නට ආරම්භ කෙළේය. පඩු පහල පත්වන්, පාණ්ඩුවර්ණය පහලවූ කොළවැනි; ජාවනින්මෙ, උපන් විධියෙන්ම; මෙහි වණ ශබ්දය සණ්ඨාන වාචකයේ. ළිහිණිමෙ, නිර්වස්ත්‍රවූම; වැතිරෙන ලදුවහව්, මඩනා ලද්දහුව; "මහා පඨවියං පංසු පරිමාණ කිලෙසෙ" මහපොළො–වෙහි පස් පමණ කෙලෙසුන්; ගුළුලජ්ජු හසර, බැහැරවූ ලජ්ජා නැමැති ආචාරය; (සංචාර–හසර) වියගළුන්, වයස් කාලයන්; (කළුත්–ගළුත්) ආකරන්–ආකාරයෙන්; (ආකාර–ආයාර–අයර–ආර) උදවිය, ඇතිවීම සහ නැතිවීම; රූකඳහි අවිජ්ජා තණ්හා කම්ම ආහාර සමුදයෙන් උදය දස්සන සතර, අවිජ්ජා.........යන සිව්දෙනාගේ සමුදයෙන් (ඇතිවීමෙන්) සිඩවූ රූපසකන්ධයාගේ පහළවීම පිළිබඳ දශීන චතුෂ්කයකි; නිබ්බත්තිලක්ඛණ දස්සන විසින් උදය දස්සන පසෙක් වේ. රූපසකන්ධයාගේ උත්පත්ති ලක්ෂණ වර්තමානාකාරයාගේ දර්ශනයක් සමග (සියල්ල) උදය දර්ශන පසක් වේ. මේ භවයෙහි රූපසකන්ධයාගේ පහළවීම වනාහි, පෙර භවයෙහි සිඩවූ අවිද්‍යාවද, එසේම පූර්ගවීන තෘෂ්ණාවද, ඒ අවිද්‍යා තෘෂ්ණා දෙක ඇසුරු කළ කර්මයද, රූපයාගේ පැවැත්මට හේතුවූ කැඳබත් ආදී ආහාරද, යන මේ සිව්දෙනා නිසා සිදුවන්–නේය. රූපසකන්ධය මෙලොවදී ගන්නා අභිනවාකාරය නිබ්බත්ති ලක්ඛණ නම්.

## 93. පටාචාර තෙරින්වත

වලඳන පින් ගුණයෙන්, අනුභව කරන පින් ක්ෂයවූ හෙයින්; කලක්, ක්ලාන්ත; ධනජුණ්කුලක්හු, පිරිහුණු ධනය ඇති කුලයක්හුගේ. ජුණ් යනු අබ්‍රංගදි 'ජුණ්ණ' ශබ්ද–යෙන්හෝ පාළියෙහි 'පාරිජුණ්ණ' යනාදී තන්හි පෙනෙන ජුණ්ණ

ශබ්දයෙන් යෝ ආහැකිය. සඟවය්, හැන්පත් කොට තබා; හඟනා, ඇදගෙන යන; දියසිලක්, දියපහරක්, ස්‍රොතයක්; සමාවෑ, තෘෂ්ණායෙන් මත්වූයෙක්වෑ; ලගු, ඇලුනා, (ලග්ගිත-ලගිය-ලගුය -ලගු) පොසොහාවරු, පොසොහාය ගෙහි, (පොසථාගාර-පොසොහාය-වර, පොසොහාවර) වැව්ජලනස්න සෙය්හය්, ප්‍රදීප ගින්න නැසෙන සේද, අඟ ලවැව් ජල උපජනසේ, නැමිත ප්‍රදීප ගින්න උපදන සේ ද, මේ අයල ශබ්දය සැලකිය යුතුය. 1අයල පහණින් (කාව් සිළුමිණ 74) 2අයලින් වදනා සොරුණ් නැතිවන බැවින් (අමා-වතුර මහානාම 214) 3අයල් සිවුරු නමින් උපන්නෙයිදු (සිඛවලඳ විනිස -34) අයල උවම (සියබස් ලකර 2-90) එයා අයාලෙගිය (සාමාන්‍ය ව්‍යවහාරයෙහි) යනු අයළ (ල) ශබ්දය යෙදුන තැන් කිපයෙකි. මේ සියල්ල ගොනුකොට සලකනවිට අයල ශබ්දයෙන් අමුනු-නැවත යන අර්ථයන් ගතහැකිසේ පෙනේ. තවත් සෙවිය යුතුය ජෙනේද, ජීවත්වන්නේ ද,

## 94 කිසාගොතමියා වත්

ශෙසෙජලෙයි, ශෙෂ කායකීයෙහි, (ධුර, ජල) උපනිස, උපනිශ්‍රය -උපකාරය, තුළෙන් මේ පිශෙවින්, තමාගේම ශක්තියෙන්, වහල්-කහස්, උපකාරසිතා, (උපකාර-උවහර-වහර-වහල-වහල්) ඇවිජිනි, එල්බෙන්නී, විදුවි, අවබොධ කරනු කැමැති, මතු, පමණක් (මපාහ මතු)

## 95 බහුපුත්තිකා තෙරින් වත්

අටවන සහස්සවගැ අටුවා සන්‍ය නිමි.

පොරොනේ, (පොරොන × ඒ) පොරොනාව, (පාරුපන-පෙරොවන-පොරොන) (සවර්ණ-සවුණු-සවුණ්-සවුන්) ගොහුකල්හි, ශොභණය කල කල්හි, (සොභිත-සොභිය-ශොභුය-ගොහු) (සද්ද-සද-සඩ-නඩ) සුමුහැනිරිවින්, සමුඨාන (හටගත්තා) රූපයෙන්, (සමුඨාන-සුමුටුහැනි) පරමින්, ස්පර්ශ කෙරෙමින් පැතිරෙමින්, දුනු දුනු වට, දුන් දුන් වස්ත්‍ර සංඛ්‍යාවට, ගෙනැකියක්, මෙහි පෙනෙන ගෙනෑ යනුව ගැනීම් අර්ථයෙහි යෙදෙන පූර්ව ක්‍රියායෙකි. මිස, (මුද) යනාදියෙහි මෙන් 'ගෙනැ' යනුයෙහිත් ග්‍රහණාර්ථ දැන් යටපත් වී තිබේ. ඇතොරජ්ජවත් හි, ඇතුළු රජගෙයි, වළඳනා ලබනුවට, පාවිච්චිකිරීමට, රුස්වාගත්, රජු සතුටුකොට ගත් සියුක් සියුක් සැපිරෙනතාක්, වතුකක වතුක්කයක් සම්පූර්ණවන-

තාක්, හතරක් එක්වූ කල්හි එයට චතුක්කයයි කියත්. සියුක් යනු එයින් ආශය ය. බැවින්, බැගින්, ලෙහනුශ, ලබන්නේ ය ලැෂි, අලස, (ආලස්‍ය-ඇලැසි-ලැසි) මට ය, ලිස්සා යන,

### 96 චූලක භාණක බමුණවත්

සැකෑෂි, සහකාරයෙකි, රී ඇලීම, (රති-රිති-රි) සංඝාදිසෙස ඇවැත, දඬුවම් ලැබීමේදී මූල මැද අග (විත මානත අබ්භානය) යන තුන් තන්හිදීම මහා සඞ්ඝයා උවමනාකරන වරද, විස්තර ප්‍රාතිමොක්ෂයෙන් දතහැකිය.

### 97 සෙය්‍යසක තෙරුන්වත්

ලජ්, වීදපාරි, (ලාජා-ලජ්) හැල්කරලුන්, ඇල්වීකරල්, 'තිණ කාරාලං, යනාදී තන්හි සෑරලිවාචක කරාල ශබ්දය පාලියෙහි ප්‍රසිද්ධය. සිංහල කැරැලි ශබ්දය කරාලයි පාළි කොළේදැයි සෙවිය යුතුය කණිණිකා ශබ්දය කැරළියි මෙහෙළුවට ආහැකිය. පස්-වනක් යන තන්හි වන ශබ්දය ජාතිවාචක වේ. ධම්ම, ධර්මය, ම්ශරින්, තියරින්, පුවසනුවවස්, ප්‍රකාශකරනු පිණිස, පිරුණෙයින් යනු හරිතෙන යන තෘතියාව බලාගෙන කී අර්ථ වේ. පිරුණු යනු අර්ථයි. රන්මෙලෙකින් සවර්ණ භාජනයකින්, මෙලා ශබ්ද-යෙන් සාමාන්‍යයෙන් භාජනත් විශෙෂයෙන් මූඩියත් කියවෙන බැව් පෙනේ. රූපසක් කරන අයිකුණ සෙඩින්මෙ, රූපය දකින අභිඥාන (හඳුන්වන සලකුණ) සේම, පූර්වභවයෙහි, පූර්වභව යෙහි (කාමාවචර-කම්වැජැරි-කාමලොකයෙහි හැසිරෙන) කසල කඩුවන්, කසළ ඉවත් හරන භාජනයක්, කස්ල යනු කවම්ර ශබ්ද යෙන් ආශය. (ජඞ්ඝ-චඞ්ක-ඝඞ්ක-සඩු) කොසිසිදුරු, සතුරු සිදුරු, මාෂංකරි, මං, මා, මාකරි, නිත්‍ය කටයුත්තකු නොකරමි ෂා මං අනාගතෙ විහතවිජනිං ශෂහවා නිසිහෙනහි ධම්ම කපි කාශි මහා කාසසපසස ථෙරසස කිර එකාහදව බිතා ආගන්ත්වා වනන පවිචනතාං ඝාඩා පානීයං පරිභොජනියං උපට්ඨා ඥපසිනි වනනාඩ ආකං කපි" යනු ඒ පිළිබඳ සම්පූර්ණ පාලිපාඨය වේ. (මා; අනාගතයෙහි විසිතුරු පවන් අතු රැගෙන හිද බණ කියන්නවුන් ලවා, එක් දෙව්දුවක් මහ කසුබ් මහතෙරුන්ට වත් පිළිවෙත් කොට පානීය (බොන) පරිභොජනීය පැන් එලවා තැබියයි කියයුත්තෙකු නොකරව මාතෘධතිඨ, පටිකකම, (මෙහි නොසිටුම්. යව) මහමෙයි සිව, මෙහි නොසිටුව, පිළිත්ංම, ඉක්මයව,

### 98 ලජ් දෙව්දුවත්

පාවරුබන්, උදේකන බත, (පාතවාර – පයවරු – පාවරු) "පාතකා අසිතබ්බෙබා පාතරාසො" උදේ කැයුත්ත පාතරාසයයි ඝඩාභාශෙක උපජීවිතුං සිඃංජනසංඥන වොහාරූපජීවිනො"

වේලඳමෙන් ජීවත්වීම සවභාවය යම් ඇත්තන්ට ද ඔවුහු වෛදෙහ රූපජීවිහු නම් වෙත්, ණකොම, ණයකොට, (ඉණ–ණ) හෝ සබ් බුනුයෙයි, සංඉවුර කිදුත හෙයින්, ඉරි පිතියන් ශිලාලිපියෙහිත් මේ අර්ථයෙහි යෙදූ 'ගොංයකඩ' ශබ්දය දක්නා ලැබේ. තුසඹු, දමයයා මිශ්‍ර කිවුඩුනාලේ බත්, (තුසඹුහු–තුසඹු–තුසඹු) කාංඩි, ඇඹුල් කැද–කාඩි හොද්දයයි ද කියත්. තුබුනගුල් ඇතිකොට කවයුත්තක් (සිඝැමක්) නැතිහෙයින් තීකත් තිබුත නගුල් ඇති කොට, දකිණීයට, දක්ෂිණාවට, (දක්ඛිණා–දකිණි) 'දක්ඛිණං අර–හතීති දක්ඛිණෙය්‍යා' දක්ෂිණාවට සුදුසුවෙත්නුයි දක්ඛිණෙය්‍ය නම් වෙත් රූළුයයි. රූසා (කටුක) යයි. උදමහයාගේ පුලි–යම් කුලම් ලිපියෙහි 'රොළ්'යි පෙනේ. අඩිවාං, අධිපතිව, වජන නික්මෙන සඳැජ්, ඇතුළුවන සහ නික්මෙන කල්හිද, ඉස්නාලද්, එපුරැවත ලද, (සිඤ්චිත–සිසිත–හිසිත–ඉසිත–ඉස්නා) කනුබොනු වහය් ගදන මතුවකුජ්, කැමිබීම සහ වසත්‍රි මාත්‍රයකුත්, 'බහුදන–තො' බොහෝ කොට දන්දීමෙන්, නොමොය නෙම්, නොහැකි වෙමි,–උත්සාහ නොකරන්නෙමි, "න උස්සාහාමීති, න සක්කොමි" යනු විනය අටුවා පාඨයි. නැහැහුම්, සැහෙවෙන තැනක් – රක්ෂා ස්ථානයක්, අසිඹිහුත් නැමියන්හු, පොලී සහණය අයකිරීමෙහි නියුක්ත මූලාදෑනියක්හු, රජුන්ගේ සහ ප්‍රභූන්ගේ ඉඩකඩම් පාලනයෙහි නියුක්තයාත් ආයුක්තයා නම්. ආයකම්මික (භාණ්ඩාගාරික) යා ආයුත්තකයා නොවේ. කගා, ගෙනවුත්, අදුබල් දෙවියුම් අඹබාල දෙවතාවං වෙමි, ගතිඋපධි කාලපයොග විපත්ති, ගති–විපත්ති (උපදින තැනේනපුර) උපධිවිපත්ති, අවලක්ෂණවීමේ විපත, කාලවිපත්ති, නුසුදුසු කාලයෙහි ඉපදීම් සංඛ්‍යාත විපත්තිය, පයොග විපත්ති, උපාය පිළිබඳ විපත, නොවිපයිද, විපාක නොදේද.

### 99 අනේ පිඬු මහසිටාණන් වත්

නොසගවන, තැන්පත්කර නොතබන, 'න විතතං අපිනං පිතතං අඡි, සිතක් පිතක් යන සිංහල ද්වින දෙක පාළියට පෙර සූ ලෙසත් මෙහින් පෙනේ. යොයනු.

### 100 අසඤ්ඤත පරික්ඛාර මහණුවත්

ඝොෂොභානුග, ඝෝෂා කරන්නේය, (ඝොස) ධාතුයෙන් නිපන් වර්තමාන කෘදන්තයි. ඔවුනාව, වැක්කිරීමට, කනකට, කොනකට, සිරිය, (ජුරිකා) කුඩා කඩුව, බොහෝමද දුනුවන්, හුඟක් දුන් නැනැත්තන් හා සවල්පයක් දුන් නැනැත්තන් අමජරාසශහෙනඩා' අසුරින් ගෙන, කොගිලා, කොංගිදී,.

## 101 බිළාල සිටුහුවත්

වදළේ, සංවිධානය කෙළේය, වදර (විචාර) ධාතුයෙන් සිඩය, නාවමාගම්නෑ, එදිනට නොයව, තවමනම්සවයි, එද නොගවයි මෙසින් ගියෙසින්, මෙයිත් ඔබ්බට යැමෙන්, උනු, අඬු, වසත්නි උගහටයි, වසතත් දුෂ්කර නොවේ යයි, ම අසිදිගැවියෝ, මා පැහැර ගනු කැමැත්තෝය, මි අයත් මා අයත් දෙය, වරාගිවිගනු, වලකාගෙන සිටියාහුය, සංඝ, පිරිවර,

## 102 මහා ධනවාණිජයාවත්

මළු, මල, ගැල් දරාඬෙහි, රියෙහි ඉදිරි පාශ්වයෙහි, දරාඬ ශබ්දය නොයෙක් දෙනා නොයෙක් අයුරින් තෝරතත් එහි අර්ථය තවමත් අප්‍රකටව පවත්නේය. "නා ඉල්වූ පලමුවන වරය ලොක ශාසන නැමැති මහා ශාලිකෙෂත්‍රයෙහි දරහඬබඳනාසේය" (පූජා-වලී රත්නසාර 575) යන පාඨය මේ කාරණය තේරුම් ගැනීමට තරමක් උපකාර වේ. දෙවදත්තයා ඉල්වූ, සියලු භික්ෂූහු ආරණ්‍යක වෙත්වා යන ප්‍රථම වරය ලෝසසුන් නැමැති මහ ඇල්කෙතෙහි දරහඬ බැඳීමක් සමානයයි මෙයින් කියනලදී. මේ දරහඬ බැඳීම නම් කෙතට ඇතුළුවන ද්වාරය ඇවිරීම වෙයි. මේ අනුව සිතනවිට කුඹුරට ඇතුළුවන කෙදර මුඛය (කුඹුරු දොරකඩ) කුඹුරු දරාඬ යයි සිතාගත හැකිය. (ධුරබණ්ඩ-දරහඬ-දරාඬ) යනු නිෂ්පත්ති ක්‍රමයසේත් සිතමිහ. වත්ථාභරණ ජාතං, වස්ත්‍ර සහ ආභරණ සමූහය; මරුවියෑ, මාගේ කැමැත්තෙන්; 'රුවියෑ'යි සප්තමී විබත් ගත්තේ කුමක් හෙයින්දැයි සොයනු. සණ්ඨිත්, (ස × ණ්ඨිත්) ලේලී වරුන් සමග; ගැටවූ යනු හැටවූ'යි වියයුතුය. අටවනලද; (සණ්ඨපිත-හැටවිය-හැටවූය-හැටවූ) බහාගන්නාවි, පහන හෙළත්නව, ඔහ වෙලයිත්, ඔහ ඉල ඇටවලින්; අඩසපි, දමාගසන උල්විලෙම යක්-අඹියෂ්ටිය; වණ අනුවදන්නම, වණ (ව්‍රණ) යම පිම්සෙත්-නට; රක්, රත්යරියෙල්; (රකබ-රක-රක්) ඇතුළු බද්හු. ඇතුල බැන්දහුය;

## 103 කුක්කුට මිත්තස්ස වත්ථු

කළුවණෙක්, කාලකණ්නියෙක්, (කාලකණ්ණී-කළුමණි, කළු මණ) පිළිඑනුයේයි, නැවත එන තැනැත්තේ, සුළුපත් ජෙලෙන්, හුළුපත් ගිත්තෙන්, (ජාලා-ජල-ජලෙත්-ජෙලෙන්) වෙඩින් අනු

වනනභාවැ, වේදනාව අනුව පවත්නෙක්වැ, ගලපුවා, ගිළිහෙන බව, උවදුරුමුනිය හෝයි, (මාගේ ශීලය) උවදුරින් මිදුනේදේ හෝයි, නොමැසියහට (නො-ඇමැසියහට) අමිශ්‍රී (නොඉවසීම) නැතියෙකුට,

### 104 සූනඛ ලුද්දකසාමිකු

(මණිකාර-මිණිකිරු-මිණිහිරු-මිණිරු) මිහින්තලා ලිපියෙහි 'මිණිර්' ශබ්දය පෙනේ, පැරණි මිණිහිරි ශබ්දය 'මණිසූරියො' සි රසවාහිනී කාරයෝ පාළිකළහ. බුදුහු, පොෂණය කළහ. (වුවුහු-බුවුහු) ජීවත් කළහ යනු අර්ථයි. වට (වට්ට) පැවැතීමෙහි ධාතුමෙන් සිඩයි. ගහය්, මැණික්කපනගලේ අතුල්ලා, පෙළි, කුඹය, (පිටක-පෙළිය-පෙළි) සිව්වන මිහිදුගේ සිලාලිපිවල පෙල් කියාද පැරණි මහාපාලි දනශාලාව ළඟ තිබෙන ගල් ඔරු ලිපියේ පෙළා කියාද දක්නා ලැබේ පිරිවැටි, මිරිකී, වෙණනත්, වේදනා-යෙන්, (වෙදන-වෙයි වෙ=තනත් විබත් වීය) උඩුකෙලිවැ, උඩුපැල් ලීයෙන්, සියකින් යනු සියතින්, සි වීයයුතුයි. (පිණ්ඩපාද-පිඩවිය-පිඩවය් පිඩවා) ගී, ගතිය,

### 105 මණිකාර කුලූපගතිස්ස තෙරුන්වත්

කාජ්, ඛජ්ජක නම් කැවිලි, සූප, සූප; මෙය දැන් තිබෙන සුප් හොද්ද නොවේ. දුරු මිරිස් ආදිය යොදා උදු පරිප්පු මුං ආදියෙන් සාදා කැබලි කළ කෑමවගීයකි. එසින් ආහාර රුචිය ඇතිවීමත් බඩේ දෙෂ පහවීමත් සිදුවන්නේය. දුම් ගැන්නිය බජනෝසින්, තෙම්පරාදු කරන්නියගේ භාජනයෙන්, කළුවන් ලභා, කාලකණ්ණියා තෝරන සලාකය. නෑඹිම්සා, නැව්හිමියා, (නාවා-නැවු-නැව්-නැ) බිරුහැඩු, බියජනක හඬ, (සද්ද-සැඩු-හැඩු-හැඬු) පිශලි තඩක්, වස්ත්‍ර පැබෙල්ලක්, කැණිදි කළගෙය, පිය සියේ මුදුන කැරැල්ලක් ශය් සිටින්නට සාදනලද ගෙය, දලදා මාලිගයේ පත්තිරිප්පුව මේ හැඩයට සාදා තිබේ. (කණ්ණිකා-කැණිය-කැණි) පසෙලියෙහි ගැමින්, පජින පාදයෙහි (ගල්පාත) වූ ගම් වලින්, මෙහි පාළිපාඨය වන "පාදගාමෙහි" යනුව පෙළෙහි නැතැයි ජයතිලක මහතා කියතත් සිරි ධම්මානන්ද ඥාණිස්සර යන නායක සවාමීන් වහන්සේලා කළ සුඩියෙහි තිබේ. (357 පිට බලනු.) (පාදතල - පතුල - පයල - පයලි - පසෙලි) පෙළෙව යනු 'පෙරෙ'යි විය යුතුයි. පූර්වයෙහි යනු අර්ථයි. කරණින්, කරණ

ශබ්දය කම්පිබත් බුහුබිස් ගත් තැනී, පිදුරු මුලක්, පිදුරු ගුලියක් (පුටක-පුළු-මූළු-මූළු-මූළු + අක් මූලක්) අමල, නිවා මන්ත්‍රණයෙහි යෙදෙන නිපාතයකි (අරෙ-අලෙ) වෙලවක්, ලජ්ජාවට පත් කෙරෙත්, දුඹුකවූ. දෙම්නස්ව; (දුම්මඩකු-දුඹුකු-දුඹුක්) නොපිරි සුන්වූ කොල ඇතියේ සසරෙහි, විශෙෂණය විශෙෂ්‍ය ගළපිබඳු පිබත්හත් තැකී, (ඇතියෙහි-ඇතියේ) හිගූ, ඔබෝක්කුවෙහි, වැමු, දුමුවාය-විසිකලාය; 'වාරෙනෙතා' යනු වාරෙනෙතා, සි වියුසුතුය. අවසිපි, අවසිඑ-ඉතිපි;

## 106 තිණ්ණංජනානංවත්ථු

"පියසසමෙ මනාපසස අනප්පං අවරි" මගේ ප්‍රිය මනාප තැනැත්-තහුට අනර්ථයක් කෙළේය. "න කථාය දෙසො අත්ථි" කථායෙහි දොෂයක් නැත්තේය. අසෝ, අසුවල්, (අසුක-අසොවු-අසොචි-අසෝ) උචාරණ, උපකරණ, කිණු, ඉණිමග-තරප්පුව, සචවාලිකා, ඇත්ත සහ බොරු, බැරූ, මලකතලද, (වාරිකා-වැරිය-වැරුය-වැරු) උදම්වූ, කුලප්පුවූ, 'සම්පතනමෙව සම්පටිච්ඡි' පැමිණි යහුම පිළිගත්තාය,

## 107 සුසාබුඩසක්කසසවත්ථු

තවවන පාපවගූ අටුවා සත්‍ය නිමි.

'නාව කතනාඩිබං' නොකට යුතුයි, "ඉදං නාම අාපත්තිං" මෙනම් ඇවැතට; බනි, බියවෙති; බැජ්නුනිරවමෙස්, "සබෙබ තසන්ති" යන තැන සබ්බ ශබ්දය අක්ෂර වශයෙන්බලනවිට සම්ප්‍රාප් යෙහිවැටෙන හෙයින් නිරවශෙෂාර්ථය ගෙන දෙයි. (බ්‍යඤ්ජන-බැජ්නු) අරුත්සාමිසෙස්, හත්ථාජානෙය්‍ය, අස්සාජානෙය්‍ය, උසභාජානෙය්‍ය, ඛීණාසව යන සිව්දෙනා මරණයට නොබිත හෙයින් අර්ථ වශයෙන් සාවශෙෂ වේ. ඉහත දැක්වූ සබ්බ ශබ්දය සම් සම් යෙහි නොව ප්‍රදෙශ සම්යෙහි වැටෙන බව මෙයින් පෙනේ. ආජානෙය්‍ය හස්තිමේ, උතුම් හස්තියාම; ඇතරුවාගේ බසෙහි අර්ථ දන්නේද හත්ථාජානෙය්‍ය නමැයි කියනු ලැබේ. සකායදිසි, පංචස්කන්ධය තමාගේය යන හැඟීම; බිලි, බලවත්,

## 108 ජබ්බග්ගියානං වත්ථු

අතුල්සැක්, අත්තල නැමැති ආයුධය; කිසපුහු, කියාපැන හොමුකලහ, සමමුබ කලහ;

## 109 ජබ්බග්ගියානං වත්ථු (දුතියං)

අභිඝරසසක්ඛු, අභි සංඛ්‍යාත සර සජීයකු ගෙවත් ගැරඩියකු

## 110 සම්බහුලානං කුමාරානං වත්ථු

දෙවනවැට එව්, දෙවන භික්ෂුවකුදු; (වට්ට-වැට) සිතුමතු' සිතුදය පමණක්; සිතන මතුයෙන්, සිතීම් මාත්‍රයෙන්; (දම-ලැබ-ලැහැබ) හකාරාගමයෙනි, සැරැහැන්නී, (දරන්නී හෝ) සරසන්නී යනු අර්ථයි. පසෙකින්, ප්‍රත්‍යක්ෂයෙන්; නිවත්හු, උපන්හු; බුදුතිර්ය, බුද්ධාන්තරය-දෙබුදු කෙනෙකුන් අතර ඇති කාලය; පැවැදෙනුවව, පැවිදිවිමව; පුරෙ එවුහු මැවූ, පූර්වයෙහි ඔහු විසින් මවනලද, ගෙවිට, ඉදිරිපැත්තෙහි; (අංලිඳයෙහි) මුවවිට යනාදිය සමගත් සසඳ බලනු. 'ඉතොනාම තිණථ' මෙහි සිට්හු මැනව; මාගවිරූ එවූසෙකින්, සත්‍රී රූපයක වැනි යකින් යනු අර්ථයි. 'එවූ' ශබ්දය විබත්නත් තැනී, කොළුවියි, කොළුවෙක් වූයෙහිය. මේ ව්‍යවහාරය ඇතැම් පළාතක තවමත් තිබේ. රජකොල්ලවගේ, රජ පැටියාවගේ යනාදී තන්හිය. උසස් අයගෙන් උපකාර ලැබෙමින් සුවසේ වෙසෙන අයට රජකොල්ලා'යි කියති. (කොණ්ඩ-කොළු) හැමූසෙනසම්, ආක්‍රොශ කළ ආකාරයම; සමවලාකථා, තමා දුෂ්ශීලව සිටගෙනත් සිල්වතුන් හා සමකොට කථාකිරීම; මෙහි 'වලා' යනු පූර්ව ක්‍රියායි. බියවලා, තුටුවලා යනාදිය සමගත් සමසර බලනු. ඉද්ධිවිධාභිඥායෙන්, ඉද්ධිවිධ සංඛ්‍යාත අභිඥායෙන්;

## 111 කුණ්ඩධාන තෙරැන්වත්

"උපවසිතබ්බතො උපොසථො" උපවාසය (ආහාර වර්ජනය) කළයුතු හෙයින් උපොසථ නම්. උපොසථාව කම්මං උපොසථකම්මං, උපොසථයම කර්මවූයේ උපොසථ කර්මයි. කරණංවා කම්මං, උපොසථස්ස කම්මං උපොසථකම්මං, කිරීම (ක්‍රියාව) හෝ කර්මයවේ. උපොසථයාගේ ක්‍රියාව උපොසථ කම්ම නම් වේ. පනරැසි, පසළොස්වක, ගෙවතුන්, විරුඩකාරියන්; ගොවලාබඳු, ගොපාලයකු බඳු, (ගොපාල-ගෙංවිල-ගෙංවිලා) කෙණෙරි යෙන්, කෙටේරියෙන්, (කුඨාරි-කෙණෙරි) කෙණෙරි සිඳුමෙන් සිඳැ, කෙණෙරි සිඳුමෙන් යනු 'සිඳැ' යන පෙර කිරියට විශෙෂණ වේ. කෙටේරියෙන් කපන කැපුමෙන් කපා-

## 112 උපොසථ කම්මවත්ථු

. අජගර, පිඹුරු, පජ්ජක්ගු, ප්‍රේතයකු (පේත-පේත) දෙමහවු ලෙත, දෙපැත්තෙන් යනු අර්ථයි. "තාවතමෙ එවරූපා අනත්ත භාවො දිට්ඨපුබ්බොති සිතං පාත්වාකාසි." මාවිසින් මෙබඳු ආත්ම භාවයක් නොදක්නා ලදැයි සිනාසුණෙතමි. අදුට්ඨපුබ්බං අත්බැව් දක්නා සේයින් වූ දිවසක් ලද සේයට, පෙර නො දක්ත ආත්මභාවයක් දක්නා පරිදි ඇතිවූ දිව ඇසක් ලැබීම ගැන; ඇස් සෙයින් වූවහුල, ඇස් වැතිවූවාහුලු. හිසින්වවා, හිසපටන්;, "සීසතො පට්ඨාය" යනු පාලියෙහි යෙදෙන සේය. 'සීසතො' යන පංචමිය වෙනුවට 'හිසින්' සිද 'පට්ඨාය' යන පෙර කිරිය වෙනුවට වටං, සිදයොදනා ලදී. ඉපෑම්හූන ලක්ඛණ, මුලින් තිබුන තත්ත්ව වෙනස්වීම් ලක්ෂණයෙහි, (පරිභොග-පිරිභොය-පිරිභොය් -පිරිහෝ) ඇලුප්, සවල්ප; (අල්ප-ඇලුපු-ඇලුප්) සුමුව්හැනිරූ සමුඝාත (නවගත්) රූපයන්; උපයනුවකැයි, උත්පාදනය කරන්නෙකැයි; (උප්පාදනක-උපයනු) අපෙළම, අත්පිඩි ගැසීම්; නො ඝැකිශහැකි, විනාශ නොකලහැකි; දෙවුඅණු, දෙවිනන් කරන නිග්‍රහ; (බිලාල සිටුහුවත් බලනු) එනෙක්සේයි, මෙපමණ විනාශයක්; (ජේද-සේය-සේයි) "සෙවලං පාපනිබ්බරොසෙනාසෙ වන හොති අථපො සාපානිකරොමිහිපි න බුජ්ඣතිසෙබ" හුදෙක් පවුකරන්නෙක් පමණක් නොවේ, පවුකෙරෙමියි නොදන්නේ ද වෙයි.

## 113 අජගරපේතශාවත්

එක් දහස්වැ, එකාසමාන අදහස් ඇත්තෝව; පිරිමිනින්හය් ඇයති බොහෝ හණ්ණනාම, පිරිමින් සහ ඔවුන් අයත් බොහෝ දෙය නැසීම් කමීය; (අංයතන-ඇයති) ශයන, ආකර්ෂණය කරන; විඛස්න, විපෘකදෙන; කටන් පවලපොත් වෙළය්, ධ්‍යාන හැමැති වෙළුමන් වෙලා; බුන්නා ඇටසිය කන්ගි සිවුවය්, තිදිගිය ඇට සිංල්ල තිබුන තැන්වලම තබා, සමුට හැනි පිණ්ඩ උපනින්,=සමු-ඝාත (ශරීරය ඔසොවා තබන) ප්‍රාණයාගේ උත්පත්තියෙන්; (ආපණ-අවුණ) කඩමාවක 'ආපණ' ශබ්දයෙන් අවුණු කියාද සුරා සාලාවාවක ආපාන ශබ්දයෙන් අවන - අවන් - කියාද හෙළුවට එන්නේය. නොයික්නව, නොහික්මුණු නැනැත්තාණෙනී; (නසික්ඛිතක-නොහික්නව) එරවු, බස්වා; (ඔතාරෙත්වා-එරවශ-එරවී) කුමා රහත්සේයට ඉඩ ඇතිසේ යට, තමන්ගේ රහත් බවට වත් සෘඩිමත් බවටවත්; අවකාසකාළ, තින්ද කලාය; කළු

යනු කර ධාතුයෙන් නිපන් අතීත කෘදන්තයි. 'මක්කච්චා කටඬ්-ඛාති' යනුවට කෝමාරිකා ලොද යන අර්ථය මෙහි කියන ලදී. (67 පත්සියයක් මහණුත්වත්හි) එන 'මක්ච් පිලෝති කාහි' යනු වච මියනා පියලියෙන්, සි අරුත් දක්වූ පරිදිත් සලකනු. හඹියෙහි, කැදෙහි; පොහො, තලා එක්යක් බවු, එක් ඇසක් ඇති බව; කුළිරොව්, කුෂ්ටරොගය; (කුඩ-කුළු-කුළි) උවසගින්, උවදුරින්, පැල, පීඩා; "සංඛිවෙජ්ද කම්මං කහාකතං" සංඛිවෙජ්ද (ගෙවල් බිඳීම්) කර්මය; කුඩා කැබැලි කැබලිති හම්. ති යනු සවල්පාර්යෙහි ය, වකුනු, මිකුටු; වකුරු යනුත් පාඨයි එය වක්‍ර ශබ්දයෙන් අ° හැකිය. හැතිසෙතිජ්, හැති කල්හිත්; තමහ දුමැතිය, තමාගේ ධර්මතාවයෙන්, (ධම්මතාය-දුමැතිය)

## 114 මහමුගලන් මහ තෙරුන්වත්

කොඬුපලස්, විල්ලුද මිශ්‍රයෙකි, හම්මිතුයේ, රුකුල්දෙනුයේ; -උපකාරවනුයේ; (සංථම්හන-හම්මන) කිරි ඔතප් නොබිදැ දෙනුයේ, කිරි ඔතප් බිදු නොදෙනුයේ, ලජ්ජාභය බිඳලන්නට නොදෙන්නේ; ඉල්ලූ, සෙවූ; කාල කුළෙහි, කලානතවූයෙහිය; නෙළුඹු දලි නෙලුම් දලු; (දලු-දලි) සමන්නාගත - සමනාය-සම්නා) කුම කියූහයක්, කුමක් හෙයින් කියූදැයි කියතොත්; දෙවසින්, දෙවෙංලක්; (දෙවායතන-දෙවියයන- දෙවයන - දෙවසින-දෙවසින්) කාලකිරිහුජ්, කලානත බවටද; නොටැසිවනු, නොවප් කාරයෙක් වන්නේය. විසිකිස්, සැකය; නොතුරු බැවින්; බැහැර, නොකල බැවින්;

## 115 බගු හණ්ඩික භික්ඛුසාවතු

කිසිසා. කිපුණු, සේවූ, දසෂවූ, බුදුලෙලහ, බුඩානුහාව, (ලීලන-ලෙලහ) රහන් එවනු, රගත් ඵලය ගෙනදෙනු වියතෙකි සත් තල් පමණ ඔවස්හි, සත්තාලයක් පමණ අවකාශයෙහි, "තස්සා දසසා මානාය" (තෘතය) දක්වන්නාවූ ඇයගේ, "සත්තාහං අප්පාහාරතාය" සත්දිනක් මුළුල්ලෙහි සවල්ප ආහාරයක් ඇති හෙයින්, මුබෙනවම විවමෙන, විවෘතවූ මුවින්ද යුකතව, "පිත්තසුරා පරික්ඛාසං අගමාසි" කිවිසුරාව පරිකෂයට ගියාය වැගුණු, මැස්සුණු, සහකාරිවන කෙලෙස් සුක්විමෙන්, සහායවන කෙලෙස් වියලීමෙන් (ඒ පෙරකල කර්මය,) සුක්ව, වියලව, නහම්කර, නොකරව, (පවජිල්ල - පැසුලු) සඩ්ඛරියමාන වන,

බැවින්, **සංස්කරණය** කළයුතු වන බැවින්, ධම්සර (ව) නුවට, ධම්යෙහි හසුරුවනු පිණිස, **හඬගොහනකම්සි**, හඬගසන කම්යයි. **අටපොහෝ දවස්**, **එක්** පක්ෂයෙක්හී පංචමී, අෂ්ටමී, චාතුද්දසී, පණ්ණරසීයි පොහෝ සතරෙක. **මිසකට** අටෙකි. **පචත්**, හමයි, **තෙජකිසුණෙහි**, තෙජෝකසිණයෙහි; **පාදකජ්ඣත්**, සෙසුධ්‍යාන යන්ට ආධාරවූ මූල් ධ්‍යානය; **දලැහි**, දිලිහි, **අග්ගිජාලා වුළු ඛිත්වා මම සරිරෙ මංස ලොහිතං ඛඩපෙතු**" ගිනිදල් නැගී මාගේ ශරීරයෙහි මස් ලේ දවාවා **පිරියමා එක්බිති**, පරිකම්යම් ඉක්බිති, **කිරියමා** යනු අප පාඨයි. **නොපිශා**, නොහැර, **අරමුණුවත්**, අරමුණුවත ලද, සොදනලද, (ධොත-දෙහ-දෝ) 'චතුන්නං මහා **පඨානං සමො ධානං චතු මහාපථො, තස්මිං චතු මහාපථෙ** මහාමාගී **සතරකැග් එක්වීම** චතුම්මහා පථනම්. **එය සතනම් විබත් ගත්විට** චතුම්මහා පථෙ,යි සිටී. **සැජ**, **අලංකෘත** යනු අර්ථය සේ පෙනේ, (සජ්ජිත-සැජය-සැජ) **සජනලද්**, අලංකාර කරන ලදුයේ, **නිමිත්තානුබ්‍යඤ්ජන ගහණයට** නිමිත්තග්‍රහණයට හා, අනුබ්‍යඤ්ජන ග්‍රහණයට රාගොත්පත්තියට හේතුවූ ශුභ නිමිත්ත ග්‍රහණයට හා, එකි එකී ශරිරාවයවයක් ශුභ වශයෙන් ගැනීමට, **ලෙඩිඩුපාත**, කැට කැබලිති ආදියෙන් දමා ගැසීම.

## 116 සන්තති මහ ඇමතියාවත්

**පරනිපාත කොළෙසි**, මූලින් යෙදිය යුතු නිවතු ශබ්දය පසුව යොදනලදී. විහිච්චවය්, විහිදුවා, **පිණිපස**, ප්‍රණීත ප්‍රත්‍යය, (පණීත -පිණිය-පිණිය්-පිණි) **දෙජ්**, අභිරික, තිල්ලජ්ජ යන දෙපදය ද, "**එවරූපානං වත්ථානං අචඡාදනඨානං**" මෙබඳු වස්ත්‍ර හඳින තැන හෙවත් ශාසනය, **උකැටු විය**, සිත ගිහිගෙයි කළකිරුනේය, (උක්කණ්ඨිත - උකැටිය-උකැටි-උකැටු) **කාමුමතිකායෙන්**, ගැටසහිත කායෙන්, 'ගාය' යනු කාත ශබ්දයෙන් ආයේය. **මති** ශබ්දය මද්ද කියතැයි සිතේ. එවිට හමින් ඇඹරූ කසය යන අර්ථ එයින් ගතහැකිය. **සමන්වාහැර**, පරීක්ෂාකොට ගෙන - යනු අර්ථයි. (සමන්නාපෙක්ඛා-සමනවය-සමන්වය-සමන්ව) **සරණධමුන්**, තිව නට යැමෙහි ලා පාදයන් වැනි ධම්යන්.

## 117 පිලොතික මහ තෙරුන්වත්

**පිළිවහණුමුඬං**, පළිගුයෙන් කරනලද, (ඵළික පාසාණ-පිළි වහණු) **පුවරුවක්**, ලැල්ලක්, (පදර-පුවරු) **බුඤ්නා**, අනුභව කරන, **පයෙක්ල**, ආධාරයෙක්ල, පාද-පය) **පෙළා**, වගුලනතපටු, පාතැටි යනුත් ආසිතන කුපධානයටම නමැයි සිබවලද විනිසෙහි කියන

ලදි. .1924 මුද්‍රණයෙහි 76 පිට) උඩරට සේරක් කලය නම්නුත් හඳුන්වනු ලැබේ. පිටිවශ, උපකරණ, (120) සිරිමාවත්ථුයෙහි “සොළොස් කහවණුවක් විකිණිලද් උවාරුණෙනැයි සේසී” යනුව ගා සසඳනු. (පරිබ්බය-පිරිවය) අම්ලමෙයන්, නොමිලමයේ, වඩක්, (44 උපුල්වන් තෙරීන්වත් බලනු) සිතුසිතු වහන, සිතුසිතු දෙය වහනය කරන හෙවත් සාධාදෙන, ජොති රස්මිණි, රැස්විහි දෙන මිණි, විරන, විහිදන, (විශිණී-විහිරන-වීරන-විරන) විශිණී ශබ්දයෙන් දිරායෑම වියළීම යන අර් කියවෙතත් එයින් ආ පාළි විසිණ්ණ ශබ්දය විසිරීම් අර්යද ගෙනදෙයි. ‘ඉහිරෙන’ යනුත් විශිණි ශබ්දයෙන්ම සිඩය. “ජොතිමෙසං රසනයි එතසමාති ජොතී රසො” මෙසින් කානතිගු විසිරෙන්නුයි ජොතිරස නම්වේ ඒ සතර අවිනත්‍ය විෂයෙහි ඇයිමේ, මේ, එක බත්කොටස පන්-සියක් පසේබුදුවරුන්ට බෙදාදීම, ඒ සතර ආචින්ත්‍ය විෂයෙහි, ඒ සිව්වැදෑරුම අචින්ත්‍ය කරුණු විෂයෙහි, හෙවත් බුද්ධ විෂයයි. ඇයි, ආදි යි හෙවත් ප්‍රථම කාරණයයි (ආදි-ඇයි) පොහොනුවීම, ප්‍රමාණවත්වීම, (පොහොනක - පහොනු - පොහොනු) සියරස බොජුන්, ව්‍යඤ්ජන සියයකින් යුක්ත භොජනය, රන්මලාක්, රන් බඳුනක්,-රන්පාත්‍රයක් ‘සැපැත් සුබගෙනි, සම්පත්ති සංඛ්‍යාත සෞභාග්‍යයන්, තැස පසු, තවො යනුව පස්වන කොට ඇති, (පඤ්චන-පසු) සාගිවනුධෑවවයන් සඳුණ් එරවය්, ශරීරයෙහි පඨවි ආදී සිව් ධාතුන් වෙන්කොට බලන නුවණ බස්පා, (වවටඨාන-වවතය-වවයන්) විහෙර සිම්හි, විහාර සීමායෙහි, (සීමා-සිම) නොඉක්ම්ය දෙනුවවය, (ඉක්මිය නොදෙනුවස්) ඉක්මෙන්නට නොදෙනු පිණිස, හස්රොජ්, පණ්ඩිත සාමණෙර වත්‍ථු බලනු. “මෙනනං බ්‍රහ්මචාරිහි” සමග හැසිරෙන්නන් සහ කරනු ලබන මෛත්‍රිය, ‘පසපිවිහනන භොජිනා, නොබෙදූ නොවළඳන බව, සයි, බඩසයින් යයි, සය,සී-සයී) කිවමනතරයෙන්, අත්සටයුතාත කිත, “සාරිපුතන කිමෙහනලබං” ශාරිපුත්‍රය තා විසින් කුමක් ලබන ලදද, “අහාරොනාම කිං ආහරති සාරිපුතන” ශාරීපුත්‍රය ආහාරය නම් කුමක් ගෙනදෙයිද, ‘නිධානඨානං’ යනු ‘තිබ්බාන-ඨානං’ කියාත් පෙනේ.

## 118 සුඛ සාමණෙරසස වත්‍ථු

---

දසවන දණ්ඩවගැ අටුවා සන්‍ය නිමි.

සැණ, උත්සවය, ගුහුනල්හි, සොෂණය කළ කල්හි, (පඩාය-පටය්-පටා) බෙරෑ, බෙර, වසන්, ව්‍යසන, පිළිමවල, ගෙනයායුතු දේ සනස්කිරීම, සුමුග, පැස, මිපිවළා, කුඩාමුට්ටි, (වාරක-වළය-වළුන්-වළා) (වෙගෙන-වෙසින-වෙසින්) බිම්සෑ, ආවෙසව, (අභිමුව්චිනා-අබිමුසිය-අබිම්සිය-බිම්සිය-බිම්සෑ)

## 119 විසාඛාය සහායිකානං වත්ථු

**ගිණියක්**, ගණිකාවක්, (ගණිකා-ගිණික-ගිණිය) **පටිවයෙන්** (118 සුඛ සාමණේර වත්ථු බලනු.) **කිවසුන් තෙරෙහි සිටිසේද්දූයි** කොපමණ වස්හි සිටියෙහි දූයි හෙවත් උපසපුයෙන් කිවන වසෙහි සිටින්නෙහිදූයි, (කති-කියි-කිය්-කී) වසුන් යනු වස් ශබ්දය නාමි විබත් බුහුබස් ගත්තැති. **ලහ පොහොනා තැන**, සලාක බෙදන තැන නොහොත් සලාක විචාරණ තැන, (පුචජන-පූදන-පොහොනා-පොහොනා) **හම්නා**, උසුලා, **හවුරුදු කොළෙහි**, වති කොටි ගණනක් මුළුල්ලෙහි, **හසුළේ**, හැසුරැණේය. **වැහුණහු**, වැගුරු-නාහ, **ඇසුණු බැවින්**, සංසක්ත (මිශුවූ)වූ බැවින්-ගැවසිගත් බැවින්, **සාඇජ් ඇතිසෙයිජ්**, බඩගිතිවූ අභ්‍යන්තරය ඇතිසේද, (ජාතජඝිතත-සය ඇජ-සය් ඇජ-සා ඇජ්) **පිළිසන්නෙක්**, කියන්නෙක්, **කොයනුජ්**, සොයන්නෙක්ද, **ගිවිසා**, ඔසොවන ලද්ද, **විදිහෙන**, විනාශවන, (විධංසන - විදහන - විදිහෙන) **සිරිමාව**, සිරිමාවගේ

---

## 120 සිරිමාවත්

"**වීසාධිකං වස්සසතං වීසං වස්සසතං**" විස්සක් අධික කොට ඇති අවුරුදු සියය වීසං වස්සසත නම්. "**තං එතිස්සා අත්ථීති වීසං වස්සසතිකා**" ඒ එකසිය විසිවස ඇයට ඇත්තේනුයි. වීසංවස්සසතිකා නමු. හමු, සම්බාධ (හමුය-හමු) **හෑසඩු**, සම්බාධ, (සංසඨ-හැසටු-හැසඩු) **කුදුලිස**, කිදිවැල්, රසකිඳවැල් යනු අථයි. **සිලිසෙන**, වැගිරෙන,

---

## 121 උත්තරථෙරියා වත්ථු

**මිහාමිග කැණ දසුන් පවාගිසැ**, මගහාමගහ කැණ දසසනශ දක්වාගිය, **අධිමනි**, අධිමානය ඇති, **බියදෙරකොවු වච**, පිට-වාහල්කඩව, **ශදලියැ හුනු තුමා දක්න**, ගදකිළියෙහි හුන් තමන් වහන්සේ දක්නා, (ශඳකිළිය-ගදළිය) **අලුවක්**, ආලෝකයක්, **අනුචජවිකං තුංබා**, නුසුදුසු නොවේද, **කොවුවන්**, **පරෙය්යන්ගේ** (කපොත-කොවොය-කොවෙඃ)

---

## 122 අධිමානික භික්ඛූනං වත්ථු

**මෙහෙණවර**, භික්ෂුණීන් වසන ආශ්‍රමය; (සමණිඝර-මෙහෙණවර) **පාසාදුවහෙ**, සතුට එලවන; **ඝොෂ**, මිහිරි ශබ්දය; **ලුඛ**, රූක්ෂ ප්‍රතිපදව; **වැමටනුශයි**, පවත්නා තැන (ලෝකයෙහි)

**ලක්ඛණ සහ අනුව්‍යඤ්ජන ධර්මප්‍රදීපිකාවෙයන් දතහැකිය.** බමුණු, භ්‍රමණය (වලනය) වූහ; **සාව බලවසිනො නා අනොසි,** ඇය බලවත් ස්නෙහ ඇත්තියක් විය. **අභිඤ්ඤ සමනන්තර ඉද්ධිවිධ ඤාණෙන්,** **ෂඩ් අභිඥවට අනතුරුව ලැබෙන ඉද්ධිවිධ ඥානයෙන්, සුලාක්,** **සළ්පයක්; 'සඞ්ඛවිජාත වණ්ණං'** වරක් වැදූ ස්වභාව; **ජරාජිණ්ණ ඛාණාපල අතිවිය විරජ්ජි''** ජරාවෙන් දිරූ තල්හි එබඳු කලකිරූ **ණය; පුඵ, ජැපුනු; මැදබුනුවා,** කුදුවූවා; **ගොනැසක්,** පරාල යක්; **අහර පිරිණැම්නි,** ආහාර පරිනාමයෙහි හෙවත් **පිර්වස්හි;** (පරිණාම-පිරිණම) **ගැලිණි,** ගැලුනු තැනැත්තිය; **සලාවැහෙන පුසා, සැලෙමින්** වැගිරෙන හැර; **මුලුම්බුණු,** කැබැලි කැබැලි කඩා කැහ යනු අර්ථයි. **ඉතිරෙතුවා,** ඉතිරීයන සිරුර; **ධාමිතු බැවෙකින්,** ධාතු මාත්‍ර භාවයකින්; **මා ආගඤ්ජි, නොඑව්; සන්-සිඳින්,** සන්සිඳුනෙහි;

---

## 123 රූප නන්දසෙරියාවත්

**වල්බ ඇති ගෙහක්,** විශ්වාසය ඇති බල්ලෙක්; (වල්ලභ-වලබ-වල්බ) **ණහ × එක්-ගෙහක්,** (සුණඛ-සුණහ,ණහ) **'සාණ'** **ශබ්දය වුවත් ණහ වියහැකිය. උපාදිණ්,** සිව්මහා භූතයන්ගෙන් හටගත්; **පච්චක්ඛතො දිඨං,** ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්නාලදී, **හවනලද** ආක්‍රොශ කරනලදී. **හව** (සාප) හැවුම්හි ධාතුයි. **පාඅවුරු** පාදධාරය, (ආධාර-අවරු-අවුරු) **පාලොඹු,** පාපුටුව, (පාදවලම්බ පයලොඹු-පාලොඹු) **දන්ති වදැරුම්,** දතයෙහි සංවිධානය, (විවාරණ-වැදැරුන්-වැදැරුම්) **තහවුරු සනවුඇතියේ මෙ,** (මේ තහවුරු සහවු ඇතියේ) මේ මරණය සපිර සවභාව **ඇත්තේ** වෙයි. **"අයස අනන භාවස්ස ජරා ආනච්ජන්ති එතතකං වඤ්ඤබ්බං"** ඒ ආත්ම භාවයට ජරාව එන්නේය යන මෙපමණක් කියයුතුයි. **උවහක්,** විනාශයක්, (උපඝාත-උවගය-උවග)

---

## 124 මල්ලිකා දෙවියාවත්

(සල්ලහුක - සලහුය - සලහු-සල්හු) **තැතිපැන ඇතියෙසි.** **නුවණ** තැත්තෙක් වෙයි. තැතිපැන නම් නුනුවණයි. **ඒ නුනුවණ** ඇති තැනැත්තේ **තැතිපැන** ඇතියේ **නම්. ශයුතුයෙහි,** කියයුතු තන්හි, ය, කිපුම්හි ධාතුයි. **යන බැවින්** කියන බැවින්, **ඒ මාත්‍රා** **නෙපුල් නොාජනී, එපමණ** (අභික්කම පටික්කම යන **පමණ**) වචනයක්**වත් නොදනී, බිරණ; නෘණවිශෙෂයෙකි, තිණකරළුණ්,** **තණ**කැරලි-තණමිටි යනු අර්ථයි. **ඔගු මයතුවට්,** ඔහුගේ විසිම පිණිස, බඹදෙයන්, බුනව දෙගයෙන්, ගමේ සම්පූර්ණ පාලනයක්

සමගම ගමදීම් බ්‍රහම හෘදයයෙන් දීම්තම්. **පණ්ණාසකානංවා** අභාවේන, ඉහෙතගත් පණ්ණාසකයක් නොමැති හෙයින්, සූත්‍ර පණ්ණාසක් පණ්ණාසකයක්වෙයි. **සෙ වෙන් සවු**, සර්වප්‍රකාරයෙන්, (සබ්බෙන සබ්බං–සවෙන්සවු–සෙවන්සවු

---

## 125 ලාළුදායිත්ථෙරස්ස වත්ථු

**පීති සොමනස්ස සමුට්ඨිත** වචන, සන්තෝෂයෙන් හටගත් වචන, **භත්තයට**, අස්තයට, **පූර්වේනිවාස** පිළිසොයන, **පෙරවිසූ** තත්ත්වය දතහැකි නුවණ විශාලත, '**කරුණා එතස්ස අත්ථීති කරුණො තස්ස භාවො කාරුඤ්ඤං**' කරුණාව ඇතියේ කරුණ නම්ද ඔහුගේ ස්වභාව කාරුඤ්ඤ නම්ද වන්නේය, **කාරුඤ්ඤමෙව කාරුඤ්ඤතා**, කුළුණැතියාගේ ස්වභාවයම කාරුඤ්ඤතා නම් වේ. අවිද්‍යාදි **දොළොස් ඇඟ**, පටිච්චසමුප්පාදයෙහි කී අවිද්‍යාදී දොළොස් **අඞ්ගයෙහි**, **එරවා**, බනා–දමා, (ආරොපෙත්වා–එරවිය එරවය) **මග ඤාණට පදට්ඨාන්කොට** ඇති, මාර්ගඥානයට මූලහෙතුව කොට ඇති, **පණ්ඩිත්**, ප්‍රාඥතා, **වැටෙන** බැවින්, **පවත්නා** බැවින්, **කෙලෙස් මහවු ලගු**, කෙලෙස් නැමැති ඉලඇට,

---

## 126 උදෙනගාථා වත්ථු

**මතු**, මාත්‍රයෙක්, ගීකිමත් වාදනය කිරීමත් **පමණක්** යනු අර්ථයි. **රෙති**, සුරායෙහි, (රා × එහි) **මත් සැහැවියෙක්ද** යහපත් ස්වභාව ඇත්තෙක්ද, **බොජුන්** බඩ, අනුභවකරන **මණ්ඩය** හෙවත් තැටිය, "**කපාල කණ්ඩං**" යනුදු අටුවාගත පාඨයි. **කිමිකබ**, කිමදමා ඉඳ හැනීමට පාච්චිකරන රෙදි කැබෙල්ල, **සොස්නාහුයි**, සොක කරන්නාහුයි,

---

## 127 මහාධන සෙට්ඨි පුත්තස්ස වත්ථු

එකොලොස්වන ජරාවග්ග අටුවා **සන්‍ය නිමි**.

**සිම්වයි**, සම්පයෙහි, **මිහිභගස්**, හෙණකලාතම් ගස්, **අසිරි නොවනු**, ආශචර්‍ය නොවන්නේය, අනාගතාර්ථයෙහි නු ප්‍රත්‍යයයි. **කාළ**, කළුහොත්, (පාදපට – පියපිළි – පියවිළි) **ඇක්මෙන්වායි**, පාගත්වායි, අනායෙහිවනු **නොදකිති සිතන කෙනෙක් වෙති**, අනාගතයෙහි සිදුවන දෙය නොදකිතැයි සිතන කෙනෙක් වෙතැයි, නොදකිති, වෙති යනාදිය **සමග සෙදෙන** සංහිත තෘතියා විභක්තියෙන් සිටිය යුතුයයි කියන්නන්ගේ මතයට පහර වදින තැනෙකි මෙය. (අනුකම්පා–අනුකපු) **නොඇක්ක**, නොපැහුයේය, '**අහමෙම්ම කුච්ඡිගතො කුමාරො සරණං ගච්ඡති**, මාගේ

කුසෙහි සිටින කුමාරයා (බුදුන්) සරණයයි, වුහුවූසින්, හරිනලද සිත, (විස්සට්ඨ-විසටු-වුහුටු) දිවාන, දිවයින, (දීපායතන-දිවයතන -දිවයන-දිවාන) නොනැකිය යන අපමා, නොනැසිය යන අප්‍රමාදය, සම්පයොජනා, මනා ප්‍රයොජනය,

---

## 128 බොධිරාජ කුමරයාවත්‍ථු

සල්ලෙඛ, කෙලෙසුන් ලියාහරින ප්‍රතිපත්ති; මැදුම්සඟියෙහි සල්ලෙඛ සූත්‍රයෙන් විස්තර දතහැකිය. නෙතසිවුරෙන් ඉතිරි තා සිවුරෙන් තමා අධිෂ්ඨාන කරනය තුන්සිවුරට මඩා තිබෙන තාක් සිවුරුමලින්; අසන්මුඛෙහි, ලංඝුකල්හි, ඩබර, පෙරගන; තෙරු, තීරස; දෙම්සවානෙවා දියබල්ලන් දෙදෙනා; රෙම්සක්, මගුරු මසක්; (කාණසිනාල කැනහිල්) අරියවංස පටිපදව, චතුක්කංගුත්තරයෙහි සතවන උරුවෙල වග්ගය බලනු.

---

## 129 උපනන්ද සක්‍යපුත්තස්ස වත්‍ථු

දරමනු, ජීවමාන; (ධරමානක-දරමනු) සජ්ඣාය විමුඛභාවං, බණ හැදෑරීමෙහි නොයෙදීම-බණ ඉගෙනීමෙන් මෙන්වීම් බව; හුන්බැවින්, ගිළිහුනු(පතිතවූ) බැවින්, කලකිරෙනුවන්, ක්ලාන්ත වන්නන්,

---

## 130 පධානික තිස්සත්ථෙරවත්‍ථු

සඩාම්ගු අරියය්, සවාමීයා සතුටුකොට. (ආරාධෙත්වා-අරියය -අරියය්) කිසිජේනයක්, කිසිඡෙදයක්; මේ කිමද යනු අර්ථයි. වර්තමාන ව්‍යවහාරයෙහි මේ මොකොද යනුයි නොබුනුමෙ, අභිහනම ය-නොබිදුනේමය; "ඉම්සසාද ෆරාය කාමමං" මේ බාල නැහැත්තී යගේ ක්‍රියාව; විවාදධිකරණ, ධර්මාධර්මාදී අටළොස් වස්තුන් නිමිතිකොට විවාද කරන භික්ෂූන්ගේ යම් විවාදයෙක් වේද එය විවාදධිකරණ නම් වේ. සිල ආචාර දිට්ඨි ආජීව යන සිව් විපත්ති යෙන් ඔවුනොවුන්ට චොදනා කිරීම අනුවාදධිකරණයයි. සෙණි පවුරු, කඩතුරා නැමැති ප්‍රාකාරය; (සාණී-සෙණී) පරික්ඛිපනාය යෙන්, වටකිරීම් අර්ථයෙන්; තුළුල් නොතුළුල් ඇසි, ඉදිමීම් නො ඉදිමීම් ආදිය. සාමාන්‍ය ව්‍යවහාරයෙහි තුරල්වීම් යනුත් ඉදිමීමට නම්. 'දුට්ඨුල්ල' ශබ්දයෙනුත් 'තුළුල්'යි ආහැකිය, නිශම කානුව, මේ වනාහි නියම් කරනු ශබ්දය කාම්ච්බන් ගත්තැනි, නියම කරනු වස්, යි විබක් නොගෙනත් සිටී. සමනා, පරීක්ෂාකර බලා; (සමා නෙත්වා-සමනය-සමනය්-සමනා) මේ අවස්ථා, මේ විධිය; ව්‍යවහාර යෙහි පෙනෙන විධි අර්ථයෙහි යෙදුන 'අවන' යනුත් අවස්ථා ශබ්ද

යෙන් ආම්කැයි හැගේ, **පෙරහරින්**, සත්කාරයෙන්; (පරිහාර පෙරහැර) **පියන්ගල්හි**, ප්‍රධාන (භාවනා) ගෘහයෙහි; **වම්මිකතැ, වම්මික** සූත්‍රයෙහි; (වම්මික-වම්මිය-වම්මිය්-වම්) **මනොඥකින්**, සවල්පය කින්; (මනාක්-මනොක) මදෙකින් යනුත් පාඨයි. **සෙවුමෙන්** (සෙවනු × ඒ සෙවනය කරන්නේය; **එසිවරා**, එයට වඩා; **ගැබිළි** ගර්භිනී; (ගබ්භිනී-ගැබිලි) හද්දණී, යනු හද්දලී වූ සැටි සලකනු. **මෙරමා අත්නෙහි සිටියහු විසින්**, අනුන් ගටතෙහි සිටියහු විසින්; (අත්තනි-අතනි-අතන-අත්න) **මෙරමා කෙරෙහි බඳුවා විසින**, අනුන් කෙරෙහි බැඳුන තැනැත්තහු විසින්, (බඳුව × ආ-බඳුවා -බඬ ා-බඳුව) **සපන් අනුන්**, සමෘඬවූ ආත්මයන්; **සොච්**, මනාජේ; (සුද්ධ-සෙ,ච්)

---

## 131 කුමාර කාසසපත්ථෙරසස මාතුයා වත්ථු

**විසේනි අලවක් සා පොහෝ විසින්**, මෙයට "පණුරුසි පොහෝ" යනුවකුදු දමා, විසේනි අටවක් සා පොහෝ පණුරුසි පොහෝ විසින්, යි වාක්‍යය සම්පූර්ණ කළයුතුය. විසෙනිය නම් පක්ෂය පිළිබඳ පස්වැනි දිනයයි පැරණීයෝ එය බණ අසන දිනය හැටි යට සම්මත කළහ. මාසේ පොහොය සා පොහොය නම්. සඳනැති පොහොය යනු අර්ථයි. සා යනුව ක්ෂය ශබ්දයෙන් ආයේය. (ක්ෂය-ඛය්-සා) **තෙනානන්**, සොරකම් කොට ගත්; **වත්න**, පවත්නා; **සිම්වති**, සමීපයෙහි; **කඩදෙරක්**, කැලෑවට වදනා දොරටුවක්, කඩ යනු කාඩු ශබ්දයෙනි. **බැලක්හු**, හටයකු, බැල, කුලිය; **පරම්පසට**, එහාපැත්තට; (පාරං-පරම්) **ගැලිෂක්**, කරත්තයක්; හින්දි ගාඩි ශබ්දය අපේ ගැලි ශබ්දයට පැරණි නම ගැලි යනුව එයින් ආ හැකිය. **පිළිසැල**, සන්තාස; **තරද**, තෙජා-තර්ජනය කොට; (තර්ජන-තරජය-තරදය-තරදය්-තරද) **මනාවක්හම ලවු**, යහපත් තැනැත් තෙකුට නොවැ යනු අර්ථයි. **කියනලදුව**-කියනලද දෙය; (ගට යනු අර්ථයි)

---

## 132 මහාකාල උපාසකසස වත්ථු

**සගෙනැ**, සංග්‍රහකොට; (සඞ්ගණ්හිත්වා-සගෙනය-සගෙනැ) **පොලොබාය්**, පොලඹවාගෙන; (පලොභෙත්වා-පොලොබය-පොලොබය්-පොලොබාය්) **පියොනලනාද**, ප්‍රයොග (උත්සාහ) කළ නාක්ජාතක හා යන්; **ගි සමග**, ගතිය (උපන) හා සමග, (ගතී-ගිහි-ගිය්-ගී) වුසුළු, වස කළද; (වසිත-වුසුතු-වුසුටු-වුසුළු) **කොඹුපතින්**, කොටුගැසුනු පත්‍රයෙන්; **සමනනනොනා හසද්න වසෙන**, හාත් පසින් බිදීම් වශයෙන්; **පරියොනඬ්ඪායිනං**, හාත්පසින් වැළඳ ගෙන සිටියේය; අභිය, අගින; ඔබුහු නාස්න, ඔහුගේ විනාශය;

### 133 දෙවදත්තස්ස වත්ථු

අසඤ්ඤත්‍ර භික්ඛු සංඝෝ යනු අසඤ්ඤත්‍ර භික්ඛු සඞ්ඝ, යි චීය යුතුය. කම්වාක්‍යය නොඅස්වා ඥප්තිමාත්‍රය පමණක් කියාකරන විනය කම්යෝ ඥප්ති කම්නම්ද, ඥප්තිය තබා එකවරක් කම් වාක්‍යය කීමෙන් කරන කම්ය ඥප්ති ද්‍රතිය කම්නම් ද, ඥප්තිය තබා කම්වාක්‍යය තෙවරක් කියා කරන කම්ය ඥප්ති චතුත්ථ කම් නම්ද, භණ්ඩුකම්ය වැනි චිවැරීම් මාත්‍රයෙන් කරන කම් අපලෝකන කම්නම්ද, වෙත්. පැදුම්දනට, නැගෙනහිර දෙසට; (පාචීන-පජීන-පැජුන-පැදුන-පැදුන්-පැදුම්) පැලදසට, බස්නාහිර පැත්තට; (පටි-පළි-පැළ-පැල) පැලවිය යනාදිය සමගත් සසඳනු.

---

### 134 සඞ්ඝභෙද පරිසක්කන වත්ථු

වළදන ලද පාවුරුබන් ඇතිය, වලදන ලද උදේ ආහාරය ඇති යැතැත්තිය; (පාතවාර-පාවුරු) ඇතියා, ඇතියෝ යනුත් පාඨයි. ඈසුව, ඇසුවහොත්; බුඩානං සාසනං පටික්කොසසි, බුදුවරයන්ගේ බණට දෙස්කියන්නෙහිද; අත්තස ඥණය වායමසි ආත්ම විනාශය පිණිස වෑයම් කරන්නෙහිය; (වලවා-වෙලෙව-වෙළෙඹ)

---

### 135 කාලථෙරස්ස වත්ථු

කාලද්දස්සු, කලයෙන් දිය ගෙනෙන දසිහු; මසනාකින්, සවල් පයකින්; මදෙකින් යනුත් පාඨයි.

---

### 136 චූලකාල උපාසකස්ස වත්ථු

(සංවෙග - සංවෙය-සංවෙයි) තවාහි, පවා, කිඳූයි, කියනුම කාවරේදූයි යනු අර්ථයි. කණොවක්, තුට්ටුවක්; සැගවෙන, සඟවන වෙන; පුනුපසුනු, පුකන පුයුකන;

---

### 137 අනත්දත්ථෙරස්ස වත්ථු

දෙලොස් වන අත්තවග්ග අටුවා සත්‍ය නිමි.

හබු, ගිතෙල් මිශ්‍ර කැඳ; (සප්පි-හපි-හපු-හබු) පසුව හබු ශබ්දය හැම් කැඳම් කියේය. මුත්ත, මුත්තනීරයෙහ්; සොපචාර නිස්සිතනෙහි, උපචාර සහිත නිශ්‍රිතයෙහි; ජීනසිස වී නම සිතා ගසනු නොහැකිය. එබැවින් සිහ ශබ්දයෙන් හිස නොව ගිස ඇහුරුකල කොත් කියනු ලැබේ. මෙහි ගිහ නිස්සයද කෙස් නිස්-සිතද වෙයි, මුළුතණ්ඩ, කුස්සියෙහි; මුළු යනුව දෙමළ 'මිලෛ'

ශබ්දයෙන් ආහැකියි. දෙමළ බසින් කුස්සියට 'මඩෙප්පළ්ලි'යි කියත්. අභිනයසට, සමීපයට; න එතං අගරුං, එය අගරු නොවේ. 'න එතං අතිගරුං' යනුත් පාඨයි

**පාසාදහස්**, ප්‍රාසාද සදහා, **පාපුරණ**, පොරොණා; **කපාල**, කබල; **කසාව**, පසාවට; **අනුමහනතා**, අනුහතමත්තාව; **සිප්පු**, සිවුපා; (චතුප්පාද–සිපුපුය–සිපුපු)

---

## 138. අඤ්ඤතරදහරභික්ඛුස්ස වත්ථු

**නුගසකාණන්**, උතුම් න්‍යග්‍රොධ ශාක්‍යයන්, (සක්ක, සැක) **ඉතිරිසම්භසි**, අධිනයම්හසි, **ඝැහැටය් කරනුමත් හිදුනාව්**, ශාක්‍යයන් විසින් කරනු ලබන මානය හිඳිනු පිණිස, (මුඤ්විණා, මුසියා, මිසියා, මිසැ) උවාම් යනු උපවා යි වියයුතුයි. **තීත්දව** යනු අර්ථයි (උපවාද, උපවය, උපවය්, උපවා) **ඉපැශැව්ගි**, **ඉපදවූයෙහිද** උපද ධාතුයෙන් නිපනි. **ඉපැවිහියැ** යනුත් පාඨයි.

---

## 139. සුඛොදනයස වත්ථු.

**කඩන සුලඟුන්**, සිරුර කැඹලි වශයෙන් කඩන වාතයන්ගේ **"අරහනතං පඩා උදතං උදනෙඩා පරිනිබ්බුතො!"** රහත්ම ප්‍රීතිවාක්‍යය පවත්වා පිරිනිවන් පෑ සේක. **තොරඹුරු**, රහස්.

---

## 143. අංගුලිමාලත්ථෙරස්ස වත්ථු..

(පෙසාකාර–පෙසෙකර–පෙහෙර) **නොකහවුරුගි දිවි, ජීවිතං** කුහවුරු නොවේමැයි; **සකුස්**, වහා; (සාකුන–සකුන–සකුස–සකුස්) **වරුතැහැරි**, මෙහි තැහැරිනම් **තීසිරි නම්හුත් හැදින්** වෙන පටපනුවන් ගෙණ් ගනු ලබන නූල් (කොසෙයය) වේ. වරු ශබ්දය වස්ත්‍ර කියයි. එහෙයින් වස්ත්‍ර වියනු පිණිසවූ තැහැරි වරුතැහැරි නමැයි සලකනුව. **සෙනෙවූ, දසෑවූ**; (ජේන–සෙහ–සෙනග) (සකුණ–සිකිණි–සිහිණි–ලිහිණි) **වෙමිගම්යි**, වියන දණ්ඩ හමුෂයහි යයි;

---

## 144. පෙසකාරධිතරාශ වත්ථු

**නිශයිවැසි**, යනු පිටිනියරි වැසි, යි වීනම මැනවි, පිටිසර වැසි යනු අර්ථයි. **ගණ්දල දෙරටිගි**, ගදකිළි දෙරටුයෙහි **ගෙණ්දල දෙරටිහි** යනුත් පාඨයි. **තාව විරාශනකි ගික්ඛු**, භික්ෂුහු තවම ප්‍රමාද වෙත් යයි; **බුදුන් නොරෙහි**, බුදුන් සමීපයෙහි; **ඔවුන් විරායත ඇත්තෙසින්**, ඔවුන්ගේ ප්‍රමාදවීම ඇති හෙයින්; 'ඔවුන් විසරායන' යනුත් පාඨයි. **ඉධපානු**, සෘඩිපාදයෝ–සෘඩිය ලබාගැනීමට මූලාධාරවන ධර්මයන් උපකාරවන ධර්මයෝ;

## 145 තිංසභික්ඛූනං වත්ථු

කාදෝ පැණියන්, කලාමැදිරියන්; (ඛජ්ජෝත - කණදෙය - කණදෙය්-කණදෝ) අරවස්ත්‍ර, ඉල්ලාද; ඉන්ද්‍රගෝවච්චන්, වර්ෂාකාලයෙහි ඇතිවන ගැඬවුල් පවුලට අයත් රතුපාට පණු විශේෂයක්, ශක්‍රගොපකයනුත් නම්. පුරෙව වැදුම්, ප්‍රථම වන්දනාව; කැබිලිකඨන්, ගර්භිණී ස්වරූපය; වටදඬු අමුණුවක්, දරමිටියක්; එකට ඇමුණු හෙවත් සම්බන්ධකළ දඬු සමූහය දඬු අමුණුව නම්. එය රවුන්වන සේ එකට තබා බැන්දවිට වටදඬු අමුණුව වෙයි. ආරක්, ආකාරයක්; සුවන්නු, මිනාව ස්පර්ශ විය. ඔටමස්, තොල්; තිබ්බිශෙගය, දරුවන් මැදීම සඳහා සකස්කළ ගෙය; අඳුරු හෙයින් ඒ නම යෙදුනේය. (තිමිර-තිමිරි-තිඹිරි) උපඨාකානම්පි අක්ඛාතරෙ න වදෙසි, උපස්ථායකයන් අතුරෙන් ඇතැම් අයට නොකියන්නේය; සෙවුන මත්ත මේ, මෙවුන් දම් සෙවිම් මාත්‍රයක් ම; සීහා, සිංහනාදය (නාද-නය-නය්-නා) ඝොරපතනෙහි, ඝෝරැන් හෙළන ප්‍රපාතයෙහි;

---

## 146 විසාඛාමාතාවිසාඛාය වත්ථු

එවංඅසසා, මෙසේ ඇයගේ; පුවරින්, ලෑල්ලෙන්; (පදර-පුවරු) වඨන්ගි, රවුන් මණ්ඩපයෙහි, (ආවට්ටන-අවටන-වටන-වටන්) ඇතුළු කාලඤවයි, කලවා යුග්මය අතර; (අනතර-අතුරු-ඇතුළ) කාවියට සමීප පාදය කලවෙය නම්. (කටිපාද-කලවය-කලවෙය-කලවෙයි) සුවණ්ණනාවා, රන්හොරු, දුකමැයි නො යන, දුකසේ කලනැකි නොවිද යන; (දුකවහැකි-දුකවහැයි-දුකවැයි) නොපසැසෑ, ප්‍රශංසා නොකොට;

---

## 147 අසදිස දානවත්ථු

මේහෙසී, සේවය-වැඩ; අවිචි පරයින් නොවා, අවිචිය පිහිට නොවට; (පරායන-පරයින්) පියලීශැව, රෙද්දෙහි බැන්ද පොදිය; (වතු-සසු-සිසු)

---

## 148. අනාථපිණ්ඩික පුත්තස්ස වත්ථු

තෙළෙස්වන (ලෝකවග්ග) අටුවා සත්‍ය තිමි.

අගහොතුරු, ගිහිපූජා; (හොත්‍ර-හොතුරු) වැනියක් දතැවිරිසි, වාතීාවක් දැනගනු කැමැති රුචිය; (වත්තිකා-වතිය-වැතිය) (රුචි-රිසි-රිහි) පදලෑඝ, පාසටහන (ලඤ්ඡ-ලස-ලෑස) සේබැවින් දසාළ බැවින්; සමහවමේ නොවන, නො ලැබෙන්නාවූම; න ඉදං කාමභොගිනො පදං, මෙය කාමභොගීයෙකුගේ පාදයෙක් නොවේ; රාගිරිණු පියා, රාගචරිතයාගේ පාදය; නොපසෑරිසී, නොවදිසි; ලාභලො, ඉක්මනින්, පෙලනු ලදුයේයි, පීඩාකරන ලද්දේ

වෙයි; හස්නු ලද්දෙවෙයි, අදින ලද්දේවෙයි; විවත්ත පටිවත්තිතං ඡද්දං-කිලෙසච්ඡදනං-යස්සසො විවත්තච්ඡද්දො, විවත්ත, සේයි; පරිවත්තිතං, පෙරළනලද; ඡද්දං, සේයි; කිලෙසච්ඡදනං, කෙලෙස් නැමැති සෙවෙනිය; යස්ස, යමෙකුටද; සො, හෙතෙම; විවත්තච්ඡ--ද්දො විවත්තච්ඡද්ද නම්. පෙරළා හෙළාපියන ලද කෙලෙස් සියන් ඇතියක්හුග, පෙරළා හෙළා දමනලද කෙලෙස් නැමැති පියසි ඇතියක්හුගේය; සව්සඤ්ඤබවු, සියල්ල දන්නා බව; ඔවස්, අවකාශයක්-ප්‍රමාදයක්; 'පච්චත්තං අත්තනියෙව පුරිසකාරො පච්චත්ත පුරිසකාරො' පච්චත්තං සේයි, අත්තනියෙව පුරිස කාරො, තමා කෙරෙහිම වූ වීර්‍ය්‍යය පච්චත්ත පුරිසකාරො, පච්ච-ත්ත පුරිසකාර නම්. ඤාත කලමා දුක්ඛිමි, තාත්තෙ මෙමාකොඳ දුක්වත්තෙ; පාහම්මියෙහි, පාදය සමීපයෙහි; තෙවම්නසාකාසි මෙම්තෙහි නොකෙළේය; (උපදම්භ-උපයම්භ) එක් දරුමගු, එක දරුවකු වැදූ මව්වරු; එක්දරුමාහු ගෙනු හ්‍රස්ව විධියෙන් එක්දරු-මිහුවිය. පුහුනන් යනු පූහුදූනන්, සී වියයුතුයි. නොනාහ සරණ බැවින්, සංසාරය නොතරන බැවින්, නොණෙයින්, අයහපත්සේ-නාපුරුකොට; ජනානුදිනන ලද්දේ; 'රාගොයෙව ගතිහෙතුත්තා රාගපදං පුග්ගලං' රාගයම ගතියට හෙතු හෙයින් රාගපද නම්. පුද්ගලයායි. 'තණ්හානාමෙසා ජාලිනී, මේ තෘෂ්ණාව නම් සත්ත්වයා සසර සමග සම්බන්ධ කරන හෙයින් ජාලිනී නම් වෙයි. සිබ්බනලද, මසනලද; (සිබ්බන-සිව්වන) ජල්කරනුවිශිජ්, තෘෂ්ණා ජාලය කරන්නීයයි ද, උවාකොට ඇතිශිජු, උකිම කොට ඇත්තී කියාද, කරනුවිශිජු, ඇතියයිජු යනු කරනුවිය × සිජු, ඇතිය × සිජු යි වෙන්කළ යුතුය එවිට කරනුවිය, ඇතිය යන ප්‍රකෘතීහු ලැබෙති. ඇලවන බැවින්, අලවන බැවින්; ඉදං මුත්ත කරීස පුණ්ණං සරීරං දිස්වා න සොභති. මලමූත්‍ර පිරුණු මේ ශරීරය දක (මගුන ජනදය) නොවෙයි. කාමයෙව කථා, කවරනම් කථා වෙත්ද;

---

